
SAMMANA
කුංකුම
අංජන 2
Kunkuma Anjana
www.sinhalaelibrary.com

# 01

බණ්ඩාරවෙල යන දුම්රියේ ප්‍රවේශ පත්‍රයක් මිලට ගෙන මම මගී පාලමෙන් එගොඩ වී දෙවන වේදිකාවට ගියෙමි... තවම බණ්ඩාරවෙල බලා යන බදුලු කෝච්චිය පැමිණ නැත. තව මොහොතකින් එය වේදිකාවට එන බව ශබ්ද වාහිනී යන්ත්‍රයෙන් කියවිණ. බදුලු කෝච්චිය මාවත් රැගෙන බණ්ඩාරවෙල යන්නේ දෛවෝපගත සිදුවීම් රැසක් අවසානයේය.

ඇත්තටම මගේ ජීවිතයේ හෙට දවස කුමක්ද...

ශඹීතා කොහේ කොතැනක ඉන්නවා ඇත්ද. මා අද බණ්ඩාරවෙල යන බව ඇය දනී. ඊයේ රැ වූ ප්‍රශ්නයද ඇය දනී. සියල්ල නිමා වූ බව ඇයටද අමුතුවෙන් කිව යුතු නොවේ.



www.sinhalaelibrary.com

ප්‍රේමය අරභයා පසුව කඩාගෙන දනෙන ලෝබකම ඊටත් වඩා නැති කර ගත යුතුය. ශහීනාව සිහිවෙන වාරයක් වාරයක් පාසා එකී ලෝබකම මට දනෙයි. ඒ ලෝබකමට ජීවිතයේ මත මැවූ දුක් කන්ද මා සිහිකර ගත යුතුය.

ලොවේ පෙම්වතුන් සියල්ලෝම එක් නොවෙති... හමුවෙන බොහෝ අයගෙන් බොහෝ දෙනා වෙන්වෙති. 'පෙම් ලෝකයේ මතක විතර කාලයයි...' කියා ජෝති කියන්නේ ඇත්තදැයි මම නොදනිමි. තවමත් මගේ ප්‍රේමයේ මතක මා අඬවයි.

අදින් පසු ජීවිතය දවන තනිකම හුදෙකලාව... පාළුව... ළඟි ළඟින් මාව හඬවනු ඇත. එහෙත් සියල්ල ඉදිරියේ ජීවත් වන්නට මම අද පාන්දරම හිතා ගත්තෙමි. ජීවත් වෙමින් දුක් විඳීම ප්‍රශ්නයක් නොවේ. හදිසියේ මෙන් දුක පැමිණ පසුව පාරවන බව පමණක් මම දනිමි.

ශහීනාව විවාහ කර දෙනු ඇත. අසාද් ඇයව සාම්ප්‍රදායික ඉස්ලාම් තුල සිරිත අනුව විවාහ කරගනු ඇත. ශුද්ධ වූ කුරානයේ අත තබා ඔවුන් වෙන් නොවන්නට පොරොන්දු දෙනු ඇත. පසුව බබාලා හදනු ඇත. සේද පැළඳගත් සාම්ප්‍රදායික මුස්ලිම් ගැහැණියක් මට සිහිවිය.

මම ඊර්ෂ්‍යා නොකරමි. වෛර නොකරමි. ආදරය කරන්නාටම සියල්ල හිමි නොවේ. අවසාන වතාවටත් මතක සිම දුමූ මම දෙවෙනි වේදිකාවට ආ බදුලු කෝච්චියට නැග්ගෙමි.

මා දුරින් යන්න යනවා
මට යන්න අවසරයි...
මට අරන් යන්න ඇත්තේ
ඒ මතකය විතරයි...

දුම්රිය පෙට්ටියේ දොරකඩ සිටගෙන අන්ධ ගායකයා ඒ





ගීතය කියුවේ හැඟීම්බර ලෙසිනි. ඔහු ඒ ගීතය මේ මොහොතේ මේ කෝච්චි පෙට්ටියේම කියන්නේ ඇයි... ප්‍රේමයේ කඳුළුද සුන්බුන්ද හැරදමා හිත හදගෙන යන මටම ඒ ගීතය ගැයුවාක් මෙන් විය.

සඳ එළිය අයිති ලොවටයි..
මට උරුම කළුවරයි..
මගේ මතක එපමණයි...

ගීතයේ අන්තරා කොටස් මගේ පපුවම ගිනි දළ ගසාන්නාක් බඳුය. දෙවියනි ආදරය මේ තරම් ගින්දර නොවාත් නම් ඔබ වහන්සේ එය ලෝකය තුළ මැව්වේ ඇයි... අනන්ත වූ හදවත් ඒ ගින්දරෙන් දැවී පිච්චී යද්දී ඔබ වහන්සේ වරදක් නොකළ කෙනෙකු මෙන් ඉන්නේ ඇයි... තනිවූ ආදරවන්තයින්ගේ පාළු හිතට කාගේ හව්හරණක්ද රැකවරණයක්ද.

අන්ධ ගායකයා කෝච්චියේ පැද්දෙමින් සීට් අල්ලාගෙන මා කරාද ආවේය... මම රුපියල් විස්සේ කොළයක් ඔහු අත තැබුවෙමි. ඔහුගේ අසරණ මුවේ සිනහවක් මතුවිය.

සෙමෙන් සෙමෙන් බදුලු කෝච්චිය මැද මහනුවර කඳු පෙලට ළං විය... ලස්සන දසුන් ඇත්තේ තව ඉස්සරහටය... මම පාළු දෙනෙතින් කඩුගන්නාව කඳු යාය දෙස බලා උන්නෙමි. උදෑසන හිරු එළිය මීදුම් කැටිති රැඳුණු කඳු මතට දීප්තිමත්ව පායා තිබුණි. මීදුම් දියවෙමින් යන්නේ හිරු එළිය නිසාය...

ජීවිත කඳු මුදුන්ද ඇත්තේ ආදර මීදුමෙන් වැසී ආදර කඳුළු වලින් තෙමී ගොසිනි. ඒ මතට අළුත් හිරු එළිය වැටිය යුතුය... බණ්ඩාරවෙලට ගොස් ජීවත් වන්නට අළුත් බලාපොරොත්තුවක් ගෙන යා යුතුය...



www.sinhalaelibrary.com

ගතවූ මාස කිහිපය සිහිනයක් මෙනි. ඒ සිහිනයෙන් නොසිතූ නොපැතූ මොහොතක මට පිබිදෙන්නට සිදුවිය... හිත සැනසෙන කර ගන්නට තරම් සුන්දර ලෝකයක් අපට තිබුනේ නැත. ආදර සඳුළු දෑසේ දරාගෙන අපිට වෙන්වන්නට සිදුවූයේ ඒ නිසාය... යළි ජීවිතයේ කිසිම දිනයක හමු නොවන අප හමුවූයේ ඇයිදැයි මම පවා නොදනිමි.

ආදරය මහෝඝයක් මෙන් වූ දූකක් වුව ශහීනා ඒ දූකට මහා ලෝබකමක් එකතු කළාය... ඒ මිහිරි ගින්දර විඳින්නට මගේ ලාමක පිරිමි සිතට බලකළේ ඇගේ ආදරයයි... එහෙත් එකවර අහසේ ඇදී මැකී ගිය දේවතා එළියක් මෙන් සෙනෙහස හරිහැටි බලාගන්නටවත් මට නොලැබිණි.

දුම්රිය පේරාදෙණිය සරසවි උයන දුම්රිය ස්ථානයේ නැවැත්විණි. බදුලු කෝච්චියේ උන් බොහෝ සෙනඟ බැස ගියෝය. ඉන් වැඩි හරියක්ම පේරාදෙණියේ සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ය.. දුම්රියේ සිට බැස ආ ශිෂ්‍යාවක් එහෙමම දුවගොස් අංගනයේ ඇය එනතුරු බලා උන් ශිෂ්‍යයෙකුගේ පුරතේ එල්ලුනාය... පැද්දෙමින් ඔහුගේ උරහිසට බරවෙමින් ගසමින් සිනාසෙමින් ඔවුන් යන අයුරු මම බලා උන්නෙමි.

මට හිල්ලින.

මමදුම්රියේ කැන්ටිමට ගොස් හුදෙකලාවේම තේකක් ගෙන බිව්වෙමි. ජීවිතය අද සිට කොතරම් පාළුද. තනිවී තේක බොද්දී මට සිතුණි.

මැද කඳුකරයේ සුන්දරම තිම්බිරි මැදින් සරණ කඳුබඩ දුම්රිය මාර්ගය දිගේ දුම්රිය සෙමෙන් සෙමෙන් ඇදෙන්නට විය. මම පුංචි එකෙකු මෙන් කවුළුවෙන් හිස පිටතට දමාගෙන පසුවෙන දිය ඇලි දෙස බලා උන්නෙමි.

සීතල විශේෂ් ටික පසුවට කඩා පාත්වෙන්නට විය... ඇතැම් තැනකදී මුළු දුම්රිය මැදිරියම විශාල මීදුම් කුට්ටියකින්





වැසී යයි... වඩාත්ම අපූර්ව අත්දැකීම නම් විනාඩියක් පමණ දුම්රිය උමං මාර්ගය යටින් යද්දීය...

එක අතකට මේ පාළුව ලස්සනය. තනිකම සැහැල්ලුය... මම දුම්රිය ආසනයේ ඉඳගෙන කවුළුවට දෑතම තබා ඒ මත මුහුණ තබා ඇලවී ඇත කඳු පල්ලම් දෙස බලාගෙන සිතුවෙමි. ජීවත් වෙන්නට සහකාරියක් අවශ්‍යමද...

ඉඳහිට මොහොතක දුම්රිය මාර්ගය අසළින්ම පස් කන්ඩි මතුවේ. ඒ පස් කන්ඩි මත නහපාට විශාල මල් පිපි ඇති ගස් දුම්රිය හා ස්පර්ශ වේ. මම අත දමා එවැනි මල් තුන හතරක් කඩා ගත්තෙමි.

'එකපාර අත දාන්න එපා. ගලකට අහු උනොත් කඩලා යයි...'

මම පොඩි එකෙකු සේ අත දද්දී මට ඉදිරිපස ආසනයේ උන් අවුරුදු හතළිහක පමණ වූ පුද්ගලයා කීවේය. ඔහු මෙතෙක් වෙලා උන්නේ පුවත්පත බලමිනි.

'මේ බදුලු කෝච්චියේ පළවෙනි පාරද...'

මගෙ ළදරු හැසිරීම නිසා ඔහු එසේ සිතන්නට ඇත. මම ලැජ්ජාවෙන් අසුනට බර උනෙමි.

'නෑ මීට අවුරුදු දෙකකට විතර කලින්නුත් ගියා...'

'කොළඹද ගෙවල්...'

'ඔව්.. මේ මහත්තයගේ...'

'මං බදුල්ලේ ටීච් කරනවා. මාත් කොළඹ තමා...'

ගුරුවරයෙකුගේ තිවුණ පෙනුම ඔහුට විය. මම පෙරටත් වඩා ගෞරව සම්පන්න ලෙස ඔහු දෙස බලා සිනාසුනෙමි.

'මේ මල්ලි තරහ වෙන්නෙපා ඇහුවට.. ඇයි ඉස්සෙල්ලා ඇස්වල කඳුළු තිබ්බේ...'



www.sinhalaelibrary.com

ඔහු මා දෙස බොහෝ වේලා බලා සිටින්නට ඇත. මට එබැවි නිච්චියක් නැත.

'ගෙදර දලා යන නිසා වෙන්න ඇති...'

'කොහාටද යන්නේ.. බදුල්ලටද...'

'නෑ බණ්ඩාරවෙලට.. පොඩි මාමා ගාවට...'

ඔහු කරුණාබරව මා දෙස බලා සිනාසුනේය. අපි දුම්රිය නැවතුම් කිහිපයක් යනතෙක් බොහෝ දේ ගැන කතා කළෙමු. ඔහු මා ගැන විස්තර ඇසුවේය. මම දන්නා අඳුනන කෙනෙකුට මෙන් මගේත් ශනීනාගේත් බිඳුණු පෙම් පුරාවත ඔහුට කීවෙමි. එය කාට හෝ කියා ලය සැහැල්ලු කරගන්නට මටද අවශ්‍ය විය. දෙතුන් දෙනෙකුට කියූ පසු හිත සැහැල්ලු වෙනු ඇත.

'ඔයා ඔයාගේ ජීවිතේ අවංකවම මට කියපු නිසා මාත් කතාවක් ඔයාට කියන්නම්.. මල්ලී වගේ හැදෙන කොල්ලෙක්ට මගේ කතාව ප්‍රයෝජනවත් වෙයි. ඔයාට වඩා අවුරුදු විස්සක විතර අත්දැකීම් මට ජීවිතේ ගැන තියෙනවා...'

මම ආසනයේ හරි බරි ගැසී මේ අපූරු මිනිසා දෙස බලා උන්නෙමි.

'මං ඉස්සෙල්ලාම මේ බදුලු කෝච්චියේ නැගලා බදුල්ලට ආවේ මීට අවුරුදු පහකට විතර ඉස්සෙල්ලා. එතකොට මට වයස අවුරුදු තිස් පහයි. අද මේ කෝච්චියේදී ඔයාව දක්කහම මට මාව මතක් උනා... මං දක්කා ඔයාගේ ඇස් දෙකුන් පාරක් තෙමෙනවා... ඔය වගේම මාත් ඉස්සෙල්ලාම දවසේ බදුලු කෝච්චියේ ගියේ ඇස්වල කඳුළු පුරවගෙන...'

ඔහුත් මා මෙන්ම ආදරයේ ගින්දර දරාගත නොහැකිව





කොළොම් තොටට සමුදුන්නාද...

'මං හරි දුප්පත් කොල්ලෙක්.. හරිම අමාරුවෙන් ඉගෙන ගත්තේ.. පුංචියට ජීවිතේ පටන් ගත්ත හදන කොටම මමත් ඔයා වගේ ආදරේ කරන්න පටන් ගත්තා.. හැමෝගෙම දෙවියේ මල්ලී ආදරේ මවන්නේ එකම විදිහට නෙමේ. කෙනෙකුගේ ජීවිතේ ඒක මල් උයනක්. තවත් කෙනෙකුගේ ජීවිතේ ඒක මළ සොහොන් පිටියක්. ඒත් ආදරය කරන්න පටන් ගනිද්දි කව්රුවත් එහෙම හිතන්නේ නෑ...'

ඔහු දැනගත වූවාක් මෙන් කියවගෙන යයි.. මම හුස්මක්වත් නොගෙන ඔහු දෙස බලා උන්නෙමි.

'කතාවට කියන්නේ මල්ලී ආදරයට කිසිම කුලයක් ජාතියක් පංතියක් නෑ කියලා... ඒත් ආදරේ දී තරම් ඒවා සළකා බලන තවත් දෙයක් නෑ... ඔයා මුස්ලිම් කෙල්ලෙකුට ආදරේ කරලා දුක් වින්ද.. ඒත් ඒ ආදරේ ඔයාට ලොකු තුවාල ඇති කළේ නෑ... ආදරේ මල්ලී මිනිස්සුන්ගේ පපුවවල් වල ඇති කරන්නේ ඔය වගේ සීරීම් තුවාල නෙමේ.. ලොකු මරණීය තුවාල... මම එහෙම තුවලා හදගෙන මරණාසන්න වෙච්ච අසරණ මිනිහෙක්... මං ආදරේ කළේ මං ඉපදිච්ච පංතියේ කෙල්ලෙකුට නෙමේ... මං වගේ හිඟන කොල්ලන්ව සල්ලි වලට ගන්න පංතියේ කෙල්ලෙකුට... ආදරේ රස්නේ පපුවට ආවම ලෝකේ තියෙන බෙදීම් වර්ග අපිට පේන්නේ නෑ.. ඒ වෙලාවට හිතට ලොකු විප්ලවවාදී අගයක් එනවා... ඒත් ඒවා ලෝකෙට ගැළපෙන්නේ නෑ... මුම්ටාස් මහල් මැරුනාම සාජහාන්ට දුක හිතුණා තමයි... එයා දෙවිට සිහිවෙන්න ටාජ් මහල් එකක් හැදුවා තමයි.. ඒ සාජහාන්

මෝගල් අධිරාජ්‍යයේ එකම රජතුමා නිසා.... ඒත් සාජහාන් මුම්තාජ් දේවිට ආදරේ කළාට වඩා තමන්ගේ ගෑණිට ආදරේ කරන්න මිනිස්සු ඉන්නවා... උන්ට ඒ ආදරේ වෙනුවෙන් මන්දිර ගහන්න සල්ලි නෑ... ඒක නිසා දුප්පත් මිනිස්සුන්ගේ ආදරේ අමරණීය වෙන්නෑ...'

සමරනායක අයියාට තිබුනේ පුදුමාකාර අදහස්ය. ඔහුගේ අදහස් වලට මම ඕනාවටත් වඩා එකඟ වන්නෙමි.

'ආදරේ කරපු පෝසත් කෙල්ලව කසාද බඳින්න මට වාසනාව තිබ්බා.. අපි බැඳපු මුල් කාලේ හරි ආදරෙන් හිටියා.. ඒත් මගේ පුංචි ගුරුකම එයාට තඩන්තු කරන්න මදිඋනා... අන්තිමට මං ලොකු මන්දිරයක් ඇතුලේ හිරකාරයෙක් උනා.. කසාද බැඳපු ගෑණී වෙන මිනිස්සු එක්ක එහා කාමරේ නිදාගනිද්දි මිනිහෙකුට ඉවසන්න බෑ මල්ලී... මං සල්ලි වලින් හුළං ගහන හුළං කපොල්ලක කුඩු හදලා තිබ්බේ... දහේ කොළ දෙකක් එහාට මෙහාට කරද්දි මගේ කුඩුව කැඩුනා... ඔයාගේ ශහීනා එයාගේ ආගම ජාතිය අමතක කරලා ඔයා ළඟට ආවේ නෑ... ඒ හැටි. මගේ ගෑණිත් එහෙමයි. එයාට එයාගේ පංතිය ඕන උනා... දුප්පත් මිනිහව මල්ලට දම්මා... මං පාරට බැස්සා ඇඳගෙන හිටපු ඇඳුම් පිටින්... හිතන්න මහ රෑක හිස් අතින් පාරට බැස්සට පස්සේ ජීවිතේ කොහෙන්ද කොතනින්ද මං පටන් ගත්තේ... මම ඒ රෑ මම උගන්නන ඉස්කෝලේ පංති කාමරේක ඩෙස්ක් එකක් උඩ නිදාගත්තා... ඊටත් මාසෙකට පස්සේ බදුල්ලට ට්‍රාන්ස්ෆර් එක හදාගෙන ආවා. ඔයා අද ආවා වගේම අඬ ඬා... ඒත් සංදේශ් මල්ලී මං ඇඬුවේ එද විතරයි.. අද අඬන්නෑ...





කඳුළු ඇස් ඇතුලේ ගල් කරගෙන ජීවිතේට මුහුණ දෙන්න... ආදරේ කියන්නේ උතුම් මිනිස්සුන් ළඟදි විතරක් පිපෙන දෙයක්. මේ කසිකබල් ආත්ම ළඟදි ඒක පරවෙනවා...'

ඔහු සාක්කුවෙන් ලේන්සුව ගෙන දෑස් පිසදා ගත්තේය. මම සැහෙන වේලාවක් ඔහු දෙස බලා උන්නෙමි.

'කවදහරි දවසක මේ ට්‍රේන් එකේ නොමෙ... පුංචි කාර් එකක කොළඹ යනවා කියලා හිතාගෙන ජීවත් වෙන්න... ජීවිතේ පතුලටම වැටුණාම ඉහළට නගිනවා කියන එක ජීවිතේ ලොකුම අරමුණ කරගන්න.. එතකොට වරදින්නේ නෑ...'

බණ්ඩාරවෙල ස්ටේෂමට දුම්රිය ළඟාවෙද්දි මට දුක සිතුණි. ඒ සමරසේකර අයියා සමඟ තවත් බොහෝ දේ කතා කරන්නට හිත ආශාවෙන් උන් නිසාය.

'අයියට පින් මට ඔය ටික කියලා දුන්නට... මං වැටිලා හිටියේ... නැගිටින්න විදිහක් නැතුව.. මං දවසක එන්නම් හම්බවෙන්න.. මට උගන්නන ඉස්කෝලේ ඇඩ්‍රස් එක දෙන්න...'

ඔහු මට කුඩා කොළ කැබැල්ලක ලිපිනය ලියා දුන්නේය. මේ ආගන්තුක මිනිසා මං බණ්ඩාරවෙලින් බහින්නටත් පෙර මාව ජයග්‍රාහී මිනිසෙකු කළේය...

'මං බහිනවා අයියේ...'

'හොඳයි සංදේශ් මල්ලී... සුබගමන්...'

කුරුළු කැලේ දුක් විඳි අහිංසක කුරුල්ලා ගිනිගත් අළු වලින් නැගිටින්නට සිතා බණ්ඩාරවෙල දුම්රිය අංගනයට බැස්සේය... මට මා ගැන අහිංසක ආඩම්බරයක් දැනුණි. ඒ හිමි හිමීට හෝ මට මේ හිත හදාගන්නට හැකි වේ යැයි සිතීයි..



www.sinhalaelibrary.com

# 02

"පුතේ.."

මාමා වේදිකාවේ ඈත සිට කෑ ගසාගෙනම මා කරා ආවේය. මගේ දෑසම කඳුලින් පිරුණි. අද සිට මගේ දුකටත් සැපටත් දෙකටම මේ බණ්ඩාරවෙල ඉන්නේ මේ පොඩි මාමා පමණි.

'පොඩි මා..මේ..'

දුම්රිය වේදිකාවේදීම පොඩි මාමා මාව වැළඟත්තේය. ඒවත් පසු ඔහු මගේ දෑලරහිසටම අත තබා මාව නොත් පුරා දක ගත්තේය. මම අසරණව සිනාසුනෙමි.

'උඹ කෙට්ටු වෙලා කොල්ලෝ..'







'ගාණක් නෑ.. දැන් මහත් වෙන්න බැරියැ පොඩි මාමේ..'

'මං උඹව මහත් කරනවා විතරක් නෙමේ ලොකු පුතේ.. උඹව මම උඹේම කකුල් දෙකින් හිටවනවා.. බලපන්..'

පොඩි මාමාගේ වචන මගේ ලයට අළුත් බලාපොරොත්තුවක් ගෙන ආවේය...

'පාන්දරමද කොල්ලෝ ආවේ..'

'ඔව් පොඩි මාමේ.. හතයි තිස් පහේ ට්‍රේන් එකේ නැග්ගේ..'

'අම්මා ඇඬුවද පුතා එද්දී...'

පොඩි මාමා මගේ කරේ තිබූ ගමන් මල්ල ඔහුගේ කරේ දමා ගත්තේය.

'අම්මා විතරක් නෙමේ පොඩි මාමේ.. අපි හතර දෙනාම ඇඬුවා.. මට පව් කියලා හිතුනා...'

'දැන් ඕවා අමතක කරලා දාපන් ලොකු පුතා... ඔයා බණ්ඩාරවෙල ආවේ ඇත්තටම ඔයාම හිතලද නැත්නම් ගෙදරින් ඈත් වෙලා ඉන්න ඕන නිසාද...'

'මට ගෙදරින් ඈත්වෙලා ඉන්න අමාරුයි පොඩි මාමේ... මමම හිතලා බණ්ඩාරවෙල ආවේ. මට මේ දවස් එච්චර හොඳ නෑ...'

'උඹට විතරක් නෙමේ කොල්ලෝ... හැම මිනිහෙක්ගෙම නපුරු දවස් ටිකක් තියෙනවා.. දැන් කෙල්ල කෝ..'

මම දුක්බර සිනාවක් පෑවෙමි.

'කොහේ ඉන්නවද මොනවා කරනවද කියලා මං වත් දන් නෑ පොඩි මාමේ... ඒත් කොහේ හරි හොඳට ඉන්න ලැබෙන්න ඕන.. ලස්සනට බැඳලා බබාල හදගෙන...'





www.sinhalaelibrary.com

පොඩි මාමා මගේ උරහිසට තට්ටු කළේය.

'උඹ හරි.. එහෙම තමයි පුතේ හිතන්න ඕන. ජීවිතේ යමක් සිද්ධ වෙන්නේ උඩ පැන පැන අඬන්නම නෙමේ. දරාගන්න. මළ කඳත් පසුව උඩ තියන් ඉන්නැතුව උඹ ඔය වගේ මනුස්සකමින් ප්‍රශ්න දිහා බලන්න පුරුදු වෙයන්. එතකොට හිතේ ගින්දර නෑ...'

පොඩි මාමාගේ මෙරූන් පැහැගත් ටවුන් ඒස් වෑන්රිය දුම්රිය ස්ථානයට එපිට තුරු සෙවණ යට නවත්වා තිබුණි. ඒ වෑන් රිය දුටුවනම මගේ නෙත් පැහැර ගත්තේය...

'ෂා... වෑන් එක ලස්සනයි පොඩි මාමේ... මේ තිබ්බ එක නෙමෙයිනේ..'

'ඒක වික්කා පුතා... මේ අලුතින් ගත්තේ.. නුවර ඉන්ද්‍රා ට්‍රේඩර්ස් එකෙන් ගත්තේ... උඹට ඩ්‍රයිවින් පුළුවන්ද...'

වෑන් රිය දුටුවිට වාහන පදවන්නට හැකි වූවා නම් කදිම යැයි මටද සිතුණි. ජීවිතයේ කොතරම් නම් දේ අතපසු වීද.. ඉගෙන ගන්නට කොපමණ නම් දේ තිබුණාද... සියල්ල මට තිබුණේ අමතකවය.

'මං උඹට දවස් දෙකෙන් උගන්වන්නම්... ඊට පස්සේ මට ලේසියි... උඹ ඩ්‍රයිවර් මං මේ පැත්තේ සීට් එකේ ෂපාන් එකේ යනවා...'

පොඩි මාමා මට වම් පස දොර ඇර දෙමින් සිනාසී කීවේය... එක වරම සීතල සුළං පහරක් හිරි ගඩු නංවමින් හමා ගියේය... මම වාහනයට ගොඩ වී නුහුරු නුපුරුදු බණ්ඩාරවෙල පරිසරය දෙස බලා උන්නෙමි.

'මං ජීවිතේ පුරාම තනියම ජීවත් වුන මිනිහෙක් ලොකු





පුතා.. තනිකම අන්තිමට මට පත්තියම් උනා.. හිතපන් මේ හීතල බණ්ඩාරවෙල මිනිහෙක් තනිඋනාම ඇතිවෙන හැඟීම.. කාලෙකට එළියට බහින්න බැරි විදිහට වහිනවා. ඒ දවස් වලට මම පාළුවේ ගෙදරට වෙලා බ්‍රැන්ඩි ටිකක් බිබී ඉන්නවා...'

පොඩි මාමා කීවේ බණ්ඩාරවෙල නගරය හරහා වාහනය පදවනා අතරතුරය. හිඳුණුවැව මුර කපොල්ලේ උන් හමුද සෙබළුන් මාමාට සැලියුට් එකක් දමුහ. ඔහුව බණ්ඩාරවෙල නගරයම හොඳින් හඳුනයි.

'ඇයි පොඩි මාමේ කසාද බැන්දේ නැත්තේ..'

ඒ ප්‍රශ්නය මටද අදාළය. මමද කසාද නොබැඳ ඉන්නට හිතාගෙන උන්නෙමි.

'මට පුතා දන් හතළිස් දෙකක්... පුතාගේ තාත්තට වඩා මම අවුරුදු අටක් බාලයි.... ආදරේ ලස්සන පැත්තකුත් ඇති. ඒත් මං දක්කේ දුක් විතරයි... ලොකු පුතාට කිව්වට මොකද පොඩි පොඩි ගැණු පල හිලව් දෙක තුනක් නම් තිබ්බා... ඒත් අන්තිමට මට හිතුණා හැම එකටම වඩා තනියම ජීවත් වෙන එක ලස්සනයි කියලා...'

තනිකම ටිකක් නොව ගොඩාක් ලස්සනයැයි මට සිතුණි. මම ඒ තනිකම විඳ ඇත්තෙමි... වින්ද තනිකම ජෝඩු වෙන්නට ගෙස් කුඩු පට්ටම් වී ගියේය... මගේ නින්ද මට නැති විය.. මගේ සැනසීම මට නැති විය.. අවසානයට කුරුළු කැලේ මගේ ගෙදරද මට ජීවත් වෙන්නට බැරි විය.

'මාත් කවදාවත් බඳින්නේ නෑ..'

මා කියද්දී පොඩි මාමා මහ හඬින් සිනාසුනේය. මම සීතලව ආසනයේ උක්කුටි වී ඔහුගේ සිනාව දෙස බලා උන්නෙමි.



www.sinhalaelibrary.com

'අනේ හරකෝ.. මෙච්චර ලස්සන අහිංසක කෙල්ලෝ ඉන්න රටේ උඹ තනියම ඉන්න... පිස්සා... කෙල්ලෙක් ඉන්නකොට කොච්චර හැඩද.. නිකං හිතම පිරිලා.. තනියම ඉන්නකොට එහෙමද... මළ මූසලයි. කිසි ජොලියක් නෑ... නිදි ගන්න ගියත් මූසල හිත පේන්නේ.. කෙල්ලෙක් ඉන්නවා නම් ඒකිගෙ මූණ මතක් කර කර නිදාගන්න පුළුවන්.. එතකොට රෑට ඒ කෙල්ල ළඟට එනවා...'

මම කොල්පට තද කරගෙන සිනාසුනෙමි. එහෙම දේවල් මාද අත්දක ඇත... කුරුළු කැලේ ගෙවූ බොහෝ රාත්‍රීන් හි ශශිකාව මහා රෑ මට සිහිනයෙන් පෙනුණි... ළඟ ඉන්නවාක් මෙන් ඒ සුසුම් හඬ මට දැනුණි.

'එතකොට මෙච්චර ලස්සන ගෑණු ඉන්න රටේ පොඩි මාමා නොබැඳ උන්නේ...'

'මං පුතේ බැන්දේ නැති බව ඇත්ත.. ඒත් ආදරේ කළා... කසාද බඳින්න හොඳ ගෑණියෙක් හම්බ උනේ නෑ... අද ඒකේ පාඩුව මට දැනෙනවා... හරියට දැනෙනවා... බණ්ඩාරවෙල ආවා කියලා පසුව ග්‍රීජ් එකේ දගෙන ඉන්න හදන්නෙපා පුතේ.. උඹ හොඳ කොල්ලෙක් වාගේ හැදියන්.. ආදරේ කරපන්... උඹේ පිටි පස්සේ මං ඉන්නවා. නාස්ති නොවී ජීවිතේ ජොලි කරපන්..'

පොඩි මාමාට ඇත්තේ නිදහස් අහිංසක දර්ශනයකි. එවැනි දර්ශනයක් හද ගත් කල ජීවත්වීම සුන්දරය.

'මං මොනවද පොඩි මාමේ කරන්නේ...'

කරන්නට වැඩක් තිබිය යුතුය. එවිට හිත රස්තියාදුවේ යනවා අඩුය.





'හිටපං හිටපං ආපු ගමන් උඹට මම වැඩ පටවන්නේ නෑ... දවස් දෙක තුනක් කැරකිලා පරිසරයට හුරු වෙලා මිනිස්සු දන කියාන අපි වැඩට බහිමු... ලස්සන වැඩක් මගේ හිතේ තියෙනවා..'

පොඩි මාමා ලස්සනට සිනාසුනේය.

'අර එළවළු පිටරට යවන වැඩේද..'

'ඔව්... මං උඹට හිමිහිට කියන්නම්.... උඹ කැම්පස් යන්නද හිත හිතා ඉන්නේ...'

'නෑ පොඩි මාමේ... මං ආසයි පොඩි මාමා එක්ක බිස්නස් කරන්න...'

'උඹ එක හිතින් මා එක්ක ඉඳපන්.. මං උඹව ගේන්න පුළුවන් ලොකු තැනට ගේනවා.. මේ තියෙන මගේ දේපොල කාටවත් නෙමේ... උඹටයි නංගිටයි තමා..'

පොඩි මාමා කියන්නේ බොරු නොවේ. ඔහු එවැනි පරිත්‍යාගශීලී මිනිසෙකි. නංගී වැඩිවියට පත් වූ ද ඇගේ උත්සවය කළේ පොඩි මාමාගේ වියදමෙනි. හුදෙකලා ජීවිතයක් ගෙවුවද දයාසම්පන්න පීතෘ ගුණයක් පොඩි මාමා වෙත විය.

'බණ්ඩාරවෙල ලස්සන කෙල්ලෝ ඉන්නවා... හිටපු ගමන් තමයි සදකාලික මල් වගේ පාරට බහින්නේ...'

ඔහු මනමාල පාට සිනාවක්ද සහිතව කීවේය.. දැනටමත් මම එවැනි ලස්සන කෙල්ලන් දෙදෙනෙකු දුටුවෙමි. මා බලද්දී එක කෙල්ලෙකු මා දෙස රවා බැලීය..

'බඩගිනියි නේද පුතා... අපි හිල්ටොප් එකට ගිහිල්ලා කාලම ගෙදර යං...'



www.sinhalaelibrary.com

බණ්ඩාරවෙල පොලිසිය අසළින් වැටුණ පාරේ ගොස් අපි කඳු මුදුනක පිහිටි අලංකාර නිවාඩු නිකේතනයකට ගොඩ වැදුනෙමු. මනාලෙස සකස් කළ ගෙළයනක් මැද පිහිටා තිබූ ඒ අවන්හලට මුළු බණ්ඩාරවෙල නගරයම පෙනෙයි.

'ගොඩාක් රෑ වල මම මේ හෝටලේට ඇවිත් අනනට වෙලා බියර් එකක් බිබී ඉන්නවා...'

මටද එසේ ඉන්නට සිතුණි. මගේ හුදෙකලා සැන්දෑව කෙසේ ගෙවෙයිද... මම නොදනිමි. බණ්ඩාරවෙලට පය තබා තවම පැයක්වත් ගත වූයේ නැත.

www.sinhalaelibrar

# 03

පොඩි මාමාගේ නිවස පිහිටා තිබුනේ බණ්ඩාරවෙල නගරයෙන් මදක් උස් බිමක පිහිටි පොඩි කුඩා කඳු ගැටයකය... ගෙටත් වඩා ලස්සන ඒ ගෙට යනා පාරය... දෙපස වූයේ එතරම් උස් නොවූ අලුත් පයිනස් ගස්ය... අව්ව සැරට බැසයමින් තිබුනෙන් ලා රත් පැහැගත් හිරු එළිය දිගැටි පයිනස් අතු අතරින් ගුරු පාරට වැටී තිබුණි...

මිදුල පුරා විවිධ වර්ග වල රෝස පෝච්චි විය. පුදුමයකට වගේ ඒ පෝච්චි සියල්ලේම තිබූ රෝස ගස් වල මල් පිපී තිබුණි. එතරම් ලස්සන ගෙළයනක් තනිකඩ පොඩි මාමා සකස් කළේ කෙසේද... තනිවූ හිතක් ඒ තරම් සියුම් කටයුත්තකට ගොනුකර ගත හැකිද...



www.sinhalaelibrar

මම වාහනයෙන් බැස ගෙමිදුල පුරාම නෙත් ඇරියෙමි. හැන්දෑවට වන්න ලස්සනය. පැත්තක මල් ගෝවා වගාවකි. මේ තරම් ලස්සන පරිසරයක පොඩි මාමා තනිවූ හිත කෙසේ සන්සුන් කරගෙන උන්නාද...

'මොකක්ද උඹ අහන්න යන්නේ...'

පලුදෙකට වූ ඉදිරිපස දොර විවර කර පොඩි මාමා ඇසුවේය... මම වාහනයේ පසුපස තබා තිබූ මගේ ඇඳුම් බෑගය අතට ගත්තෙමි.

'හැම දෙයක්ම හරි ලස්සනයි... ඒත්...'

'කියපන් කොල්ලෝ...'

'මේ ගෙදර පොඩි නැන්ද කෙනෙක් ඉන්න තිබුණා...'

පොඩි මාමා සිනාසුනේ දුක්බර ලෙසිනි. තනිකඩ පිරිමියෙකුගේ ඇස් වල ඇත්තේ කොතරම් පාළු දුක්බර අසරණ හැඟීමක්ද...

'අපිට ඕන අතු වල මල් පිපෙන්නේ නෑ පුතා... මල් පිපෙන්නේ ගහට ඕන අතු වල... හැම මිනිහෙකුටම දෛවයක් ඉරණමක් කියලා දෙයක් තියෙනවා...'

එසේ නම් මගේ දෛවය කුමක් විය හැකිද... එය දැන්මම දැනගන්නට ඇත්නම්...

සාලය කුඩා එකකි. එහි තිබුනේ කුඩා පුටු සෙට් එකකුත් කෑම මේසයකුත් රූපවාහිනී යන්ත්‍රයකුත් පමණි. ඒ ටිකද පිළිවෙලකට තබා තිබුණි. මම ගේ පුරාම ඇවිද්දෙමි. ජීවිතයේ නපුරු දවස් කිහිපයක් ගත කරන්නට ලැබුණු පොඩි මාමාගේ නිවස ඇත්තටම කුඩා අසපුවක් මෙන් විය...

මම පොඩි මාමා බිත්තියේ ගසා තිබූ සිදුහත් කුමාරයා ගිහිගෙය හැර දමා නික්මෙන අසුපිට යන සිදුවීම දක්වෙන





චිත්‍රය දෙස බලා උන්නෙමි.

'ඔක්කොම දලා එයා යනවා... ලස්සන බිරිඳක්... චූටි හුරතල් පුතෙක්... අනාගත සක්විති රජකම...'

'අපි කොහොමද පොඩි මාමේ එහෙම දලා යන්නේ... අම්මා හැපි හැපී අඩයි... තාත්තා මැරෙයි... නංගිට සිහි නැති වෙයි...'

'ජීවිතය ගැන එච්චරටම කලකිරෙන්න ඕන නෑ පුතා...'

මාමා සල්ලි හම්බ කළේය... ඇත්තටම ඔහු බණ්ඩාරවෙල ඉන්න හොඳම ව්‍යාපාරිකයන් කිහිප දෙනාගෙන් එක්කෙනෙකි. එහෙත් පොඩි මාමා ගත කළේ චාම් ජීවිතයකි.

'මේ පුතාගේ කාමරේ... මං අස් කරලම තිබ්බා...'

එය දුටුවනම මගේ සිත් ගත්තේය. කුඩා සිංගල් ඇඳක් ලස්සන මේසයක් ඇඳුම් අල්මාරියක් පමණක් තිබූ කාමරයේ බිමට දමා තිබුනේ සනීප රෙදි කාපට් එකකි. මම සපත්තු ගලවා ගෙළ බැඳි ටයි පටිය බුරුල් කර නිදහස් හැඟීමෙන් කාමරය තුළට පිවිසුනෙමි.

'මේවා දැක්කානම් කලින්ම මං එනවා... හරි ලස්සනයි පොඩි මාමේ...'

අහිංසක ලෝබකමකින් මගේ සිත පිරුණි.

'මේ කාමරේ හිස් තිබ්බේ ලොකු පුතේ... මං මේ ඇඳයි අල්මාරියයි මේසෙයි අලුතෙන්ම ගත්තේ... මං උඹට හෙට පොඩි කැසට් එකකුත් අරගෙන දෙන්නම් රෑට සිංදු අහන්න...'

ඔහේ පාළුවෙන් මා දුක් විඳිනැයි පොඩි මාමා හිතනවා විය යුතුය. එහෙමම කියා දුකක් තනිකමක් දැන් නැත.

'අපි කන්න යයන්නේ පොඩි මාමේ...'

කුඩා කැබිනෙට්ටු ගසා තිබූ කුස්සියේ තිබුනේ ලිප් දෙකේ ගෑස් උදුනකි. එහෙත් එහි මෑතකදී කිසිවක් ඉඹූ බවක් නොපෙනුණි.

'තනිකඩයෙන් උනාම තනියම ගොඩක් දේවල් කරගන්න පුළුවන්... ඒත් තනියම උයන් කනවා කියන එක ලොකු දෙයක් බං...'

'එතකොට පොඩි මාමා කෑවේ...'

ඔහු සිනාසුනේ අහිංසක ලෙසිනි.

'ජයදේව අන්කල්...'

හදිසියේම යුවතියක් පොඩි මාමාගේ නම කියනු දොරකඩින් ඇසුණි. මම පුදුම වී පොඩි මාමා දෙස බැලුවෙමි.

'කවුද පොඩි මාමේ...'

'වරෙන් යන්න ඉස්සරහට...'

පොඩි මාමා සාලයට ගියේ මගේ කරට අතකුත් දමාගෙනය... දොරකඩ ලා රෝස පැහැයට හුරු ගවුමක් ඇඳගත් අහිංසක පෙනුමැති යුවතියක් විය... ඇයත් නංගිගේ වයසේ වෙන්නට ඇත...

මම ඇය දෙස බලද්දී ඇය ලැජ්ජාවෙන් සිනාසී බිම බලාගත්තාය... පොඩි මාමා මගේ කරවද අත දමාගෙන ඇය අසළටම ගියේය. බාටා සෙරෙප්පු දෙකක් දමාගෙන සාමාන්‍ය ගවුමකින් සැරසී උන්නද ඇය වෙත තිබූ චාම් ලස්සන ඉන් මැකීගොස් තිබුනේ නැත.

'ජයදේව අන්කල් අද වේලාසන ඇවිත්... මං මේ වාහනේ දකලා ආවේ...'

මා දෙසද බලා යුවතිය කීවාය... මේ පොඩි මාමා හොඳින් දන්නා අඳුනන යුවතියක් විය යුතුය...





'අද මගේ පොඩි කොල්ලා මං ළඟට ආවනේ කෙල්ලේ... ඒ නිසා වේලාසනම ආවා... ලොකු පුතා... ඔයා ඇහුවනේ පොඩි මාමා කෑවේ කොහොමද බිව්වේ කොහොමද කියලා... මේ කෙල්ල තමයි මට කෑම එක හදන් එන්නේ... අසනීප උනාම මට කොත්තමල්ලි ටික රත්කරගෙන එන්නේ... මේ ඉන්නේ බණ්ඩාරවෙල ඉන්න හොඳම කෙල්ල... කවදහරි මං තමා මේ කෙල්ලව කසාදත් බන්දවලා දෙන්නේ...'

යුවතියගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය... ඇගේ අහිංසකකම ඒ මුහුණේ පමණක් නොව සිතහවේද ඇත.

'මේ දුවේ මගේ අයියගේ පුතා... සංදේශ්... අද ඉඳලා මා එක්ක මෙහෙ ඉන්නවා... අයියටත් එක්ක අද ඉඳලා කෑම හදන්න පුළුවන් නේද...'

යුවතිය හිස වැනුවාය.. ඇය වැඩිපුර කතා නොකරන්නේ මා ඉන්නා නිසා විය යුතුය... මංද ඇට්ටර කොළඹ කොල්ලෙක් යැයි ඇය හිතනවා විය යුතුය...

'අද ඉඳලා මං ආස දේවල් තෙමේ... මෙයා ආස දෙයක් හදලා දෙන්න ඕන...'

'රහවෙයිද දන්නෑ...'

බලාපොරොත්තු බිඳී ගිය අසරණ හඬකින් ඇය කීවාය.

'ඔයා හදන්නකෝ... ඊට පස්සේ මං තෙමේ කෑම වර්ණනා කරන්නේ...'

ඇය උන්නේ මගේ ආගන්තුක ඇස් ඉදිරිපිට අසරණවය... සිංදුවක් කියන්නට පාසල් සාහිත්‍ය සංගමේ වේදිකාවට නැගී යුවතියක් මෙන් ඇය තෝන්තු වී උන්නාය.

'මං තේ හදන් එන්නද...'

'පුතා මොනවද බොන්නේ.. තේද කෝපිද...'

'කිරි කෝපි...'

මම එක්වර කීවෙමි. ඇයට එකවර සිනාගියේය. යුවතිය අතින් කට වසාගෙන අප දෙදෙනා අතරින් කුස්සියට ගියාය...

'ඇයි එයා හිනාවෙන්නේ.. ඇයි මාමා කිරි කෝපි බොන්නැද්ද...'

'කෙල්ලෝ ඔහ දේටයි එපා දේටයි ඔක්කොටම හිනාවෙනවා බං...'

ඇය පීරිසි කෝප්ප දෙකක්ද රැගෙන යළිත් යාලයට ආවාය... මම ඇය දෙස මෘදුව රවා බැලුවෙමි... කෙල්ල බිය වූවාය...

'අන්කල්... මේ අයියටත් සීනි අඩුවෙන්ද දන්නේ... නැත්නම් මං සීනි වෙනම ගේන්නද...'

පොඩි මාමා සිනාසුනේය.

'මට දියවැඩියාව නෑ...'

මම හිනාවකින් තොරව කීවෙමි.

'ඔයා තේ දෙකම රසට හදන් එන්න පුතේ...'

කෙල්ල දිව ගියේ පස්සත් උඩ දගෙනය. පියගැටපෙළ බැසයද්දී ඇගේ දෙපා පවා මම දුටුවෙමි.

'පව් ලොකු පුතේ... අහිංසක කෙල්ලෙක්... අම්මා තාත්තා නෑ... ආච්චි ගාව ඉන්නේ... හිනාවෙලා උන්නට කෙල්ල දහ දුක් විදිනවා... හොඳ තැනක ඉපදුනා නම් පොඩි සුරංගනාවියක් වගේ ජීවත් වෙයි... මේ කෙල්ලගේ දෛවය ගැන හිතද්දී උඹෙයි මගෙයි දෛවය අපිට මොනවද පුතේ දීපු දුක්...'





ඇයට මොහොතකටවත් පාට් එක දම්මේ අපරාදේ යැයි මට සිතුණි. දුප්පත්කමත් අසරණකමත් කපාගෙන ආ අහිංසක බවක් ඒ ඇස් වල විය... ඇය ගෙනාපු කිරි කෝපි එක බීමේ අලුත් ආශාවකින් මම මඟ බලා උන්නෙමි...

කෙල්ල දිව ගියේ පස්සත් උඩ දගෙනය. පියගැටපෙළ බැසයද්දී ඇගේ දෙපා පවා මම දුටුවෙමි.

'පව් ලොකු පුතේ... අහිංසක කෙල්ලෙක්... අම්මා තාත්තා නෑ... ආච්චි ගාව ඉන්නේ... හිනාවෙලා උන්නට කෙල්ල දහ දුක් විදිනවා... හොඳ තැනක ඉපදුනා නම් පොඩි සුරංගනාවියක් වගේ ජීවත් වෙයි... මේ කෙල්ලගේ දෛවය ගැන හිතද්දී උඹෙයි මගෙයි දෛවය අපිට මොනවද පුතේ දීපු දුක්...'

ඇයට මොහොතකටවත් පාට් එක දම්මේ අපරාදේ යැයි මට සිතුණි. දුප්පත්කමත් අසරණකමත් කපාගෙන ආ අහිංසක බවක් ඒ ඇස් වල විය... ඇය ගෙනෙන කිරි කෝපි එක බීමේ අලුත් ආශාවකින් මම මඟ බලා උන්නෙමි...

නාගන්නට ආසය. බණ්ඩාරවෙල වතුර හීතල වුවද ඒ වතුර ගත පුරා නහවා ගැනීමේ ආශාවකින් මම උන්නෙමි. නාගෙන අලුත් සරමක් දමාගෙන මා වෙනුවෙන් පොඩි මාමා වෙන්කර දුන් "කාමරයේ මොහොතක් තනිවෙන්නට ආසය... වත්ත වටා රවුමක් ගසා අලුත් පරිසරය සමඟ යාළු වෙන්නට හිත ආසය...

සියල්ලටම වඩා බණ්ඩාරවෙලදී දුටු ලස්සනම කෙල්ල මගේ විරහී පසුව මොහොතකට අවුල් කර තිබුණි. ශහීනා නිසා විදි කටුක වේදනාවෙන් පසු යුවතියක් දෙස නොබලාම ඉන්නට මම සිතා ගත්තෙමි... එහෙත් ඒ වෘත්‍රය මේ බණ්ඩාරවෙල පොඩි කෙල්ල ඉදිරිපිට කඩන්නට මට සිදු විය...

කමීසයත් කලිසමත් ගලවා මම සරමක් දමා ගත්තෙමි.



www.sinhalaelibrary.com

කමිසයකට සම්ප වූ සුදු වෙස්ටි එක නොගලවාම මම තත්පරයකට ඇඳේ ඇල වුණෙමි. පරිසරය සීතල වුව වෙල්වට් ඇඳ රෙදි දමූ ඇඳ උණුසුම්ය. පාළු හිතකට ජීවිතයේ දුක සතුට හුදෙකලාව රහසේම විඳින්නට මේ අඩි තුනයි හයේ සිංගල් ඇඳ හොඳටම ඇතිය.

අම්මාව... නංගීව... තාත්තාව සිහිවී හදවත මොහොතකට අවුල් විය... තව ටිකකින් තාත්තාට කතා කළ යුතුය... ඉක්මනින්ම කුරුළු කැලේ ගෙදරට දුරකතන ඇමතුමක් ගත යුතුය.

ශහීනා හදිස්සියේම ජීවිතයට කඩා පාත් වූ මේඝයක් වැනිය. මොනවාද මොනවාද ජීවිතයට වූ බව පමණක් අද මට මතකය... හැමෝගේම ඇස් වල කඳුළු පිරුනාද මතකය...

ආදරය ජීවිතයකට වැඩියේ වැරදි නැකතකිනි. කුරුළු කැලේ ගෙවී ගිය රාත්‍රිය සිහිවෙද්දී දැනුද හදවතට මහා ලැජ්ජාවක් දනෙයි... රාත්‍රී අහසේ මොහොතකට පායා නිවී ගිය තරුවක් වෙනුවෙන් මම ඇඬුවෙමි... ගෙවී ගියේ ජීවිතයේ නපුරු දවස් කිහිපයක් වන්නට ඇත.

# 04

"ජයදේව අන්කල්..."

යුවතියකගේ හඬින් මම ගැස්සී ඇහැරුනෙමි. ඇයට ඇත්තේ කුරුළු පැටියෙකුගේ වැනි මෘදු හඬකි... මම දෙර රෙද්ද මෑත් කළෙමි. ඇය ඉමේසය මත පීරිසි කෝප්ප දෙකක් වෙනුවට තේ පෝච්චියකුත් රවුම් වන්නට කපාපු චොකලට් කේක් එකකුත් තබා තිබුණාය. මම වෙස්ට් එක පිටින්ම කුඩා රවුම් කෑම මේසය අද්දරට ගියෙමි.

යුවතිය හිස ඔසවා බලා සිනාසුනාය. ඇගේ දෙකොල් තුනීය... ඒනිසා සිනහව ඕනාවටත් වඩා දෙපසට ඇදී යයි. හිනාව ලස්සන ඒ නිසාය...

'කිරි වලට නම් ලක්ස්ප්‍රේ තියෙන්නේ... එළකිරි හම්බ වෙන්නේ උදේට තමා...'

මට ඕනා එළකිරක් නැත.

'කිරි හම්බ වෙන්නේ මේ වටේ එළදෙන්නු ගෙන්මද...'

මම මගේ වගක් නොමැතිව ඇසුවෙමි. සුවතියට ඉබේටම සිනා ආවාය. ඇය කොල්පට මුව තුළට ගෙන සිනහව සඟවා ගත්තාය.

'ම්... එක් කෙනෙක් දෙන්නෙක් ඉන්නවා...'

කෝලි කුට්ටු කෙහෙල් ඇවරියත්, චොකලට් රෝල් දිසියත් මා දෙසට ළංකර ඇය කීවාය. තවමත් කෙල්ලගේ නම නොදනිම ප්‍රශ්නයකි. කොළඹ ඌෂ්ණය තවමත් හිතේ තිබුනත් සුවතිය ඉදිරිපිට ඕනාවට වඩා නිහතමානී වන්නවද හිත නොතැමේ...

'කන්න... මහත්තයා එනවා කියලා ජයදේව අන්කල් කිව්වේ නෑ... කිව්වා නම් මොනාහරි හදලා තියනවා...'

මගේ පපුව උණු විය... කන්නට කටට ගත් කේක් කැබැල්ල පවා මගේ උගුරේ හිරවිය. අසරණ කෙල්ල මට මහත්තයා කියන්නේ ඇයි... මට මහා දුකක් දැනිණ.

'මං හදිස්සියේ ආවේ...'

මම මෘදුව කීවෙමි.

සුවතිය මගේ කෝප්පයට කිරි කෝපි වත් කළාය. ඒ සුවඳ අපූරුය... කිරි සමඟ මුසු වූ අලුත් කෝපි සුවඳින් කෑම කාමරය පිරී ගියේය. එහෙත් කිරි කෝපි සුවඳට වත් ඇය වෙතින් හමා එන මෘදු යෞවන සුවඳ මකාලන්නට බැරි විය...

'තව චොකලට් කේක් කෑල්ලක් කන්න... ජයදේව අන්කල් කේක් කන්නෑ...'





මම සිනාසී තවත් කේක් කෑල්ලක් ගත්තෙමි. මා පෙරේත කොල්ලෙකු යැයි ඇය සිතනවා විය යුතුය... එහෙම සිතනා එක හොඳය...

'කාමරේ අස් කරලා තියෙනවා හොඳ මදි නම් මං ආයෙත් අස් කරලා දෙන්නම්... ජයදේව අන්කල් මහත්තයා රෑට එනවා කියලා කිව්වේ නෑ...'

මේ පිස්සු කෙල්ලගේ මහත්තයා කතාව මට වදයකි...

'වාස් ටික මං අහක් කරලා තිබ්බේ... උදේට අලුත් මල් කපලා දන්නම්...'

'මොනා... මල්ද...'

'මෙහේ හරියට මල් වර්ග තියෙනවා ජර්බරාස් ලිලී රෝස වගේ... පල්ලෙහා යායට තියෙනවා...'

මම ප්‍රථම වරට ඇය දෙස එක දිගට බලා උන්නෙමි. සුවතියගේ ගෙළ සැරසූ නූලක් තරම් සිහින් රන් වෙන් පටක් විය. දෙකණේ පෙති වල වූයේ කුඩා ගම්මිරිස් ඇට තරම් වූ රන් කරාබු ජෝඩුවකි... දුප්පත් කමට සුවතියගේ වූ පුදුමාකාර ලස්සන මකා ලන්නට නොහැකි වී ඇත.

මගේ ඇස් හා ගැටී ඇය ලැජ්ජාවෙන් නෙත් බිමට බර කර ගත්තය... මහ අවලම් කොළඹ කොල්ලෙක් වන්නට ඇතැයි ඇය හිතනවා විය යුතුය.

'ගෙවල් කොහේද තියෙන්නේ...'

මමද නොසන්සුන්ව ඇසුවෙමි. මනමාල කමක් වූව පිළිවෙලට කරන්නට සංදේශ් දන්නේ නැත.

'මේ ළඟ... පහළ... ජයදේව අන්කල්ගේ ගාඩ්න් එක ඉවර වෙන්නේ අපේ පොඩි ගෙදරින්... මහත්තයාගේ කාමරේ ජනෙල්

ඇරියාම අපේ පොඩි සාලේ පේනවා...’

තව එක්වරක් මහත්තයා කිව්වොත් මේ කෙල්ල මගෙන් ගුටි කනවා. ඇය සෝදගත් පොඩි මාමා තුණු බැණුම් අසනු ඇත. ඇඟ සෝදගත් පොඩි මාමා සරමකින් සැරසී අවයක් කරේ දමාගෙන පැමිණ කෑම මේසයේ වාඩි විය.

‘මගේ කොල්ලා මොනවද කෙල්ලේ කියන්නේ...’

කෙසෙල් ගෙඩිය ලෙලි අරිමින් මාමා ඇසුවේය. ඔහුගේ කරේ වූ රන් චේන් පට පපුව මැද දිලිසෙන්නට විය.

ඇය සිනාසුනා පමණි.

‘ඔයත් කේක් කෑල්ලක් කන්න පුතේ...’

පොඩි මාමා ඇය අසළ වූ කේක් ප්ලේට් එක ළං කළේය.

‘මං පස්සේ කන්නම්...’

‘දුවේ... අපේ කොල්ලට ටිකක් මේ වත්ත පිටියත් පෙන්නන්න... මං යනවා පොඩ්ඩක් ටවුමට... අද හාල් ස්ටොක් එකක් එවනවා කොළඹින්... ඒක බලාගන්න ඕන... පුතාට මොනවා හරි ටවුමෙන් ගේන්න ඕනෙද...’

‘පස්සේ බලලා ගන්නම් පොඩි මාමේ...’

‘එහෙනම් පුතේ මේ කෙල්ලට ආස දෙයක් කියලා රෑට හදවගන්න... අපි රෑට කතා කරමු... ඔයා ටිකක් රිලැක්ස් එකේ ඉන්න...’

පොඩි මාමා ඇගේ හිසද අතගා කිරි කෝපි කෝප්පයද රැගෙන කාමරයෙන් ගියේය... මම නිහඬවම කෝපි එක තොල ගෑවෙමි.

‘මං යනවා පුතේ...’

පොඩි මාමා ගියේය. කෑම කාමරයේ තනිවූයේ ඇයත්





මාත්ය...

‘ඇයි ඔයා කෝපි බොන්නෑ...’

‘මං ආච්චි එක්ක බොන්නම්... රෑට මොනවද දන්නෑ ආස...’

මං පුටුව මෑත්කර නැගිට්ටෙමි. යුවතිය හිස් අඩු කෝප්ප ගෙන එකට අල්ලා සෝද යලි ට්‍රේ එක මත තැබුවාය... යුවතියක් සමඟ තනිපංගලමේ කාමරයක සිටීම හොඳ නැති නිසාම මම සාලයට ආවෙමි... ටිකකින් ඇයද සාලයට ආවාය...

‘කිව්වනම් දන්මම හදන්න පටන් ගන්න පුළුවන්...’

දුප්පත් කෙල්ල උවවස්සට බර වී ඇසුවාය. මගේ හිතට සියුම් වේදනාවක් දනෙමින් තිබුණි. ඇය වැනි යුවතියකගෙන් උයාගෙන කා හැකිද...

‘මට පොල්සම්බෝලයි බතුයි තිබ්බත් ඇති... කැමති දෙයක් බලලා හදන්න...’

‘මස් කනවද...’

මම හැරී බැලුවෙමි.

‘ඔව්... ඒත් ඊට වඩා කරෝල වලට ආසයි...’

‘ජයදේව අත්කලුත් එහෙම තමා... මං එහෙනම් යන්නද... උයන්න ලෑස්ති කරලා එන්නම්...’

කෙල්ල යනවානම් යා යුත්තේ මං පිටදී උන් දොරකඩ හරහාය. ඇය මෘදු ගමනින් පැමිණ දොරකඩ එල්ලී හිස එසෙව්වාය...

‘තව ටිකක් හැන්ද වෙලාම වත්තේ ඇවිදින්න යන්... එතකොට තමා ලස්සන... මහත්තයා ස්වීටර් ගෙනාවද...’

මම දැඩි අපහසුකමකින් හිස වැනුවෙමි. ඇය 'යන්නම්' කියාගෙන මා අද්දරින් මාරු වූවාය... මම ප්‍රථම වරට ඇයව ළඟට දැක ගත්තෙමි.

'නම මොකක්ද...'

මම දුබල හඬකින් ඇසුවෙමි. යුවතිය පහළ පඩියේදී හැරුනාය... කෙල්ල පැත්තටත් ලස්සනාය...

'චන්දනා...'

උත්තරය කටේ තබාගෙන උන්නාක් මෙන් ඇය ගත් කටටම කීවාය. ඒනම නම් ගැළපෙන්නේ ඇයටමය.

'මං යන්නම්...'

යළිත් ඇය හැරුනාය.

'මේ...'

මම චන්දනාව නැවැත්වූයෙමි.

'මට මහත්තයා කියන්නෙපා... තේරුණාද...'

මම බොරුවට සැර කළෙමි. යුවතිය සිනාසුනා මිසක් කිසිවක් කීවේ නැත.

'ඇඟ හෝදනවනම් ඇල් වතුරෙන් ඇඟ හෝදන්න එපා... ටැප් එකේ උණු වතුරත් එනවා... එකපාර ඇරලා ෂවර් එකයට ඉන්නත් එපා... එතකොට පිච්චෙනවා... බාත් එකට උණු වතුරයි හීතල වතුරයි කලවම් කරගන්න ඕන...'

එසේ ඇයටම කියා රත්කරගත යුතුය. මම මට පිටුපා යන යුවතියකගේ නැළවෙන උකුල දෙස බලා උන්නෙමි...

බණ්ඩාරවෙල කුරුළු කැලේට වඩා ගොඩක් හොඳ දැයි මම දෙරකඩටම වාඩි වී සිතුවෙමි...

# 05

පුංචි බාත් ටබ් එකේ තුනීරස්නයක් තිබූ උණු වතුරේ බැස නාද්දී එහෙමට කියා හීතලක් තිබුනේ නැත. මම අමු හෙළු බැල්ලෙන් බාත් ටබ් එකට බැස පොඩි එකෙකු මෙන් සබන් පෙණ මතු කර ගත්තෙමි. විකකින් සබන් පෙණ ගොඩකින් මාව වැසී ගියේය...

මේ ඉන්නේ සැබෑ සංදේශ්ය... තනිවී හුදෙකලාවී ඌටම හිතෙනා දෙයක් කරනා මේ සංදේශ් ආදරයෙන් පිස්සු වැටී උන් සංදේශ්ට වඩා ලස්සනය.. මම පොඩි මාමාගේ හෙඩ් ඇන්ඩ් ෂෝල්ඩර් ෂැම්පු බෝතලයෙන් බාගයක්ම හිස ගල්වා නැවෙමි... මොහොතකින් මුළු නාන කාමරයම ෂැම්පු පෙණ වලින් පිරී ගියේය...



www.sinhalaelibrary

තෙත වතට තුවාය දවටා ගෙන පැයකට පමණ පසු මම කාමරයට ආවෙමි... බණ්ඩාරවෙල සීතල කොතරම්ද කියා තේරුනේ එවිටය.. මාව ශීතකරණයක දමූවාක් මෙන් වෙව්ලන්නට විය...

මේ සීතලට සරම හරියන්නේ නැත. මම වහාම කලිසමත් අත් දිග ටී ෂර්ට් එකත් ඇඳගත්තෙමි.. එහෙත් සීතලේ නම් අඩුවක් වූයේ නැත. පැයක් වතුරේ බැස නෑව නිසාදෝ ඇඟේ වෙනදාට රස්නයට තිබෙනා තැන් පවා අද අයිස් බෝල මෙනි...

දුරකතනය එක දිගටම නාදවිය... මම වෙව්ලමින් ගොස් රිසීවරය අතට ගත්තෙමි. කතා කළේ නංගීය.

'අ..යියේ..'

'මා..ව වෙව්ලනවා බබා..'

'අනේ පව්... එච්චරටම සීතලද...'

'මං ආ..වු ගමන් නාන්න ගියා නංගී..'

'සීත පළාත් වල ගිහිල්ලා හවසට නාන්න හොඳ නෑ.. කරදරයක් නැතුව ආව නේද..'

'කිසි කරදරයක් නෑ...'

නංගී නිහඬවූවාය.

'නංගී...'

'බණ්ඩාරවෙල හොඳයි...'

'ඔව්... ගොඩාක් හොඳයි...'

'අපිට නම් පාළුයි... පන්සලේ බෝධිය නැති උනා වගේ..'

නංගී සිටියේ ඇඹුම්බරවය... මේ ආවේ ඔවුන්ව තනිකර බව මට සිහිවූයේ එවිටය.. දෛවය මාව බණ්ඩාරවෙලට





ගෙන ආවා මිසක මා ආවේ නැත. දෛවය මට කුරුළු කැලේ ඉන්නට දුන්නේ නැත.

'අයියාගේ මෝඩ නංගියේ කඳුළු ගැන හිතන්නෙපා.. පුළුවන් තරම් හිත නිස්කලංක කරගෙන බණ්ඩාරවෙල ඉන්න...'

'මට මෙහේ හොඳයි නංගී...'

'කවදාවත් කුරුළු කැලේට එන්නැද්ද...'

'එනවා.. එහේ ඉන්නකොට හිතට හරි කරදරයි.. මෙහෙදි මොනවත් මතක් වෙන්නෑ... මං ආසයි එහෙම ජීවත් වෙන්න..'

'කොහේ හිටියත් ඔයාට නම් හොඳක්ම වෙන්න ඕන.. දැන් මොනවද කරන්නේ...'

'පොඩි මාමගේ ගේ තියෙන්නේ පොඩි කන්දක... පොඩ්ඩක් මිදුලේ කැරකිලා බලන්න හිතුවේ...'

'තනියම තාම කොහෙවත් යන්නෙපා..'

'නෑ තනියම නෙමේ යන්නේ..'

'පොඩි මාමා එක්කද...'

'නෑ.. කෙල්ලෙක් එක්ක..'

මම කටට ආ දේ කීවෙමි. නංගී මා කී දේ විහිළුවට ගන්නට ඇත.

'අනේ හොඳයි.. වැරදිලාවත් බණ්ඩාරවෙලදී දෙමළ කෙල්ලෙක් හොයා ගන්නෙපා.. අන්තිමට දෙවන ප්‍රේමයත් ජාතිවාදයටම යට වෙයි...

'සිංහල කෙල්ලෝ ඔක්කොටම වඩා හොඳයි..'

'අම්මා හෙට කතා කරයි.. උදේ වරුවේ ගෙදර ඉන්න...'

දුරකතනය තබා මම මිදුලට බැස්සෙමි. කෝපි එකක්



www.sinhalaelibrary.com

ඔන මේ වෙලාවටය.. කඳු දෙසින් හමා එන අනී සුළඟේ පවා ඇත්තේ ගත හී ගඩු පුබුදුවන කටුක සිසිලකි... සීතල උහුලා ගත නොහැකිව මම මිදුලේ පිස්සෙකු සේ ව්‍යායාම කරන්නට ගත්තෙමි..

චන්දනාගේ මුහුණ මිදුලේ දකුණු කෙළවරින් මිදුලට එබුනේ මම එකතැන දුවමින් දෑත් දෙපසට විහිදුවමින් සිටිද්දීය... හැන්දෑ ඉරමලේ තුනී ආලෝකය වැටුණු ඇගේ මුහුණ දවල් දුටුවාටත් වඩා ලස්සනය.

ඇය ළඟට එන්නට පුථම ඇය ගැල්වූ පුයර සුවඳ මා කරා ආවේය... මම අත් දෙක කිහිල්ල යට තද කරගෙන හති ඇරියෙමි.

'එකපාර නැවේ ඇයි... ඒකයි හීතල... මය කොණ්ඩෙත් තවම තෙතයි...'

ඇය තිවේ අක්කා කෙනෙක් මෙනි. මම තෙත කොණ්ඩය ලැජ්ජාවෙන් පිස දැමුවෙමි.

'ජයදේව අන්කල්ගේ ස්විටරයවත් ඇඳගන්න... තව ටිකකින් හීතල තවත් වැඩි වෙනවා. ඉන්න මං ගෙනල්ලා දෙන්නම්...'

මා මිදුලේ තබා චන්දනා ගෙතුළට ගියාය. නිවසේ විදුලි පහන් පවා දල්වූයේ ඇය විසිනි. ගෙදරකට ගැහැණු අතක් තිබිය යුතුය... පිරිමි දහසකගෙන් නොලැබෙන සිරියාවක් ලස්සනක් ගැහැණු අතකින් ගෙයකට ලැබෙයි.

'ආ.. ඔහොම විනාඩි පහක් ඉන්න පුළුවන් නම් මං කෝපි එකක් හදලා ගේන්නම්..'

'මාත් එන්නද...'

'අ..පේ ගෙ..ද..ර..'





'ශ..චි..'

යුවතිය සිනාසී හැරුණා මිසක කතා කළේ නැත. ඇය පියගැට පෙළ බැසගෙන ගොස් පහතම පඩියේ හැරී බැලුවාය.

'මං ආච්චිටත් කිව්වා ජයදේව අන්කල්ගේ පුතා ඇවිත් කියලා... ආච්චිටත් ආසලු බලන්න...'

මේ පිස්සාගේ මොනවා බලන්නද... මම ස්විටරය ඔහේ වත පටලවාගෙන ඇය පිටුපස වැටුනෙමි.

'අ..ම්..මේ..'

ගහක පහළ අත්තක් පහළට නැමී තිබෙනු නොමිමත් අඳුරේදී මම නොදුටුවෙමි. එය කෙළින්ම අහක බලාගෙන ගිය මගේ නළලට වැටුණි. මාව එහෙම කළු ගල් පඩියට වැටුණි.

'අ..නේ ටිකක් පාත් වෙලා එන්න කියන්න මට අමතක උනා...'

නළලත දෑතින්ම බදගෙන බිම වාඩිවූ මගේ මුහුණට එබී ඇය කීවාය..

'කෝ... බලන්න. ලේත් එනවද...'

මෘදු ඇඟිලි තුඩු වලින් මගේ අත නළලෙහින් මුදා ඇය පාත් වූවාය... යුවතියගේ ඇස් හරියටම තිබුනේ මගේ නළල ගාවමය...

'මගේ වැරැද්ද... මට මේ ටික ඇති.. මට වඩා උස කෙනෙක් ගිය ගමන් ඔළුව වදිනවා.. අනේ.. ම..ට සමා..වෙ..න්..න...'

ලොකුවට පෙන්වූවද එහෙම අමාරුවක් හිසට නොදැනිණ. අත්ත තද අරටුවක් ඇති ගසක අත්තක් නොවේ...

'හුට්ටක් ලේ..ත් එනවා... දන්මම නළලේ තැව්වේ නැත්නම් හොඳ නෑ... මං කෝපියි උණුවතුරයි අරගෙන එන්නම්... යන්න ගෙදරට...'

'කමක් නෑ.. යන් ඔයාගේ ගෙදරටම ගිහින් තවා ගමු..'

මම නළලත අත තබාගෙන අත්ත යටින් පාත් වී පහළට බැස්සෙමි. චන්දනා මට අඩියක් පමණ ඉදිරියෙන් පස්ස හැරී හැරී පොඩි දරුවෙකු ගැන බලන්නාක් මෙන් මා දෙස බලමින් ඉදිරියට ගියාය...

'අද ආවට මේ දූප්පත් පැළට ආයේ එන්නෙපා... ඔය අද මළව හප්පලා කිව්වේ ඔය ගමන යන්නෙපා කියලා..'

පුංචි නිවස ඉදිරිපිට මිදුලට එද්දී චන්දනා හැරී මෑදු හඬින් කීවාය.. මම ඇගේ කතාව ගණනකට නොගෙන තවමත් කපරාරු නොකළ ඒ කුඩා නිවස දෙස බලා උන්නෙමි.

'ඇවිත් ඉඳගන්න... මං උණු වතුර ටිකක් ටක් ගාලා අරගෙන එන්නම්...'

ඒ සාලය අපේ කාමරය තරම්ය.. බිමට ක්‍රමවත්ව රතු ගඩොල් ලයිසන් කර තිබුණද සිමෙන්ති දමා තිබුණේ නැත... සාලයේ වූයේ කුඩා වේවැල් පුටු හතරකුත් අඹලැලි මේසයකුත් පමණි... චිමිනි ලාම්පුව දල්වෙමින් තිබුනේ ඒ මතය...

කපරාරු නොකළ ගඩොල් බිත්තියේ මැද ඇගේ අහිංසක මුහුණය. චිමිනි ලාම්පුවේ දුප්පත් එළිය ඒ කුඩා ඡායාරූපයට වැටී ජීවිතය පිළිබඳ නිසංසල දර්ශනයක් මට පෙන්වීය.

විනාඩියකට දහ පාරක් හිනාවෙන මේ අහිංසක යුවතිය ඒ හිනාවෙන්නේ ඇගේ ජීවිතයේ ඇති කොතරම් නම් දුකක් සඟවාගෙනද... කුරුළු කැලේ උඩ තට්ටුවේ කාමරේ තනිවී ඉකිබිඳ බිඳ හැඬූ මා ගැන මටම ලැජ්ජා සිතුණි... ඒ කඳුළු





මොන තරම් බොළඳ කඳුළුද... අවනතවානම් මේ කෙල්ල මේ වසාගත් දුප්පත්කම වෙනුවෙන් ඇඬිය යුතුය.. අම්මා තාත්තා නොමැතිව ජීවිතය කෙළවරේ ඉන්නා ආච්චිත් සමඟ අනාගතයක් ගැන නොදන ජීවත්වෙන මේ කෙල්ල කෑ ගසා ඇඬිය යුතුය. නැත. ඇය ජීවිතයේ දුක මැද සිනාසෙන්නීය. පිදුරුතලාගල තරම් දුකක් මෑදු ගෝසා පවුඩර් තට්ටුවකින් වසාගෙන ඇය ජීවිතයට සිනාසෙන්නීය.

මගේ නළලත දැන් රිදෙන්නේ නැත. එහෙත් මේ දුප්පත් පැලට ගොඩ වූ මොහොතේ සිට මගේ පපුව පැත්තක් රිදෙයි.

'මේ මගේ ආච්චී...'

මම පුටුවෙන් නැඟිට ඇය දෙස බැලුවෙමි. මා බලාපොරොත්තු වූයේ කුදු ගැසී ගිය වියපත් කාන්තාවකි... එහෙත් ඇගේ ආච්චි ඒ තරම්ම දුබල වී නැත. ඇය මේ අපූරු මිණිපිරිය සමඟ හුදෙකලා ජීවිතය සමඟ තනිවම සටන් කරනා අපූරු මිත්තනියකි.

'පොඩි දූව මහත්තයා ගැන ඇවිත් කිව්වා... ජයදේව මහත්තයටත් දූත් ඉතින් පාළු නැතිවෙයි...'

'ආච්චි... මේ බලන්න මහත්තයාගේ නළල... එද්දී අර දෙවැටේ වැලි ආත්තා ගහේ අත්තක වැදුනා...'

ආච්චි ඇගේ වියපත් සුරත මගේ නළලත මත තැබුවාය. මේ තරම් සීතලක් ඇති සවසකත් ඇගේ අත උණුසුම්ය.

'උණු වතුර ටිකකින් තැව්වනම් හරි... අද ආවට මහත්තයා ආයේ මේ පැත්තේ එන්නෙපා.... පොඩි දූව නිතර එනවනේ..'

මම බිම බලාගත්තෙමි. පිරිමියෙකු නැති නිවසකට ඒම වරදක් යැයි මට ප්‍රථම වරට සිතුණි.



www.sinhalaelibrary.com

'තවත්නොහ නෑ... මං යන්නම්..'

වේවැල් පුටුවෙන් නැගිට මම කීවෙමි.

'වරදවලා හිතන්නෙපා... මහත්තයා හිතන්නැති තරම් අපි දුප්පත්... මෙහෙමවත් ජීවත් වෙන්නේ ජයදේව මහත්තයාට පින්සිද්ධ වෙන්න...'

ආච්චි දෑත් පිසදමමින් ගෙතුළට ගියාය... කුස්සියේ බැදෙන කරවල සුවඳක් මගේ කටට කෙළ නැංවීය.

'අවුරුදු ගාණකට පස්සේ අපේ ගෙදරට අමුත්තෙක් ආවේ... තරහ නැත්නම් ඉඳලා කෝපි එකක් බීලම යන්න...'

අඬන්නට ආසන්න වූ යුවතියගේ දෙනුවන් මාව නිහැඬින් වේවැල් පුටුවට බර කරවීය...

'මට බයයි.. මෙහෙත් ටිකක් තවාගම්...'

මෘදු උණුසුමැති කපු රෙදි කැබැල්ලෙන් ඇය මගේ නළලත සෙක මත්තු කළාය.. වසාගෙන උන් දෙනෙත් මම මොහොතකට ඇරියෙමි. ඇගේ නුවන් සිබුනේ මගේ මුහුණෙහිමය. විමිනි ලාම්පුවේ දුප්පත් එළියෙන් මම ඇයට වඩාත් ළඟට දක ගත්තෙමි.

දුප්පත් කමත් අහිංසක ලස්සනකැයි මට සිතුණි.. මේ මුහුණ පුරා නිර්මල සඳ එළියක්සේ පැවති ඇත්තේ ඒ දුප්පත් කමේ අහිංසක ඡායාවය...

'දෑත්.. රිදෙන්නෑ...'

'රිදෙන්නෑ තමයි... අත්තා ගහේ අතු එච්චර සද නෑ...'

චන්ද්‍රා සිනාසී කීවාය. මම ලැජ්ජාවෙන් බිම බලා ගත්තෙමි. මම බොරුවට ඇයට කියා නළලත තවා ගත්තේ ඇයි...





'මේ ගෙදර ඉන්නේ ආච්චියි ඔයයි විතරමද...'

ඇය 'ඔව්' කියන්නට මෙන් හිස වැනුවාය. විමිනි ලාම්පුවේ එළිය අඩු වී ගියෙන් චන්ද්‍රා එහි දල්ල වැඩි කළාය. ලයිට් එළියෙන් නොපිබිදුණු අහිංසක සුන්දරත්වයක් විමිනි ලාම්පුවේ දුප්පත් කහ ආලෝකයේ ඇතැයි මට සිතුණි.

'ආච්චිට මං ඉන්නවා මට ආච්චි ඉන්නවා...'

'ජීවත් වෙන්න මේ ලැබෙන ටික ඇතිද...'

'ඇති.. අපි දෙන්නට හාල් හුණ්ඩුවක් තියා ගන්නනම් හොඳටම ඇති... ආච්චියි මමයි වත්තේ එළවළු ටිකකුත් දාලා තියෙනවා... මාසෙකට සැරයක් එළවළු ටිකකුත් එකතු කරලා ඩවුමේ පොළ කඩේට දෙනවා...'

ඇගේ ජීවිතයම මේ තරම් අවංක ලෙස මට කියන්නට ඇය සිතුවේ ඇයි. ඊටත් වඩා මේ දේවල් මට ඇයගෙන් අසන්නට සිතුනේ ඇයි.

'පොඩි දුව...'

ආච්චි කුස්සියේ සිට කතා කළාය.. චන්ද්‍රා ගියේ අන්තිම වරටත් මගේ 'නළලත රෙදි කැබැල්ලක් තබාය... නොරිදෙන බව දන්නේ නම් ඇය තවන්නේ ඇයි.

'ආච්චි හදිස්සියේ අග්ගලත් හදලා..'

අග්ගලා සුවඳ බඩගිනි බඩවත්තෙක් විය. මම දිග පුවාලු ගෙඩියකුත් අග්ගලාවකුත් අතට ගත්තෙමි. සංදේශ් කන්නට ලැජ්ජා නැති කෙනෙකු වීම සැනසිල්ලකි.

'අග්ගලා රහයි...'

'දන් හාල් බැදලා හදලා තියෙන්නේ..'

'තව එකක් කන්න..'



www.sinhalaelibrary.com

මං අග්ගලාවක් කන්නට දෙද්දී ඇයම මට එකක් දී ගෙන දුන්නාය. මං බොහොරිගෙනු ඇයි වන්දනා නිසාවා විය යුතුය.

'හරි පෙරේතයෙක් කියලා හිතාවා ඇති නේද...'

මම අත වූ කෙසෙල් ලෙල්ල ලී එක මත නොතබා ඇය අතට දුන්නෙමි.

'මං එච්චර හැටියට හිතන්නෑ...'

කෝපි එක ඊට වඩා රසය. කොළඹ හදන කෝපි පවුඩර් මෙන් නොවේ. මේ කෝපි වල අපේ කෝපි සුවඳක් තොකමක් ඇත.

'මේ කෝපි මොනවද...'

'අපි ඇට වේළලා කුඩු කරලා හදාපුවා.. කබලේ බැදලා...'

කෝපි කුඩු කබලේ බැදෙද්දී එන සුවඳ මට දනුත් එන්නට විය. මේ කෝපි කෝප්පයේත් සීනි පොල් සමඟ බැදී හාල් පිටි වූ අග්ගලාවේත් දියවී ඇත්තේ මේ ද්‍රප්පත් කෙල්ලගේත් මිත්තණියගේත් මිහිරක්ම නොවේද...

'ඔට හැම අරයෙන මේ කළුවර පාරේ එන්නේ නොහොමිද...'

මම අඳුරු දෙවැට දෙස බලා ඇසුවෙමි.

'මට බය නෑ... එත් ගෙදර ලයිට් දැම්මාම මේ පැත්තත් එළියයි...'

මම මිදුලේ වූ අඳුරත ආලෝක කදම්බයෙන් වන්දනා දෙස බැලුවෙමි. ඇය මිදුලේ ඒ මේ අත දුව ගොස් කිලු පැහැ වැලේ මලක් දෙස බලා බිම බලා ගත්තාය.

'මං යන්නම්...'





'හොඳයි.. හොඳාක් ස්තූතියි අපේ ගෙට ගොඩවුණාට...'

ගෙවල් වලට ගොඩ වීමටත් ස්තූති කරනවා... කොළඹ මිනිසුන්ට වඩා මේ කඳුකර මිනිසුන්ගේ හදවත් වල මිනිස්කමක් ඇත.

දෙවැට දිගේ උඩට ගොස් වැටී මඩට වැදුණ වැලි ආස්කා ගසේ අතු අතරින් මම හැරී බැලුවෙමි. ඇය ඉතියෙන් මට පාත්වී යන්නයයි කීවාය. මම සිනාසී හිස සිමිට ඔර කර ගත්තෙමි.

ගෙට යන්නට හිතක් නැත. මම මිදුලේ කෙළවරින් දමා තිබුණ බිරිස් ගල් වැනි මහාව කැපූ කළු ගල් කුට්ටි මත ඉඳගත්තෙමි. ජීවිතය තිබුණේ කොහේද.. දත් තිබුණේත් කොහේද.. මේ ලෙස ඇවිද්දුවන්නේ දෙවියද...

Sl-unlimited.com
www.sinhalaelibrary.com

# 06

මම හාප්පස කළුවර කඳු වැටි දෙස බලමින් සිතුවෙමි. ඊයේ පෙරේද මෙන් නොවේ. අද හිතට බරක් නැත. තුනී සාංකාවක් සමඟ ගැලී ගිය අහිංසක තනිකමක් මට දැනෙයි. මම එය මුළු හිතින්ම විඳ ගත්තෙමි.

මං මේ බණ්ඩාරවෙලට ඒ කරන්නේ මොනවාද. තවමත් පොඩි මාමා එය මට කියා නැත. මේ නිදහස් හදවත තබාගෙන බණ්ඩාරවෙල වුනමේ එළවළු වික්කද සැපකි.

චන්ද්‍රානාගේ නිවසේ දල්වූ චිමිනි ලාම්පුවේ ලා කහ පැහැගත් හීන් ආලෝකය බෝගන්විලා යාය මැදින් යාංතමට පෙනෙයි. මම දැන් කිහිල්ල යට ගසාගෙන එළිය දෙස බලා උන්නෙමි. ජීවිතය ගැන මම අත් නොවිඳි තුමක්දෝ පාඩමක්



චන්ද්‍රානා මට නිහඬවම කියා දෙන්නීය. ජීවිතය යනු මහා සැපක්වත් මහා දුකක්වත් නොවේ. දුකේ ටිකක්ද සැපේ ටිකක්ද එකට කවලම් කළ වූටි තිළිණයකි. දුක වැඩි කර ගත යුතුද නැත. සැප වැඩි කර ගත යුතුද නැත. එවිට ජීවිතය හිස්ය.

අගනුවර ජනප්‍රියම බාලිකා පාසලක ඉගෙනගත් මේ සංදේශ් නොදන්නා ජීවිත දර්ශනයක් බණ්ඩාරවෙල මේ කෙල්ල දනී. ඇය සතුටින් ඉන්නේ ජීවිතයේ දුක නැති නිසාම නොවේ. හිතනවානම් සොයා සොයා යනවානම් අනන්ත දුක් ඇයට තිබෙන්නට පුළුවන.

මම පාවහන් ගලවා හීන් උදුපියළිය බිම මත ඇවිද්දෙමි. සැන්දෑ සීත පිනි හීන් උදුපියළිය මතට වැටී තිබුණෙන් දෙපතුල් වලට දැනුනේ කුඩු කළ අයිස් පලසක යන්නාක් මෙනි.

පොඩි මාමා මට බරපතල වැඩක් දෙනවානම් හොඳය. හිතත් ගතත් එසේ වැඩ කරන්නට බලා උන්නේය. එලෙස යමක යෙදවුණ කල හිතට රස්තියාදු ගසන්නට ඉඩක් නැත.

මේ කඳු ඉස්මත්තේ ඇති සුන්දර නිවහනට.. එහි වූ මගේ පුංචි කාමරයට... හීන් උදුපියළිය රවුමක් වට කරගත් රෝස සහ බෝගන්විලා උද්‍යානයට... මම ආදරය කරන්නට පටන් ගත්තෙමි. මේ තරම් මේ බිමට බැඳෙන්නට සිත හදිසි වූයේ ඇයි...

පොඩි මාමාගේ වාහනය ගුරු පාර දිගේ උඩට ඇදෙන්නට විය. මම උදුපියළිය ගොල්ලෙන් මෑන්වී දෙරකඩට ආවෙමි.

'ලොරි විත අරින්න ටිකක් පරක්කු උනා පුතේ... මං ඉඳලා බලන්නම ඕනේ නැත්නම් මුන් ගහනවා...'

පොඩි මාමා වාහනයෙන් බැස ආවේ පාර්සලයක් ද රැ.

www.sinhalaelibrary.com

ගෙනය.

'හෙට ඉඳලා මටත් වැඩ ටිකක් බෙදලා දෙන්න මාමේ..'

'වැඩ ටිකක් නෙමේ කොල්ලෝ කවදහරි මං උඹට මේ වැඩ ඔක්කොම දෙනවා.. හිටපන් හිටපන්...'

පොඩි මාමා මගේ කරට අතක් දමාගත්තේය...

'මොනවද මාමේ මේ...'

'බියර් දෙකක්.. තව හොඳ තාර මස් ටිකකුත් මට හම්බ උනා... කෙල්ලට දුන්නම් රෑට රසට හදලා ගන්නවා...'

තාර මස් මම කා නැත.

'තාර මස් රහද මාමේ..'

'කියලා වැඩක් නෑ... උඹ අද කාලා බලපන්කෝ...'

මගේ කටට කෙළ ඉනුවේය... දන් මේ තාරා මස් ටික ගෙනිහින් දෙන්නේ කවුද...

'හදන්න දන්ම දෙන්න වෙයිනේ මාමේ...'

'කෙල්ල එයි.. මගේ වාහනේ ආවහම ජීකි ඇවිත් බලනවා... පූරුද්දට වගේ..'

මවුන්ගේ ජීවිත ගැන තවත් තොරතුරු පොඩි මාමා ගෙන් දනගැනීමට මට සිතුණි. එහෙත් ඔනවාට වඩා ඒ ගැන හිත වෙහෙසන්නේ ඇයි...

'අද ටිකක් රෑ වෙනකල් ඇහැරිලා ඉමු.. උඹට මෙහේ පාළුද කොල්ලෝ...'

'පොඩ්ඩක්වත් නෑ මාමේ... තිබුණත් මං මේ පාළුවට ආසයි...'

'පාළුව හරි ලස්සනයි තමා පුතේ..'





පොඩි මාමා කියූවා සේ වන්දනා ඉදිරිපස දෙරින් ගෙට ගොඩ වූවාය.. ඇයව දකින හැම වාරයකදීම මට මොකක් හෝ මතක් වෙයි... ඒ මතක් වන්නේ කුමක්ද කියා මට එකවර සිතා ගත නොහැක.

බණ්ඩාරවෙලට රාත්‍රිය උදාවෙමින් තිබුණි... කඳ සීතලද තුනී පාළුවද හීන් සාංකාවක්ද එකම විටක පපුවට දනෙන්නට විය... අම්මාගෙන් තාත්තාගෙන් නංගීගෙන් තොරව ගෙවන ජීවිතේ ප්‍රථම රාත්‍රිය මෙසේ විය... ගෙදර ලොකු පුතා වුවද මා හැදුනේ එහෙම ලොකු කමක් ඔළුවේ තියාගෙන නොවේ.. සමහර අවස්ථාවක මම නංගීටත් වඩා බාල හිතෙන තරම් ගෙදරදී හුරතල් උනෙමි... අද ඒ සෙනෙහස නැත... රැකවරණය නැත... රෑට තිදගත් පසු හොරෙන්ම කාමරයට පැමිණ පොරවන නංගී නැත...

ජීවිතය මෙහෙම වන්නට ඇත... උස් මහත් වෙද්දී උරහිස් පළල් වී උගුර දණ්ඩ පනින කල්හි යොවුන් වියේ උරුමය තනිකමට තතුවෙනවා විය යුතුය... සමහර විට අනාගතයේදී මීටත් වඩා නපුරු තනිකම් ඇති විය හැක... මේ පුංචි රටේ දුක් විඳින හැම කොල්ලෙකු මෙන්ම මමද මගේ පාළු හිත සනසාගෙන ජීවිතයට මුහුණ දෙන්නෙමි.

ආදරය කරන්නට කිසිම සූදානමක් පපුවේ නැත... සංදේශ්ට ආදරය ගුණ නැත... කැපද නැත... සෙනෙහස මේ ආත්මය අවුල් කර දමනවා පමණි...

'ඉතින් පුතේ.. මොකද මූණ කළු කරගෙන... මුස්ලිම් කෙල්ල මතක් උනාද...'

මිදුලේ උඩුපියැඹියා ගොල්ලේ ඇවිදිමින් රෑ අහස දෙස බලා උන් මගේ පිටට අතක් දමා මාමා ඇසුවේය...

'පොඩි මාමත් මට හිනාවෙනවා...'



www.sinhalaelibrary.com

මම දුක්බරව කීවෙමි.

'ආදරේ කරන කෙල්ලෙක්ට හිනාවෙන්න තරම් උඹේ පොඩි මාමා කුහක නෑ පුතේ... උඹ ආදරේ නිසා දුක් වින්දේ මාසයයි දෙකයි... ඒත්, මේ මාමා අවුරුදු ගණන් තොකා තොබී දුක් විඳලා තියෙනවා... නාස්ති වෙලා තියෙනවා... ඒ ආදරේ හැටි... එනකොට එන්නේ පද්ද පද්ද සිලිං බිලිං ඔක්කොම අරගෙන... හරියට කානිවල් දෙක තුනක් එකපාර ආවා වගේ... යනකොට යන්නේ මල ගෙවල් හතක මුසලකම දීලා...'

ඒ මළ ගෙවල් හතක පාළුව මටද විය... ඒ මුසලකම කුරුළු කැලේදී එහෙමම මමද වින්දෙමි... ආදරයට මේ තරම් දෙබිඩි ලක්ෂණ දුන්නේ කවුද...

'ගෑණියෙක් එක්ක එකට ඉඳලා ඒ ගෑණිව නැති උනාට පස්සේ කොල්ලෙක්ට ඒ ගෑණිගේ පපුවේ පුපුඹ දනෙනවා දනෙනවා වගේ... ඒ වෙලාවට තමයි මඳ කිපිච්ච ඇතෙක් වගේ ගාල කඩාගෙන දුවන්නේ... ඒත් පුතේ... කඩාගෙන යන සරුංගල් සොයන එක එච්චර ලේසි නෑ... ඊට වඩා හොඳයි අලුත් සරුංගලයක් හදාගන්න එක...'

මම හිතා උන්නේ සරුංගල් නොයවාම ඉන්නටය... එකම සරුංගලයක් දෙස බලාගෙන ඉඳිද්දී ඇස් රිදෙයි... ආදර බලාපොරොත්තුවක් එකම පතුවකින් එකම හැඟීමකින් රැකීම සිතනා තරමම පහසු නැත... අවංක ආදරවන්තයෙකු වීම සංවේදී හදවතක් උරුම කෙනෙකුට දුකකි... මම ඒ දුක වින්දෙමි... ඕනාවටත් වඩා වින්දෙමි...

ලස්සන කෙල්ලකු දෙස බලා අහිංසක සතුටක් ලබන්නට හැම කොල්ලෙක් මෙන්ම මමද ආශා කළෙමි... එහෙත් ඒ





කෙල්ලවම අයිතිකර ගන්නට ගිය නිසා අර සතුට මට නැත...

කුරුළු කැලේට ආ සුන්දර රාමලාන් සඳ දෙස හොරැහින් බලා උන් දවස් කොතරම් ලස්සනද... මරතෝන්ඩිය රටා ඇඳෙන සුරත ඇඟිලි කරු අතර හිරකර ගන්නට ගිය තැන දෙනැතම ඇවිලී ගිය ගිනි ගොඩවල් විය...

'ජීවිතේ පුතා ටික කාලයක් පාළුවෙනුත් ඉන්න ඕනෙ... එතකොට අලුත් ජීවිතේකට ලෝබකමක් එනවා... හරියට කද බඩගින්නකදී කෑම වල සුවඳටත් ආස හිතෙනවා වගේ...'

පොඩි මාමාත් සමඟ ගෙස් මම මිදුලේ තිබූ ප්ලාස්ටික් පුටුවේ වාඩි උනෙමි... කුඩා මේසය මැදින් කුඩයක් ගසන්නට පොල්ලක් දමා ඇත... පොඩි මාමා හීතල බියර් බෝතලය කඩා පෙණ නගින උස බියර් වීදුරුවට දම්මේය...

'මොනවද පොඩි මාමේ මම කරන්නේ...'

ඔහු සිනාසුනේය...

'මේ බණ්ඩාරවෙල උඹට ආස ඕන දෙයක් කරන්න පුළුවන්... හැබැයි පුතේ උඹට නාස්ති වෙන්න නම් දෙන්නෑ...'

'මං එහෙම නාස්ති වෙන්නෑ පොඩි මාමේ... නංගිගේ අනාගතයක් ගැන හිතන්න ඕන...'

'මං උඹ ගැන දන්නවා පුතේ... කොල්ලෝ තනි උනාම පුතේ අයාලේ යනවා... ගැහැණියෙක්ව දක්කහම බලන්න හිතෙනවා... ඒ ගෑණි ඇස් කරකවලා බැලුවොත් ගාල කඩාගෙන වගේ ඒ ගෑණි පස්සේ යනවා... එහෙම ගිය කොල්ලෝ ගොඩක් නාස්ති වෙලා තියෙනවා...'

ආදරය නිසා දුක් විඳින්නට මිසක නැති නාස්ති වෙන්නට මට වරම් නැත... පිස්සෙකුසේ ගෙවූ දවස් දෙක



www.sinhalaelibrary.com

කුනටත් මම වෛර කරමි...

'මං ගත්තා ලොකු පුතා බණ්ඩාරවෙල අලුත් ඉඩමක්... ඉඩම පොඩියි... අක්කර කාලක විතර... ඒකේ පොඩි ගෙයක් තියෙනවා... මේ ළහම...'

'මාමාට තවත් ගෙයක් මොකටද... මේ ගේ ලස්සනයිනේ මාමේ...'

'ගෑණු නැති මම ගෙවල් එකතු කරන්නෙ මොකටද නේද... ඒක ගත්තේ වෙන දේකට පුතා...'

'බිස්නස් එකකට...'

'ඔව්... කාලෙක ඉඳලා මගේ හිතේ තිබුණා මේ උඩරට හොඳම එළවළු පිට රට යවන ප්‍රොජෙක්ට් එකක් පටන් ගන්න... හොඳම එළවළු තෝරලා ඒවා සුද්ධ කරලා පැකින් කරලා පෙට්ටි වල අසුරලා ලේබල් කරලා එහෙම යවන්න...'

'ඒක මරුනේ පොඩි මාමේ... මේ බණ්ඩාරවෙලට වැලිමඩයි.. නුවර එළියෙයි වැවෙන එළවළු විතරම ඇති...'

'උඹ ආසද වැඩේට...'

'පිච් තමයි... මාමා මාව දන්නේ ඒකටද...'

'උඹට පුළුවන්ද ඒක බාරගන්න...'

මගේ දස් තෙත් විය... ව්‍යාපාරයක් මටම බාර දෙන්නට තරම් මා පොඩි වැඩි නැද්දැයි මට අසන්නට සිතුණි...

'අපට වැඩේ මුලින්ම සුළුවට පටන් ගනැකි... ඒකට ඒ පොඩි ගේ ඇති... මං උඹට නව ස්වාෆ් එකකුත් අරගෙන දෙනවා... දැනට තියෙන්නේ එළවළු පැකට් කරලා කොළඹ එක්ස්පෝට් කම්පැනි එකකට යවන්න විතරයි...'





'පොඩි මාමට මාව විශ්වාසද... වැඩේ හරියටම කරයි කියලා...'

'උඹට ඒක කරන්න පුළුවන්... මට ඒක ෂුවර්...'

ඒ වචන මගේ ආත්ම ශක්තිය වඩවන්නක් විය... අද සිට මට හිනෙනුත් එළවළු පෙනෙනු ඇත. බෝංච් තක්කාලි... තද දම් පැහැගත් බටු... තද කැඹිලි පාට ලස්සන කැරට්... සුදු පැකින් වල අසුරනු මට මැවී පෙනෙයි.

'මේ පොඩි කොල්ලටත් රස්සාවක් දෙන්න ඕන කියලා මම කාලෙක ඉඳන් හිතාගෙන හිටියේ... දැන් ජීවත් වෙන්නේ හරි අමාරුවෙන්... දුප්පත් මිනිස්සුන්ට නිකං සල්ලි දික් කරන්න බෑ... ඒක ඒ මිනිස්සුන්ගේ ආත්මය බාල්දු කරන වැඩක්...'

'ඒ කොල්ලයි ආච්චියි හරි අමාරුවෙන් ජීවත් වෙන්නේ... ගෙදරට ලයිට් වත් නෑ...'

පොඩි මාමා හිස වැනුවේය...

'පොඩි උනාට ඊයි හරි දක්ෂ කොල්ල... උඹට හදලා ගන්න පුළුවන්... දුප්පත් කොල්ලෙකුට ජීවත් වෙන්න උදව් කරන එක ලොකු පිනක්...'

'පින්කතා නෙමේ පොඩි මාමේ... මං ඒක කරන්නම්...'

ඇය තාර මස් හදගෙන ආවේ ඒ මොහොතේය... කරුමෙට බියර් බෝතලය තිබුණේද මගේ අතේය... එත්දනා මා කොළඹ හොඳ බේබද්දෙකු යැයි හිතනවා විය යුතුය...

'ආච්චිද දුවද හැදුවේ...'

'ආච්චි මස් හදන්නෑ අන්කල්... පව් පිරෙනවලු... මං හැදුවේ...'

'අනේ උඹේ ආච්චිගේ රෙද්ද... මස් ටිකක් කෑවට මොන



www.sinhalaelibrary.com

පව්ද කෙල්ලේ...'

මම තාර මස් කෑල්ලක් ගත්තෙමි... කටට කෙළ උනන පහේ සුවඳක් ඉන් හමා ආවේය...

'චන්දනා ආසද රස්සාවක් කරන්න...'

පොඩි මාමා ඇසුවේය... ඇය හිස් බියර් බෝතලයක් අතට ගෙන පසෙකට වී බිම බලා ගත්තාය...

'කියන්න දුවේ... ආසද...'

'හොයලා දෙනවනම් ලොකු දෙයක් අන්කල්...'

දුබල අසරණ දුප්පත් හඬකින් ඇය කීවාය... මේ කුඩා ජීවිතය මැද ඇය විඳින අනේක විධ දුක්ඛ දෝමනස්සයන් ඒ වචන තුළ කැටිවී තිබුණි...

'ලබන මාසේ ඉඳලා ලෑස්ති වෙන්න... මං ඔයාව කොහේවත් අරින්නෑ... මගේ ළඟම වැඩට ගන්නම්...'

කෙල්ලගේ ඇස් කඳුලින් පිරුණි... ඒවා අප ඉදිරියේම ගලා යන්නට විය...

'ජයදේව අ...න්...ක...ල්...ට පින්...'

එපමණකි... මගේ මුළු හදවතම පිච්චී ගියේය... මිනිස්සු ලැබෙන පුංචි දෙයකින් පවා කොතරම් සතුටු වනවාද...

Sl-unlimited.com

www.sinhalaelibrar

# 07

මට ඇහැරුනේ පාන්දරමය. ඒයේ ඇඳට වැටුණ හැටියේම මට නින්ද ගියේ සීතලට විය යුතුය. ඒවත් තාරා මස් සමඟ චන්දනා ගෙනා බත් මම පැලෙන්නට කැවෙමි.

ඇගේ බත් ටික ගෙදර අම්මාගේ බත් ටික සිහි ගන්වන්නක් විය. අළුත් පහේ සුවඳ කටට කෙළ උනනා බැදුම් තෙල් සුවඳ මැල්ලුම් මැලවූ සුවඳ බඩගිනි දෙගුණ කරන්නක් විය.

මා නිදගන්නට යද්දී චන්දනා කුඩා උණු වතුර බෝතලක් රැගෙන දුවගෙන ආවාය.

'ආපු පළවෙනි දවසේ නිසා සීතල හැදෙයි... මං කෝපි ටිකක් හැදුවා..'

මම එය නොගෙන ඇය දෙස මොහොතක් බලා උන්නෙමි. කෙල්ලෙකු දෙස එසේ බලාගෙන සිටීම නොහොබිනා කමක් බව මට හිතුනේ පසුවය.

'මං.. කා..මරෙන් කියන්නද...'

වන්දනා නෙත් බිමට බර කරගෙන ඇසුවාය... මේ මොන ඇස් බිල්ලෙක් දැයි ඇය මා ගැන හිතන්නට ඇත.

'දෙන්න...'

උදේ නැඟිට මම උණුවතුර බෝතලය ඇර බැලුවෙමි. ඒවා තද සීතලට නිවී ගොසිනි. ඇඳ උන් වී ෂර්ට් එකට උඩින් ස්වීටරය දමාගෙන මම සාලයට ආවෙමි. පොඩි මාමා තවම ඇහැරී නැත. ඔහු ගොරවන හඬ තරමක් ශබ්දයට සාලයට ඇසෙයි. ඉදිරිපස දොර විවෘත කරත්ම මිදුලේ තිබූ කටුසර සීතල එහෙමම ගෙට කඩා වැදුණි. මිදුලේ ගස් දෙක තුනක් ඇරෙන්නට අනිත් සියල්ල තද මීදුමෙන් වැසී ඇත.

මේ තරම් මීදුමක් මා දකිනා ප්‍රථම වතාව මෙයය. මේ නිවස තනා ඇත්තේ අහසේ වලාකුළු මැදයයි සිතෙනා තරමට හාත්පස මීදුමය.

තවමත් ඉර පායන්නට හිතලාවත් නැත. මිදුලේ බාගයක් දුර ඇවිද යද්දී මාව සට සට ගා ගැහෙන්නට විය. සීතල සමඟ සෙල්ලම් කළ නොහැකි බව මට දැනුනේ සරම යටින් එන සීතල දරා ගන්නට බැරි වූ නිසාය.

රෑට පාසලේදී ක්‍රීඩා කිරීමට අඳින දිග රනින් කලිසමක් ඇන්දනම් හොඳ යැයි මට සිතුණි. සත ස්විටර් රෙද්දෙන් නිම කළ එවැනි කලිසමක් බණ්ඩාරවෙල වවුමෙන් ගත හැක.

යළි නිදගන්නට ආසාවක් නැත. මම ගේ පුරා රවුමක් ගැසුවෙමි. පොඩි මාමා තී දේ හරිය. ගැණියෙක් ගේ ව සිටිය යුතුය. ආදරණීය සන්දෙස් කිරියාවක් ඇත්තේ එවිටය.





කුස්සියට ගොස් විදුලි කේතලය ගසා මම කෝප්ප ගත්තෙමි. පිටි සීනි කෝපි බෝතල කොහේද කියා මම නොදනිමි. මම කබඩ් එකින් එක ඇරියෙමි. කේතලය හිබබ ඉක්මනට පැසී තිබුණි.

'මං තේ හදලා දෙන්නම්..'

වන්දනාගේ හඬ කුස්සිය දොරකඩින් ඇසුණි. ගවුම උඩින් ලා රෝස පාටට හුරු ස්විටරයක් ඇඳ උන් ඇය උදෑසන මීදුම මෙන් පිත් පාට යැයි මට සිතුණි. හිතුනේ එය පමණක් නොවේ. සංදේශ් දත් තරක දේවල් හිතුණේ අඩුවෙනි.

'ගුඩ් මෝනින්...'

මම කලබල වූ සිත සන්සුන් කර ගන්නට වෙර ගත්තෙමි.

'ගුඩ් මෝනින්.. මං හිතුවේ තව පරක්කු වෙලා ඇහැරෙනවා කියලා...'

'උදේ හීතල ආවා...'

මම තේ හදන තැනින් මෑත් උනෙමි. ඇය ඒ ළඟම තිබූ කබඩ් එකකින් කුඩා තේ සීනි පිටි බෝතල් එළියට ගත්තාය.

'මොනවද බොන්න ඕන...'

මම පිටුපස දොර ඇර උළුවස්සට බර උනෙමි. තවමත් පාන්දර කළුවරය.

'එළකිරි ගෙනාවා.. ඒක හදලා දෙන්නද...'

මම හිස වැනුවෙමි. ඇය කුඩා ඇල්මිනියම් මුට්ටියක් ගෙන ගෙන ආ කිරි බෝතලය එයට හැලුවාය.

එළකිරි තමයි... මට කියවුනේ ඉබේටමය... කොළඹ කොල්ලන් එළිකිරි යැයි කියන්නේ ලස්සන කෙල්ලෙක්ටය. 'ඒකි මාර එළ' යැයි ඔවුන් කියති.

'කහට ටිකකුත් දන්නද.. එතකොට තමා රස...'

මම ඇය හද දෙන දෙයක් බොමි. ඇය තේ හදද්දී මම ඇය දෙස හොරැහින් බැලුවෙමි.

'කොහෙද ඉස්කෝලේ ගියේ..'

කිරි උතුරන තුරු මුට්ටිය දෙස බලා උන් ඇය මා දෙසට හැරී සිනාසුනාය.

'ගුඩ් ෂෙපඩ් එකට.. ගිය අවුරුද්දේ ඕලෙවල් කළේ..'

'මොනවද රිසල්ට්ස්..'

'ඒ ලෙවල් කරන්න ඇති..'

'ඇයි ඉතින් කරන්නැත්තේ..'

මා ඇසුවේ මෝඩ ප්‍රශ්නයකි. ජීවිතයේ පල්ලමටත් වඩා විකක් පල්ලමට වැටුණ කෙල්ලෙකුගෙන් මේ ප්‍රශ්නය නෑසිය යුතුය.

'වියදම් වැඩියි... එච්චර දුර ඉගෙන ගත්තය කියලත් ජොබ් එකක් ලැබෙන්නැනේ. ඊට වඩා හොඳයි කියලා හිතුනා ගෙදරට වෙලා එළවළු පාත්ති ටිකක් දන එක..'

ඇය තුළ සාමාන්‍ය කෙල්ලෙක් තුළ නැති අසාමාන්‍ය අවංක බවක් ඇත. බොහෝ විට කෙල්ලන් ඇත්ත කතා නොකරති. කොල්ලන් එවැනි කෙල්ලන්ට කියන්නේ 'අම්මෝ මය බොරු හිල' කියාය..

'දන් ඉතින් එළවළු පාත්ති දන්න ඕන නැනේ... චන්දනා ජොබ් එකට ආසද...'

'ඊයේ රෑ මට නින්ද ගියෙත් නෑ සතුටට... කවදද දන්නැනේ අළුත් ප්‍රොජෙක්ට් එක පටන් ගන්නේ...'

'ඉක්මනට පටන් ගන්නවා... අද හෙටම මාත් ආවේ





ඒකටනේ...'

මා සමඟ කතා කරද්දී කිරි මුට්ටිය ඇයටත් නොදනී උතුරා යන්නට විය.

'අන්න උතුරනවා..'

මම මහා දෙයක් වුවාක් මෙන් කීවෙමි.

'ආ..නේ දක්කේ නෑ...'

'කමක් නෑ.. කිරි උතුරනවා දකින්න හොඳයි...'

මා කීවු පසු චන්දනා කිරි උතුරන්නාක් බඳු සිනාවක් මුව මත ඇඳගෙන කිරි එක ජෝග්ගුවට පෙරුවාය.

උණුකළ එළකිරි ඇය උස වීදුරු දෙකට දම්මාය... ඊට පසු එයටම තද කහට ඇති තේ වතුර ටිකකුත් දම්මාය. බොන්නට ආස හිතෙනා කිරි තේ පාට ආවේ එවිටය... සියල්ලටම පසු සීනි හැඳි දෙකක් දමා ඇය එය ලතාවකට ගැසුවාය...

එළකිරි තේක බීමේ මහා පෙරේතකමකින් මගේ මුව තෙත් විය...

'සීනි වැඩිනම් තව කහට ටිකක් දන්නම්...'

මම උගුරක් බොනතුරා ඇය බලා උන්නාය. මම වීදුරුව මුවේ තබාගෙනම ඇය දෙස බැලුවෙමි. දුප්පත් කෙල්ල පින් පාටට සිනාසුනාය...

'ර...හ...ද...'

'ම...'

තේක ගත්තා නම් සංදේශ් කුස්සියෙන් යා යුතුය... එහෙත් මට යන්නට තරම් හිතක් නැත.

'මං අන්කල්ට තේක ගිහින් දීලා එන්නම්...'



www.sinhalaelibrary.com

පොඩි මාමාගේ තේකද රැගෙන ඇය කුස්සියෙන් ගිය පසු මට මහා පාළුවක් දැනුණි. මම කුස්සියේ දොරකඩ පඩියේ ඉඳගත්තෙමි. ටයිල් පොළොවේ සීතල සරම පසාරු කරගෙන තට්ටමට දැනුණි...

ගේ පිටුපසට පෙනෙන්නේ අලංකාර ගෝවා වගාවකුත් ලීක්ස් වගාවකුත්ය... තැන තැන සලාද කොළ ගස් සිටුවා තිබේ... උදෙන්ම අවදි වී ගොවියෝ ස්වෙටර් ඇඳගෙන ගොවිපල වල වැඩ කරති. පොම්ප වලින් වතුර දමති... බෙහෙත් ඉසිති...

'තේක ඇල්වෙනවා...'

ඇගේ හඬට මාව ගැස්සී ගියේය... මම ලැජ්ජාවෙන් පිටුපස බැලුවෙමි. තේ හැඳි කෝප්පය සෝදමින් ඇය සිනාසුනාය...

'මේ ඉඩම් කාගෙද...'

'ඒක ගොවිපළක්... අක්කර දෙකක විතර එළවළු දාලා තියෙන්නේ... මේ පැත්තේ අල...'

චන්දනා පහළ කඳු බෑවුම් පෙන්වා කීවාය... එහෙත් මට බැලුනේ දොරකඩට ආ ඇගේ දෙපා දෙසය. නිලට හුරු බාටා රබර් සෙරෙප්පු දෙකක් පැළඳ උන් ඇගේ දෙපා පිරිසිදුය...

'මම අත්කල්ගෙන් ඇහුවා මොනවද උදේට හදන්නේ කියලා... ලොකු පුතාගෙන් අහන්න කිව්වා...'

චන්දනා තවමත් මට නමක් ගමක් කියා කතා නොකරයි. මුලින්ම ඇය මට කීවේ මහත්තයා කියාය... කෙල්ලෙක් එලෙස කතා කරද්දී මට මහා ලැජ්ජාවක් දනෙයි.

'මොනවා හරි කමක් නෑ...'

ඒ දුප්පත් ගෙදර මොනවා හැදුවත් රසය...

'කිරිබත් හදලා ගේන්නද... ළූණු බැඳුම් එක්ක... ඊයේ





තාර මස් උයපුවක් තව ගොඩක් තියෙනවා...'

'ඇයි ඔයාලා කෑවේ නැද්ද...'

චන්දනා නැහැයි කියන්නට මෙන් හිස වැනුවාය...

'ඇයි...'

'සතියකට එකාවක් කෝවිල් යනවනේ... ඉතින් මස් කන්නෑ...'

'ඇයි කෝවිල් යන්නේ...'

මාත් අසන්නේ මුදුම්කාර ප්‍රශ්නය...

'නිකං... මේ පැත්තේ දෙමළ මිනිස්සු යනවනේ... ඉතින් අපිටත් ඉබේටම යැවෙනවා...'

'බාර වෙන්නද...'

'ඔ...ව්...'

මොනවද කියා අසන්නට මගේ කට නලියයි... එහෙත් ඒ තරම් ඇයව අසරණ කළ යුතු නැත... දුප්පත් කෙල්ලෙක්ට දෙවියන්ට බාරවී පතන්නට කොතරම් දේ ඇත්ද...

'එහෙනම් කිරිබත් හදන්නද...'

මම හිස වැනුවෙමි. ඇය කිරි ගෙනා බෝතලය රැගෙන ගියාය... තව එළකිරි වීදුරුවක් බීමේ ආශාවකුත් මට ඇති විය. ඒ තරම් ඒ එළකිරි වීදුරුව රසය...

# 08

"තාත්තේ..'

මගේ කට හඬ ඇසී තාත්තා මොහොතක් කතා නොකර උන්නේය. ජීවිතය පුරාම අප වෙනුවෙන් දුක් විඳි ඔහුට මා ද දුකක් දුන්නායැයි මම තැවුනෙමි...

'තා...ත්...තේ... තාත්තා ලයින් එකේ ඉන්නවා නේද...'

'ඔව්... ලොකු පුතා සනීපෙන්ද...'

තාත්තා ඇඹුම්බර හඬින් ඇසුවේය. නිසැකවම මේ මොහොතේ තාත්තාගේ ඇස් වල කඳුළු තිබෙනු ඇත.

'ඔව් තාත්තේ... තාත්තලා සනීපෙන් නේද...'

'සනීපෙන් තමයි පුතේ... ඒත්...'





මගේ පපුව හිරවිය. ගෙදර කරදරයක්ද...

'ඇ...යි... තාත්තේ...'

'නෑ පුතේ මුළු ගේම පාළුයි...'

'මං ඉරිදට එනවා තාත්තේ...'

'දැන්ම ගෙදර එන්නෝන නෑ... ලොකු පුතා ටිකක් ඔහේ ඉන්න...'

'ඇයි තාත්තේ...'

'මෙහේ මඟුලක්නේ...'

ශහීනාගේ විවාහය... මට පුදුම හිතුණි. මේ ඉක්මනට ඇය විවාහ වෙනවාද...

'ලොකු පුතා අවුල් වෙන්නෙපා... ඔහේ හොඳද...'

තාත්තා ශහීනා ගැන වචනයක්වත් කතා කළේ නැත... එක අතකට වල දැමූ ආදරයක් යළි ගොඩට ඇද පලක් ඇත්තේ කාටද...

'බණ්ඩාරවෙල හොඳයි තාත්තේ... මේ පොඩි මාමයි මායි වවුමේ කඩේට යන්න...'

'කැම්පස් යන්නත් ආශාවක් නැත්නම් පොඩි මාමා ළඟට වෙලා බිස්නස් එක් ඉගෙන ගන්න...'

'පොඩි මාමා අලුතෙන් එළවළු පිටරට යවන වැඩක් පටන් ගන්න යන්නේ... ඒක මං කරන්නේ...'

'මේ කොළඹ වෙච්ච දේවල් අමතක කරලා අඬුරුවත් සරඹින් එහෙනම් ඒ වැඩේ කරන්න... පොඩි මාමගේ විශ්වාසේ දිනාගෙන වැඩ කරන්න... එයා ඔයාට හරි ආදරෙයි...'



www.sinhalaelibrary.com

'පොඩි මාමා ආවා මං දෙන්නම්...'

පොඩි මාමාද ටවුමට යන්නට ඇඳගෙන සාලයට ආවෙන් මම දුරකතනය ඔහුට දුන්නෙමි.

'අයියේ... ලොක්කා ගැන බයවෙන්නෙපා... මං මූව බලාගන්නම්...'

පොඩි මාමා එහෙම කතා කළ එක හොඳය...

'මම කවදහරි මේකට ලොකු මිනිහෙක් කරලා පුළුවන් නම් හොඳ කෙල්ලෙකුත් බන්දලා දීලා කොළඹ එවන්නේ... කොල්ලව ටිකක් මං ගාව තියාගන්නම්... අයියලාට පාළුද...'

වඩාත් පාළු අම්මාටත් නංගීටත් විය යුතුය... ගෙදර තනිවන්නේ ඔවුන්ය...

'යන්...'

අපි වාහනයට නැග්ගෙමු. පොඩි මාමා අතුරු පාරකින් වාහනය රැගෙන ගොස් චන්දනාගේ ගේ අද්දර එය නතර කළේය. ඒ පැත්තෙන් ඇගේ නිවසට පැමිණිය හැකි බව මං දැන උන්නේ නැත..

පොඩි මාමා හෝන් එක ගැසුවේය. චන්දනා දුවගෙන ආවේ ඉඳුල් අතිනි. ඇය කන්නේ බත්ය.

'අනේ මැණික... ඔයා බත්ද කන්නේ...'

අහිතක් නොමැතිව යුවතිය සිනාසුනාය. මේ බණ්ඩාරවෙලට ආ මොහොතේ සිට මා දුටු වඩාත්ම සුන්දර දේ ඇගේ සිනහවය. එය හදවතේ පිළී ඉරක් අඳියි...

'මෙහේට එන්න පුතේ...'

චන්දනා පොඩි මාමා උන් පැත්තෙන් වාහනය අද්දරට ආවාය...





'ජොබ් එක ගැන ආච්චිට කිව්වද...'

'ඔව්... ආච්චි හවසට බාරෙකුත් වෙන්න යන්නේ... කරදර අඩු වෙයිලු...'

දුප්පත් ජීවිතයකට රැකියාවක් යනු මෙතරම් බලාපොරොත්තුවකැයි මම නොසිතුවෙමි. පොඩි මාමා රුපියල් දහේ කොළ තුනක් උඩ සාක්කුවෙන් එළියට ගත්තේය.

'මෙතන රුපියල් තුන්දහක් තියෙනවා... මේ කෑම බිලට එහෙම නොවේ... ජොබ් එකකට යනකොට ලස්සනට අඳින්න ඕනනේ... හවසට ආච්චිත් එක්ක ටවුමට ගිහින් ඇඳුම් ටිකක් ගන්න... ආ...'

ඇගේ ඇස් කඳුළින් පිරුණි.

'ජයදේව අන්කල්ට පින්...'

නිහතමානීව මාමා දුන් මුදල් ගනිමින් චන්දනා කීවාය.

බොහෝ යුවතියන් මෙන් බොරුවට ඒ මුදල් ඇය ප්‍රතික්ෂේප කළේ නැත... ඇගේ නිහතමානී කම මගේ හදවත පුරා අලුත් කම්පනයක් ඇති කළේය.

'දවල්ට කෑම හදන්නද...'

පොඩි මාමා බැලුවේ මා දෙසය...

'මං එන්නෑ... ලොකු පුතා එනවා... කොල්ලට කෑම ටිකක් හදන්න...'

ඇය හිස වැනුවාය... වාහනය එතැනින් පහළට බහිද්දී මට හැරී බලන්නට සිතුණි. එහෙත් ඒ හැඟීම මම අමාරුවෙන් මැඩ ගත්තෙමි...

'කවදහරි මේ කෙල්ලට හරියන්න ඕන...'

පොඩි මාමා කීවේ ඇගේ නිවස පසුවී ටික දුරක් ගිය



www.sinhalaelibrary.com

පසුය...

'කෙල්ලෙකුට හරි යනවා කියන්නේ ඒකිට හොඳ කොල්ලෙක් හම්බවෙනවා කියන එකට... නාරුමයෙක්ට අහුවුනොත් මේ කෙල්ල පව්...'

ඒ ගැන හිතන්නට තවම ඇය ලාබාල වැඩිය...

'හැමෝගෙම දෛවයක් කියලා දෙයක් තියෙනවා පොඩි මාමේ...'

මම මහා පණ්ඩිතයෙක් මෙන් කීවෙමි...

පොඩි මාමා මාදෙස බලා සිනාසුනේය...

'ඇයි පොඩි මාමේ හිනාවෙන්නේ...'

'පුතේ... ජීවිතේ හොඳ පැත්තකට පෙරලුනාම අපි කියනවා වාසනාව කියලා... නරක පැත්තට පෙරලුනාම දෛවය කියනවා... ඔක්කොම බොරු බං... දෛවය කියලා කෙහෙල්මලක් නෑ... තිබ්බත් උඹ ඕවා හිතන්නෙපා... උඹට ඕන මොනවද... ඒක මට කියපන්... මං උඹට ඒ ජීවිතේ ලබාගන්න උදව් කරන්නම්...'

'මං කිව්වේ ඒ ගැන නෙමේ...'

මම ලැජ්ජාවෙන් කීවෙමි.

'ඕනවට වඩා හිතන්නෙපා... ටික දවසක් ඔහේ ගෙවිච්චදෙන්... එක කන්නයක ගොයම් කපලා නව කන්නයක් එනකල් කුඹුරක් ටික කාලයක් ඔහේ තියනවනේ...'

අපි කතාවෙන් කතාවෙන් බණ්ඩාරවෙල නගරයට සේන්දු උනෙමු... පොඩි මාමා පාරේ උන් පොලිස් නිලධාරීන්ට අත වැනුවේය. ඔහු මේ බණ්ඩාරවෙල නගරයේ ජනප්‍රිය චරිතයකි...





'මං උඹටත් අද සල්ලි ටිකක් දෙන්නම්... ඇවිදලා ඕන දෙයක් ගනින්...'

මොනවා වත් නොගත්තද මේ වවුමේ ඇවිදින්නට මමද ආශා කළෙමි... සියල්ලට කලින් සීතලට හොඳ ජැකට් එකක් ගත යුතුය...

පොඩි මාමාගේ තොග කඩයේ කැෂියර් කුටුවට වී මම පැයක් දෙකක් උන්නෙමි. ඒ පැය දෙක තුනට රුපියල් පනස් දහසකට වඩා මම අත ගෑවෙමි. එතරම් මුදලක් මා අතින් අල්ලූ ප්‍රථම අවස්ථාව එය විය... ඊට කලින් මා මේ අතින් ඇල්ලූ විශාලම මුදල රුපියල් දෙලොස් දහසකි. ඒ පරණ ගෙදර සිටියදී අම්මා දමූ සීට්ටුවක සම්පූර්ණ මුදලය.

අම්මා සීට්ටුව දමිංමේ කුරුළු කැලේ සෑදූ අපේ ගෙදරට පුටු සෙට් එකක් ගන්නටය...

ජීවිතයක් හදා වඩා ගැනීම බොළඳ සුරංගනා සිහින වලින් පමණක් කළ නොහැක්කකි. එහි ප්‍රායෝගික පැත්තක්ද ඇත. පොඩි මාමා මෙන් ජීවිතය වෙහෙස මහන්සියෙන් කැප වීමෙන් ගොඩනඟා ගන්නට මමද ආශා කළෙමි.

ජීවිතයේ සිදුවන සියල්ල වෙන්නේ හොඳට යැයි මම අසා ඇත්තෙමි. ශනීනාට ආදරය නොකළේ නම්... අපේ ආදරය මැදට මහා බාධකයක් කඩා නොවැටුනේ නම් තවමත් කුරුළු කැලේට වී සුරංගනා සිහින දකිනවාය... එහෙත් සියල්ල කනපිට පෙරලී බොහෝ කඳුළුද සුසුම්ද හෙළූ පසු මම බණ්ඩාරවෙලට ආවෙමි.

එසේ වූ එක කොතරම් හොඳදැයි හිතෙන්නේ දැන්ය. සාම්ප්‍රදායික ඉස්ලාම් චාරිත්‍රානුකූලව විවාහ වෙන මුස්ලිම් මනමාලියක් මට මැවී පෙනුණි. තවමත් ඇයට මාව මතකදැයි මම සිතුවෙමි. අද හෝ හෙට නොවේනම් නව වසරකින් දෙකකින් ඇයට මාව සදහටම අමතක වී යනු ඇත.



www.sinhalaelibrary.com

ජීවිතය යනු මෙය වන්නට ඇත. ශහීනාව කොහේදී හෝ මට හමුවේ නම් ඇයට මුළු හදවතින්ම මම සුබ පතමි. ආදරය වියෝගයක් වී හදවතට අහිමි වූ පසු කුහකකමක් පපුවේ ඉතිරි කරගෙන පලක් නැත.

'ජයදේව මහත්තයට අලුත් ගෝලයෙක් ලැබිලා තියෙන්නේ...'

පොඩි මාමාගේ කඩයෙන් අල ගන්නා තොග වෙළෙන්දෙක් මා දෙස බලා සිනාසී කීවේය... මම ඔහු දුන් චෙක් පත පොතේ ලියමින් උන්නෙමි.

'මේ මගේ පුතා මුදලාලි... කොල්ල ඉගෙන ගෙනත් ඉවර එකේ බිස්නස් එකක් පුරුදු කරන්න මං බණ්ඩාරවෙල ගෙන්න ගත්තා..'

පොඩි මාමා කීවේ ළෙන්ගතු සෙනෙහෙබර හඬිනි.

'බිස්නස් නම් පිහිටන මූණක් තියෙන්නේ... පුංචි මහත්තයා වෙළඳම අල්ල ගනී..'

'ගහේ කටු උල් කරන්න ඕන නැහේ සේනවිරත්න මුදලාලි...'

පොඩි මාමා ලෝකයට මාව හඳුන්වා දෙන්නේ ඔහුගේම පුතා කියාය. එසේ හඳුන්වා දෙද්දී ඔහුගේ දෙනෙත් ආඩම්බරකමකින් දිලිසෙනු මට පෙනෙයි. ඊටත් වඩා ආඩම්බරයක් මගේ පපුවට දැනෙයි.

'දක්ක නේද... ඔය මිනිස්සුන්ට හොඳ ඉවක් තියෙනවා පුතේ.. ඒ මිනිස්සු දෙයක් කියන්නේ බොරුවට නෙමේ...'

වෙළෙන්දන් ගිය පසු පොඩි මාමා මගේ පිටට සුරත තබා කීවේය.





'මාත් වැඩේට ආසයි පොඩි මාමේ...'

'එච්චරයි පුතේ ඕන... ඔය සල්ලි වලින් හාර පන්දහක් අරගෙන උඹට කැමති දෙයක් ගිහින් ගනින්...'

'එච්චර වැඩියි පොඩි මාමේ.. මාත් තුන්දහක් විතර ගන්නම්...'

පොඩි මාමා වන්දනාට දුන්නේද ඒ ගණනය. එක එක දේවල් ගන්නට ආශාවක් එන නමුත් විශාල අවශ්‍යතාවයක් නම් නැත.

'හාරදහක් ගනින් පුතේ.. ටවුම වටේ රවුමක් ගහලා කැමති දෙයක් අරගෙන දවාලට කන්න ගෙදර යන්න...'

'මාමා දවාලට කන්නේ...'

'මං සල්ලි වගයක් බේරන්න වැලිමඩට යනවා... කෙල්ල දවල්ට උයලා ඇති.. කාලා හවස් වරුවේ මේ පැත්තේ වරෙන්.. කඩේ මං නැතත් සුමනවීර ඉන්නවා..'

මම මාමා දුන් රුපියල් හාර දහසත් සාක්කුවේ දමාගෙන පාරට බැස්සෙමි. මෘදු අව් රැල්ලක් නගරයට වැටී තිබුනද ඒ අව් රැල්ලේ තද රස්නයක් නැත.



www.sinhalaelibrary.com

# 09

ඇඳුම් ගන්නට කඩයට ගිය පසු මට අම්මාවත් තාත්තාවත් නංගීවත් සිහිවිය. අඩුම තරමේ මේ මුදලින් නංගීටවත් ඇඳුම් දෙකක් රැගෙන තබා ගත යුතුය. මම කමිස දෙකකුත් ජැකට් එකකුත් ගත්තෙමි. තවද වැඩි මුදලක් නොවූ පිරිමි සුවඳ විලවුන් බෝතලයක්ද ගත්තෙමි.

සාප්පුවේ ගැහැණු ඇඳුම් පැත්තට මා ගියේ නංගීට ඇඳුමක් තෝරා ගන්නටය.... කාන්තා ඇඳුම් තෝරා මට පුරුද්දක් තිබුණේ නැත. ඊටත් නංගීගේ සිරුරේ ප්‍රමාණය මට තිච්චි නැත.

කෙල්ලන්ට නම් ඇඳුම් ඕනා තරම් තිබුණි. ප්‍රශ්නය තේරීමය.

'මේ බ්ලවුස් එකේ මීඩියම් සයිස් එකක් දෙනවද...'





හදිස්සියේ ඇසුන පුරුදු කටහඬින් ගැස්සී මම පසුපස බැලුවෙමි. ලා කොළ පැහැයට හුරු සාය හැට්ටයක් අතේ තබාගෙන චන්දනා උන්නාය. ඇය මාව දැක පුදුමයෙන් සිනාසුනාය.

'ඇඳුම් ගන්න ආවද..'

මම ඇසුවෙමි. ඇය දෙනෙත් කුඩා කර හිස සැළුවාය... අලුත් ඇඳුම් අතර ගැවසී යුවතියගේ මුහුණේවත් අලුත් පාටක් වැටී තිබුණි...

'කාටද ලේඩිස් ඇඳුම් තෝරන්නේ...'

මා අතගාන්නේ ගැහැණු ඇඳුම් බව මට සිහිවූයේ එවිටය.. ගැහැණු ඇඳුම් තෝරන්නේ මගේ පෙම්වතියට යැයි ඇය සිතනවා විය යුතුය...

'නංගීට... ඔයා මොනවද ගන්නේ...'

'මේ...'

ඇය තෝරා තිබූ ඇඳුම් ලස්සනය... ඒවාවල වර්ණද දීප්තිමත්ය.

'මටත් ඇඳුම් දෙකක් තෝරලා දෙනවද... මට තේරුමක් නෑ...'

'එයාගේ ඇගේ සයිස් එක කොහොමද දන්නෑ...'

මම චන්දනාගේ වත දෙස බැලුවෙමි. මගේ දෙනෙත් ඒ වත පුරා යද්දී ඇය ලැජ්ජාවෙන් බිම බලා ගත්තාය... මගේ ඇස්වල තරක පාටක් තිබුනාදැයි මම නොදනිමි. එහෙත් මගේ හිතක නම් එවැන්නක් නැත. මා බැලුවේ ඇගේ වතත් නංගිගේ වතත් සසඳ බලන්නටය. නංගීට ඇත්තේද ඇගේ වැනිම මධ්‍යම ප්‍රමාණයේ සිරුරකි... ඕනානම් නංගීට වඩා චන්දනා ටිකක් උසය.



www.sinhalaelibrary.com

'ඔයාට වඩා චූටිවත් මිටියි... ඔයාගේ ඇහමයි...'

චන්දනා ඇඳුම් තෝරන්නට ගත්තාය. මම ඇගේ පසුපසින් වැටුනෙමි. මට බොරුවක් කිව නොහැක. මා ඇඳුම් තෝරන අතරවාරයේ ඇය දෙස හොරැහින් බලා උන්නෙමි...

'මේ පිනපෝ එක.. ඒක ලස්සන වෙයි... ගාණ නම් ටිකක් වැඩියි... මාත් ඉස්සෙල්ලා අරගෙන තිබ්බා...'

එය ඇය කියනා තරම්ම ගණන් නැත. රතුත් සුදුත් මිශ්‍ර කර මසා තිබූ ඒ අලංකාර පිනපෝ ගවුමේ මිල තියම කර තිබ්බේ රුපියල් හත්සිය පනහක් ලෙසය. කොළඹ තිම් ඇඳුම් සල්වල ඇඳුම් වල ගණන් සසඳද්දී මේ ගාණ වැඩි නැත.

චන්දනාද මේ පිනපෝ ගවුමට ආශා කරන්නීය... අහිංසක යුවතියට ඇඳුමක් වෙනුවෙන් එතරම් මුදලක් වැය කරන්නට නොහැක. නංගී මේ ඇඳුම ඇඳ ලබන සතුට ඇයටද විඳින්නට දිය හැකි නම්... මගේ සිත මහා දයාවකින් ඉතිරී ගියේය.

'ඇ..යි හොඳ නැ..ද්..ද...'

මම කල්පනාවට වැටෙද්දී චන්දනා ඇසුවාය.

'නෑ.. නෑ.. ඒක හරි ලස්සනයි... නංගී හරි ආසයි පිනපෝ වලට...'

'එ..යා ලූස් හොයාද දන්නේ...'

චන්දනා ඇසුවාය. මට සිනා ගියේය.

'ටි..ක..ක් එයාට ලූස් තමා...'

මම කීවෙමි. චන්දනා අතින් කට වසාගෙන සිනාසුනාය.

'නෑ.. පිනපෝ ගවුමට ලූස් හොයා දලා ලස්සනයි.. මධුරි දන්නේ...'

'කවුද මධුරි...'



www.sinhalaelibrary.com



'අර හින්දි පිල්ම් වල ඉන්නේ...'

කෙල්ලෝ ඔක්කොම එකය. ඔවුන්ගේ ලෝකයේ ඇත්තේ අහිංසක බොළඳ සිහිනය. ඒ තරමටම ඒ සිහින අහිංසකය.

මම දෙවරක් නොහිතා පිනපෝ ගවුම් දෙකක්ම ගත්තෙමි. චන්දනා පුදුමයෙන් බැලුවාය.

'ඇ..යි දෙකක්...'

සිනාසුනා මිසක මම කිසිවක් නොකීවෙමි.

'ඔයා ඇඳුම් අරගෙන ඉවරද...'

පසුපසට හැරී මම ඇසුවෙමි.

'ඔව්...'

චන්දනාට කවුන්ටරයට යන්නට ඉඩදී මම පසුපසට උනෙමි. කෙල්ල දන් හිතන්නේ පිනපෝ දෙක ගැනය. මා මෝඩයෙක් යැයි ඇය සිතනවා විය යුතුය. හොඳම ඇඳුමක් වුව දෙකක් ගන්නේ නැත. අරගෙන වැඩක් නැත.

ඇය ඇඳුම් ගොඩක් ගෙන නැත. අතට මුදලක් ලැබුණ කල ඒ සියල්ලගෙන්ම ඇඳුම් ගන්නට තරම් ඇයට වත්කමක් නැත. පියවා ගත යුතු තවත් අවශ්‍යතා රැසක් ඇයට තිබෙන්නට පුළුවන.

මම බිල්පත් ගෙවන තුරු චන්දනා සාප්පුවෙන් පිටත කොරිඩෝවට වී බලා උන්නාය. මම බිල ගෙවන අතරවාරයේදී කළු වීදුරුවෙන් එපිට වූ ඇගේ මුහුණ දෙස මොහොතක් බලා උන්නෙමි.

'මේක වෙනම දලා දෙනවද..'

එක පිනපෝ ගවුමක් පෙන්වා මම කීවෙමි. සේවකයා එය වෙනත් බෑගයක දමා දුන්නේය. මම අලංකාර කළ රතු පොලිතින් බෑග් තුනද රැගෙන එළියට ආවෙමි.

'ඇඳුම් ටික දෙන්න... මං ගෙදර ගිහින් කියන්නම්...'

එළියට ආ පසු වන්දනා කීවාය. මම එක් පිනපෝ ගවුමක් දැමූ බෑගය සුරකට ගත්තෙමි.

'මුකුත් හිතන්නෙපා... මේක මං ගන්නේ ඔ..යා..ට ආ...'

මම පිනපෝ ගවුම ඇයට පෑවෙමි. අසරණ යුවතියගේ දෑස් වල මා බලාපොරොත්තු නොවූ ලෙස කඳුළු පිරුණි. ඒවා දෙකම්මුල් වලට වැටේවි යැයි මම බිය උනෙමි.

'ඇ..යි අඬන්නේ... මං හොඳ හිතින් දෙන්නේ.. මගේ නංගිට දෙනව වගේ...'

ඇය තොල් පට තද කර බැලුවාය... ගවුම ඇය නොගනීවියැයි මට බියක් දැනුණි.

'ආ.. ඉතින් ගන්න... මිනිස්සු බලන් ඉන්නවා...'

දෑස් පිසද ඇය පිනපෝ ගවුම අතට ගත්තාය. මට සැනසුම් සුසුමක් පිට විය.

'ම..ට පින් කියලා විතරක් කියන්න පුළුවන්...'

වන්දනා බිඳුණ හඬින් කීවාය.

'මං ඉස්සරහ එහෙම කතා කරන්නෙපා... මට පින් දෙන්න ඔයා කිරි අම්ම කෙනෙක් නෙමෙනේ... ආ.. ඇඳුම් ඔක්කොම ටික ඔයා එහෙනම් අරන් යන්න...'

මම සියළු පාර්සල් ඇය අතට දුන්නෙමි.

'දවල්ට බත් කන්න එනව නේද...'

'ඔ..ව්...'

'එහෙනම් යන්නං...'

ඇඳුම් බෑග් සියල්ලම පපුවට තුරුල් කරගෙන යුවතිය





ගියේ ඇගී සිනාවක් තොල් පට මත ඇඳගෙනය... කෙල්ලගේ පපුවට මොනා මොනාවද වෙන්නේය. තේරුමක් නැත.

බණ්ඩාරවෙල නගරය පුරා මම මගේ ඇවිද්දෙමි. ඒ අතරවාරයේදී වන්දනා මගේ හදවත පුරා සැරිසරමින් උන්නාය.

කෙල්ලෙක් ගැන හිතන්නට විශේෂත්වයක් අවශ්‍යම දැයි මම නොදනිමි. අනික් අතට කෙල්ලෙක් ගැන සිතීම පවක් දැයි මම නොදනිමි. මුස්ලිම් යුවතියක් සම්බන්ධකර එසේ සිතීම පවා ඉස්ලාම් ආගමට අනුකූලව පාපයකි. මුස්ලිම් යුවතියකටද අන් ජාතියක අන් ආගමක තරුණයෙකු ගැන සිතීම පාපයකි.

හිතෙනා හිතට වැටකඩොළු බඳින්නට මම නොහිතුවෙමි. මොනාවවත් හිතන්නට නැති හිත එහෙම දෙයක් ගැන අහිංසකව හිතා සතුටු වනවානම් එහි ඇති වරද කුමක්ද...

මද්දහන හිරු මඩල බණ්ඩාරවෙල නගරයට ඉහළින් මුදුන් වී තිබුණි. අව්ව වැටුණද කොළුම මද්දහන සැරම නිතියම් නැත. ගෙදර යන්නට තවම බඩගින්නක්ද නැත. වන්දනා ගෙදර ගොස් පිනපෝ එක ඇඳ හැඩ බලන්නට ඇතැයි මට සිතුණි. කෙල්ලන් එහෙමය. අලුත් ඇඳුමක් ගෙනා පසු නාගී එය ගෙනා මොහොතේම ඇඳ කණ්ණාඩිය ඉදිරිපිටට වී ඩාන්ස් කරයි. එහාට කැරකෙයි... මෙහාට කැරකෙයි...

කෙල්ලෙකු වී ඉපදුනා නම් හොඳ යැයි මට නිතරම සිතුණි. එවිට ගෙදරට වී මොනවා හෝ පුංචි දෙයකින් සැනසී ජීවත් වන්නට තිබුණි. පිරිමි ආත්මයක දුක වැඩිය... බරද වැඩිය...

නගරය වටා රවුම් දෙක තුනක් ගසා පත්තර කඩයෙන් පත්තර දෙක තුනක්ද ගෙන මම ගෙදර ආවෙමි. සැතපුම් තුනක් පමණ මම ඇවිද්දෙමි. එහෙත් ගතට විශේෂ මහන්සියක් නැත.

වන්දනා පෙනෙන්නට වත් නැත. මම කාමරයට ගොස්

සීතල වතුරින්ම නෑවෙමි. වතුමෙන් ගෙනා සන්සිල්ක් බිත්තර ඇඹුලු බෝතලයෙන් බාගයක්ම මම හිසට ද නෑවෙමි. සුවඳ ඇඹුලු පෙණ සේදී යද්දී සිතට එන්නේ අමුතුම සතුටකි.

මට ගෙදර ජම්බු ගසේ බටය සිහිවිය... මෙහේ එහෙම නැත... පීලි ඇත... එහෙත් පීල්ලකට හිස අල්ලා නෑම හිතනා තරම් ලේසි නැත.

නාගෙන අලුත් සරමකුත් කමිසයකුත් ඇඳ එළියට එද්දී නම් සැහෙන බඩගින්නක් මට විය. දොරකඩට ආ මංව දක ඇත එමින් උන් වන්දනා ගමන ඉක්මන් කළාය.

මේ දුප්පත් කෙල්ල මිනාවට වඩා මට බය වීම ගැන මගේ දුකට හේතුවිය. ඇය හිතනා තරම් මම මහාවංශයේ කොල්ලෙක් නොවූනෙමි.

'අ...නේ චූට්ටක් පරක්කු උනා...'

හොඳි මාළු බෙදූ කුඩා ඇලුමිනියම් බාස්කට් එක රැගෙන එමින් ඇය කීවාය. ඉස්සර අප පන්සලට දනය රැගෙන යන්නේද මේ භාජන වර්ගයේම ලොකු ප්‍රමාණයේ ඒවාවලය.

'මං විතරනේ... පිහානට බෙදන් එන්න තිබ්බා...'

ඇය මේසය අස්කර ඒ මත හොඳි මාළු තබද්දී මම කීවෙමි.

'එහෙම කන්න බෑ... මදිපාඩු බෙදාගන්නෝනානේ...'

'වන්දනා කෑවද...'

ඇය බත් ගෙනා කුඩා වීදුරු බෝල් එක හොඳි මාළු දීසි මැද තබා සිනාසුනාය.

'ප...ස්...සෙ කනවා...'

'පිහානේ එක ඇදිලා බැලුවද...'

සුවසිය තොල් පට මුව තුළට ගත්තාය. ඒ සිනහව





සඟවාගන්නටය.

'ලස්සනයි... වැඩට අඳින්න අරන් තිබ්බා...'

කෑම ටික දක බඩගින්න දෙගුණ විය.

'හිමින් කන්න... තව ගෝවා කොළ මැල්ලුමක් තියෙනවා මං අරගෙන එන්නම්...'

වීදුරුවට වතුර එකක්ද පුරවා මං අසල තබා වන්දනා ගියාය... මිනාවට වඩා මේ කෙල්ලගෙන් වැඩකාර කම් ගන්නට මට ලෝබ හිතුණි. දෛවය විසින් ජීවිතයක් පහතටම දමූ කල ඒ ජීවිතය තවත් අසුරාදමිය යුතුද... මනුස්සකම පිළිබඳ සිහින් වේදනාවක් මං තුළ විය.

කිරි මාළුවක්... සෝයා මීට් බැදුමක්... අඹ මාළුවක් සමඟ බත් විය. ඇය කියූ නිසාම මම හෙමින් කෑවෙමි. එය අසීරු කටයුත්තක් විය. මට හෙමින් කා පුරුද්දක් නැත.

'දු...න් බෑ...වේ...'

වන්දනා ආවේ උණු උණු ගෝවා මැල්ලුමක්ද සමඟය. මම ඉන් බාගයක්ම දමා ගත්තෙමි. ගෝවා මැල්ලුම මේ තරම් රස යැයි මම නොදත උන්නෙමි.

'බඩගින්නේ නේද... හිමින් කන්න...'

මං එසේ කීවේ ඇයව යවන අදහසින් නොවේ.

'ක...ම...ක් නෑ...'

වන්දනා විනාඩියකට නතර වූවාය. මං කද්දී ළඟ සිටීම ඇගේ යුතුකම යැයි ඇය සිතනවා විය යුතුය.

'බණ්ඩාරවෙල වෙන කව්රුත් නැද්ද...'

'අජේද...'

'ඔව්...'



www.sinhalaelibrary.com

ඇය නැතැයි කියන්නට මෙන් හිස දෙපසට වැනුවාය.

'ආච්චිට මං ඉන්නවා... මට ආච්චි ඉන්නවා...'

'ආච්චිට ඔයා විතරයි තමා... ඒත් ඔයාට තව කවුරුහරි ඇතිනේ...'

මම සිනාසෙමින් ඇසුවෙමි. ඇගේ මූහුණ තුනී පැහැපත් පාටකින් විකසිත විය.

'මෙහෙම හොඳයි...'

චන්දනා කීවාය. මම තව ගෝවා හැන්දක් බෙදාගනිමින් නෙත් එසවීමි.

'කොහොමද...'

'තනියම...'

'ආච්චි හැමදාම ඉන්නෑනේ...'

ඒ ප්‍රශ්නය මා ඇසුවේ ඇයි... දුප්පත් කෙල්ලව මා අසරණ කළා යැයි සිතී මම පසුතැවුනෙමි.

'කා...ලා ඔ...හො...ම තියන්න... මං පස්සේ ඇවිත් අස් කරන්නම්...'

චන්දනා හැරුනේ දෙනෙතට පිරුණු කඳුළු මගෙන් සඟවාගනු පිණිසය. එහෙත් ඒවා මම දුටුවෙමි. මගේ මෝඩකම ගැන මම තැවුනෙමි. පුංචි ලී පතුරක් අල්ලාගෙන මහ සයුර මැද ඉන්න එකියකගෙන් 'ලී පතුරත් නැති උනොත් ඔයා මොනවද කරන්නේ කියලා ඇසිය හැකිද... මා ඇසුවේ එවන් ප්‍රශ්නයකි.

එතනින් එහා කෑම තවතා මම බත් ගෙනා භාජන සියල්ල සෝද තවා තැබුවෙමි. ජීවිතය ගැන තවමත් මට අත්දැකීම් නැතැයි මට සිතෙයි...



www.sinhalaelibrary

sl-unlimited.com

www.sinhalaelibrar

# 10

සිවස් වනතුරු මා උන්නේ අමාරුවෙනි. වෙනද ඇය හවස තේ හදන්නට එන්නීය. මම ඇය එනතුරා බලා උන්නෙමි. නැත... ඇය ආවේ නැත...

හැන්දෑවේ හතරට පමණ මම මාමාගේ කඩයට යන්නට ඇඳගෙන භාජන ටිකද රැගෙන කුඩා දෙබැවෙන් චන්දනාගේ නිවසට ගියෙමි.

නිවස පාළුය.

'චන්දනා...'

මම කෑ ගැසුවෙමි. ඇය ගෙතුළ සිට කුඩා සාලේ කෑල්ලට ආවේ එවිටය. අසනීප වූ බවක් ඒ මුහුණේ විය.

'මේ හාජන ටික දීලා යන්න ආවේ... මං වවුමට යනවා...'

ශෝකීපසුතැවීමක් ඒ මුහුණේ විය.

'අ...නේ ඇයි සෝදලා ගෙනාවේ... එහෙමම තියන්න තිබ්බනේ...'

'ඇ...යි සනීප නැද්ද...'

'මළව රිදෙන්න අරන් ටිකක් ඇලවෙලා උන්නා... නේ බිලත් නෑ නේද...'

'ඒකට ගාණක් නෑ...'

මම යන්නට හැරී තිවෙමි.

'විනාඩියකින් මං තේ හදන්නම්...'

'ඇයි මළුවේ කැක්කුම ආවේ දවල් මං කිව්ව එකටද...'

ඇය බිම බලාගත්තාය.

'ඒක කියන්න ඕන නෑ... හැම වෙලාවෙම හිතෙනවා...'

'අපි හැමෝම කවදාහරි තනිවෙනවා... ඒ වෙද්දී තව හොඳ කෙනෙක් හම්බ වෙලා ඉඳීයි... මං යනවා...'

'නේ...'

'මං වවුමෙන් බොන්නම්...'

යන්නට හැරී මම යළිත් ඒ තුවන් දෙස බැලුවෙමි. චන්දනා දිප්තිමත් ඇස් වලින් සිනාසුනාය. මමද අහිතකින් තොරව සිනාසුනෙමි. සුවඳක් දැනී මම නතර උනෙමි.

'ඇයි මිදුල මෙච්චර සුවඳ...'

මම ඇසුවෙමි.

'පැට දිගටම දසමන් පිපිලනේ... ඒකයි...'

මිදුලේ වූ දසමන් මලක් කඩාගෙන මම නහයට තබා





ගත්තෙමි. ඒ සුවඳ අහිංසක ලෙස පපුවේ තැන්පත් විය.

ටික දුරක් ගිය පසු යළිත් හැරෙන්නට මට සිතුනි. ඒ හැඟීම මම අමාරුවෙන් මැඩ ගත්තෙමි...

අම්මාත් තාත්තාත් නංගීත් බණ්ඩාරවෙල ආවේ ඉරිද දවල්ය... තද අව්වකුත් වැස්සකුත් නොවූයෙන් බණ්ඩාරවෙල අවට පරිසරය පැහැබර විය...

මාව දකිද්දී අම්මාගේත් නංගීගේත් ඇස්වල කඳුළු පිරෙනු මම ඇතදීම දුටුවෙමි... මම මිදුල මැදදීම අම්මාටත් තාත්තාටත් දණ ඔබා වැන්දෙමි.

'බණ්ඩාරවෙලට ඇවිත් සති දෙකයි... අයියා ඒ විකට ලස්සන වෙලා නේද අම්මේ...'

නංගී මගේ වතට බරවී කීවාය. මම ඇගේ කරට අතක් දමා ඇගේ ගෙල මිරිකා ගත්තෙමි.

'මල්ලි මෙච්චර ලස්සන ශේක ඉන්නවා කියලා මං හිතුවේ නෑ...'

අම්මා පොඩි මාමා දෙස බලා කීවාය.

'අලුත් ගේනේ අක්කේ... ගේ ලස්සන උනාට ගේ පිරුනේ පොඩි එකා ආවට පස්සේ...'

'මෙහේ පිරිලා... එහේ පාළුවට ගිහිල්ලා...'

අම්මා මා දෙස බලා කීවේ සංවේගයෙනි.

'ඒකට කමක් නෑ... ලොකු පුතා මෙහෙට වෙලා ඉන්න...'

තාත්තා අම්මාගේ කතාව ගණන් නොගනිමින් කීවේය.

'තාමත් මළව අවුල් කරගෙනද ඉන්නේ ලොකු පුතේ...'

අම්මා ගෙට ගොඩවී රහසින් මෙන් ඇසුවාය. මම ලැජ්ජාවෙන් බිම බලාගත්තෙමි.



www.sinhalaelibrary.com

'එහෙම නෑ අම්මේ.. මෙහේ නිස්කලංකයි...'

අම්මාත් තාත්තාත් පොඩි මාමාත් කතාවට වැටුණොත් මම නංගීවත් ඇදගෙන මගේ කාමරයට ගියෙමි.

'හා... මෙයා මෙහේ ඇවිත් සැප ගන්නවා... මටත් හිතෙනවා නවතින්න ඇත්තම කියලා...'

නංගී මගේ ඇඳේ ඇලවී කීවාය... මම ඇය වෙනුවෙන් වන්දනාව කියා තෝරාගත් ඇඳුම් දෙක ඇය අත තැබුවෙමි.

'අ...නේ හරි ලස්සනයි... අයියද තෝරුවේ...'

මමත් හිසින් හොකීවෙමි.

'ඊයා පව්.. ගෙදර ඉද්දී මට හරියට මතක් වෙනවා... කාමරේට ගියාම පපුව පිච්චිලා යනවා...'

නංගී හඬමින් කීවාය.

'මේ සතියේ විතරයි... ඊට පස්සේ මම හැම වීක්එන්ඩ් එකකම එනවා...'

නංගී හිස ඔසවා දයාබර ලෙස සිනාසුනාය. ඇය මොනවදෝ කියන්නට තටමන්නීය..

'ශ..හී...නා බැ...න්...ද...'

පපුවට ඇන තිබූ ගල් ඉත්තක් එකවර උගුල්ලා ගනිද්දී ඇතිවන කම්පනය... වේදනාව නංගිගේ කතාවෙන් මම අත් විඳ්දෙමි. මොහොතක් යනතුරු මම කතා බහකින් තොරව උන්නෙමි.

'වෙඩින් එකට දවස් දෙකකට කලින් රෑ ඇවිත් මා එක්ක ගොඩක් වෙලා කතා කළා... ඔයාට දෙන්න කියලා ලියුමකුත් දුන්නා...'

එසේ කියූ නංගී බියපත් දෙනෙතින් බැලුවාය. ඇගේ





ලිපියක් නැවත බලන්නට මට අවශ්‍යතාවයක් නොවීය. මිහිදන් කළ ආදරයක් හාරා නැවත ගොඩ දමූ කල දුකද මට පමණය.

'මං ඒ...ක පු...ච්...ච...ලා ද...ම්...මා ක...ම...ක් නැ...තේ...ද...'

නංගී මට වඩා බුද්ධිමත්ය... ඒ ලිපිය ඇය බණ්ඩාරවෙල රැගෙන ආවානම් නිකමටවත් මට කියවෙන්නට තිබුණි. ඉන්පසු හදවත පුරා ඇතිවන වේදනා ගිනිදල් නිවන්නට මා අසල කිසිවෙකු නැත.

'ඕ...ව් ඔයා එහෙම කරපු එක හොඳයි... මං පිටකොටුවෙන් බණ්ඩාරවෙල බස් එකට නගිද්දී ගොඩක් දේවල් අමතක කරලා දම්මා නංගී...'

මම මිලටගත් පර්ෆියුම් බෝතලයක් ගෙන නංගී නාස් පුඩු වලට තබා එහි සුවඳ විඳගත්තාය...

'ශහීනා ගැන වැරැද්දක් කියනවා නෙමේ... ඒ...ත් අයියේ අ...මා...රු වෙලාවක එහෙම දලා යන කෙල්ලෙක් ගැන ජීවිතේට විශ්වාසෙ තියන්නෙපා... නැහි නැති ඔයත් එක්ක එන ගෑණියෙක් ගැන විශ්වාසෙ තියන්න... අ...හි...ං...ස...ක සිංහල කෙල්ලෙක්...'

මොකක්දෝ හේතුවකට මට වන්දනාව සිහිවිය... අද ඇයට වැඩ වැඩිය... පොඩි මාමා අම්මලාවත් එක්කම උයන්නට ඊයේම ඇයට මිඩරය දුන්නාය...

'අයියට හරි ලස්සන හිනාවක් ගියා...'

නංගී අසළදී බොරු කිරීම අමාරුය. ඇස්පිල්ලමක් වැරදී ගැහුවද ඇය එය බලාගෙන ඉඳී.



www.sinhalaelibrary.com

'ඔයාට හීතලයි නේද... මං ස්වීටරයක් දෙන්නද...'

නංගී තවත් යමක් අසනැයි කියෙන් මම කීවෙමි...

අල්මාරියෙන් මගේ ස්වීටරයක් ගෙන මම නංගී මතට දැමුවෙමි... නිතර දකින නංගීට වඩා අද දකින නංගී ලස්සනය...

'නාලා මං මේක ඇඳගෙනම ස්වීටරේ අඳින්නම්... ලස්සන පිනිපෝ එක... අයියමද අයියේ තේරුවේ...'

එකම ප්‍රශ්නය නංගී දෙවෙනි වරටත් ඇසුවාය... චන්දනා මේ පිනිපෝ ගවුමට පැලෙන්නට ගියේ ඇයි දැයි මම දන් දනිමි...

'මං නෙමේ තේරුවේ... වෙන කෙනෙක්...'

'ක...වු...ද...'

මම නංගීට චන්දනා ගැන කීවෙමි... මගේ හිතේ හොරයක් නැත... අතීතයේ මගේ ජීවිතයේ දුක්බර දේවල් මම නංගී සමඟ කියා ඇත්තෙමි... මගේ හිත හදන්නට මටත් වඩා ඇය දුක් වින්දය... එවන් වූ ඇයට පුංචි දෙයක්වත් සඟවන්නට මට ඕනාකමක් නැත.

'දුප්පත් ළමයෙක්... මං එයාටත් මේ ගවුමම අරන් දුන්නා...'

අවංක සතුටකින් මම කීවෙමි.

'මටත් ආසයි අයියේ ඒ ළමයව බලන්න...'

'දැන් තේ අරගෙන එයි... යන්...'

නංගීත් මමත් සාලයට ආවෙමු.

'ඕනනම් පොඩි කෙල්ල බන්දලා දෙමු... මං වෙඩින් එක ගන්නම්...'

පොඩි මාමා නංගීව දැක කීවේය... නංගී බියපත්ව ඇස්





ලොකුකර ගත්තාය...

'මං බඳින්නේ අයියා බැන්දට පස්සේ... නේද අම්මේ...'

දැන් සියල්ලන්ගේම ඇස් මා වෙතය.

'ලොක්කා බඳින්නෑ කියන්නේ...'

මම ඔළුව කසමින් පැමිණ අම්මා ඉඳගෙන උන් පුටුවේ පුටු ඇන්දට බර වීමි.

'කොහොමත් එයා තව අවුරුදු පහ හයක් ඔහොම ඉඳපුවාවේ... නාම විස්සනේ...'

'විස්ස උනාට කමක් නෑ... හොඳ කෙල්ලෙක් හම්බ උනොත් බන්දලා දෙමු...'

පොඩි මාමා තාත්තා දෙසද බලා කීවේය... තාත්තා යමක් කියන්නට ගිය නමුදු ඉදිරිපස දොරෙන් තේද රැගෙන චන්දනා එබුනාය... ඇස් හය හතක් එකවර අහිංසක කෙල්ලගේ මුහුණට එල්ල විය... චන්දනා එකම එක වරක් පමණක් සිනාසී බිම බලා ගත්තාය...

අම්මා මා දෙස බලනු මම හොරැහින් දුටුවෙමි... චන්දනාගේ පැමිණීමෙන් අපහසුතාවයට පත්වූයේ මාය...

ඇය වැලි තලපත් ආනමාලුත් පිරවූ ට්‍රේ එකක් ටීපෝව මත තබා නිහඬවම කුස්සියට ගියාය... මොහොතකට කලින් ඇය දිය නාන්නට ඇත... ඒ සුවඳ සබන් සුවඳ සාලය පුරාම මොහොතකට විසිරිණි... ඊට වඩා වේගයෙන් මගේ සිතුවිලි විසිරිණි...

'අපට උයලා දෙන්නේ මේ කෙල්ල... මේ පල්ලෙහා ගෙදර ඉන්නේ... අහිංසක කෙල්ලෙක්...'

පොඩි මාමා පැහැදිලි කළේය... නංගී මා දෙස බලා තොල්පට ඇදකරනු මට පෙනිණ... ඇගේ කටකාරකමට මා

චන්ද්‍රාට ගවුමක් අරගෙන දුන් බව ඇය මෙතන කියතැයි මම බිය උනෙමි..

යළිත් චන්ද්‍රා සාලයට රිංගුවාය.. එවරද සියල්ලන් ඇය දෙස බැලුවෝය... අපහසුතාවයට පත්වන්නේ ඇය නමුදු අසරණ වන්නේ මය.

'ජයදේව අන්කල්.. කෝපි හදන්නද... කිරි හදන්නද...'

සීතල වැඩිය.. කෝපි හදන්න යැයි කියන්නට සිතුණ නමුදු මම ඇයට වැඩියෙන් නොදන්නා ගාණට උන්නෙමි...

'කෝපි හොඳයි පුතේ.. තව ටිකකින් බතුත් කනවනේ...'

ඇය කුස්සිය දෙසට යද්දී මම මගේ දෙනෙත් අමාරුවෙන් පාලනය කර ගත්තෙමි..

'සාහේ හරි ලස්සන දරුවෙක්..'

අම්මා පුටු පත්තේ ඉඳගෙන උන් මගේ දෙපා මතට පුරත දමා කීවාය..

'අපිත් යන් අයියේ කුස්සිය පැත්තට..'

නංගී මාව එක්කර ගත්තාය... අපි යද්දී චන්ද්‍රා කෝපි හදමින් උන්නාය... ඇය නංගී සමඟ ලෙංගතුකමක් නැතුව සිනාසුනාය... මුල් පළවෙනි දවසෙ චන්ද්‍රා මා සමඟවත් එතරම් පුරුදු ලෙස සිනාසුනේ නැත...

'මේ මගේ නංගී..'

මම චන්ද්‍රාට නංගිව හඳුන්වා දුන්නෙමි.

'ඔයාට තැන්ක්ස් මට ලස්සන ඇඳුමක් තෝරලා දීමට..'

චන්ද්‍රා පුදුමයෙන් බැලුවාය... මා එය නංගීට කියතැයි ඇය නොසිතන්නට ඇත...





'තව වැලි තලප කැල්ලක් ගෙනත් දෙන්නද...'

'එපා ළමයෝ මම කෑවා... චන්ද්‍රා මේ පාරද ඒලෙවල් කරන්නේ..'

නංගී ඇසුවාය... චන්ද්‍රා අසරණ දෙනෙතින් මා දෙස බැලුවාය.

'මං ඕලෙවල් අරගෙන ගෙදර නැවතුනා...'

ඇගේ තව අවංක කමේත් දුප්පත් කමේත් ඒ සියල්ලටම වඩා නිරහංකාර බවේත් සැඟු ප්‍රකාශයක් විය... නංගී සියල්ල තේරුම් ගන්නට ඇත...

'අපෝ... ඔයා එහෙනම් ගොඩ... මේ ඒ ලෙවල් කිරිල්ල මටත් එපා වෙලා අයියෝ... ගෙදර ඉන්න බැරි නිසා යනවා.. වා...සා...ය...ක්...නේ...'

චන්ද්‍රා තේ කෝප්ප සියල්ලම ට්‍රේ එක මත තබා එය ගේනට ගත්තාය.

'අපේ තේ දෙක මෙතනින් තියලා යන්න... අපට අල්ලන්න ඕන නෑ...'

නංගීටද ඇත්තේ මගේ ගතිගුණමය... දුප්පත් අයගෙන් වැඩකාරකම් කර ගන්නට ඇයටද හිතක් නැත... චන්ද්‍රා තේත් රැගෙන සාලයට ගිය පසු නංගී බැලුවේ මා දෙසය...

'හරි හොඳ ළමයෙක් නේද...'

'ඔයාට එහෙම හිතෙනවද...'

'ම්... දුප්පත් කියලා නෑ අයියේ කෙල්ලන්ගේ හරි මළව... මේ කෙල්ල එහෙම නෑ...'

'මටත් එහෙම හිතෙනවා...'

මම අවංකව කීවෙමි. නංගී චන්ද්‍රා මේසය මත තබා

ගිය කෝපි එක අතට ගත්තාය.

'අයියා ආදරේ කරන්න තිබ්බේ මේ වගේ අහිංසක සිංහල කෙල්ලෙක්ට...'

මම නංගිගේ කතාවට පිළිතුරු නොදුන්නෙමි. අතීතයේ සිදු වූ දේවල් සිදු නොවුනා නම් කියා සිතිය හැකිදැයි මම නොදනිමි. ශනීතාට මා ආදරය නොකළානම් මම කිසිම දිනයක මේ බණ්ඩාරවෙල නවතින්නට නොඑමි. සියල්ල සිදුවන්නේ දෛවය විසින් යැයි අද මට සිතෙයි.

'අ...යි...යේ...'

නංගී කතා කරන්නේ තෙපරබාමිනි. කඳුකරයට ආපසු ඇගේ මුහුණ තවත් පියකරු විය.

'ඇයි නංගී...'

'ආස නැද්ද ආදරේ කරන්න... දැන් අන්දකීමුත් තියෙනවනේ... ශනීතා වගේ කඩාගන්න බැරි මලකට නෙමේ...'

මම උළුවස්සට බරවී පහළ නිම්නයේ ගෝවා ගස්වල පිපී තිබූ ලා කොළ පැහැගත් ගෝවා මල් දෙස බලා උන්නෙමි.

'නංගි කැමතිද ආයේ මම දුක් විඳිනවට...'

මගේ ප්‍රශ්නයට නංගී සිනාසුනාය.

'ආදරේ කරන කරන පාරට දුක් විඳින්න ඕන කියලා කවුද අයියට කිව්වේ...'

'ගොඩක් කෙල්ලන්ගේ හිතේ තියෙන අහිංසකකම පප්පුවේ නෑ... මම...'

කියන්නට ගිය දේ මට ගිලුනේ චන්දනා කුස්සියට ආ නිසාය. මට හැමදාම වෙන්නේ මේ වාගේම ඒවාය... ඇය දැස් ලොකුකර බිම බලාගත්තාය... සමහර විට මම මේ කතාව ඇය





එන නිසා නවතා දැමූ යැයි එවිට කෙල්ල සිතනු ඇත.

ඇය නිහඬවම තේ සෑදූ භාජන සෝදා තැබුවාය. යද්දිට වඩා කෙල්ලගේ මුහුණ අමුතුය.

'මේ තේක තිවෙනවනේ...'

චන්දනා කීවේ මා දෙස බලාය... මම ඇය දෙස සමාව ඉල්ලන බැල්මක් හෙලා කෝපි කෝප්පය අතට ගත්තෙමි.

'පෙයාර්ස් තියෙනවා... කඩලා ගෙනත් දෙන්නද... හරි රසයි...'

චන්දනා කීවේ නංගීටය. ඇගේ වත්තේ පෙයාර්ස් ගසක් තිබෙනා බවවත් මම නොදනිමි... මේ තරම් ඉඳ ඇය මට පෙයාර්ස් කඩා නොදුන්නේ ඇයි...

'අනේ දෙන්නකෝ... කෝ ගහ...'

'අපේ ගේ පිටිපස්සේ තියෙන්නේ...'

'මාත් එන්නද කඩන්න...'

චන්දනාගේ සුරතින් අල්ලාගත් නංගී ඇයත් සමඟම මිදුලට බැස පහළට ගියාය. මට මහා පාළුවක් දැනුණි. බොහෝ දුරක් ගිය පසු යුවතියන් දෙදෙනාම සිනාසෙමින් පසුපස බැලුවෝය.

මම දෙදෙනාටම විරුත්තුවෙමි. නංගී දිව දික් කළාය... ඇයවත් බණ්ඩාරවෙල නවත්වා ගන්නට ඇත්නම් යැයි මට සිතුණි.

අම්මා ජ්වරය දමාගෙන මිදුලට බැස්සාය. ඇයද මොහොතක් නැවතී නංගීත් චන්දනාත් යන මඟ බලා උන්නාය.

මම ඔවුන්ගෙන් දෙනෙත් ගෙන අම්මා දෙස බැලුවෙමි. අම්මා සිනාසුනේ මෘදුවය... පසුගිය කාලයේ සමහර ප්‍රශ්න ඇතිවන්නට පෙර ඇය සිනාසුනේ මෙලෙසිනි...



www.sinhalaelibrary.com

'බණ්ඩාරවෙල ආපු විකට පුතා පාට වැටිලා...'

අම්මා කියද්දී මම ලැජ්ජාවෙන් චිරිත්තුවෙමි.

'වෙලාවට කෑම ටික කනවද...'

'ඔව් අම්මේ...'

'මේ පොඩි කෙල්ල උයන කෑම රහද...'

එවර නම් මගේ දෙතොල් එසවිණ.

'රසයි...'

'කෙල්ල දක්කහම මටත් ආස හිතුනා...'

අම්මා මෙලෙස කීවේ ඇයව දුටු විට මටත් ආස හිතෙනවා බව දන්නවාක් මෙනි.

'ගම්වල ළමයිනේ... කැලිලා පොඩිවෙලා නෑ...'

මම කෝකටත් බේරෙන පිළිතුරක් දුන්නෙමි... දෙමව්පියන් සමඟ කෙල්ලක් ගැන කතා කිරීම සංදේශ් නවතා දමා ඇත...

'ඒ දරුවගේ අම්මයි තාත්තයි මොනවද කරන්නේ...'

අම්මා ඇසුවේ ඇගේ ජීවිතය පිළිබඳ දුක්බර පැත්තය.

'ඒ ළමයගේ අම්මයි තාත්තයි නෑ... ආච්චියි මේ කෙල්ලයි ඉන්නේ...'

අම්මාගේ දස් අනුකම්පාවෙන් බර විය. ඇය වැනි යුවතියක් එවැනි දෛවයේ රුදුරු ඉරණමකට ගොදුරු වී ඇතැයි සිතීම පවා අපහසුය. චන්දනාව දුටු මුල්ම මොහොතේ මටද සිතුනේ එහෙමය.

'අම්මා ඇඟ හෝදන්නේ නෑ...'

'වතුර සීතලයිනේ පුතා...'

'මං අම්මට ඇඟ හෝදගන්න ටබ් එකට උණුවතුර ටිකක්





පුරවලා දෙන්නද...'

'මට ඒ කරාම තේරෙන්නේ නෑ පුතේ...'

උණුවතුර කරාමයත් ඇල්වතුර කරාමයත් තිබුනේ එක ළඟය... උණුවතුර කරාමයේ පුංචි රතු ඩොට් එකක් ඇත... ඇල් වතුර කරාමයේ උඩ තිල් ඩොට් එකක් ඇත. මමද එය සොයාගත්තේ බණ්ඩාරවෙල ආපසුවය.

මම අම්මාටත් තාත්තාටත් නාන්නට සෑහෙන්නට ටබ් එක මුදු රස්නය ඇති වතුරින් පිරවූයෙමි.

'අම්මයි තාත්තයි නාන්න... මං ටබ් එක පිරෙව්වා...'

අම්මාත් තාත්තාත් දෙදෙනාම මා දෙස බැලුවේ ආදරයෙනි.

'ලොකු පුතා බණ්ඩාරවෙලට සිත්න වෙයි වගේ... නේද නෝනා...'

අම්මා සිනාසුනා මිසක කතා කළේ නැත.

'ඔයාලගේ සතුට අපේත් සතුට... ඒත් ඔයාලත් දුක් විඳ විඳ අපිත් දුක් විඳිනවා නම් ඒක ප්‍රශ්නයක්නේ...'

තාත්තා මගේ හිස අතගා එසේ කියා නාන්නට කාමරයට ගියේය... පොඩි මාමා ගෙනැවිත් තිබූ බියර් බෝතල් කිහිපය මම ශීතකරණයට දැමුවෙමි...

'පුතත් බියර් බොනවද...'

අම්මා මා පසුපස එමින් ඇසුවාය.

'වීදුරුවක් විතර බොනවා...'

මම ඔළුව කසමින් කීවෙමි. එය වරදකැයි මම නොසිතුවෙමි.

'ඔයා දැන් පොඩි ළමයෙක් නෙමේ... හැමදේකම සීමාව කොතනද කියලා ලොකු පුතා තේරුම් ගන්නෝනා... මිනිහෙක්

හැඳෙනවා කියන්නේ ඒකට...'

'මං දන්නවා අම්මේ... ආයේ අම්මගේ ලොකු පුතා පිස්සෙක් වෙන්නෑ... ඒක මුවර් කරලා මං කියනවා...'

මම මගේ ජීවිතය ගැන ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළෙමි... මා තුළ එවැනි ආත්ම ශක්තියක් විය... අම්මා කියන්නාක් මෙන් හැම දෙයකම සීමාව මම දන් දන්නෙමි...

කොල්ලෙකුගේ ජීවිතය ලස්සන ඒ සීමාව තුළ සිට කරනාදේ තුළය... සීමාව ඉක්මවා ගිය විට ජීවිතය එහෙම පිටින්ම අවුල්වෙයි... මේ කාරණාව මම දන් අත්දැකීමෙන් දන්නෙමි.

නංගි ආවේ මම නාන කාමරයේ ඇයට නාන්නට වතුර පිළියෙල කරද්දීය.

'පව්... කෙල්ල අයියට දෙවියෙකුට වගේ සලකන්නේ... එදා මට අරන් දුන්න පිනිපෝ එක ඒකිටත් අරන් දුන්නාම කෙල්ලට ඇඬුනලු... ජීවිතේ කව්රුවත් එහෙම කරන්නෑලු...'

'මං එච්චර දෙයක් හිතලා අරන් දුන්නා නෙමේ... මට ඔයාව මතක් උනා...'

'හැමෝටම එහෙම මතක් වෙන්නෑනේ...'

මම ඇල්වතුර පිරවූ ටබ් එකට උණුවතුර පිරෙව්වෙමි.

'මේ කාටද...'

'ඔයාට... අම්මටයි නාන්නටයි මං වතුර පුරවලා දුන්නා...'

'මෙහෙම කොහොමද නාන්නේ...'

මට හිනා ගියේය.

'හිනාවෙන්නේ... දන්නැති නිසානේ අහන්නේ...'

'ඔක්කොම ගලවලා මේකට බැහැලා ඉන්න...'





'හොර්වෙන්...'

'ඔව්... හරි සනීපයි...'

'ඔයත් එහෙමද කරන්නේ...'

'ම්... පැයක් විතර උණු වතුරේ බැහැලා හිටියාම හරි සනීපයි...'

මම ටබ් එකේ පිරුන මද රස්නය ඇති උණු වතුර පොදක් නංගීගේ මුහුණට දමා සීවෙමි.

# 11

සඳ පායා තිබුනේ හද කහ පාටටය. ඒ ඇයි දැයි මම පුදුමයෙන් සිතුවෙමි. හෙට පෝය බව මට මතක් වූයේ ඉන්පසුය... පසොලොස්වකට මෝරන සඳේ සඳ රැස් වැහි බර බවකින් තොර බණ්ඩාරවෙල අහස පුරා අසීමිතව විහිදී තිබුණි... ඈත මීදුම් කැටි ගැසුණු කඳු යායවල් මත පවා මිහිදුම් පොදවල් මෙන් සඳ එළිය විය.

මගේ හදවතේ පවිත්‍ර වූ යමක් පැවලෙන බව දැනෙයි. මේ රාත්‍රිය... මේ හද කහ පැහැගත් සඳ... කඳු මුදුන් වල කැටිරුණු මීදුම් පොකුරු... ඒ මත විහිදී ගිය සඳ රැස්... මේ සියල්ලමත් මේ සීතලත් එකම චමත්කාරයකට පොකුරු ගැසී මගේ හදවත මන්මත් කරන්නට විය.





ජීවිතයේ විශේෂ දුකක්වත් විශේෂ සතුටක්වත් නැතැයි මට හිතෙයි. ඇත්තේ ටිකක් දුක දේවල් හා ටිකක් සතුටු දේවල්ය. ටිකක් දුක වන දෙයක් මහා දුකක් කරගන්නේත්... ටිකක් සතුටු දෙයක් මහා සතුටක් කර ගන්නේත් අපමය.

පසුගිය දින දෙකේම අම්මාත් තාත්තාත් නෑගිත් උන් නිසා පාළුවක් නොවිය... එහෙත් අද උදෙන්ම සියල්ලෝම බණ්ඩාරවෙල ස්ටේෂන් එකෙන් කොළඹ ගියෝය... හිතුනොත් නුවරින් බැස දළදා මාලිගාවටත් ගොස් යන බව අම්මා කීවාය...

අම්මාටත් තාත්තාටත් මං වැන්දේ ස්ටේෂමේ ගල් පොළොව මතදීය.

'ඔයාව මෙහේ බලාගන්න කවුරුවත් නෑ... ඔයාට ඕන දෙයක් ඔයාට කරන්න පුළුවන්... වැරදි දෙයක් කළොත් ලොකු පුතේ ඒකේ දුක අපි ජීවිතේ පුරා ගෙවන්න ඕන... ඔයාට දුකක් වෙන්නේ නැති දෙයක් කරගන්න...'

තාත්තා කීවේ මගේ හිස පිරිමැදය. යළිත් දුක් කන්දරාවක් පපුවට හලා ගැනීමේ අදහසක් මටද නොවිය. දුක් විඳිද්දී ජීවිතය ලැබුනේ මේකටද කියා සිතෙයි.

'ජීවත් වෙන්න ඕනේ කොහොමද කියලා දූත් ලොකු පුතා දන්නවා... එයා කොළඹදීත් නරක දෙයක් කළේ නැහැනේ..'

අම්මා කීවාය. ආදරය කිරීම බරපතල වරදක් නම් මං එය බරපතලව කළෙමි. එපමණකි. ඉන් එහා කිසිවක් මම නොකළෙමි.

'කිරි දානෙට එහෙනම් පොඩි මාමවත් එක්කගෙනම එන්න...'

අපි අවුරුදු පතා කිරි දානයක් දෙන්නෙමු. මෙතුවක්

අපට කරදරයක් නොමැතිව ජීවත් වන්නට ලැබුනේ කොතරම් දුෂ්කරතා තිබුනද එවැන්නක් කළ නිසා යැයි අපි හිතුවෙමු.

මගේ විසි වසරක ජීවිතය පුරා දුකක් කියා මං විත්දේ මගේ ආදරය නිසාය. ඒව කළින්ත් දනුත් මම සතුටින් ඉන්නෙමි. සතුටු වන්නට මට විශේෂ හේතුවක් අවශ්‍ය නැත.

හාත්පස පාළුය. සඳ එළිය මිසක අන් කිසිවක් නැත... ගහ කොළ නිසංසල් සෙලවෙයි. පොඩි මාමා හවස බිඳුණු වැව ගොස් තවම ආවේ නැත.

මම බාටා රබර් සෙරෙප්පු දෙකක් දමාගෙන මිදුලට බැස්සෙමි. පුදුමය. රෝස මල් වල පොහොට්ටු දවාලක මෙන් දිස්වෙයි.

හුදෙකලා වූ හදවතකට මේ සඳ එළිය අපරාදේ යැයි සිතෙයි. මම ඔහේ ඇවිදගෙන දෙකන්ඩියක් බෙදෙන තැන වූ උස් තණ පිස්සේ හිටගෙන දෑත් බැඳගත්තෙමි. මුළු පළාතම පෙනෙන හොඳම තැන මෙයය...

ඈත කඳු වල තැන තැන දල්වෙන විදුලි පහන් එළි මට පෙනෙයි... ඒවා දෙස කොතරම් බලා උන්නද එපා නොවෙයි. තද පිපාසාවක් දනුනද ගෙට ගොස් වතුර ටිකක් බීමට ආශාවක් නැත.

මුළු හදවතට පරිසරයම ඇලවී තිබුණෙන් තව පැයක් දෙපැයක් වත් මෙතනට වී ඉන්නට මම ආශා කළෙමි. කිරි කෝපි ටිකක් නොවේනම් නෙස්ටමෝල්ට් කෝප්පයක් වටින්නේ මේ වෙලාවටය...

'අනේ අපිට පැලකුවට දූවට බොහෝම ස්තුතියි... ආච්චිට කියන්න කැමත් හරි රහයි කියලා...'

උදේ ගෙදී අම්මා චන්දනාගේ අතකින් අල්ලා කීවාය.

චන්දනා තරමක් විශාල බෑගයක් රැගෙන ආවාය.





'මේ මොනවද...'

නංගී ඇසුවාය.

'මගේ පාත්ති වල අළුත් එළවළු ටිකක්... කැරට්ටුයි... බීට්රූට්... ගෝවා මලුයි...'

'අනේ එතකොට අපි ඔයාට මොනවද දෙන්නේ...'

චන්දනා සිනාසුනා පමණි. ඇය මෙවැන්නක් කළේ උපකාරයක් බලාගෙන නොවේ.

ගෙදරට ගොස් තේකක් ඉල්ලාගෙන බොන්නට හිතුනද මේ රෑයේ ගැහැණු ළමයෙකු ඉන්නා ගෙදරකට යාම හොඳ නැත. මා පිරිසිදු තමුදු ලෝකය බලන ඇස් පිරිසිදු නැත. නිබඳ දරා ගැනීම හොඳම දේය.

මට තරු ගැනිය හැකි දැයි බැලුවෙමි. තරු ගැනිය හැකි දවස් ඇත. එහෙත් අද එවන් දවසක් නොවේ. තාරකා අනන්ත ප්‍රමාණයක් අහසේ විසිරී ඇත.

ජීවිතයක් ගත් කලද මේ තරුවකට සමානය. අප පුංචි තාරකාවක් මෙනි. විශේෂයෙන් අප දෙස බලන්නට කෙනෙකු නැත. තාරකා පොකුරක් බැබලෙනවා මිසක තනි අහසක තනි තරුවක් බැබලිය නොහැක.

මිය ගිය පසු අප හැමෝම තාරකා වෙතැයි පුංචි කාලයේ රූපවාහිනියෙන් බැලූ ළමා නාට්‍යයක කියවිණ. එය ඇත්තක් නම් මම මේ අහසේ කොතක හදට බොහෝ දුරින් සමහර විට නොපෙනෙන තරම් දුරින් ඈතට වන්නට වන තරුවක් වන්නෙමි... මගේ පාඩුවේ මම ඉන්නෙමි.

එකවරම වාගේ දෙරකඩින් රූවක් මතුවූයෙන් මම හිම්හිට විමසිලිමත් වූයෙමි. ඒ චන්දනාය. ඇයට මාව පෙනෙනවා දැයි මම නොදනිමි. මට ඇයව හොඳින් පෙනෙයි.

චන්දනා මාව දක්කාය. ඇය මේ පැත්තට ඒවි යැයි



www.sinhalaelibrary.com

මම සිතුවෙමි. එහෙත් මොහොතකින් ඇය ගෙතුළට ගියාය. සඳ වළාකුළකට සැඟවී ගියාක් මෙන් බඳුව ඇතුළ ලය අඳුරු විය.

එක අතකට හදවත මේ තරම් යළි බොළඳ වන්නේ ඇයි.. මේ ඇස් කාව හෝ යළි යළි දකින්නට ඕනවාට වඩා බලාපොරොත්තු වනවානම් එය දුකකි. මේ දෙපා කා ළඟට හෝ යළි යළි යැවෙන්නට හදනවා නම් එයද දුකකි. මේ දෑත් කාගේ හෝ අතක පැටලෙන්නට යළි යළිත් දවෙනවා නම් එයද දුකකි. මේ හදවත කාගේ හෝ ආදරයක් පිච්චි පුච්චි පසමින් වැද වැටෙනවා නම් එය මහාම දුකකි.

කොළඹ ස්ටේෂමෙන් බදුලු කෝච්චියට නගිද්දී මම මගේ ආදර හිත දුම්රිය පීල්ලකට විසි කළෙමි.

මොහොතකින් චන්ද්‍රාගේ රුව යළිත් දෙරකඩින් මතු විය. එවර ඇය කුඩා පඩි පෙළ නගිමින් උඩට එන්නට විය. ඇගේ අතක ජේ කෝප්පයක් තිබෙනු දක මගේ හදවත පිනා ගියේය. ඇය මේ ගෙනෙන්නේ හිස් කෝප්පයක් විය හැක. නැත්නම් කොත්තමල්ලි කෝප්පයක් විය හැක. සංදේශ්ට එන්නේ එහෙම අලකලංචිය.

පඩි පෙළ උඩම පඩියට ගොඩවී තණ බිස්සට එන තුරු ඇයව සම්පූර්ණයෙන් නොපෙනේ. මගේ දෙනෙත් ඇයව වඩාගෙන ඉහළට එක්කාගෙන එන්නට විය.

මම සරම ඔසවා කන්ඩියෙන් තණ බිස්සට පැන්නෙමි. එතන දිග සිමෙන්ති බංකුවක් විය.

'කිරි කෝපි එකක් හදන් ආවා...'

මම අක්කරයක් පමණ සිනාසී කිරි කෝපි එක අතට ගත්තෙමි... ඇයව සිපගන්නට තරම් මට දන් සතුටුය.

'ඉල්ල ගන්න බැරිව හිටියේ...'

මම අවංකව කීවෙමි. චන්ද්‍රා සිනාසී යන්නට හැරුනාය.





මේ රාත්‍රියේ ඇය මාව මෙතන දමා යන්නේ ඇයි. අපේ තනියට සඳ එළිය ඇත.

'ටිකක් ඉන්න...'

මගේ දෙතොල් පට අතරින් එහෙම වචන දෙකක් පිටවිය. ඇය ගවුමට උඩින් ඇඳ උන් ස්වීටරයේ නොපියවුණ බොත්තමක් පියවමින් මා දෙස බලා සිනාසුනාය.

'ගේ ඇතුළට වෙලා මොනවද කරන්නේ...'

සංදේශ් අහන්නේ පුදුමාකාර ප්‍රශ්නය. ඇයට මට මෙන් රස්තියාදුවේ යාමේ කඩිකුලප්පුවක් නැත. කෙල්ලන් හැදෙන්නේ ගෙවල් ඇතුළේය.

'අද ආච්චිට ටිකක් සනීප නැතුව වෙල පහම නිදි... මම උයලා දනුයි ඉවර වුනේ...'

'ඇයි.. ආච්චිට මොකක්ද අසනීපේ...'

'එකක් කියලා නෑ...'

චන්ද්‍රා කීවේ ඒ ගැන තව දුරටත් කතා කිරීම දුකක් බව අඟවමිනි. ජීවිතයේ දුකම අත් විඳින කෙල්ලෙක් හැම මොහොතේම ඒ දුකම දෙඩවන්නට අකමැතිය...

'මොනවද ඉව්වේ...'

මම තවත් කිරි කෝපි උගුරක් බී ඇසුවෙමි. කිරි කෝපි එක මට රත්තරන් වාගේය. එකපාර එය බී අහවර කරන්නට මට ලෝබය.

'රතු කැකුළු ඉඳි ආප්ප ටිකක් හැදුවා... හාල්මැස්සෝ උයලා පොල් සම්බෝල හැදුවා... ඇ..ත්..ද...'

දිගටම ඒ ගෙදරින් මතුල් ගෙයක මෙන් කෑම හැදුනි. අම්මාත් තාත්තාත් නංගීත් උන් දින තුනේ ඇයට අත අහවරයක්

නොතිබෙන්නට ඇත.

'ඒ ඇති.. ඉඳි ආප්ප හදන්න අමාරුයි නේද...'

'එහෙම නෑ... කැකුළු හාල් පිටි තියෙනවනේ... ඒ නිසා ලේසියි...'

දන් සඳ එළිය පෙරටත් වඩා ලස්සනට යුවතියගේ වත මතට වැටී ඇත. ඇය අහස බලන මොහොතක් බලා මම ඒ රුව දෙස බලමි. මට ගීයක පදයක් සිහිවිය. 'දකුවම් ලද යුතු අප නොව යෞවනයයි...'

'බණ්ඩාරවෙලට හැමදම මෙහෙම ලස්සනට හඳ පායනවද...'

යුවතියගේ දෙනෙත් එසවුනේ ලතාවකටය. සඳ දන් බැබලෙන්නේ ඇගේ දෙනෙත් වලය.

'පායනවා... ඒ..ත් මෙච්චර ලස්සනට පායලා තියෙනවා මාත් දක්කමයි...'

වයිච් ගිය හඬකින් චන්දනා කීවාය. රැයේ චමත්කාරය දුටුවේ මා පමණකැයි මම සිතුවෙමි, නැත. ඇයද එය දක ඇත...

'අපිව ජේන නිසා වෙන්නැති...'

මම උගුරෙන් මෙන් කීවෙමි.

තවකතා කියවන්නට ගත් පසු සංදේශ් ලස්සන වචන දන්නේය.

'වෙ..න්..නැ..ති...'

මම ගැස්සී යුවතියගේ මුහුණ බැලුවෙමි. ඇය සිනාබරව බිම බලා ගත්තාය.

ලෝකය ලස්සනට පෙනෙන්නේ හදවතේ ඊට වඩා ලස්සන





යමක් ඇති විටය. මගේ හිතේ මොනවද ඇති බව සැබෑය. එහෙත් ඇගේ හිතේ...

'ඇයි රෑ වෙනකල් ලයිට් දලා තියෙන්නේ...'

චන්දනා ඇසුවාය. මා රෑ වන තුරු ඇහැරී ඉන්නා බව දකින්නට ඇයද ඇහැරී බලා සිටිය යුතුය.

'දවස් විසේම නවකතා කියෙව්වා... රෑ වෙනවා දන්නෙ නෑ... පාන්දර තමයි කියවලා ඉවර වෙන්නේ...'

'ඒ..ක තමයි... මං හිතුවා අසනීපයක්ද දන්නෑ කියලා...'

මගේ පපුව හොස් ගා ද ගියේය. චන්දනාගේ ලය තුළ වූයේ ලාබාල යුවතියකගේ හඬ නොවේ. සිතුවිලි විසින් මෝරා යවනු ලැබූ නැන්පත් යුවතියකගේ කරුණාබර හඬය.

'චන්දනා රෑට ඇහැරිලා මොනවද කරන්නේ...'

මගේ ප්‍රශ්නයට ඇය සිනාසුනාය. දන් ඇයට 'රෑට ඇහැරී ඉන්නේ නැහැයි' කිව නොහැක...

'සමහර දවස්වලට නින්ද යන්නෑ... එතකොට දෙරකඩට වෙලා ඔහේ ඉන්නවා...'

'මොනවද ඇහැරගෙන කල්පනා කරන්නේ...'

හැම ප්‍රශ්නයකටම ඇගේ මුවේ ඇත්තේ අන්ත අසරණ සිනහවකි. තුනී තොල් සහල දෙපසට වී හැඳෙන ඒ සිනාව මගේ හදවත තුළ අසාමාන්‍ය රස්නයක් ඇති කිරීමට සමත් විය.

'එ..කා..ක් කියලා නෑ... එක එක ඒවා...'

'දන් ජොබ් එකට යන්න ගත්තහම උදෙන්ම නැඟිටලා උයන්න වෙයි...'

'අපෝ ඒක පුළුවන්... කොහොමත් මං පාන්දර



www.sinhalaelibrary.com

ඇහැරෙනවා..'

'උදේටත් කෑම බැදගන්න වෙයි.. ගිහින් තමයි කන්නේ..'

'උදේටත් කෑම එක කන්නේ ඉස්සරත් මා කළේ එහෙමය. උදේ කෑම එක කන්නේ පාසලට ගිය පසුය. පන්තියේ බංකුවක් උඩ ඉඳි ආප්ප පාර්සලයක් ලෙහාගෙන කෑමේ වෙනමම සෞන්දර්යයක් ඇත.

අලුත් ඔෆිස් එකේ මම මොනවද කරන්නේ..'

'සොම්නා සුකුහලයක් මුසුවූ හඬකින් යුවතිය ඇසුවාය.

'චන්දනා මගේ ඇසිස්ටන්.. මගේ නකුට වගේ මං පස්සේ එන්නෝන..'

මම නිකමට කීවෙමි. චන්දනා තොල්පට මුව තුළට ගෙන මදහස සඟවා ගත්තාය.

'ඇයි හිනාවෙන්නේ.. බැරිද..'

මම මවාගත් කේන්තියකින් ඇසුවෙමි.

'අ..නේ නෑ පුළුවන්..'

'මං කියන හැම දෙයක්ම කරන්න වෙයි..'

'පු..එ..ව..න්..'

'මං කිව්වොත් ඔෆිස් එක අතුගාන්න කියලා..'

'පුළු..ව..න්..'

'ම්.. මං කිව්වොත් රෑ දොළහ වෙනකල් වැඩ කරන්න කියලා..'

'පු..එ..ව..න්..'

'මං කිව්වොත් මට..'

කියන්න ගියදේ ගිලගෙන මම චන්දනා දෙස බැලුවෙමි. නැත. විහිළුවට වත් එහෙම දේවල් කිව යුතු නැත.





'අන්කල් එනවා..'

පොඩි මාමාගේ වාහනය පහල රවුම නැත උඩට එන්නට විය. චන්දනා මා අතින් කෝප්පය ගත්තාය.

'මං යන්නද..'

ඇය කීවේ කියනවානම් හොයා ඉන්නට වුවද ලෑස්තිය කියන්නාක් මෙනි. එහෙත් මේ මහ රෑ යුවතියක්ව ළඟ තබා ගැනීම බරපතල වරදකි.

'මේ..'

'ඇයි..'

'රෑටත් මේ වගේ කිරි කෝපි එකක් ඕන..'

යුවතිය පහළට ගියේ හිස වනමිනි. මම සරම උන්ඩි කරගෙන ඉහළට ආවෙමි.

# 12

අලුත් එළවළු ව්‍යාපාරය පවත් ගන්නට පොඩි මාමා කඳු ගැටයක තනා තිබූ කුඩා නාමුදු ලස්සන නිවසක් ගෙන තිබුණි. සෙනසුරාද උදේ පොඩි මාමා ඒ ගේ පිළිසකර කරන තැනට මාවද රැගෙන ගියේය.. මේ ගමනට චන්ද්‍රනාවද පොඩි මාම එක් කරගත්තේය. ලා නිල්වට තුරු කමිසයකින් හා සුදු නිල් සායකින් සැරසී උන් ඇය වාහනයේ පිටුපස අසුනට දුවගෙන විත් නැග්තාය..

'මොකක්ද කෙල්ලේ මය පුසුඹ..'

ඇය වාහනයට ගොඩ වූ විටම වාහනය තුළ පැතිරී ගිය සුවඳ විඳ පොඩි මාමා ඇසුවේය. යුවතිය ලැජ්ජාවෙන් සිනාසුනාය.





'ඩේසිහුටාන්...'

චන්ද්‍රනා පහත් හඬින් කීවාය... දේශීය විලඳුන් වර්ගයක් වූව ඒ සුවඳේ විශේෂත්වයක් ඇතැයි මට සිතුණි..

අලුත් ඉර එළිය පැහැබර ලෙස කඳු මත වැටී තිබුණි. චඩාන් ලස්සන උදෑසන කැටි ගැසුණු මීදුම් පොකුරු අතරින් ආලෝක රේඛා කැපී එද්දීය... ඒ ආලෝක රේඛා මාවතේ තැනින් තැන වූ යුකැලිප්ටස් ගස් මතටද වැටී අපූර්ව කඳුකර චමත්කාරයක් මවා තිබුණි.

පසුපස හැරී මේ උදෑසනේ ඇය දෙස බලන්නට මට සිතෙයි.. ඒ රුව මේ තරමටම නෙතට රසඳුනක් වූයේ කෙසේදැයි මම නොදනිමි.

'එළවළු මුදලාලි ආයිත් ආවචි එක්ක කතා කරලා හෙම නැද්ද දුවේ...'

පොඩි මාමා මා නොදන්නා කාරණාවක් ඇය හා කතා කළේය. ඒ වික පොඩි මාමා ඇසුවේද පසුපසට හැරී සිනාසෙමිනි...

'නෑ.. නෑ.. ඒවුනාට ගිය පාර ඇවිතුත් පැයක් විතර කතාව... ය..න්..නෙ..ම නෑ...'

මේ තරමට සිනාවෙමින් රස කර කර කියන කතාව කුමක්ද... මා නොදන්නා දෙයකට ඔවුන් සිනාසෙද්දී මට මහා දුකක් ඇතිවිය.

'උඹට තිබ්බේ කෙල්ලෙ එළෝළු මුදලාලිට කැමති වෙන්නනේ.. මිනිහා නරකමත් නෑ...'

පොඩි මාමා යළිත් සිනාසී කීවේය.

'පි..ස්..සු... අනේ ආච්චිට හොඳයි...'

යුවතිය සෝන්තියෙන් කීවාය.



www.sinhalaelibrary.com

'මේ පැත්තේ පොඩි පොඩි එළවළු වතු වලින් එළවළු එකතු කරපු මුදලාලි කෙනෙක් ඉන්නවා.. රතු මුදලාලි කියලා...'

පොඩි මාමා මට විස්තර කළේය...

'අ..නේ ජයදේව අත්තල්..'

චන්ද්‍රා බැගෑපත්ව කීවේ මට ඒ කතාව නොකියන ලෙසය.

'හිටපන් කෙල්ලේ.. ඉතින් රතු මුදලාලි මෙකිට ලව්... ඇයි ඉතින් කැරට් අලේ වගේ ඉන්නවනේ... මිනිහට ආසාවේ බැරුව ඇති... මෙකිගේ තාත්තගේ වයස...'

මම වරක් පමණක් පසුපස හැරී බැලුවෙමි. ඇය දෑතින් මුව වසාගෙන සිනාසුනාය.

'ඉ..හි..න්...'

මම පෙරට දුවුවෙමි.

'මිනිහා බැඳලා දන් දික්කසාදලු... ආයෙත් බඳිනවනම් බඳින්නේ මෙකිවලු... ආච්චිගෙනුත් අහලා... ආච්චි කියලා පව් සිද්ධ වෙන කතා නොකියා ඉන්න කියලා...'

මම බඩ අල්ලාගෙන සිනාසුනෙමි. චන්ද්‍රා දෙතොල් පට තද කරගෙන වාහනයෙන් එපිට පයිනස් ගස් දෙස බලා උන්නාය.

'ඕක ඉතින් ඔච්චර හිනාවෙන්නෝන දෙයක්යැ... අපි ඒ පිස්සට ලව් කළායැ... මත්තා එහෙනම් හිනාවෙන්නෝන...'

චන්ද්‍රා කීවේ තොරිස්සුමෙනි...

'මිනිහට කසාද බැඳපු දුවලා දෙන්නෙකුත් ඉන්නවලු...'

'ආච්චි කියලා දන් මඟුල් කතා නොකර එළොවට





වැඩක් වෙන දෙයක් කරන්න කියලා...'

ඇත්තටම මා ඇයට සිනාසුනේ ඇයි... ඒ අසරණකම... ඒ දුප්පතකම... ඒවා සිනාසිය යුතු දේවල්ද... බොහෝ දුරක් ගිය පසු මම හැරී බැලුවෙමි. කෙල්ලගේ ඇස්වල කඳුළුය...

අලුත් නිවස පිහිටා තිබුණේ දෙමටමල් විහාරය අසබඩය. විහාරයේ බෝ මළුවත් නිවසේ මිදුලත් තිබුණේ ළඟ ළඟය... කොටින්ම කිවහොත් බෝගසේ කොළ වැටුනේ අපේ නිවසේ ඉඩමටය...

'අවුරුදු දෙකක් හොයලා මේක ගත්තේ...'

'හරි නිස්කලංකයි මාමේ... පදිංචි වෙන්නත් හොඳයි...'

'පල්ලෙහා ඉඩ තියෙනවා පුතේ පස්සේ ගේ හදමු...'

චන්ද්‍රාගේ දෙනෙත් බිමට බරව ඇත... පොඩි මාමා ගේ ජේන්ටි කරන මිනිසුන් සමඟ කතා කරද්දී මම ඇය වෙතට ළං වුනෙමි. චන්ද්‍රා බෝ ගසෙන් බට බෝ පතක් අත තබාගෙන එහි නාරටි පිරිමදිමින් උන්නාය...

'ක..රු..ණා..ද...'

මම මෘදු හඬකින් ඇසුවෙමි. චන්ද්‍රා නෑනැයි කියන්නට මෙන් හිස දෙපසට වැනුවාය. එහෙත් ඇය මගේ මුහුණ බැලුවේ නැත.

'මේ පැත්ත ලස්සනයි නේද...'

මම ඇය සමඟ යාළු වන්නට සිතා ඇසුවෙමි.

'ම්...'

'පන්සලකුත් තියෙනවනේ... හරි නිස්කලංකයි...'

'ම්...'

යළි ඒ ඇස්වල කඳුළුය...



www.sinhalaelibrary.com

'මං හිනාවුනේ ඔයාට නෙමේ...'

'මං දන්නවා... මාගේ දුප්පත් කමට... මට ගැලපෙන්නේ රතු මුදලාලි වගේ පිස්සෙක් තමා... මං... ඒක දන්නවා...'

මේ කෙල්ල මේ කියවන්නේ මොනවාද... ආත්මානුකම්පාව පිසින් ඇවිළුණු ඇගේ හිත දුන් ඇත්තේ දුකේ පතුලේය.

'ඔයාගේ දුප්පත් කමට හිනාවෙන්න අපිත් මහ පෝසත්තු නෙමේ චන්දනා...'

එපමණක් කියා මම ඇය වෙතින් මෑත් උනෙමි... ගෙට පිරියම් කර තිබුනේ ගුරු පැහැගත් ඔරේන්ජ් පාටකි... ඒ පාට ලස්සනය.

'පිටිපස්සේ එලවළු හෝදන අංශයයි පැකට් කරන අංශයයි දනවා... ඉස්සරහා ඔෆිස් එක... උඹට පුරචන්ද කොල්ලෝ ඔක්කෝම බලාගන්න...'

පොඩි මාමා මගේ කරට අතක් දමාගෙන ගේ පුරා යමින් ඇසුවේය. 'නොහැක්කක් නොමැත...' ඒ අපේ පාසලේ තේමා පාඨයයි. මම එය අදහමි.

'ලබන පළවෙනිද වැඩ පටන් ගමු... ඉස්සෙල්ලාම අපි වෙන කම්පැනි එකක සබ් කරමු.. පස්සේ අපිට කෙළින්ම එක්ස්පෝට් කරන්න පුළුවන්...'

'පැකින් පෙට්ටි ගේන්න ඕන නේද මාමේ...'

'ඔව්... ඒවා මෙහෙටම සප්ලයි කරන අය ඉන්නවා... උඹට මේ කෙල්ල විතරක් ඇත්ද...'

'වැඩ කරන මිනිස්සුන්ට අමතරව චන්දනා විතරක් ඇතිවෙයි... ඉස්සෙල්ලාම කට්ටිය දාගෙන බෑ නේද...'

'ඔව්... අපි වැඩේ නැගලා යනවද කියලා බලන්න





එපැයි...'

පොඩි මාමා මාවත් චන්දනාවත් තනි කර යළිත් ටවුමට ගියේය.

'අපි යන් පන්සල පැත්තේ...'

ඇගේ හපුටු වූ මුහුණ මඳක් එළිය විය.

'මල් මුකුත් නැතේ...'

'මල් ඕන නෑ... නිකං වැඳලා එමු... යන්...'

යුවතිය මා හා වැටුණාය. පන්සලේ මකර තොරණ යටදී මම ඇය දෙස බැලුවෙමි. තරහ නැහැයි කියන්නාක් වැනි සිනාවක් ඒ මුව මත විය.

'බඳින්න අහලා තියෙන්නේ රතු මුදලාලි විතරද...'

මම ඇසුවෙමි.

'මං දන්නෑ...'

මල් ආසනයේ මල් ගොඩ අල්ලා වඩිමින් යුවතිය කීවාය.

'ආස කෙනෙක් ඉන්නවනම් ආච්චිට කියන්න තියෙන්නේ... ආච්චි මිණිපිරිව බන්දලා දෙයි...'

මල් ආසනය මත තිබූ සහ අරලියා මලක් ගෙන මම කීවෙමි. මේ පාන්දර ඇගේ වතින් නික්මෙන අසාමාන්‍ය සුන්දරත්වයත් මේ සහ අරලියා මලේ නිර්මල චමත්කාරයත් එකක් යැයි මට හිතෙයි...

'ආච්චිට මං කියලා තියෙන්නේ...'

අපි පහන් වැට දිගේ පියවර මැන්නෙමු.

'මොකක්ද...'

පොල් තෙල් පහන් දල්වෙද්දී නැගෙන විටි විරි හඬ



www.sinhalaelibrary.com

මිසක අන් හඬක් අප වටා නැත. හාත්පස නිස්කලංකය... ශාන්තය... එහෙත් සංදේශ්ගේ හදවත නොසන්සුන්ය.

'මං කසාද බඳින්නෑ කියලා...'

'හොඳ කෙනෙක් හම්බ උනොත්...'

මම අසරණ හඬින් ඇසුවෙමි. ශුචිනිය බෝ කොළයේ හැඩයට කැපූ පහන් වැට අද්දර නැවතී හිස ඔසවා මා දෙස බැලුවාය. ඇගේ මුහුණද බෝ කොළයේ හැඩැතිය... දිගැටිය...

'කොහොම හොඳ කෙනෙක්ද...'

'මං වගේ හොඳ කෙනෙක්..' මට එසේ කියන්නට කටට ආවේය.

'හොඳ කෙනෙක් හම්බවෙලාම නැද්ද...'

මම නිවෙන්නට ආසන්නව තිබූ පහන් තිරයක් ඔසවා කළී දල්වූයෙමි. චන්දනා නිවී ගිය පහන් වැටියක තිබූ ඉතිරි පොල් තෙල් මා දල්වූ පහනට දැමුවාය. අපි දෙදෙනාගේම ඇස් ඒ පහන් වැටියට යොමුව තිබී ඊළඟ වාරයේ එකට ගැටිණ.

හිතේ එකක් තබාගෙන තවත් එකක් අහන්නේ සංදේශ්ය... ඒ නිසා මුලින්ම දෙනෙත් ගත්තේ මාය.

'එක හොඳ කෙනෙක්ව දකලා ති..යෙ..නා..වා...'

ගොත ගසමින් චන්දනා කීවාය. මගේ ඇහිලි තුඩ පහන් දැල්ලට පිච්චී ගියේය.

'කා..වු..ද...'

පහළටම බර වූ බෝ අත්තක් යට පහන් වී යන අතරවාරයේ ශුචිනිය අසුරුවට සිනාසුනාය. බාරයකට කවුරු හෝ එල්ලූ කහ කොඩියක් අතරින් මම ඒ සිනහව පහනක්





මෙන් දැක ගත්තෙමි.

'ඒ..ක කියන්න බෑ...'

චන්දනා ඒ වචන ටික කියා පත්තිනි දේවාලය අසළට ගොස් වැඳගෙන උන්නාය... මම පර්ස් එක ඇර එහි තිබූ මාරු කාසි සියල්ල අතට ගත්තෙමි.

'ආ දන්න...'

මාරු කාසි සියල්ල මම චන්දනා අත තැබුවෙමි. ඇය මාරු කාසි ටික ගත්තේ දෝතින්මය.

'මං විතරද දන්නේ...'

'මට දෙයියන්ගෙන් ඉල්ලන්න දෙයක් නෑ...'

තපුරුකමට මම කීවෙමි. චන්දනා කල්පනාබරව මාරු කාසි එකින් එක දේවාල හතරට ගොස් දැමුවාය.

'උදේට පන්සලට ඇවිත් මල් පූජ කරලම වැඩ පටන් ගන්න පුළුවන්...'

පුංචි විහාර ගෙට පියනගමින් ඇය කීවාය. ඇයට ඉස්සර වන්නට දී මම ඒ නැලවෙන බඳ දෙස බලා උන්නෙමි. පන්සලකට ආවා නම් තුන් දෙර පිරිසිදු කර ගත යුතුය.

විහාර ගේ පුරා වූයේ මඳ අඳුරු නිශ්චලතාවයකි. සුදු ලේස් තිරයක් දැමූ සුදු බුදුරුව අප දෙසම බලා ඉන්නේය.

'අරයා බණ්ඩාරවෙල කෙනෙක්ද...'

මම විහාර ගෙයිදී ඇසුවෙමි.

'බොරු කියන්නෙපා බුදු හාමුදුරුවෝ ඉස්සරහා... බොරු කියලා පව් පුරවගන්නවා...'

'මං බොරු කියන්නෑ... එයා දන් ඉන්නේ බණ්ඩාරවෙල තමා...'



www.sinhalaelibrary.com

විහාර ගෙයි බිමට දමා ඇත්තේ බටර් පැහැගත් පිගන් ගඩොල්ය. ඒවා මතුපිට ලැමිනේට් කළාක් වැනි දිස්නයක් වේ. එහෙත් මා බැලුවේ ඒ දෙස නොවේ. පිහන් ගඩොල් මතුයේ නතරව තිබූ ඇගේ දෙපා දෙසය.

බෝධි පූජාවට තබා තිබූ පලතුරු වට්ටියකින් අඹ පලු දෙකක් මම ගත්තෙමි.

'මීවා කාලා පව් සිද්ධ වෙනවා...'

'මොන බණ පොතේද එහෙම තියෙන්නේ... බුදු හාමුදුරුවෝ එහෙම නපුරු දෙවියෙක් නෙමේ... බඩගින්නට මේ ඔක්කොම මෙතනට වෙලා කෑවත් එයා මොනවත් කියන්නෑ...'

මම අඹ පලු දෙකින් එකක් ඇය වෙතට දික් කළෙමි.

'කමක් නැද්ද...'

'මොනවත් වෙන්නෑ කන්න...'

කර්තකලොම්බු අඹ බැය රසය.

'එතන තිබ්බ දෙඩම් ගෙඩි දෙක ගත්තනම් ගෙදර තිබිල්ලා හදන් බොන්න තිබ්බා...'

මගේ පව්කාර කතාවලට කිසිවක් නොකී චන්දනා මගේ අඹ ලෙලිද රැගෙන මළුව කොනක තිබූ කුණු බක්කියට ගොස් දමුවාය.

'වැඩපලේ මම මොනවද කරන්නේ...'

ඒ ගැන තවම මටත් අදහසක් නැත.

'දෙන්නත් එක්ක කරන්න තියෙන හැම දෙයක්ම කරමු...'

චන්දනා හිස වැනුවාය... අපි අළුතින් ජේන්ට් ගෑ නිවස තුළ ඇවිද්දෙමු. අළුත් සිත්තු සුවඳ හදවතට ගෙන ආවේ





නැවුම් හැඟීමකි.

නිවස තනා තිබුණේ එකම තට්ටුවක නමුදු බිම අසම බර වූ නිසා පෙනුනේ තට්ටු තට්ටු වශයෙනි.

'රස්සාවක් ලැබෙයි කියලා මං නම් හීනෙන් වත් හිතුවේ නෑ... බණ්ඩාරවෙල ගෑණු ළමෙකුට කරන්න ජොබ් එකක් නෑ...'

'රස්සාවක් නොකර හිටපු දවස්වල අමාරුකම් තිබ්බද...'

මම අවංකවම ඇසුවෙමි.

'අපි පිරිමහගෙන ජීවත් උනා... කොහොමත් අනාගතයක් කියලා දෙයක් දකින්න බැහැ... ණය බේරගෙන ජීවත් වෙනවා...'

'අනාගතේ ගැන මොනවද හිතලා තියෙන්නේ...'

ජනෙල් පලු දෙක දෙපැත්තේ අපි මුහුණට මුහුණ බලා ගත්තෙමු.

'හිතන්න බ..ය..යි... වැඩිය බලාපොරොත්තු නැතුව හිටියාම හිත නිදහස්...'

'දැන් හිතන්න... ඕනවට වඩා ජීවිතේට බයවෙන්නෙපා...'

මම පණ්ඩිතයා සේ කීවෙමි.

'බය නොවී කොහොමද සංදේශ් අයියේ... අපිට කියන්න කවුද ඉන්නේ...'

මේ ඇය මගේ නම කියූ ප්‍රථම වතාවය. ඇගේ හඬ තුළ ජීවිතයේ බොහෝ දේ නොලැබී ගිය අසරණ දැරියකගේ ඇඬුම්බර බව විය.

'කාටවත් එහෙම අය එකපාර ලැබෙන්නෑ... හිමිහිට ලැබෙයි... ජීවිතේ දිහා නරක පැත්තෙන්ම බලන්නෙපා...'

'අ..නේ නෑ... හැමදම උදේ පහන තියලා මං කියන්නේ මේ ටිකවත් අපිට දෙනවට පින් කියලා...'

සාමාන්‍යයෙන් ගැහැණු ළමයෙකු තුළ මේ උපේක්ෂා සහගත බව නැත. බොහෝ යුවතියන්ට මලක් දුන් විට මල් ගසම ඉල්ලති... එවන් යුවතියන් සමහ මේ ජීවිතයේ බොහෝ දුර යා නොහැක. දුකත් සැපත් එක හා සමානව ඇති ජීවිත දෛවයකදී වඩාත් වටින්නේ චන්දනා වැනි සම සිහින් ජීවත්වන යුවතියකි.

www.sinhalaelibrar

# 13

බණ්ඩාරවෙල වසන්ත කාලය ළඟ එන බැව් කියා පාන්නට මෙන් අළුත් රෝස පොහොට්ටු ගස් වල මතුවී ඇත. ඒ වසන්ත කාලයත් සමහම මගේ හදවතත් යම් පරිවර්තනයකට ලක් වේද...

වතාවක් ආදරය නිසා මට උන් හිටි තැන් පවා අහිමි විය... බොර වූ හිත පැදෙන්නට ගත්තේ බණ්ඩාරවෙල ආ පසුය... දැන් හදන්නේ ඒ හැඳුණු හිත මැදින් නෙළුම් ගොබයක් එබිකම් කිරීමටද...

වන්දනා තනිකර මම අලුත් නිවස පිටුපස වූ පියගැට පෙළ දිගේ වතුර කඩිත්ත දක්වා ගියෙමි. පහළටම බැස්ස පසු මම හැරී බැලුවෙමි. ඇය පියගැට පෙළ ඉහළම බලා



www.sinhalaelibrar

උන්නාය.

මට උණ ගත්තේ පාන්දරය. ඇඳ රෙදි තුනක් පොරවා ගෙන ගුලි ගැසුනද මාව අයිස් පෙට්ටියක දමූ කලෙක මෙන් වෙව්ලන්නට විය... වෙනද පාන්දරම නැගිට ස්වීටරයක් ඇඳගෙන මිදුලේ සක්මන් කරනා මම අද ඇඳටම වී ගුලිවී උන්නෙමි.

උදේ වෙද්දී උණ වැඩිවිය. මට කෙඳිරි ගෑවුනේ ඉබේටමය.

'සංදේශ් අ..යියේ...'

තේ රැගෙන ආ ඇය දොරකඩ සිට කතා කළාය... වෙනද ඇය එනතෙක් මම තණ පිස්සේ ඇවිදිමින් ඉන්නෙමි.

නැගිට ගන්නටවත් පණක් නැත. සීතල පළාතකදී ගත්තා උණ දරාගෙන සිටීම දුෂ්කරය. මම අමාරුවෙන් ගැහි ගැහී ගොස් දොරේ ලොක් එක පන්නා අපහසුවෙන් ඇය හා සිනාසී යළිත් ඇඳට ආවෙමි. දත් දත් මාව ඇඳ වැටෙතැයි මට සිතුණි.

මගේ වෙනස ඇය දකින්නට ඇත... තේකක් රැගෙනම දෙවින් එබුනේ ඒ නිසාය. මම හිසේ සිට පොරවාගෙන වෙව්ලන මුහුණින්ම ඇය දෙස බැලුවෙමි.

'ඇ..යි මේ...'

මම කතා කරගන්නට පවා බැරි තරමට වෙව්ලුවෙමි. ඇය බලා උන්නේ දෙනෙත් ලොකු කරගෙනය.

'සංදේශ් අයියේ... ස..නී..ප නැ..ත්..ද...'

යාන්තමට මම හිස වැනුවෙමි.

ඇය තේ එක ඇඳ අද්දර තබා මා අසළටම ආවාය. මම පුතෙක් ආත්මානුකම්පාවෙන් අම්මා කෙනෙක් දෙස බලන්නාක් මෙන් ඇය දෙස බැලුවෙමි...

'අ..නේ වෙව්ලනව නේ..ද...'



යුවතිය අසරණ හඬින් කීවාය.

'පා..න්..ද..ර ඉඳලා අමාරුයි...'

ඇඳ අද්දර පහත් වූ ඇය මගේ නළලටත් ගෙල පාමුලටත් පිටි අත්ල තැබුවාය... අනන්ත අමාරුකම් මැදත් මම ඒ දිගිටි ඇඟිලි වලින් අප්‍රමාණ සුවයක් ලදිමි.

'හොඳටම උණ... අ..නේ මං දන්නෑ... නැත්නම් උදෙන්ම එනවා...'

ඇය පසුතැවුණාය.

'දවල් වෙද්දී ඇරිලා යයි...'

'එහෙම බහින්නේ නෑ... ආවිටත් හැදිලා දවස් හයක් හතක් ඇල්ලුවා... ගොඩාක් අමාරුද...'

'වෙ..වි..ල..න..ව..නේ...'

චන්දනා ඇඳ පාමුල උන්නේ කරකියා ගත හැකි දෙයක් නැතුවය.

'ජයදේව අන්කලුත් තවම නිදි... මං ඇහැරලා කියන්නම්... උදෙන්ම බෙහෙත් ගන්න යන්න.... ඩොක්ටර් රාජසිංහම් හොඳයි...'

'මාමාට ඇහැරවන්නෙපා... රෑ වෙලා නිදාගත්තේ...'

'උදෙත් කිරි බොන්නෙපා... ඉන්න මං ඉක්මනට කොත්තමල්ලි හදන් එන්නම්...'

චන්දනා ගියේ තවත් වතාවක් මගේ නළලතට අත තබාය. අත එහෙමම තබන්න යැයි කියන්නට මට සිතුණි. යුවතියකගේ අතේ අප්‍රමාණ සුවයක් විය.

'මං දුවලා එ..න්..න..ම්...'

www.sinhalaelibrary.com

මම එහෙමම දෙනෙත් පියා ගත්තෙමි.

'පු..තේ..'

චන්දනා යන්නට ඇත්තේ පොඩි මාමාටත් ඇහැරවාය.

'උණ වගේ පොඩි මාමේ...'

'උණ නේන්නම්... ඇයි කොල්ලෝ මට ඇහැරුවේ නැත්තේ...'

'ඇරිලා යයි කියලා හිතුනා මාමේ...'

පොඩි මාමා එනට අත තිබ්බේය.

'තාම උණ ලාවට තියෙන්නේ... අර කෙල්ල ඇස්වල කඳුළු පුරෝගෙන කියද්දී මට බයත් හිතුණා...'

ඔහු එසේ කියද්දී මට මහා ලැජ්ජාවක් දැනිණ... ඇත්තටම මට මහා උණක් නැද්ද...

'උදෙන්ම යන් බෙහෙත් ටිකක් ගන්න... වෛරස් උණ ඇල්ලුවොත් දවස් හය හතක් අල්ලනවා... උඹට තවම මේ සීතල හරියට පුරුදුත් නැතේ...'

'දවල් වෙද්දී ඇරෙයි නේද මාමේ...'

'උඹ එන්නෙපා... මං කඩේ කොල්ලෙක් අතේ බෙහෙත් ටික එවන්නම්...'

එය වඩාත් හොඳය... සාමාන්‍යයෙන් මම වෛද්‍යවරුන් ළඟට යන්නට අකමැත්තෙමි.

'බෙහෙත් ගන්න ඕනෙත් නෑ... මේ ඉන්නේ වෙද හාමිනේලා මහ තරම්...'

කොත්තමල්ලි වීදුරුවකුත් උණුවතුර භාජනයකුත් රැගෙන කාමරයට ආ චන්දනා දෙස බලා පොඩි මාමා කීවේය.





ඇගේ දෑස් අනුකම්පා සහගත ලෙස බිමට වැටිණ.

'මං නවතින්නද දුවේ... නැත්නම් ඔයා මගේ කොල්ලව බලාගන්නවද...'

මං ඇඳ උන් කමිසය යටින් අත දමා මගේ උණු පිට අතගා පොඩි මාමා ඇසුවේය. ඈය මගේ තුවායත් උණු වතුර භාජනයත් අල්ලාගෙන නෙත් බිමට බර කර ගත්තාය.

'ම..ට පුළුවන්...'

ඒ වචන මගේ ලෙඩ පපුව මැදට වැටුනේ වෙනිවැල් කල්කයක් මෙනි.

චන්දනා මා අසලට ආවේ පොඩි මාමා කාමරයෙන් ගිය පසුය.

'මේ තුවායෙන් ඔළුව වහගෙන හුමාලේ ටිකක් අල්ලමු... සීතලට සෙම හිරවෙලා... ඒකයි ඔය කටහඬත් වෙනස් වෙලා තියෙන්නේ... ඒකට උණ ගන්නේ...'

පොරවනය එතින් ඉවත් කරද්දී ඇඳඋන් සරම එහාට මෙහාට විය. චන්දනා දෙතොල් පට තද කරගෙන මුහුණ අනෙක් පසට කර ගත්තාය. ගැණු ළමයි ළඟ වැදගත් විදිහට හැසිරෙන්නට තවම සංදේශ් ඉගෙන ගෙන නැත.

මම උණුවතුර බේසමට උඩින් මුහුණ තබා බිම දණ ඔබා ගත්තෙමි. චන්දනා මගේ හිස වැහෙන්නට තුවාය දැම්මාය.

'තව ළං කරන්න...'

මගේ හිසට අත තබා ඈය හිස වතුර බේසම අසලට පාත් කළාය. උණු වතුරින් හා වාෂ්පයෙන් මුළු මුහුණම ස්වේද වන්නට විය.

ගත පුරා දහදිය දැම්මේ ඉබේටමය.

'ඈ..හි..ද...'

තුවාය යට සිට මම ඇසුවෙමි.

'හ...ව ටි..ක..ක්...'

චන්දනා උන්නේද මගේ පාමුල ඇණ තියාගෙනය. මම යන්තම් තුවාය මෑත් කර බැලුවෙමි. මට පෙනුනේ නිරාවරණය වූ ඇගේ දණමඩලට ඉහලින් වූ දෙපාය. වහා මම තුවාය පහතට දැමුවෙමි.

'හ..යි දැන් ඔළුව උස්සන්න...'

දෙපැත්තෙන් අල්ලා මම තුවාය මෑත් කළෙමි. හුමාලයට රතු වූ දෙනෙතින් මම ඇය දෙස මොහොතක් බලා උන්නෙමි. ඇය කියුවා හරිය. හුමාලයට ස්ටීම් වූ පසුව නළල හා ඒ අවට බුරුල් විය.

'දැ..න් ටිකක් සනීපයි නේද...'

දහදියෙන් තෙත්වූ මුහුණ මම තුවායෙන් තෙත මාත්තු කර ගත්තෙමි.

'මේ ටික සනීපයි...'

'ඒකනේ... සිද්ධාලේපයි දෙහි කොළයි මේ උණුවතුරට දලා තියෙන්නේ...'

හුමාලයෙන් ආ පැහිරි සුවඳ එන්නට ඇත්තේ දෙහි කොළ වලිනි.

'ආ... දැන් මේ කොත්තමල්ලි එක බොන්න... ආයි පොරවන්නෙපා... පෙරේටවාම උණ බහින්නේ නෑ... ටිකක් හුලං වදින්නෝන...'

ඉඟුරු රසය යහමින් තිබුණෙත් මම කොත්තමල්ලි පස් පංගුව වීදුරුව බිගෙන බිගෙන ගියෙමි. මද රස්නයක් තිබු කොත්තමල්ලි වතුර සෙම බැඳුණු උගුරට දිව ඔසුවක් විය.





'බෙහෙත් ගන්නෑ...'

හිස් කොත්තමල්ලි වීදුරුව ගනිද්දී චන්දනා ඇසුවාය.

'දැන් බෙහෙත් ඕන නෑ...'

'ආයෙත් උණ ගන්නවා...'

'එතකොට ආයිත් ස්ටීම් කරමු...'

'මොනාද කන්නේ...'

'කන්න බෑ... කට අප්පිරියයි...'

දිව තිත්තම තිත්ත රසයෙන් යුතුවිය.

'ලුණු මිරිස් එක්ක රොටි හදලා ගේන්නද... කට තිත්ත උනාට ඒක කන්න පුළුවන්... උණුවෙන් ගේන්නම්...'

චන්දනා වතුර බේසමත් ගෙන යද්දී මම ඇය දෙස බලා උන්නෙමි. දවස් තුන හතරක සිට හදවතට කුමක්ද වීගෙන යයි. එය මෙසේ වචන වලින් පහද තීම අමාරුය.



www.sinhalaelibrary.com

# 14

දවස පුරාම විටින් විට උණ ගත්තේය. පොඩි මාමා එවූ බෙහෙත් ටී උදේ නිදගෙන නැගිටිද්දී දහවල් එකත් පැන තිබුණි. ඒ මොහොතේ මට ඇඳෙන්වත් බැසගන්නට බැරි තරමට ගත පණ නැති වී ගොස්ය. පැත්තකට හැරෙද්දී නළලේ තිබූ යමක් පහතට වැටිණ. මම එය අතින් ගත්තෙමි.

නළලතේ තිබුණේ සුදු පැහැල් රෙදි කැබැල්ලකි... මම එය ඉඹ බැලුවෙමි. ඉන් ආවේ ඕඩි කොලෝන් සුවඳකි. මා නිදගෙන ඉන්නා අතරවාරයේදී එය දමන්නට ඇත්තේ චන්දනාය. දෙවන වරටත් මගේ ආත්මය වටා කැරකෙන මේ ගැහැණු ආත්මය කෙරේ මම ලෝබකමින් උන්නෙමි.





'බත් චුට්ටක් ක..මු...'

ඇඳට වී මහේ කල්පනා කරමින් සිටියදී චන්දනා පැමිණ ඇසුවාය.

'කන්න බැනේ තිත්තයි නේ...'

'උණු උණු බත් එක්ක මිරිස් මාළු ගෙනාවා... ඇණුත් තෙල් දලා තියෙන්නේ... කන්න පුළුවන්...'

'බෑ... අමාරුයි...'

මගේ කීම ගණනකට නොගත් ඇය බත් පිඟානද උණු වතුර වීදුරුවද ගෙන ඇඳ මත ඉඳගත්තාය.

ඇය ඇගේ අතින්ම බත් එක අනද්දී මම පුදුමයෙන් බලා උන්නෙමි.

'ආ.. ක..ට..ක් කාලා බලන්න...'

දිවග වියළී ගියෙන් මම කොට්ටයක් ගෙන ඇඳේ ඉඳගත්තෙමි.

කුඩා සිහින් ඇඟිලි අතර වූ බත් කටත් මා වෙතටම එල්ල වී තිබූ ඇගේ දෙනෙතුත් දෙස මම මොහොතක් බලා උන්නෙමි. මේ දුප්පත් යුවතියගේ ජීවිතයෙන් විහිදෙන අසාමාන්‍ය අව්‍යාජත්වය ඉදිරියේ මම කම්පනයට පත් වී උන්නෙමි.

'කන්..න්..නැ..ත්..නම්... මං නි..ය..ලා යන්නම්... ප..ස්..සේ කන්න...'

මගේ මුවට ළං කළ අත චන්දනා පහතට හෙළුවාය. මම සිහිනයකින් පිබිදුනාක් බඳුව සිනාසුනෙමි.

'කැ..වි..වො..ත් ටිකක් කන්නම්...'

මම උගුරේ සෙම අතරින් කීවෙමි. වළාකුළකට හැංගී

සඳ සිනාසෙන්නේ යම් සේද එහෙමම යුවතිය හොකු බිමට බර කර මෘදු සිනහව සඟවා ගන්නාය. කෙල්ලෙක් ලස්සන එසේ සිනාසෙන විටදී යැයි මට සිතෙයි.

'ර..ස..යි...'

ප්‍රථම බත් කට කද්දී මට කියවිණ. අළුත් මිරිස් මාළු හොද්දේ සැරත් ඇඹුල් බැදුම් තෙල් රසයත් තිත්ත දිවහ කපාගෙන දනෙන්නට විය.

'එහෙනම් කට තිත්තයි කිව්වේ...'

'දැන් තිත්තක් නෑ...'

'එහෙනම් බත් ඔක්කොම ටික කමු... හාමතේ හිටියාම උණ වැඩිවෙනවා...'

සියල්ලටම වඩා සංදේශ්ගේ හිත ඉන්නේ හාමතේය... අතනට මෙතනට හිත දුවන්නේ ඒ නිසාය. අහිංසක කෙල්ල පිවිතුරුව කරනා උවටැන් ගැන අපිරිසිදු හිතකින් හිතන්නේ කෙසේද...

'මොනවද කියන්න ගියේ...'

වත්දනා කට හදද්දී මම ඇසුවෙමි.

'නෑ මොනවත් නෑ... මිරිස් මාළු සැර වැඩිද... ගම්මිරිස් ටිකක් යහමින් දලා තියෙන්නේ...'

'මං සැරට ආසයි... මොනවද කියන්න ගියේ කියන්න...'

'මෙහෙම ආවට ආච්චි කැමති නෑ... මට ගිය පයින් එන්න කිව්වා...'

'ඇ..යි...'

මම මෝඩයා සේ ඇසුවෙමි. පිරිමියෙකු හුදෙකලාවේ ඉන්නා ගෙයකට තරුණ ගැහැණු දරුවෙකුට එවන්නට





වැඩිහිටියෙක් කැමති නැත. ඔවුන් එසේ සිතීම වැරදි නැත.

'ආච්චි හිතන ඒවා මං හිතන්නෑ...'

ඇය හිතන්නේ මොනවාදැයි මම නොඇසීමි. මට මේ තරම් කැපවී ඇප උපස්ථාන කරනා යුවතියව වරදට පොළඹවාගෙන ඇගේ ආත්මයෙන් යමක් උදුරා ගන්නට තරම් මේ සංදේශ් පහත් නැත. එහෙත් ලෝකය මගේ හිත ගැන දන්නේ නැත.

'මට ත..නි..ය..ම කන්න පුළුවන්... වත්දනා යන්න... ආච්චි බනියි...'

මගේ කතාව ඇසූ පාටක් යුවතියගේ මුහුණේ නැත.

'මම එහෙම හිතන්නෑ කිව්වනේ...'

'කොහොමද...'

'සංදේශ් අයියා අනිත් අයට වඩා වෙනස්... නැත්නම් මෙම එන්නේ නෑ...'

මම මගේ ආත්මය පිළිබඳව ආඩම්බරයට පත් උනෙමි. අඩුම තරමේ මගේ හදවත වත් ඇය තේරුම් ගෙන ඇත.

'ආච්චිට බයයි මං ගැන... අපිට මොනා හරි උනොත් කාට කියලා කියන්නද...'

'ආච්චි කියන්නේ ඇත්ත... ගෑණු ළමයි පරිස්සම් වෙන්නෝන...'

මම මහා පණ්ඩිතයා සේ කීවෙමි.

'මෙච්චර කාලෙකට පරිස්සම් උනා... මෙහෙමවත් පිරිමි ළමයෙක් ළඟ කවදවත් ඉඳලා නෑ... ආච්චිට ඒකයි බය...'

පිඟානේ ඉතිරි වූ අවසන් බත් කටත් කවා වත්දනා ජයග්‍රාහී ලීලාවෙන් හිස් පිඟාන මට පෙන්නුවාය...



www.sinhalaelibrary.com

'දත් ටිකක් නිදාගන්න.. හවස් වෙද්දි උණ බහී...'

'හවස එන්නෙපා.. මට තේ හදාගන්න පුළුවන්... මාමා ආවට පස්සේ කෑම ගේන්න..'

ආච්චිගෙන් ආයෙම බැණුම් අසන්නට වේ යැයි සිතා මම නීවෙමි. මොහොතක් මා දෙස බලා උන් ඇය දෙනෙත් නෙත් වන තරමට ඇසිපිය නොහෙළා උන්නාය.

'මහොම හිතනවා කියලා දන්නව නම් මං කියන්නෙත් නෑ... අනික මේ හිහන වැඩකාර කොල්ලට සංදේශ් අයියා මොනවා කරන්නද...'

මගේ මෝඩ කතාව ගැන මමම තැවුනෙමි. යමක් කිව යුත්තේ දෙවරක් සිතාය. එහෙත් එක් වරක් වත් හිතන්නට පෙර මගේ මුවින් වචන පිටවේ.

'ආයි ඔය කතාව කිව්වොත් ගේන තේකක් වත් මං බොන්නෑ...'

මගේ වැරැද්ද මම අතවශ්‍ය කේන්තියක් ගෙන පිට කළෙමි. පිරිමින් එහෙමය. වැරැද්ද පිළිගනු වෙනුවට පෙරළා ගැහැණුන්ට චෝදනා කරයි.

'සො..රි...'

චන්දනා එපමණක් කියා කාමරයෙන් ගියාය. මුළු කාමරයම හද්ද පාළුවකට නතු වූවාක් වැනි විය. 'බැඳීම කියන්නේ දුකට කියන තවත් නමකි.' පොඩි හාමුදුරුවන්ගේ වචන මට සිහිවිය. මගේ හිත මේ යළිත් සූදානම් වන්නේ ටික කාලයක් ජීවිතයට හිනි ලෑ දුක යළිත් පසුවට ගන්නටද.

නැත. එය තහනම් ප්‍රදේශයකි. මතු මතුත් ඒ ගින්දර පසුවට ගැනීමට මා සූදානම් නැත. ලස්සනම කලාව ප්‍රදෙකලාව යැයි මට සිතෙයි.





මා කවරක් හිතුවද හවස් වෙද්දී හදවත මෙන්ම දෙනෙතද නොසන්සුන්ය. තව දුරටත් කාමරයේ සිව්තු නොහැකිව මම ස්වීටරයද දමාගෙන ඉදිරිපස දොර ඇර දෙරකඩට ආවෙමි.

බණ්ඩාරවෙලට මේ දිනවල වැසි නැත. ඒත් සීතල එමටය. රෑ වෙද්දි හමා එන තුහින පින්න මාසයකට වඩා ගත වෙව්ලවාලයි.

හය වන තුරුත් චන්දනා ආවේ නැත.. මගේ හිත දවෙන්නට විය. මේ පුංචි කෙල්ල මගේ ආත්මයට මේ තරම් බලපෑමක් කර ඇතැයි මම සිහිනෙකින් වත් නොහිතුවෙමි. ඇය තේන්නේ ඇයි. ඒවත් වඩා පසුව දන්නේ ඇයි.

හයයි කාලට පමණ පියගැට පෙළ නැගගෙන ඉහළට ආවේ චන්දනා නොවේ. ඇගේ ආච්චිය. මාව නැගිට්ටුවේ ඉබේටමය. බණ්ඩාරවෙලට ආ කිසිම දිනයක ඇය මෙසේ කර නැත.

'ආ..චි..චි..යේ.. ඇයි ආච්චි ආවේ... තේ හදාගෙන මං බොන්න හිටියේ...'

'කෙල්ලට හිසරදේ කියලා දවල් ඉඳලා නිදි පොඩි මහත්තයෝ... බොරුවක් කියන්නෑ ඇත්තටම අමාරු ඇති...'

දවල් යද්දි ඇයට එවැනි අමාරුවක් තිබුනේ නැත. මා කියූ දෙයකින් චන්දනාගේ හිත රිදුනාවත්ද.

'මගෙන් උණ බෝවුනාද දන්නෑ...'

මම ඇගෙන් දෙනෙත් වසන්කර කීවෙමි.

'මොන... මං බැලුවා එහෙම උණක් නෑ... රෑ වෙද්දී ඇරිලා යයි... පොඩි මහත්තයට දත් ඉණෙයි...'

'ඉණයි ආච්චියේ... දවල් බත් ටිකකුත් කෑවනේ...'

'මං මේ කිරි තේකක් හදාගෙන ආවා... තව කොත්තමල්ලි



www.sinhalaelibrary.com

වඩියක් ගේන්නද...'

'ආච්චි මහත්සි වෙන්නෙපා... මට දන් ගුණයි... ඉත්ත තිසේ ඇම්මට මං ගාව පෙත්තක් තියෙනවා මං දෙන්නම්... ඒක කිව්වාම ඇරිලා යයි...'

මම වහා කාමරයට ගොස් මා ළඟ තිබූ පැනඩෝල් පෙති දෙකක් ආච්චි අත තැබුවෙමි. ඇය එය ගත්තේ දිගු හුස්මක් හෙළාය.

'මේ කෙල්ලට මොනා හරි උනොත් මාත් දිවි තහගන්නවා මහත්තයෝ... මේ ටිකවත් ඉන්නේ මේ කෙල්ලව දලා යන්න බැරි නිසා...'

ආච්චි මට මේ ටික කියා අඬන්නේ ඇයි. මම කරකියා ගත හැකි දෙයක් නොමැතිව ඇය දෙස බලා උන්නෙමි.

'මටත් එයා ගැන හරි දුකයි... මටත් ඉන්නේ මේ වයසෙම නංගී කෙනෙක්නේ ආච්චියේ...'

ආච්චී යන්නට හැරුණේ දෙනෙතේ මතුවූ කඳුළුද පිසදගෙනමය... මම අන්දමන්දව ආච්චි අත තබා ගිය තේක අල්ලාගෙන උන්නෙමි.

මං හිතනවාට වඩා යුවතියකගේ ආත්මය බරපතලය. එවැන්නන් සමඟ ගනුදෙනු කළ යුත්තේ එහි වගකීම් ගන්නේ නම් පමණි.

යුවතියක් සමඟ මිතුරුවට වඩා යද්දී කතා හැදෙන්නේ ඇයටය... ඒසේ හවස ආච්චි චන්දනාව නෙව්වේ හේතුවක් ඇතිවය... සමහර විට මා සමඟ මිතුරුවට වඩා ඇඟෑලුම් කමක් පවත්වනවායැයි කියා ආච්චී ඇයට බණින්නට ඇත. ආච්චී අසා ඇත්තේ කොළඹ කොල්ලන් සල්ලාලයන් කියාය. ඉඩක් ලද මොහොතක මාද ඇගේ මිණිපිරියගේ පිරිසිදු





යමක් පැහැර ගනී යැයි ඇය සිතන්නට ඇත.

මම බණ්ඩාරවෙලට ආ දිනයේ සිට මේ ආදරණීය යුවතියගේ ඇසුරෙන් වින්දනයක් සතුටක් ලැබුවෙමි... එය කිසි කලෙකවත් පහත් වින්දනයක් නොවීය. ආච්චි මට කියා ගිය ඒ කතාවෙන් පසු මම මා ගැනම සැක කළෙමි.



www.sinhalaelibrary.com

# 15

ඉස්සරහට තේ ටික බෙදරදීම හද ගත යුතුය. කිරි කාරයාට කිරි බෝතලය ගෙනෙන්නට කිවූ පසු එය උණු කරවා තේ සෑදීම මහා දෙයක් නොවේ. ආරම්භයක් ලෙස මම උදෙන්ම නැගිට කෝපි හැදුවෙමි. පොඩි මාමාට කෝපි ටිකක් ජ්ලාස් එකට දමා මම කෝපි මග් එකක්ද අතැතිව දෙරකඩ වාඩි උනෙමි.

මීදුම් කපාගෙන තවමත් වැටෙන්නේ යන්තම් හිරු එළියයි. අද ආච්චි තේ ගෙනාවොත් හෙට සිට තේ ගෙනෙන්නට එපා යැයි කියන්නට මම සිතා ගත්තෙමි. ලෝකයේ බොහෝ දෙනෙක් දෙස බලන පහත් බැල්මෙන්ම කිසිවෙක් මා දෙසද බලද්දී මට වාවා ගත නොහැක.







චන්දනා පිය ගැට පෙළ නැඟ ආවේ උදවන නැගෙනහිර හිරු මඩලට පිටුපාය. එනිසාම ඇගේ ශරීරය වටා මෘදු ආලෝක කදම්බයක් විසිරී තිබුණි. බලා ඉන්නට අහිංසක ආශාවක් ආවද මම වත්තේ කොනක තාම පොදන්නා පුදී මල් වැලේ එල්ලෙන අලුත් සුදු මල් දෙස බලා උන්නෙමි. එහි අතු පුංචිය. මල් විශාලය.

යුවතියගේ බැල්ම විත් කම්මුල් වල වදිනවා දනෙයි. ඇගේ එක් අතක සුදු කිරි බෝතලයය. අනෙක් අතේ අලුත් ජර්බරාස් මල් පොකුරකි. ඒ දෙකම වාසනාවන්ත සුබ දසුන්ය. හොඳ පිරිසිදු දකුම්ය. සියල්ලටම වඩා ඇය සොඳුරු දසුනකි. මම අහක බලා උන්නේ මේ සියල්ල ගැනම නොහිතාය.

'ගුඩ් මෝනින් සංදේශ් අ..යියේ...'

චන්දනාගේ හඬට නවතාගෙන උන් හද ගැස්ම යළි ප්‍රකෘති තත්වයට පත් විය. ඇය ගැන හිතකින්වත් අහිතක් හිතන්නේ කෙලෙසකද...

'මෝනින්...'

එහෙත් මම පරිස්සමට උත්තර දුන්නෙමි. ඕනවාට වඩා ඕනැම නැත.

'දන් සනීපයි නේද...'

'ටිකක් හොඳයි...'

මගේ කතාවේද ඇස් බැල්මේද අමුත්තක් දුක චන්දනා දෑස් ලොකු කරගෙන බලා උන්නාය. ඇගේ ඇස්වල තිබුණේ 'ඇයි මේ' කියන්නාක් බඳු බැල්මකි.

'සං..දේ..ශ් අයියේ... ආ..යි උණ..ද...'

මල් ටික මගේ පය පාමුල තබා අසරණ යුවතිය අහිතක් නැතුව සීතල අත්ල නළලට තැබුවාය. තුන් හිතම කම්පාවෙන්





www.sinhalaelibrary.com

බර විය. ඇගේ ආච්චි අප අතර රැඳුණු මේ අව්‍යාජ මිතුදමට ගැරහුවේ ඇයි... මට මහා දුකක් දැනිණ.

'අ..නේ උණකුත් නැතේ...'

'මං කිව්වේ උණ බැහැලා කියලා...'

'හේනම් ඇයි මූණත් එක්ක මැලවිලා...'

මට කියා ගත හැකි දෙයක් නොමැතිව බිම තබා තිබූ කෝපි කෝප්පය ගෙන තොල ගෑවෙමි. යුවතියගේ දෑස් උඩ ගියේ එය දකය.

'මොනවද මේ...'

ඇය කෝප්පයට එබී ඇසුවාය.

'හානේ... තේ හදගෙන... ඇ..යි මං එනකං උන්නැත්..තේ...'

ඒ ඇස්වල මදවිය ඇට තරම් කඳුළුය. සංදේශ් මේ දිනවල මුහුණ පාන්නේ අසිරු රංගනයකටය...

'අද ඉඳලා මම තේ හදන්නම්...'

'ඇ..යි... ඒ...'

යුවතියගේ උගුරෙන් වචන පිට වූයේ කැඩි කැඩීය.

'තේ එක හදගන්න එක මොකක්ද... ඒකටත් ඔයාලට කරදර කරන්න බෑනේ... අනික මෙච්චර පාන්දර මෙහේ එන්නෙපා...'

ටික වෙලාවක් ඇය මා දෙසම බලා උන්නාය... ඉන් අපහසුවකට පත් වූයේ මාය.

'අ..නේ මං හිතලා ඊයේ එන්නැතුව උන්නෑ... මේ ඔළුව උස්සන්නවත් බෑ...'

මට ඇය ගැන දනෙන අවංක දුක ඇයට පෙන්වන්නට





නොගියෙමි.

'දෙන්න කිරි බෝතලේ මං හදන්නම්... චන්ද්‍රා යන්න... උදේ කෑමත් ආච්චිට ගේන්න කියන්න...'

සංදේශ් මේ කරන්නේ හොඳ වැඩක් නොවේ. අහිංසක බව දත දත කෙල්ලෙකුගේ පසුව විඳවීම සුදුසු නැත. මේ කෙල්ල ඕනවාටත් වඩා අහිංසකය.

'අ..නේ බොන්නෙපා... දෙ..න්..න...'

කෝපි කෝප්පය යළි මුවට තබා ගනිද්දී යුවතිය එය මගෙන් උදුරා ගෙන ගෙට ගියාය. මම කර කියා ගත හැකි දෙයක් නොමැතිව ඇය මගේ පය පාමුල තබා ගිය පොඩුරු ජර්බරාස් මල් පොකුර අතට ගත්තෙමි. ජර්බරාස් මල් පොකුර මැද වූ තැඹිලි පැහැයට හුරු රෝස මල මා දක්කේ පසුවය.

තවමත් හද්ද පාන්දරය. චන්ද්‍රා කුස්සියේ කිරි උණු කරන තේ හදන ශබ්දය පාන්දර නිසලතාවය බිඳිමින් ඇසෙයි. ඇය සමඟ හදිස්සියේ තරහ වූයේ අපරාදේ යැයි මට සිතුණි.

එහෙම කළ විට මේ පාන්දර මොන තරම් පාළු... ඇයව සොයාගෙන කුස්සියට යන්නට ඕනා වූ නමුදු මට යන්නට දූත් ලැජ්ජය. අවසානයේ අලුත් මල් දමන වීදුරු මල් පෝච්චිය ගෙන එයට වතුර පුරවාගෙන එන්නට මම කුස්සියට ගියෙමි. කිරි එක උණුවන්නට තබා අත් බැඳගෙන එදෙස බලා උන් යුවතිය උන්නේ හොටු ඉහළට සුරමිනි. ඇයව මේ පාන්දර ඇඬෙව්වේ ඇයි...

වීදුරු පෝච්චිය සෝද එයට සින්ක් එකේ ටැප් එකෙන් වතුර පුරවද්දී ඇය තොල් පට තද කරගෙන හැරී බැලුවාය. ඒ ඇස්වල කඳුළු වැනි වතුර මෙනි.

අහංකාර සංදේශ් ඒ කඳුළු ගැනවත් නොහිතා මල් පෝච්චියට වතුර පුරවාගෙන යන්නට හැරුණේය. යුවතිය

දුවගෙන වින් කෑම කාමරයේදී මට ඉස්සර වී මගේ පැත්තට හැරුණාය.

ඇගේ දැන් එකට එක් වූයේ මා ඉදිරිපිටදීය.

'වරදක් උනානම් ස..මා..වෙ..න්..න... අ..නේ මට ග..හ..න්..න... අයියා ඕ..හො..ම කතා නොකර උන්නොත් මේ... දුප්පත් කෙල්ල මැරෙයි... ආච්චි මොනා හරි කිව්ව නම් මට ඒකටත් සමාවෙන්න...'

නොහිඳු මොහොතක යුවතිය මට පහන් වී වැන්දය. ආත්මයේ ඇට කටු පවා පොඩි වන සෙයක් මට දැනුණි. මම මල් පෝච්චිය මේසය මත තබා ඇගෙ දෙතින්ම නැගිට්ටවූවෙමි. මොරසූරන වැස්සක් සේ කඳුළු ගලන ඇය දෙස මම බලාගෙන්වනම උන්නෙමි.

'මට සමාවෙන්න...'

දකුණතින් ඒ හිස අතගා මම කීවෙමි.

'ආ..ච්..චි මොනාද ඒයේ කිව්වේ...'

'මොකුත් නෑ...'

'ඇයි එහෙනම් තනියම කෝපි හදගත්තේ.. මට එන්නෙපා කියන්නේ..'

ඈයට දෙන්නට උත්තරයක් මා අත නැත.

'ලෝ..කේ කව්රු ගැන එහෙම හිතුවත් මං... මං... සංදේශ් අයිය ගැන එහෙම හිතන්නෑ..'

එසේ කී යුවතිය මල් පොකුර ගෙන මල් වාස් එකට දමා එය මනාසේ සකසා යළි මගේ අතට දුන්නාය.

'ආච්චි මං ගැන දන්නෑ සංදේශ් අයියේ... ඔයා මොනාවවත් මට කරන්නේත නෑ... මොනාද ඕනේ මං ඒ හැම දෙයක්ම





ආසාවෙන් දෙනවා... ආච්චි ඒක දන්නේ නෑ...'

ගවුමේ දෙඋරහිසින් කඳුළු පිසද එසේ කියා වන්දනා ගියාය. සැබෑ යුවතියකගේ ඒ නිර්මල ප්‍රකාශය ඉදිරියේ මම සැලී ගියෙමි. කොල්ලෙක් ඉඳිද්දී සිතා මතාම ගවුම සකසා ගන්නා පපුව වසා ගන්නා යුවතියන් අතරේ ඇගේ මේ අවංක කමට මම ගරු කළෙමි.

'අපේ ආච්චිට පිස්සු... ඔයා මට කියන්නෑ මොනවා හරි මෙහේ ඇවිත් කියවන්නෑකි...'

'මොනවත් කිව්වේ නෑ... ඔයා හිස රඳේ හැදිලා තිද කිව්වා...'

'මට හැන්දෑවේ හරියට දුක හිතුනා... ඇඬුවාම ඔළුව කැක්කුම හැදෙනවා...'

ඇය ඇඬුවේ ඇයි කියා අසන්නට මම නොගියෙමි. අප අතර රහස් කතාවක් විණි.

'ආච්චි එක්ක තරහ වෙලා කතාවට යන්නෙපා... එයා ඔයාට හරි ආදරෙයි...'

මම එළු කිරි වීදුරුව අතට ගනිමින් කීවෙමි. ඇගේ මුවහට අමුතු සිනාවක් ආවේය.

'ඔය මා එක්ක ආච්චි තරහ වෙලා ඉන්නේ ඔය මොනාවට වත් නොමේ...'

'එහෙනම්..'

'අපට දුරින් නෑදෑවෙන මාමා කෙනෙක් ඉන්නවා බිඳුණුවැවේ... ඒ මාමගේ පුතා මාමා මාර්ගයෙන් මං ගැන අහලා එවලා... අතුලට එල්ල් එකක් තියෙනවා... එලෝලු තමයි එයත් ට්‍රාන්ස්පෝට් කරන්නේ... ආච්චි හරි ආසාවෙන්

ඉන්නේ අතුලයියට මාව බන්දලා දෙන්න... ඉරිද එයාලට එන්නත් කියලා...'

මම මහා සංවේගයකින් බලා උන්නෙමි. හදිස්සියේවත් ඇය විවාහ වී බණ්ඩාරවෙලින් ගියහොත් කොතරම් පාළුවක් මට දැනෙනු ඇත්ද.

'ඉ..තින් බඳිනවද එයා..ව...'

'ඉරිද එයාලට ආවිචි එන්නෙයි කියලා... මං බැණ බැණ ඉන්නේ... ඒකට මං එක්ක තරහාවෙලා ඉන්නේ...'

'ඇයි එයාව බඳින්න පුළුවන්නේ...'

යුවතිය මගේ කතාවට පිළිතුරක් නොදී පිටුපස දොරත් වසා ගේවා පාත්තී දෙසම බලා උන්නාය.

'අතුලයියව මං දැකලා තියෙන්නේ දවස් දෙකයි තුනයි... එයා මාව දැකලා තියෙන්නෙත් දවස් දෙකයි තුනයි... මං එයා ගැන මොනවවත් දන්නෙත් නෑ... එහෙම ඉඳලා දුක් විඳින්න උනොත් මට කව්රුවත් නෑ අයියේ...'

'කව්රු බැන්දත් එයාව තේරුම් ගන්න වෙන්නේ බැන්දට පස්සේ තමයි ළමයෝ..'

'එ..හෙ..ම..ම..ත් නෑ... සමහර අයව බඳින්න කලින් හොඳට තේරුම් ගන්න පුළුවන්..'

'කාව..ද...'

මම හදිස්සියේ ඇසුවෙමි. යුවතිය බිම බලා ගත්තාය.

'මං කිව්වේ සමහර අයව... ඔය එක එක අය ඉන්නේ...'

මටසිලිටි දෙකම්මුල් පුරා නිර්මල මදහසක් පැතිර ගියේය... එවර නම් ඒ කම්මුලක් එක මොහොතකට සිප ගැනීමේ හිතුවක්කාර ආශාවක් උපන් බව මම කියමි.





'පවුල් ජීවිතේ ගැන මට හරි අත්දැකීම් තියෙනවා සංදේශ් අයියේ... මගේ අම්මයි තාත්තයි මැද්දේ මං ජීවත් වුනේ හා පැටියෙක් වගේ... හිතින් පෑහෙන්නේ නැති අය බැන්දම ප්‍රශ්න ගොඩාක් ඇතිවෙනවා... එහෙම දුක් විඳින්න අමාරුයි...'

වයසින් තරමක් ළාබාල වුව චන්දනා අත් දැකීම් වලින් මෝරා ගිය යුවතියකි. එක්තරා දුරකට ජීවිතය පිළිබඳ ඇගේම දර්ශනයක් ඇයට ඇත.

'ඔයාට එහෙම කවදාවත් වෙන්නේ නෑ...'

'වෙන්න තියෙන දෙයක් වළක්වන්න බෑ සංදේශ් අයියේ...'

'ඇයි දුකෙන් වගේ කතා කරන්නේ...'

'සංදේශ් අයියත් හැම වෙලාවෙම දුකෙන්නේ ඉන්නේ... සමහර දවස් වලට මං බලං ඉන්නවා පහළට වෙලා රෑත් දෙරකඩට වෙලා හරි කල්පනාව

'රෑට නින්ද යන්නෑ චන්දනා...'

'පෙලක් වෙලාවල් වලට මටත් නින්ද යන් නෑ... ආච්චි බනිනවා රෑ ඇහැරිලා නින්දෙන් ඇවිදිනවා කියලා...'

පොඩි මාමා කාමරයට ආවෙන් ඇගේ කතාව නැවතිණ.

'මොනවද දුවේ මගේ කොල්ලා කියන්නේ...'

ඔහු ඇසුවේ චන්දනාගෙනි.

'බණ්ඩාරවෙල හරි පාළුයිලු... කොළඹ ගර්ල් ෆ්‍රෙන්ඩ්ව මතක් වෙනවා ඇති...'

ඇගේ කතාවට පොඩි මාමා හඬ නගා සිනාසුනේය. මගේ ආදර කතාව අකුරක් නැර ඔහු දනී.

'සංදේශ් අයියා කොළඹ දාලා එන්න ගොඩාක් හේතු



www.sinhalaelibrary.com

කියෙනවා පොඩි කෙල්ලේ.. උඹ හිතනවට වඩා මේ කොල්ලා දුක් වින්ද.. ඌට මෙහේ පාළුවක් දැනෙන්න විදිහක් නෑ...'

චන්දනා පරාජය බාර ගත්තාය. එළකිරි මග් එක මාමා අත තබද්දී චන්දනා හොරැහින් මා දෙස නෙත් හෙළුවාය.

'අපි සෙනසුරාද උදේ කොළඹ යනවා පුතේ.. සංදේශ් අයියලාගේ ගෙදර කිරි දානයක්..'

යුවතියගේ දෑස් කුඩා විය. මම හොඳට බලාගෙන උන්නෙමි.

'කා..ව..ද..ද එන්නේ..'

'අපි සද්දූ තමා එන්නේ..'

චන්දනා ඉන් පසු කිසි කතා බහක් නොමැතිව අපට පිටුපා කෝප්ප සෝදන්නට ගත්තාය. පොඩි මාමා මා දෙස බලා 'කෙල්ල පව්' යැයි කියන්නට මෙන් ඇස් පුංචි කළේය.

'අනිත් දවසේ යනකොට ඔයාවත් අපි එක්කං යන්නං...'

පොඩි මාමා එසේ කීවේ ඇගේ හිත හදන්නටය.

'ඉරිද චන්දනාව බලන්න මනමාලයෙක් එනවලු...'

මම විහිළුවක් ලෙස නොව බැරෑරුම් ලෙස කීවෙමි. පොඩි මාමා පුදුමයෙන් ඇය වෙත ගියේය.

'ඇත්තද කෙල්ලේ..'

'ඔ..ව් ජයදේව අන්කල්.. ආච්චිගේ පිස්සු වැ..ඩ...'

ඇගේ හඬේ උගුරෙන් බිඳී ගිය ස්වභාවයක් විය.

'හදිස්සියේ.. උඹ තාම පොඩි කෙල්ලනේ... අනික ඔයාව දීගන්න බැරි කෙල්ලෙක් යැ...'

පොඩි මාමා කියන්නේ ඇත්තය. චන්දනා දී ගන්නට





බැරි යුවතියක් නොවේ. ඇගේ ආකර්ශනීය සුන්දරත්වයක් පිහිටා තිබුණි. මීට වඩා වත් පොහොසත් කම් ඇති පවුලක ඉපදුනා නම් ඇය මීටත් වඩා ලස්සනට අඳිනු පළඳිනු ඇත. සියල්ලට වඩා චන්දනා ගුණ යහපත් යුවතියක් වූවාය. යුවතියකගේ ගුණ යහපත් කම ඇය ගල්වන සුවඳ විලවුන් බිඳක් බඳුය. ඒ සුවඳ ඇය හා යන යන තැන ඇය හා එයි.

'කවුද දන් ඔය එන මනමාලයා...'

'ජයදේව අන්කල් දන්නවා... අර එළෝලු ට්‍රාන්ස්පෝට් කරන නිල් පාට එල්ෆ් එකේ එන්නේ... අතුල... සංදේශ් අයියාගේ වයසේ ටිකක් උස් කෙනෙක්...'

'හරි හරි මං මිනිහව දන්නවා... 'ජනහිත' එල්ෆ් එක ගේන කොල්ලනේ...'

'ඔ..ව්...'

පොඩි මාමා දිග සුසුමක් හෙළුවේය. ඔහු යමක් කියන්නට ගොස් ගිල ගත්තේය. චන්දනා වෙත ගිය පොඩි මාමා අතේ වූ කෝප්පය ඇය අතට දී ඇගේ හිස අතගෑවේය.

'ආච්චිගේ හිත හදන්නනේ... උඹ මගේ එදට ඉඳපන්... ඒත් ඌ උඹට ගැළපෙන කොල්ලෙක් නෙමේ... උඹ මලක්... ඌ කබරයෙක්...'

'මම කැමතිම නෑ...'

'උඹ කැමති කෙනෙක් ඉන්නවද කෙල්ලේ...'

යුවතිය ලැජ්ජාවෙන් සිනාසුනා ඇරෙන්නට ඔව්යැයි කීවේ නැත.

'වෙන්න තියෙන දෙයක් තියෙනවනම් ඒවිතේ වෙයි... උඹලගේ ආච්චි මං කියන දේවල් වත් පිළිගන්නේ නෑ...



www.sinhalaelibrary.com

ගෑණි ටිකක් තදයි... නැත්නම් මං කියනවා...'

'ආච්චි හිතන්නේ සාට හරි බන්දලා දුන්නම ඒ මිනිහා ඔහේ මාව බලා ගනී කියලා... අම්මගෙයි තාත්තගෙයි පවුල් ජීවිතේට වෙච්ච දේ වත් ආච්චිට මතක නෑ...'

'වයසක මිනිස්සුනේ කෙල්ලේ... උඹ බයවෙන්නෙපා... මං ඔයාව පිට දරුවෙක් කියලා හිතලා නෑ... ඉස්සෙල්ලා අපි රස්සාව කරමුකෝ...'

පොඩි මාමා ගියේ මගේ දෙසද බලාය.

'තාම කට තිත්තද...'

'ඔ..ව්...'

'උදේට මොනාද කන්නේ...'

'මොනාහරි...'

'රොටි හදලා ලුණු මිරිස් එක්ක...'

උණු උණු පොල් රොටියක් මට මැවී පෙනුණි.

'මිප ළඟ ඉඳගෙනම කන්න තියෙනවනම් මරු... කට්ට සම්බෝල එක්ක...'

'මං උණු උණුවෙම අරගෙන එන්නම්...'

යන්නට සූදනම් වී චන්දනා යළිත් හැරුණාය.

'කොළඹ ගිහිල්ලා සඳුදටත් වඩා කල් ඉන්නවද...'

'හිතුනොත් ඉන්නවා...'

මම බොරුවට කීවෙමි. වේගයෙන් ඉහළට ගත් ඇගේ පපුව ඒත් සමඟම පහත් විය.

'ඇඳුම් ටික තියලා යන්න... මං හෝදලා මැදලා තියන්නම්...'





නංගිවත් මට එහෙම කරන්නේ නැත. මේ දුප්පත් යුවතිය ලවා මගේ ඇඳුම් සෝද ගැනීමට මට නොහැක.

'මං ගෙදර අරගෙන යන්නම්...'

'එ..පා... ගියාම මටත් පාළුයි... කරන්න වැඩකුත් නැතේ...'

තරමක් දිගට වැවූ නියපොත්තකින් බිත්තිය සූරමින් චන්දනා මිමිණුවාය.

'අපි සඳුද උදෙන්ම එනවා... ඉන්නවා කියලා මං බොරු කිව්වේ...'

'ඇඳුම් මට තියලා ය..න්..න...'

'කොළුඹින් මොනා හරි ගෙනත් ඕනද...'

විශේෂත්වයක් නැතද මම සාමාන්‍ය ලෙස ඇසුවෙමි. මගේ ලෙඩට දුකට උවටැන් කළ ආදරණීය සාත්තු සේවිකාවට මා නොසළකා සිටින්නේ කොහොමද.

'නංගියි සංදේශ් අයියයි ඉන්න ෆොටෝ එකක් මට ගෙනත් දෙනවද... ඒ ඇති...'

එපමණක් කියා චන්දනා නික්ම ගියාය. සෙනසුරාදත් ඉරිදත් කිරි දනය යෙදුනේ අපරාදේ යැයි දන් මට සිතෙයි.

ඕනාවට වඩා බැඳීම් වලට බැඳුණු කල හිත වැඩ කරන්නේ අනිත් අතටය.



www.sinhalaelibrary.com

# 16

**මෙ**නසුරාද පාන්දරම කොළඹ යන්නට ඇඳ ගනිද්දී මගේ හිතට මහා දුකක් දැනිණ. බණ්ඩාරවෙල දවස් දෙකකට හෝ දමා යන්නේ අපරාදේ යැයි යටි සිත කියන්නට විය. මොකක්දෝ ආදරණීය ලාටු වර්ගයකින් මගේ ආත්මය බණ්ඩාරවෙලට බන්ද ඇති බවක් මට දැනෙයි.

තවමත් පරිසරය කළුවරය. ඇයව බලාම කොළඹ යන්නට බලකරන හිත ගැන මම පුදුම වුනෙමි. ප්‍රේමයක පුන්චි අළුව් ගිය අවාසනාවන්ත වස්සාන සමයක මම හිත හදගන්නට බණ්ඩාරවල ආවෙමි. හිත් නිමිතයක පිපුණ මේ පියකරු කාශේෂන් මල මගේ නෙත ගැටුනේ එවිටය.

උදේ දවල් රෑ පුරා ඒ කුසුම මගේ නෙත් ඉදිරිපිට පිපි





සුවඳ දෙන්නට විය. වරුවක් පැයක් ඒ මල පෙනෙන්නට නොමැති වූවිට මගේ ඇස් දෙකට පවා පාළු දැනුණි. යළි බැඳීම ඇයි... ජීවිතයේ කුණාටු සමයකින් පසු ප්‍රේමයේ මඳ පවන් හමා ඒ යැයි සංදේශ් හිතුවේ ඇයි.

ඊයේ හවස සිට කෙල්ලගේ මුහුණ අඹුතුය. ඇය කතා කළේ පවා වචන දෙක තුනකි. ඇස් වල පවා තිබුනේ තුනී නෙත ගතියකි. යමක් කිවුවා යැයි ඊයේ රෑ සිතාගත්තද කැම එක කබා ඇය එහෙමම ගියාය. උදේ එන බවක් වත් නොකීවාය.

නිල් ඩෙනිම් කලිසමත් සුදු ටී ෂර්ට් එකත් ඇඳගෙන මම බණ්ඩාරවෙලින් ගත් රතු කැප් තොප්පියද දමා ගත්තෙමි.

කැප් එකක් ගත්තේ පෙරේද ඉන්දියා ලංකා මැච් එකේදී සචින් මෙවැනිම කැප් එකක් පැළඳ උන් නිසාය. එය ලස්සන යැයි මට හිතුනේ මගේ මුහුණද සචින්ගේ මුහුණ මෙන් රවුම් නිසාය.

පුංචි පුංචි සද්ද බද්ද කුස්සියෙන් ඇහෙද්දී මට මහා සැනසීමක් දැනුණි. යුවතිය පාන්දරම පැමිණ ඇත. ඒ කුඩා දෙය සංදේශ්ට මේ තරම් හිතට ගන්නට වැදගත් නැත. පාන්දරම නාගෙන මුහුණේ ගාගත් සිග්නේචර් ආෆ්ටර් ෂේව් වලින් එන සුවඳ මගේ සිතට ඇති කළේ මෘදු සතුටකි.

උදෙන්ම කිරි බෝතලය ගෙන වන්දනා එය හදමින් උන්නාය. මගේ සපත්තු හඬ ඇසී එක්වරක් පමණක් මා දෙස බලා ඇඹුම්බර හිනාවක් පෑවාය.

ඇය උන්නේ දුකෙනි. ඒ දුක ඇය පෙන්නුවේ නිහඬවය. මම ඇය අසලටම ගොස් හිස එසවීමි. ඒ ඇස් මට නොපෙනෙන තරමට බිමට බරවී තිබුණි.

'උදෙන්ම ගියාම ලේසියි..'

ඇය හිස නොඋස්සාම උන්නාය.

මම මිමිණුවෙමි. ඇය හිස නොඋස්සාම උන්නාය.

'ඇ...යි... මේ...'

හදිසියේම චන්දනාගේ ඇස්වල තිබුණ කඳුළක් උණු කිරි භාජනයට 'සටස්' ගාමින් වැටින. ඇය අඬන බව මා තේරුම් ගත්තේ එවිටය.

'ඇ...යි අඬන්නේ...'

මා කැවුනේ ඇයව අල්ලාගන්නට බැරුවය. වචනයක්වත් කතා නොකළ යුවතිය මුකුත් නැතැයි කියන්නට මෙන් හිස වැනුවාය.

'කියන්න...'

මම චන්දනාගේ අත් ගෙබය මත සුරත තබා ඇයව මා පැත්තට හරවා ගත්තෙමි. යුවතිය අතේ ඇඟිලි පටලවා ගෙන යටි තොල හපාගෙන උන්නාය.

'ස...දු...ද එ...න...ව නේ...ද...'

මම චන්දනාගේ උරහිසෙන් අත ගත්තේ මගේ අත ඇගේ සුරත දිගේ පහලට පිරිමැද වැටෙන්නට සලස්වමිනි.

'ඔ...ව්... සඳුදා උදෙන්ම එ...න...වා...'

'ගියාම මේ පැ...ත්...ත...ම පා...ර...යි...'

ඇය අඬන්නේ ඒ පාළුව දනීද... කිසිවෙකුගේ ජීවිතය සදාකාලික නැත. පාළුවට තනිකමට හිත පුරුදු කළ යුතුය.

මගෙන් මෑත් ඈත් වී කබඩ් එක ළඟට ගිය ඇය හොඳටෝම පැහැවී ගවුමේ පහළ වාටියෙන් කඳුළු පිසද මුහුණ විසල් කරගෙන යළි හැරුනාය.

'උදේට මහින්ද කන්නේ...'

'ඔව්... පුස්සැල්ලාවේ රෙස්ට් එකෙන් කනවා...'





එළකිරි වීදුරුව හදමින් යුවතිය කුමක් හෝ කියන්නට කට හැදුවාය.

'මං බඩුවක් හැදුවා... ගෙනියන්න දෙන්නද...'

ඇය ඇසුවේ බියෙනි. මං කැප් එක ගලවා එය අතින් පැත්තට පලඳ ගත්තෙමි. ගැඟුලින් පලඳින්නේ එලෙසය.

'එහෙම ලස්සනයි...'

චන්දනා කීවාය. කණ්නාඩියකින් මෙන් මට ඇගේ ඇස් වලින් මාව පෙනෙන්නට විය.

'මො...න...ව...ද හැදුවේ...'

'පුහුල් දෝසි... ගේන්නද...'

'ගෙදර ගිහින් කාටද දෙන්නේ...'

'අම්මට හරි... නංගිට හරි... මං දුන්නා කියන්නෙපා... මං ආසාවට හැදුවේ...'

එළකිරි වීදුරුව මා අතට දෙද්දී මම පරිස්සමින් ඇගේ නෙත් දෙස බලා උන්නෙමි. මගේ බැල්ම සැර වැඩි නිසාදෝ කෙල්ල බිම බලා ගත්තාය.

'හවසට මෙහෙට ඇවිත් ඉන්න... මං කෝල් කරන්නම්...'

එහෙම කීවේ ඇයිදැයි මමවත් නොදනිමි.

'කීයටද...'

'හතරට විතර...'

'කොළඹ ගියාම මේ හිඟන කෙල්ලව මතක නැ.. කමක් නැ... මං ඉන්නම්...'

'බලපන් මට අමතක වෙයිද කියලා...'

මා වටා කුඩා රැස් මාලාවක් මෙන් කැරකෙන



www.sinhalaelibrary.com

චන්ද්‍රනාගේ සුවඳ මගේ ලෝකයෙන් අමතක කළ නොහැකි බව මා තේරුම් ගත්තේද අද උදසනය. මේ දවස් දෙකේ බණ්ඩාරවෙලින් යාමේ දුක මම පසුවේ තබාගත්තෙමි. එහෙත් මා දවස් දෙකකට වෙන්වී යන දුක කෙල්ලට වාවාගන්නට නොහැකි විය.

'ඉරිදා එන මනමාලයට කැමති වෙන්නෙපා.. ඌ කබරයෙක් මයා මලක්..'

එන මනමාලයා කබරයා යැයි ඊයේ කීවේ පොඩි මාමාය.

මම එයද ඇදගෙන ඇයට මෙසේ කීවේ ඇයි...

'එයාට නෑ...මේ.. මං කාටවත් කැමති නෑ...'

'කාටවත්ම කැමති නැද්ද..'

මම ඇසුවෙමි.

'නෑ...'

'නෑ නිකං චූට්ටක් වත් කැමති කෙනෙක්...'

සංදේශ්ට දුක හිතෙන්නේ ඇයි...

'හො...ඩ...ක් කැමති කෙනෙක් ඉන්නවා...'

නියපොතු හපද්දී මම ඇගේ අතට ගැසුවෙමි.

'බඩට ගිහින් ඔපරේෂන් කරන්න වෙනවා...'

ඒ කතාව අම්මා නිතරම කියන්නේ තාංගිටය.

'කාටද කැමති...'

'මං ද...න්...නෑ...'

එසේ කී යුවතිය සාලය හරහා දුවගොස් මිදුලට බැස්සාය.

අපි යනතෙක් ඇය වාහනය ළඟට වී උන්නාය.





'ටිකක් හිනාවෙලා ඉඳපන් කෙල්ලේ.. ඔහොම ඉඳලා සිරියාවක් නෑ...'

මාමා ගේකුළ සිට පැමිණ වාහනයට නැග්ගේ පොඩි කෙල්ලගේ පස්සට ගසමිනි. චන්ද්‍රනා ඇස් වල කඳුළු පුරවාගෙන තමුදු දෙතොලින් මදහසක් පෑවාය.

'උඹට පාළුයි නේ...ද... අපි සඳුදා එනවා කෙල්ලේ... යතුර උඹ ළඟ තියෙන්වනේ... ඇවිත් ටී. වී. එක එහෙම බලන්න මැණික...'

'මං සඳුදා කෑම හදලා තියන්නද අත්කල්...'

'අපි හිතුවේ මහින් කාලා එන්න... කමක් නෑ... උඹ කෑම හදපන්... අපි උඹෙත් කෑම කන්න බලාගෙන එනවා...'

මම යන්නම් කියන්න හිස වැනුවෙමි. පොඩි මාමා වාහනය ඇද්දුවේය.

මිදුලේ රෝස පැළ වලට පසුබිම්ව අහසත් ඇගේ මුහුණත් මම පැති කණ්ණාඩියෙන් දුක ගත්තෙමි. මට හිල්පුනේ ඉබේටමය.

'ලොකු පුතේ...'

මාමා කතා කළේ සෑහෙන දුරක් ගිය පසුය.

'පොඩි මා...මේ...'

'උඹට මොනවද වෙනව වගේද...'

මම සිනාසුනෙමි. පොඩි මාමා අහන්නේ මොනවා ගැන දැයි මම දන උන්නෙමි.

'උදේ කොළඹ යන්න ඇඳගත්තහම හරියට දුක හිතුනා පොඩි මාමේ...'

'උඹේ හිතත් මගේ වගේ... කද නෑ... අපි වැඩිය



www.sinhalaelibrary.com

හිතන්නැතුව ජීවත් වෙමු...'

පොඩි මාමා කියන්නේ ඇත්තය.

'බණ්ඩාරවෙලට ආවයින් පස්සේ උඹ ලස්සන වෙලා.. කොළඹින් එද්දී උඹ හරි කැත වෙලා හිටියේ...'

'මටත් එහෙම හිතෙනවා මාමේ...'

'මිනිස්සු ලස්සන වෙන්නේ ආදරේ කරනකොට.. ලේ පිරිසිදු වෙනවනේ...'

මම සිනාසුනෙමි. පොඩි මාමා ඇසක් ගසා ඉදිරිය බලා ගත්තේය. මම  වාහනයේ කැසට් රෙකෝඩය ක්‍රියාත්මක කළෙමි.

කලක් ඇවෑමෙන් පෙරුම් පුරා
සසැඳෙන පිවිතුරු සිතක් සොයා
සිහින විමානෙන් ඔබ ඇවිදින් අද
මගෙ හදවත මල් ලොවක් කළා...

www.sinhalaelibrary

# 17

කුරුළු කැලේ මගේ හිත අලුතින් කඩා දම්මේය. මගේ කාමරයට ගොස් උඩ දොර මා ඇරියේ පුරුද්දටය. ශහීතාගේ කාමරය පාළුය. ඇය උදේ හවා වතුර දමා බැල්කනියේ සිටවූ බතික් බෝගන්විලා ගසේ එක මලක් වත් නැත. කොළ දෙක තුනක් පමණක් තිබූ බෝගන්විලා ගසත් අපේ මියගිය ආදරයත් දෙකම එකක් යැයි මට සිතුණි.

අපේ ආදරයේ අවසාන දවස මට සිහිවිය. ඒ තරම් දුක් විදි දවස් කිහිපයක් යළිත් මේ ආත්මයේ ඒ යැයි සිතීම අපහසුය. ආදරය ගින්දරක් වී සාමාන්‍ය කොල්ලෙකුගේ කෙල්ලෙකුගේ පපුව දවා හළු කළේ කොතරම් කෲර ලෙසද.

ශහීතා දැන් කොහේ ඉන්නවා ඇත්ද. සියල්ල අමතක

කළා යැයි කියා පසුව දන් මේ සූදනම් වන්නේ කුමකටද... අතීතය කෙරේ වූ අලුත් ලෝබකමකින් දවෙන පිච්චෙන ළය සනසාගත හැකි කිසිවක් දනට කුරුළු කැලේ ඉතිරි වී නැත.

පර්දුව යටින් සැඟවී ගියේ ශහීනා පමණක් නොවේ. මගේ කුළුදුල් ආදරයද... ජීවිතයේ ලස්සනම දවස් කිහිපයක හිටු සිහිනද සියල්ල ඒ යටින් ඈතට පාව ගියේය.

මතුපිටින් නැඹුවද හදවත ඇතුලාන්තයට සටස් සටස් ගා යමක් වැටෙනු මට දැනෙයි.

අප ආදරය කළේ කොතරම් ටික කාලයක්ද. ඒත් ඒ ටික කාලය හදවතිට කළ බලපෑම මොන තරම් දරුණු විද. ශහීනාගේ පාසල් ගමන අතරමඟ අඩාල වූයේත් ඇයට හදිස්සියේම විවාහ වන්නට සිදු වූයේත් මා නිසාද.

ආදරය පසුවේ ඇති කරන තුවාල කාලයත් සමඟම සුවවේ. එය සැබෑය. එහෙත් ඒ සෙනෙහස අහිමි කළ මිනිසුන්ගේ සිහින... අපේක්ෂා... ඒවාට වන්නේ කුමක්ද. ඒවාට වග කියන්නේ කවුද.

පුංචි කෝච්චියේ සීතාවක ගිය අයුරු... මහ වැස්සේ කුරුළු කැලේ මා තෙමුණ හැටි... පුරා රියක් අවදි වී ඒ පැත්තෙන් මේ පැත්තට... මේ පැත්තෙන් ඒ පැත්තට ලියුම් කැලි හුවමාරු කර ගත් හැටි... මට මැවි මැවී පෙනෙන්නට විය.

අවසාන දවසේ සැලෝන් එකේ උඩ තට්ටුවේදී මගේ පපුවට තුරුල් වූ ශහීනාගේ මූහුණ මට සිහිවිය. බණ්ඩාරවෙලින් පන්සලක් කරගෙන ආ හිත කුරුළු කැලේදී අමු සොහොන් පිටියක් විද.

දන් දන් ශහීනා බැල්කනියේ දොර ඇරගෙන එතැයි මම බලා උන්නෙමි. නැත. සඳ හෙවනැලි වැටෙන සුදු බිත්ති සේ හිස් බව මිසක මතක නොතක ඡායාවක් වත් නැත.





'අ..යි..යේ...'

නංගිගේ සීතල අතක් විත් මගේ උරහිස මත රැඳුණි. මම ඇගේ අතින් ඇද ඇයව ඉදිරියට ගත්තෙමි. නංගී පුටු පත්ත මත වාඩිවී මගේ හිස පුරා උකුණෙක් සොයන්නට මෙන් ඇඟිලි තුඩු ගෙන ගියාය. උකුණන් මගේ හිසේ නැතද එහෙම අතගාද්දී හිසට සනීපය.

'ම..ත..ක් වෙනව නේද...'

ඇගේ හඬ සියුම්ය. අඩවන පුළුය.

'ම්...'

'මටත් හරියට මතක් වෙනවා... ගිය සතියේ දවසක ආවා... කෙල්ල කෙට්ටු වෙලා ගිහින්... අර පිරිච්ච පාට දන් නෑ...'

'ක..තා කළාද...'

'ම්... ජීවිතේම කළකිරිලා වගේ කතා කළේ... හරි ඉක්මනට එයා මේ හැම දෙයක්ම දලා යනවලු... ජීවත් වෙන එකේ කිසිම තේරුමක් නැලු... මං පුළුවන් විදිහට හිත හැදුවා... කෙල්ල හරියට කම්පනේට පත්වෙලා...'

'පොඩි ළමයෙක්නේ... එකපාර බන්දලා දුන්නනේ...'

'ඩොක්ටර් ළඟට යන ගමන් කිව්වා ආවේ... මං හිතන්නේ බබෙක් ලැබෙන්නද දන්නෑ... මං අහන්න ගියේ නෑ...'

අම්මා කෙනෙක් වූ පසු ඇයට සියල්ල අමතක වී යනු ඇත.

'මං කුරුළු කැලේ හිටිය නම් මට පිස්සු හැදෙනවා නංගී...'

'අම්මත් කියන්නේ ඒකයි...'

'ඔයාට පාළුද...'

'මාත් ඒකට පුරුදු වෙලා අයියේ... පුළුවන් නම් එක දෙයක් කරන්න... කොහොමහරි ටෙලිෆෝන්වත් ගෙදරට ගමු... එතකොට මට ඔයාටවත් කතා කර කර ඉන්න පුළුවන්...'

ගැහැණු ළමයෙකු මේ තරම් තනිවීම පුදුම නැත. නංගීගේ පාළුව මගේ හිතට බියක් ඇති කළේය.

'මං ඔයාට බඩුවක් කියන්නද...'

මම නංගීගේ දෙපා මත පුරන තබාගත්තෙමි.

'හා...'

'ජීවිතේ ගැන මොකක් හරි තීරණයක් ගන්නවනම් මට කියන්න...'

නංගී සිනාසුනාය.

'අයියා කියන්නේ මං මේ පාළුව දරාගන්න බැරිව මොකෙක් හරි කොල්ලෙක් එක්ක යාළු වෙයි කියලද...'

නංගීට මට වඩා ඉව ඇත.

'ඔව්...'

මම අවංකව කීවෙමි. ඇය විනාඩි දෙක තුනක් කතා නොකර උන්නාය.

'නෑ අයියේ... අයියා දුක් විඳපු හැටි මං දක්කා... එහෙම දෙයක් කරගන්න කලින් මං ගොඩාක් හිතනවා... මං දුක් විඳින්න ආස නෑ... මං හිත්ද ඔයා අම්ම තාත්තා දුක් විඳිනවා බලන් ඉන්නත් මට බෑ... කවදහරි මගේ ළඟම ඉන්න දුප්පත් කොල්ලෙක්ට මං ආදරේ කරයි... ඒත් අද නෙමේ... අයියා





බයවෙන්නෙපා...'

'බයට නෙමේ නංගී මං කිව්වේ...'

'මං දන්නවා රත්තරන් අයියේ... ඔයා හොඳ අයියා කෙනෙක්... අපි ඉස්සෙල්ලා අයියගේ ජීවිතේ පිළිවෙලක් කර ගමු... ඒකටත් තව කල් තියෙනවනේ... තාම විසි එකනේ...'

'නංගිලා ගෙදර ඉඳිද්දී අයියලා බඳින්නේ නෑ...'

'ඒයි කියලා නංගිලව ඉක්මනට දී ගන්න ඕන කමට මොකෙක්ගේ හරි ඇගේ ගහනවද...'

'මං ඔයා ගැන එහෙම හිතන් නෑ... කවදහරි ඔයාව මං ලස්සනට දෙනවා... ඒවා ඔක්කොම කරන්නේ මම...'

නංගීගේ මුහුණ ලා සඳ එළියට අපූරුවට දිලෙයි. ඇය මා ගෙදර නැති දවස් ටිකට තවත් ලස්සන වී ඇත. මට ඉන්නේ මේ තරම් හැඩ නංගී කෙනෙක් යැයි හරියටම මට හිතුනේ අදය.

'අයියටයි මාමටයි තිබ්බේ අර කෙල්ලවත් එක්කගෙන එන්න... පව්...'

නංගී මේ කියන්නේ චන්ද්‍රා ගැනය.

'කෙල්ලව කොළඹ තියා එහේ ගෙදරටවත් දත් එවන්නේ අඩුවෙන්... ආච්චිට බයයි...'

'මං දන්නවා ඔයා එහෙම කරන කොල්ලෙක් නෙමේ... ඕන නම්...'

නංගී කියන්නට ගිය දේ හිලගෙන අහිත් කට වසාගත්තාය.

'මොකක්ද උඹ කියන්න ගියේ... ඕනනම්...'

'කවුරුත් නැති වෙලාවක් බලලා කෙල්ලට කිස් කරයි...'

මම නංගිට පහරක් ගැසුවෙමි. එහෙත් නංගී කියන්නාක් වැනි දෙයක් නොවීමට හේතුද නැත. එහෙම හිතුනා දවස්ද තිබුණි.

'පව්... හෙට ඒ කෙල්ලව බලන්න මනමාලයෙක් එනවා... ආච්චිට පිස්සු... රස්තියාදු කාරයෙක්ලු...'

'මොකද මේ විකට අහිත් අය දුකෙන් වගේ කතා කරන්නේ...'

නංගී තිබේ මලොක්කුවටය.

'මට ඇති දුකක් නෑ... මං කිව්වේ පව් කියලා...'

'පව් නම් ඉතින් මොනා හරි කරන එකනේ තියෙන්නේ...'

එසේ කී නංගී අහක බලාගෙන හිස වනා මෙසේ කීවාය.

'අම්මයි තාත්තයි නම් බණ්ඩාරවෙල ඉඳලා එද්දී ඒ කෙල්ලට හරියට ප්‍රසංසා කළා...'

මම කිසිත් නොකීවෙමි. නංගිගේ කරට අත දමාගෙන මම කුරුළු කැලේට එහා රබර් යාය දෙස බලාගත්වනම බලා උන්නෙමි.

'හැම දේකටම කලින් ජීවිතේ පොඩි පිළිවෙලක් හදාගන්න ඕන නංගී... මෙහෙම තමා ජීවත් වෙන්න ඕන...'

'මටත් ඒක තියෙනවා අයියේ... සැප විඳින්න නෙමේ... ඒත් අපි හරියට තනිවෙච්ච ජීවිත ගත කරන්නේ...'

කොල්ලෙක් පවුලක ඉඳිද්දී මීට වඩා පිරියක් තිබිය යුතුය. මගෙන් ගෙදරට තව බොහෝ යුතුකම් ඉටු කළ යුතුව ඇත.





'අපි යත් පහළට... කිරියා එක හැඳිගාන්න ඕනේ...' නංගී හදිස්සියේ කීවාය.

'කිරි අම්මලා ඔක්කොටම කියලා නේද තියෙන්නේ...'

'ඔව්... අම්මයි මායි ගිහින් කිව්වා...'

මම නංගිගේ කරට අත දමාගෙන පහළට බැස්සෙමි.



www.sinhalaelibrary.com

# 18

කිරි අම්මලා වැඩියේ මහ පාන්දරය. එළිය වැටෙන්නටත් පෙර සුදු පිරුවටයෙන් සැරසුණු කරුණාවන්ත මුහුණින් යුතු කිරි අම්මලා වැඩියේ මුළු තුන් හිතම පුරවමිනි. කිරි දනයේ ඉවුම් පිහුම් වැඩ අම්මා ඒ පිළිබඳව පළපුරුදු කම් ඇති ගැහැණු දෙදෙනෙකුට හැමදම දුන්නාය. ජොසේ අම්මා හදන කිරියා එක ඇත්තටම පුදුම තරම් රසය. කිරිබතද එසේමය.

කිරි අම්මලා හත් නමට එක කිරි අප්පා කෙනෙක්ද විය. ඔවුන් සියල්ලෝම සාලයේ දමූ දිග පැදුර මත වූ කුෂන් කැබලි මත ඉඳගෙන උන්නෝය.

කිරි අම්මලාට කුළුදුලේ කිරි වැඩුවේ මමය. ඊට පසු





නංගීය... ගඩොල් කැබලි තරම් වූ විශාල කිරිබත් කැබලි ජොසම්මාගේ කිරිබතේ විශාලත්වය පෙන්විය. කාත්තා ගෙනවිත් තිබුණේද විශාල කෝලිකුට්ටුය... කිරි අම්මාවරුන්ගේ දනයක් ලෝබකමක් නැතුව දිය යුතුය.

කිරි අම්මාවරුන් කිරි දනය වළඳද්දී මම නංගිගෙ අත අල්ලා ගත්තෙමි. සුදු සායට සුදු කමිසයක් ඇඳ උන් නංගි වෙතින් ආවේ පිවිතුරු පාටකි.

'හිතම පිරිලා නේ...'

නංගී මගේ කණට කර මිමිණුවාය.

'ම්... මේ පාර ගිය පාරටත් වඩා සරුයි...'

මෙවර කිරි දනයට දෙන්න කියා පොඩි මාමාද මා අත රුපියල් හාර දහසක් තැබුවේය. මම එය අම්මාට දුන්නෙමි.

කිරි දනය අවසානයේ මහ කිරි අම්මා මගේත් නංගීගේත් හිස් වල දෙළොස් මහේ පහනින් තෙල් ගා පින් දුන්නාය. ඇය පින් දෙන ආකාරයට කවදත් අපේ ඇස්වල කඳුළු පිරුණි.

'දුවගෙයි පුතාගෙයි කටයුතුද හිතේ තියෙන විදිහටම ඉෂ්ට සිද්ධ වෙන්න ඕනේ... තුණුරුවන් සරණයි... දළදා දෙවි රැකවරණයි... තිස් තුන් කෝටියක් දේවතා බැල්ම ලැබෙන්නයි...'

කිරි අම්මලා සියල්ලන්ම ගියේ අපේ හිස අතගාගෙනය. සුදු සරමත් අත් දිග කමිසයත් පැළඳ උන් මම කිරි අම්මලා සමගම මඳ දුරක් ගියෙමි. කිරි අම්මලාට දුන් කිරි පිඬු ඔවුන්ට තනිවම රැගෙන යා හැකි ඒවා නොවේ. බොහෝ කිරි අම්මාවරු තමන්ගේ පුතුන් හා මුණුපුරන් එක්කාගෙන විත් තිබුණි.

'මේ දුන්න කිරි පිඬු වල හැටියට මය දෙන්නගේම

ජීවිත වල කිරි ඉතිරෙන්න ඕන...'

අම්මා කීවේ සියළු කිරි අම්මාවරුන් ගිය පසු සැහැල්ලුවෙනි. මම බිම බලාගත්තෙමි. ගිය වසරේ මගේ ජීවිතයෙන් ඉතිරුවේ කිරි නොවේ. කඳුළුය... එහෙත් ඊට මට කරන්නට දෙයක් නැත. දෛවය මට පාලනය කර ගත නොහැක.

'කිරි ඉතිරුවේ නැතත් කමක් නෑ අක්කේ... මේ කොල්ලයි කෙල්ලයි හිනාවෙලා ජීවත් උනොත්...'

එසේ කීවේ පොඩි මාමාය. මම මේසය මත වූ කිරිබත් කෑල්ලක් කටට දමා ගත්තෙමි.

'ඉන්න පුතේ... ජොසම්මා ලුණු මිරිසුයි එළුණු බැදුණුයි හදනවා...'

නංගී බලා උන්නේ මා කෙළ ගිලින අයුරුය. කුමන හේතුවකට හෝ මට වන්දනාව සිහිවිය. ඇයව මට කිරි දනය පුරාම සිහිපත් විය. ඇය අද වැනි දවසක මේ ගෙදර ඉන්නට තිබුණි. එසේ නම් ඇය ඒ අතට මේ අතට දුවමින් සෑහෙන වැඩක් කරනු ඇත.

'අපේ කෙල්ලත් එක්කගෙන එන්න තිබ්බා නේද පුතා...'

අම්මාත් තාත්තාත් ගිය පසු පොඩි මාමා සාලයේ එලූ පැදුරේ සතිපයට හාන්සි වී කීවේය. මම සිනාසුනෙමි.

'ගෙදරක ඉන්න ඕන කෙල්ලෙක් ඒකී... මට නම් හරි ලෝබයි...'

පොඩි මාමා මෙසේ කියන්නේ ඇයි... කවර අරමුණකින්ද...

'වන්දනා එහෙ කැම අරගෙන එනවට වත් ආච්චි එච්චර කැමති නෑ පොඩි මාමේ... පොඩි මාමා හිටපු නැති



වෙලාවක ආච්චි ආවා...'

'උඹ ඒක ගණන් ගන්නෙපා... ආච්චි හැම කොල්ලා ගැනම හිතන විදිහට තමයි උඹ ගැනත් හිතන්නේ... මං දන්නවා උඹ එහෙම ඒ කෙල්ලට කරදරයක් කරන්නෑ කියලා... නැත්නම් බය නැතුව මංත් ඔය කෙල්ලව ගෙදරට ගේන්නන්නේ නෑ...'

'මං මගේ හෘද සාක්ෂියට විරුද්ධ වැඩක් කරන්නෑ පොඩි මාමේ... මං හිතන්නේ එහෙම දෙයක් මගේ නංගිට උනොත් කියලා...'

'හැඟීම් කියන ඒවා කාටත් තියෙනවා පුතේ... ඒත් මනුස්සකම් හැම එකාටම නෑ... මං දන්නවා උඹ ගැන... උඹ කියන්නෙපා...'

අම්මා කිරිබත් කෙසෙල් කිරියා සමඟ සීනි සම්බෝලත් ලුණු මිරිසුත් පැදුරටම ගෙනාවාය. නංගී විශාල කෝලිකුට්ටු ඇවරියකුත් තැඹිලි වතුර ඩිගැන්ටරයකුත් ගෙනාවාය.

'තාත්තත් කමු තාත්තේ...'

තාත්තා බලා සිටිද්දී මම කීවෙමි. අපි සියළු දෙනාම පැදුර් ඉඳගෙන කිරිබත් කෑවෙමු. කාලාන්තරයකට පසු එකට වාඩිවී කිරිබත් කටක් කෑමේ සතුට අප අතර විය.

'අයියා ගෙදරට ටෙලිෆෝන් ඇප්ලයි කරන්න... මං සල්ලි දෙන්නම්... මේ කෙල්ලටත් පාළු ඇතිනේ ගෙදරටම වෙලා ඉන්නකොට... ලොකු පුතාට එනකොට නිතරම ගෙදරට කතා කරන්න පුළුවන්නේ...'

පොඩි මාමා තුළ ඇත්තේ ඉහවහා ගිය මිනිස්කමකි. ඔහු බොහෝ විට තමන්ගේ සතුටක් ගැන හාංකවිසියක් වත්

නොහිතා අනුන්ගේ සතුට වෙනුවෙන් වියදම් කරයි.

'ලොකු පි..නා..ස් පොඩි මාමේ..'

'වෙලි ෆෝන් අරන් දුන්නා කියලා කොල්ලන්ට එහෙම කතා කරනවා නෙමේ..'

පොඩි මාමාගේ කතාවට නංගී ඔහුට ඇද කළාය.

'මං කතා කරන්නේ එක කොල්ලෙකුට විතරයි... අපේ අයියට...'

'එයාව මට විශ්වාසයි...'

අම්මා නංගී දෙස සෙනෙහසින් බලා කීවාය. දුක හිතුනේ මටය.

'අම්මටයි තාත්තටයි මාව විශ්වාස නෑ...'

මගේ කට හඬේ දුකක් විය.

'ඔය කිව්වේ ලොකු පුතණ්ඩියා කතාවක්...'

අම්මා හිස බර කර අනුකම්පාවෙන් යුතුව කීවාය... එක අතකට මම අම්මාගේත් තාත්තාගේත් විශ්වාසය වරක් බිඳි පුතෙකු නොවේද...

'කොල්ලා තමයි කවදහරි මේ පවුල බබලවන්නේ... මං අද කිව්වා කියලා අක්කයි අයියයි හිතාගන්න...'

පොඩි මාමා කීවේ විශාල කෙලිකුට්ටු ගෙඩියක් කඩමිනි.

'කොල්ලගේ අනාගතේ මං බලාගන්නම්... ආයේ පොඩි එකාට දුක් විඳින්න මං ඉඩ තියන්නෑ...'

'අයියා කසාද බැඳලා ලස්සන වාහනේකින් ගෙදර එනවා මං හීනෙනුත් දැක්කා... ලස්සන කෙල්ලෙක්ව බැඳලා හිටියේ...'

අද දවසේ මාතෘකාව මං බවට පත්විය. මම නංගීට



පැදුරේ ඉඳගෙන රිව්වෙමි.

'මනමාලියෙක් කොහොම වෙතත් හෙට අනිද්දා ලස්සන වාහනේකින් මං කොල්ලව ගෙදර එවනවා...'

'අ..නේ එපා... ඔය කඳු පාරවල් වල වාහන එලවලා...'

අම්මා බියපත්ව කීවාය.

'අක්කේ... මේ කොල්ලෙක්... ගැණු ළමයෙක් නෙමේ...'

'ඒත් මල්ලී... කොල්ලෙකුට කියලා මට ඉන්නේ මෙච්චරයි...'

'උඹට මොනාවත් වෙන්නෑ... කාපං පුතේ...'

පොඩි මාමා මගේ පිඟානට තව ලොකු කිරිබත් කෑල්ලක් දමමින් කීවේය. මම අළුවා කෑල්ලක් සමඟ කිරිබත් කෑල්ල මුසු කරගෙන කෑවෙමි.

'හීනෙත් දක්සේ අර කෙල්ල එක්ක එනවා...'

අම්මාත් තාත්තාත් ගිය පසු නංගී පිඟානද රැගෙන පැදුරෙන් නැඟිට්මින් කීවාය. පොඩි මාමාද ළඟය.

'මට හිතුණා...'.

ඔහු කීවේ එපමණය. මම තැඹිලි වතුර වීදුරුව බිගෙන බිගෙන ගියෙමි.

'පව්... හවසට කෙල්ලට කතා කරපන්...'

කොහොමත් මම චන්දනාට කතා කරන්නට සිතා උන්නෙමි. ඊයේ හවස තිබූ වැඩ නිසා එය ඇත්තටම අමතක විය. රෑ ගතිද්දී බණ්ඩාරවෙල දුරකතනය නාද වුවා මිසක කිසිවෙක් ගත්තේ නැත. රෑ වූ නිසා ඇය යන්නට ඇත.

www.sinhalaelibrary.com

# 19

හවස් වරුවේ බලාපොරොත්තු නොවූ ලෙස මහ වැසි ඇද වැටුණි. චන්දනාට කතා කරන්නට වඩුමට යන්නට නොහැකි වෙතැයි මට බිය සිතුණි.

'කොහේ යන්නද අයියේ..'

'නිකං හන්දිය පැත්තේ ගිහින් එන්න...'

'මේ මහ වැස්සේ..'

'මං වැස්සේ ඇවිදින්න ආසයි...'

නංගී යමක් කියන්නට ගොස් යළිත් එය ගිල ගත්තාය.

'කමක් නෑ... කියන්න ගිය දේ කියන්න...'





'මට දවසක් ශහීනා කිව්ව කතාවක් මතක් උනා...'

'මොකක්ද...'

'දවසක් මහ වැස්සේ ඔයා එද්දි ශහීනා වාහනේ ඉඳලා කතා කළාද...'

ඒ දවස මට කෙදිනකවත් අමතක නොවේ. කුරුළු කැලේ දෙවනත් කරමින් වැසි වැටුණු එද මම දිය බරියකු සේ තෙමී තෙමී ගෙදර ආවෙමි. ලෙඩ වූයේ ඊට පසුය.

'එද කෙල්ලට හරියට දුක හිතුනලු... කාර් එකෙන් බැහැලා එයාටත් තෙමී තෙමී එන්න හිතුනලු...'

ඒ අතීතය සිහිවෙද්දී හදවතට තුනී සංකාවක් පාළුවක් දැනෙයි... අතීතය සිහිනයකැයි නොසිතෙන්නේ ඒ අතීතයේ පාළු සුන්බුන් තවමත් කුරුළු කැලේ පුරා විසිරී ඇති නිසාය... මේ රබර් ගස් යාය දකිද්දී පවා මට සිහිවෙන්නේ ශහීනාවය...

'මට කුඩයක් දෙන්න නංගී...'

පොඩි මාමා දවල් කෑමෙන් පසු නිදි ගත්තේය... හෙට පාන්දරම අපි බණ්ඩාරවෙල යන්නට සිතා ගත්තෙමු.

කුරුළු කැලේ රබර් ගස් දෙවනත් කරමින් මහ වැසි ඇද වැටෙයි. මම වැහි මීදුමෙන් වැසී ගිය ශහීනාගේ නිවස දෙස බැලුවෙමි. හදවතේ අතීතය ඇඳී ඇත්තේ යම් දුක්බර සිතුවමක් සේද මේ නිවසද අද මට පෙනෙන්නේ එවැනිම පාළු මුසල මන්දිරයක් ලෙසිනි.

මම මහ වැස්සේ පයින්ම හන්දියට යන්නට ගත්තෙමි. හාත්පස වැහි වහිද්දී පාරක හුදෙකලාවේ ගමන් කිරීම මහ හුදෙකලා රසවත් බවක් ගෙන දෙන්නකි. හන්දියට ළං වෙද්දී තරුණ ජෝඩුවක් නයින්ටි බයිසිකලයක මහ වැස්සේම කුරුල් ඊ ගියෝය. තරුණිය යතුරු පැදියේ පිටුපස අසුනේ ඉඳගෙන පෙම්වතාව තදින් බදාගෙන උන්නාය... වැහි වතුරට අමතරව



www.sinhalaelibrary.com

ඔවුන්ගේ මුහුණු වලින් කව එක දෙයක් පේරෙයි... ඒ ආදරයේ සතුටය.

මම එය කිසිම දිනයක විඳ නොමැත්තෙමි. ආදරයේ දුක මිසක සතුට කවර පාටදැයි මම නොදනිමි.

හන්දියේ දිජිති කොමියුනිකේෂන් එකෙන් මම බණ්ඩාරවෙල ගෙදරට ඇමතුමක් ගත්තෙමි. එය පලවෙනි නාදවීමේදීම වන්දනා ගත්තාය. අසරණ කෙල්ල දුරකතනය අසලම සිටින්නට ඇත.

'හෙලෝ...'

මම කතා කළෙමි. එහා පැත්තෙන් හුස්ම හඬක් මිසක කටහඬක් නොඇසෙයි.

'වන්දනා...'

දුරකතනයේ එහා පැත්තේ ඉන්නේ ඇය බව මම දනිමි. ඒ හුස්ම ගන්නා හඬ එන්නේ ඇගේ පපුවෙනි.

'ඇ..යි කතා ක..ළේ නැත්තේ...'

යුවතියගේ හඬ ඇඩුම්බරය. ඒට අමතරව හොටු ඉහළට සුරන හඬක්ද නැගෙයි.

'ඊයේ කිරි දතේ වැඩ තිබ්බ... කතා කරන්න බැරි වුනා... සො..රි...'

මා කතා නොකිරීම වරදක් වෙන්නේ කෙසේද. මා සමාව ඉල්ලුවේ එය වරදක් ලෙස මගේ පපුවට බාරගත් නිසාද.

'හවස බලන් හිටියද...'

'ඔ..ව් රෑ අට වෙනකල් බලන් උන්නා...'

මගේ ළය ඇවිලීගෙන ගියේය. ඒ ගෙදර රෑ අට වන තුරු මහ සීතලේ තනිවම මේ කෙල්ල සිටියේ කෙසේද. එසේ





සිටියේ මගේ ඇමතුම එනතුරුද...

'මං හිතු..වේ හවසම යන්න ඇති කියලා...'

වන්දනා කතා කළේ නැත. මගේ අතින් විශාල වරදක් වූ බවක් මට හැඟෙන්නට විය. හිතේ ඇතුළ කුහරයක සිට යුතුකමක් ඉටු නොකළ නිසා ඇති වන පසුතැවීමක් කඩාගෙන එන්නට විය. කෙල්ලෙකුට වචනයක් කියද්දී පවා පරිස්සම් විය යුතුය.

'මට සමාවෙන්න...'

මම බයාදු ස්වරයකින් කීවෙමි.

'මං හිතුවා අදත් කතා කරන එකක් නෑ කියලා...'

'කතා නොකළ නම් රෑ අට වෙනකල් ඉන්නවද...'

'තනියම ඉන්න හරි බයයි... කැසට් එක දාගෙන උන්නේ... ආච්චි බැන්නත් එක්ක... මං කිව්වා ටී.වී. එකේ ෆිල්ම් එකක් ගියා බැලුවා කියලා...'

අද රෑම බණ්ඩාරවෙලට යන්නට ඇත්නම් යැයි මට සිතුණි.

'කෝල් එක ගන්න හන්දියට එන්න ඕන... මෙහෙට මේ නා කපන්න වහිනවා... පාරට බහින්නවත් බෑ...'

'අ..නේ වැස්සේ ඇ..යි ආවේ...'

'අදත් නාවොත් රෑ වෙනකල් තනියම ඉඳියිනේ...'

ඉන් පසු අප අතර කෙටි නිහඬතාවයක් විය.

'කිරි දතේ හොඳට තිබ්බද...'

'ඔව්... ලස්සනට තිබ්බා... මාමයි අපේ නංගියි ඔයාවත් මතක් කළා...'

'ජයදේව අන්කලුයි නංගියි හරි හොඳයිනේ... නැත්නම් මේ හිඟන කෙල්ලට මොකක් වෙනවද...'

සියල්ලන්ටම වඩා මට ඇයව සිහිවිය.

'මට මොකක් උනේ නෑ කියලද හිතෙන්නේ...'

'හිතුනනම් කතා කරනවා..නේ...'

'එහෙනම් ඒකට සමාව දෙන්නේ නෑ... නේද...'

මම දුකෙන් ඇසුවෙමි. දුප්පත් කෙල්ල මට එසේ නොකරන බව මම දනිමි.

'කතා කරන්න මම මොන කෙල්ලෙක්ද සංදේශ් අයියේ...'

වැරැද්ද කළේ මාය. ඒ නිසා එයට මාම දුක් විඳිය යුතුය. මට අසනීප වූ විටදී මගේ ඇඳ අද්දර ඉඳ මට බත් ටික කැවූ කෙල්ලව ඒයේ මම මහ රෑ වන තුරු අර පාළු ගෙදර තැබුවෙමි.

'කොළඹින් මොනවා හරි හෙට එද්දී ගේන්නද... යාළු කරගන්නත් ඕනනේ...'

'මං යාළුයි... යාළු කරගන්න තෑගි ඕන නෑ...'

'එහෙනම් මොනවද ඕනේ...'

මගේ උගුර සිරවිය.

'මු..කු..ත් එපා... ඔය මනුස්සකමම ඇ..ති... හෙට උදේම එනවද...'

කෙල්ල යළිත් හොටු හිරුවාය.

'සනීප නැද්ද...'

'නෑ... මේ... හෙම්බිරිස්සාව වගේ...'

ඇය අඬන බව මම දනිමි. ළඟින් උන්නානම් ඔළුව





වත් අතගා සැනසිය හැක.

'මං ඔක්කොම ඇඳුම් සෝදලා මැදලා අස්කළා...'

ඇය මගේ කවුද... මම දිගටම සිතුවෙමි. වන්දනා දුරකතනය තැබුවේ නැත. මටද තබන්නට ලෝබ සිතුණි.

'වැස්ස තවත් වැඩි කරන්න කලින් ගෙදර යන්න...'

'අපි උදෙන්ම එනවා...'

'මං කෑම හදලා තියන්නම්...'

දුරකතනය තබා පාරට ආ මම ගෙදර නොගොස් මහ වැස්සේ කුඩය යටින් රස්තියාදු ගැසුවෙමි. මටත් වඩා වේගයෙන් මගේ සිත රස්තියාදුවේ යන්නට විය.



www.sinhalaelibrary.com

# 20

**පො**ඩි මාමාත් මමත් යළි බණ්ඩාරවෙල ආවේ නුවර පාරෙනි. එද්දී අපි අලුතින් අරඹන එළවළු අපනයනය කිරීමේ අලුත් ව්‍යාපාරයට අදාල මිළදී ගැනීමේ සමාගමටත් ගියෙමු. 'ඇග්රෝ වෙජ් එක්ස්පෝට්' නමැති එම එළවළු සහ පළතුරු අපනයන කිරීමේ ආයතනයට පොඩි මාමා හඳුන්වා දුන්නේ මාවය.

මුලින්ම අපි ඉතාම කුඩා එළවළු තොග ප්‍රමාණයක් කොළඹ සමාගමට එවන්නට පොරොන්දු වූයෙමු. මටද එය සැනසීමකට හේතු විය.

නුවර පාරේ තිබූ තදබදය කඩවත නගරයේදී අඩුවිය. පැහැදිලි දිස්නිමත් හිරු එළිය නුවර පාර අවට කුඩා කඳු





ගැට මතත් පොල් රුප්පා මතත් වැටී තිබුණි. කුමක්දෝ හේතුවක් නිසා තුනී සැනසිල්ලක් හිටි සැනසී ගිය උපශාන්ත බවක් මගේ හදවතේ විය.

මේ කිරි දනයේ ආනිසංසද, නොවේනම් ජීවනයේ දුකත් සැපත් සම සිහින් දරාගන්නට තීරණය කළ පසු හිතට දැනෙන නිරාමිස ආනන්දයද, නැතහොත් මේ සියල්ලටම වඩා වෙනස් හැඟීමක් නිසා හදවතට ගෙනෙන සොඳුරු අරුමැසි බවක්ද.

වරකාපොල ටවුමේදී මට චන්දනාව සිහිවිය. ඇයව සිහිවූයේ වරකාපොල ටවුමේ සාප්පුවක එල්ලා තිබූ සාගර නිලට හුරු බ්ලවුසයක් දකිද්දීය. කොළඹින් ඇයට මොනවා හෝ ගන්නට මට බැරිවිය. අනෙක් අතට එසේ ගන්නට මට ලැජ්ජාවක්ද විය.

'පොඩි කෙල්ල බලන් ඇති අපි එනකල්...'

පොඩි මාමා කීවේ මා පුදුමයට පත් කරවමිනි. මං සිතුවේ ඇය ගැන බව ඔහු දැනගත්තේ කෙලෙසද.

'පව්... දුප්පත් කෙල්ල...'

මගේ කටින් එසේ පිටවිණි. පොඩි මාමා වාහනය නුවර පාර අයිනේ වූ පොල් අතු සෙවිලි කළ හෝටලයක් ළඟ නතර කර මා දෙස බලා සිනාසුනේය.

'උඹටත් හරියට ඒ කෙල්ලව මතක් වෙනව නේද...'

මම පිළිතුරක් නොදී සිනාසුනෙමි.

'ලොකු උන්නැහේ කන්න මොනවද තියෙන්නේ...'

පොඩි මාමා පොල් අතු කඩයේ මුදලාලිගෙන් කෑ ගසා ඇසුවේය. අපි පොල් අතු කඩය ඉදිරියේ වූ පොල් කොටන් බංකුව උඩ වාඩි උනෙමු.

'උණු පොල් රොටි තියෙනවා මහත්තයෝ.. කට්ට සම්බල් එකක්..'

'පොල් රොටියක් කාලා ප්ලේන්ටියක් බොමුද... දවල්ට පේරාදෙණියෙන් කමු..'

අපි එක පොල් රොටියක් නොව පොල් රොටි දහයක් පමණ කෑවෙමු. පොල් රොටි කන්නට ලුණු මිරිස් පමණක් නොව මස් හොද්ද අපට ලැබුණි.

'දැන්නම් බණ්ඩාරවෙලටම ගිහින් කෑවත් ඇති පොඩි මාමේ..'

'උඹට අර කෙල්ලගේ බත් කන්න ඕන වෙලා... කැමැත්තක්.. කැමැත්තක්..'

පොල් රොටි කෑම නිසා දැවිල්ල ගත් කටින්ම අපි කෝපි බීවෙමු. පොඩි මාමා දුම්වැටියක් දල්වාගත්තේය.

'ලොක්කෝ මේ ආනමාලු කැන කීයද...'

ලාවට ඉදෙමින් තිබූ ආනමාලු කැන පෙන්වා පොඩි මාමා ඇසුවේය.

'රුපියල් තුන්සියක් දෙන්න මහත්තයා... ඔය උදේ ගෙනාවේ..'

පොඩි මාමා කෙසෙල් කැන හෙට්ටු කලේ නැත. ඔහු මේ කෙසෙල් කැන ගත්තේ මේ දුප්පත් මිනිහාට කරනා උදව්වක්ද වශයෙනි.

'හවසට උණු ආප්පයක් අර කෙල්ලට කියලා හදගත්තම මරු... නැත්නම් උදේට කිරිබත් ටිකක් එක්ක ආනමාලු හරි රහයි..'

උණු උණු ආප්ප සමග ආනමාලු කනු මට මැවී පෙනුණි.







පොඩි මාමාටත් ඇත්තේ මට මෙන්ම සරල අහිංසක ආශාවන්ය.

මාවනැල්ල වටුමේදී මම පොඩි මාමා දෙස බැලුවෙමි. චන්දනාට මොනවාවත් නොගෙන බණ්ඩාරවෙල යන්නට බැරි ගතියක් මට දැනෙයි. නංගී ඇයට කැවුම් මුං කැවුම් පාර්සලයක් තනා දුන්නාය. එහෙත් මට මදිය. එද්දී ඇය සව්දෙදල් පවා පාර්සලයක්ම හද දුන්නාය. දැන් කීයට ගියද ඇය බත් ටික හද දෙන්නීය.

'පොඩි මාමේ..'

'මොකද කොල්ලෝ..'

'මං අර කෙල්ලට මොනවා හරි කොළඹින් ගේනවා කිව්වා...'

ඔහු සිනාසුනේ මාව අපහසුතාවයට පත් කරමිනි.

'උඹත් මං වගේ තමා... හරි ලාමකයි... හරි හරි හිටපන් මං තතර කරලා දෙන්න..'

මම ලාමකදැයි මම නොදනිමි. පොඩි මාමා කියන්නේ ඇත්තක් විය හැක. ලාමක හිතක් යනු ඉක්මනින්ම සැලෙන ඉක්මනින්ම කම්පාවට පත්වෙන ගැණු ගැන වැඩිපුර නැවෙන හිතකටද...

'උඹ මොනවද ගන්න යන්නේ..'

'මොනවා හරි පොඩි දෙයක්.. නැත්නම් හොඳ නෑ මාමේ... එද්දී සව්දෙදලුත් හදලා දුන්නා..'

පොඩි මාමා රුපියල් පන්සියේ කොළයක් මා අත තැබීය.

'මගේ ගාව සල්ලි තියෙනවා මාමේ..'

'මේකත් දලා ඒ කෙල්ලට මොනවා හරි අරන් දීපන්..'

එසේ කියා ඔහු තවත් දුම්වැටියක් දල්වා ගත්තේය. මම සාප්පුවට ගොස් කැරකුණෙමි. කෙල්ලන්ට කැඟි තේරීම තරම් අපහසු දෙයක් තවත් නැත.

'මේක කීයද...'

කුඩා කළු පටියක් සහිත චූටි කාන්තා ඔරලෝසුවක් දක මම ඇසුවෙමි.

'හත්සිය විසි පහයි...'

'අඩු නැද්ද...'

'හාරසියක් දෙන්න...'

'කමක් නෑ දෙන්න...'

නිහි දිග පෙට්ටියක එය දමාගෙන මම යළිත් වාහනයට ආවෙමි.

'මේ ලාබෙට ඔරලෝසුවක් තිබ්බා...'

මම එතරම් ගණනකට නැති බවක් පොඩි මාමාට පෙන්නුවෙමි. ඔහුව තැම්බීම පහසු නැත. ඔහු හොඳින් තැම්බුණු මිනිසෙකි.

'ඕක ඔය කෙල්ලට හරි ලොකුයි... දවසක් මං ගවුමක් ගන්න සල්ලි දීලා ගවුම ඇඳගෙනත් ඇවිත් පෙන්නුවා... මට හරි දුක හිතුනා... සල්ලි කොච්චර නාස්ති කරනවද පුතේ... ඒත් එක රුපියල් පන්සියේ කොළේකින් ඒ කෙල්ල මාසයක් සතුටු වෙනවා...'

පොඩි මාමා කියන්නේ ඇත්තය. දුප්පත් මිනිස්සු එහෙමය. ගත් අත් ඔරලෝසුව යළිත් ගෙන බලන්නට හිතුනද මම ඒ අදහස අත් ඇරියෙමි.

හිතේ ඒ කෙළවරේ සිට මේ කෙළවරටත්.. මේ කෙළවරේ







සිට ඒ කෙළවරටත් කව්දෝ ඇවිදිනු මට දනෙයි. මේ හැඟීම මෙහෙමම කුරුළු කැලේදී මම වින්දෙමි. ශශිතා හිත පුරා තබා ගිය ඇගේ මරතෝන්ඩිය ඇඳි පා සටහන් තවමත් සඳකඩ පහනක තටබුන් මෙන් හදවතේ ශේෂ වී ඇත.

දුන් හදවත යළිත් හිත මත ගෙනවිත් තබා ගත්තේ කවුද... සමනල පිහාටු වලට ආදර කුසුම් බර වැඩි බව හිත නොදන්නේද... ආදරයෙන් දුක් විඳ හද ගන්නට බණ්ඩාරවෙල ගෙන ආ හිතට මේ සීතල කඳු අකර වූ හුදෙකලාවේදී එක විදිහකට ඉන්නට බැරි ඇයි...

සන්සුන් වූ තැන්පත් වූ හිතක් මට කෙදිනකවත් තිබුනේ නැත. මට ඇත්තේ ඒ මේ අත දුවන චංචල දඟ හිතකි. එවන් හිතක් උරුම මට එසේ වීම පුදුමයක් නොවේ.





www.sinhalaelibrary.com

# 21

බණ්ඩාරවෙල නිවසේ මිදුලේ වාහනය නවත්වද්දීම මම චන්දනා දෙස බැලුවෙමි. යුවතිය නිවසේ ඉස්තෝප්පුවේ සිට මිදුලට දුවගෙන මෙන් ආවාය. රතු බොට් වැටුණු අත් නැති ගවුමක් ඇඳ උන් ඇය වෙනින් ආවේ වෙනදට වඩා ලාබාල පෙනුමකි. කෙටි වරලසට පෝනිටේල් දමන්නට එපා යැයි කියන්නට මට සිතුණි.

'උඹට හොඳයි කෙල්ලේ සිකියුරිටි ජොබ් එකකට...'

පොඩි මාමා බසිද්දී කීවේය. ඔහු ගෙට ගියේ චන්දනාගේ හිස අතගාගෙනමය.

මම මාවතැල්ලේදී ඇය වෙනුවෙන් ගත් ඔරලෝසුවද රැගෙනම වෑන් රියෙන් බැස්සෙමි. යුවතිය සිනාසුනෝ අහක





බලාගෙනය. මම බියටම ඇගේ නිවස දෙස බැලුවෙමි.

අපි දෙදෙනාම ආධුනික නළු නිළි යුවලක් මෙන් ඇඹරුණෙමු. වෙන් උන දවස් දෙකට දෙන්නාටම මොනවා හෝ උනාදැයි මම නොදනිමි.

'මං ඇඳුම් බෑග් එක ගන්නම්...'

ඇය මාව මඟහැර වෑන් රියේ පිටුපස දොර විවර කළාය. මා දෙස හොරැහින් බලා මගේ ඇඳුම් බෑග් එකද රැගෙන කාමරයට යන යුවතිය දෙස මම බලා උන්නෙමි. ගෑණු ළමයින් ඇවිදින විට පස්ස මෙතරම් නැලවෙන්නේ ඇයි...

මම ඇය පිටුපසින්ම කාමරයට ගියෙමි. දන් ඇත්තේ යද්දී තිබූ කාමරය නොවේ. ඇය එය අස්පස් කර ඇතුවා පමණක් නොව වෙනස් කරද ඇත.

'නිකං කම්මැලි කමට අස් කළේ... හොඳ නැත්නම් වෙනද තිබ්බ විදිහට හදලා දෙන්නම්...'

'අ..නේ එපා... මේ විදිහ හොඳයි...'

ඇගේ ඇඟිලි කුඩු මේසයේ දරය පුරා යයි. මගේ දෙනෙත් බිමට බරවූ ඒ දෑස් වෙත යයි.

'ආ... පොඩි තෑග්ගක්...'

මා අත තිබූ කුඩා ඔරලෝසු පෙට්ටිය දිගු කළෙමි.

'මට තෑගි මොකටද...'

'මේක ගන්න ඉස්සෙල්ලා... හැමෝටම තෑගි බෙද බෙද යන්න මං නත්තල් සීයා කෙනෙක් නෙමෙයි...'

'ඉතින් ඇ..යි ම..ට මේ... මො..ක..ක්..ද... සංදේශ් අයියේ...'

'බලන්න ඇරලා...'



www.sinhalaelibrary.com

මම මේසය අසල වූ පුටුව අනෙක් පැත්තට හරවා ඉඳගත්තෙමි. චන්දනා ඔරලෝසු පෙට්ටිය විවර කර එදෙස බලා උන්නේ ඇස් ලොකු කරගෙනය. එය එතරම් පුදුම වන්නට තරම් බඩුවක් නොවේ.

'මෙච්චර තෑග්ගක් ඇ..යි මට... අ..නේ මං...'

ඇයට කතා කරගන්නට පවා බැරිවිය.

'තෑග්ගේ සයිස් එකයි ප්‍රයිස් එකයි බලන්නෙපා මෝඩි... සෝ ගන්න...'

මම ඇගේ අතින් ඔරලෝසුව උදුරා ගත්තෙමි.

'සෝ අත දෙන්න...'

සිසිදු පැකිළීමකින් තොරව යුවතිය වම් අත පෑවාය. මම ඔරලෝසුව නොපළඳ මොහොතක් ඇගේ අත දෙස බලා උන්නෙමි.

'කව්රු හරි ඉල්ලපු ගමන් ගෑනු ළමයි මෙහෙම අත දික් කරනවද...'

තරවටුවක් සේ මම කීවෙමි.

'හැමෝම ඉස්සරහ එහෙම දික් කරන්නෑ...'

ඇය කීවේ හිතුවක්කාර හඬකිනි. ඇගේ අත අල්ලා බලන්නට ඇඟිලි කරු අතර පටලවා ගන්නට නොවේනම් ඒ අත ගෙන කම්මුලට තබා ගන්නට මගේ හිතට මහා ආශාවක් ඇතිවිය. සියල්ල අමතක කර මම කළු ඔරලෝසුව ඇගේ වමතේ මැණික් කටුව ලඟින් බැන්දෙමි. ඒ අතට ඔරලෝසුව මේ තරම් හැඩ වෙතැයි මම නොසිතුවෙමි. මම දෙනෙත් එසවීමි.

'ලස්සනද...'





මට ඇය පේන්නේ නැත. මම පාත්වී බැලුවෙමි. ඇගේ ඇස්වල කඳුළුය.

'ඒ..යි මොකද මේ...'

'අ..යි..ය ම..ට ඇ...යි මෙ..හෙ..ම ක..ර..න්..නේ...'

ඉතාමෙ අනුකම්පාසහගත අසරණ ස්වරයෙන් ඇය කතා කළාය. සංදේශ් මේවා කරන්නේ ඇයි දැයි ඔහුවත් දන්නේ නැත. හිතට එකහෙළා හිත කියන දේ කරනු මිසක කිසිම දෙයක බරක්පතලක් සංදේශ්ට නැත.

'මං... දැ..න්..නෑ චන්දනා... හිතන්නෙපා... තේ තිබ්බයි...'

යුවතිය ඔරලෝසුවේ හැඩ බලමින් කාමරයෙන් පිටවූවාය. මම විසිල් පාරක් ගසා ඇඳට පැන්නෙමි.

බණ්ඩාරවෙල නගරයේ ඉතාම ජනප්‍රිය ව්‍යාපාරිකයෙක් වන මදනායක මුදලාලි අද රෑ කෑමකට මෙහේ එන බව පොඩි මාමා කීවේය. මදනායක මුදලාලි සතුව බණ්ඩාරවෙල නගරයේ ග්‍රොසරි කිහිපයක්ද හාඩ්වෙයාර් එකක්ද කොළඹ බණ්ඩාරවෙල ඉන්ටර් සිටි බස් කිහිපයක්ද විය. පොඩි මාමාගේ සමීපම මිතුරෙක් වූ ඔහු මාසයකට වතාවක් පමණ මෙහේ එන බව පොඩි මාමා අද උදෑසන කීවේය.

'කෙල්ලේ රෑට මදනායක මුදලාලි එනවා... මොනවද හදන්නේ...'

උදේ කෑම ගන්නා අතරවාරයේ පොඩි මාමා ඇසුවේය. මම සුදු ඉඳි ආප්ප උඩින් කිරි හොදි හැඳි දෙකක්ම දමා ගත්තෙමි. ඉඳි ආප්ප සමඟ කිරි හොදි තරම් අපූරුවට යන හොද්දක් තවත් නැත.

'නූඩ්ල්ස් හදන්නද අන්කල්... කරි දෙකතුනක් එක්ක...'

'මහන්සිද...'



www.sinhalaelibrary.com

පොඩි මාමා කාරුණිකව ඇසුවේය. චන්දනා මං දෙස බලා සිනාසුනාය.

'ඒක මොකක්ද අන්කල්... අලුත් එළවළු සලාද කොළ දලා සලාදයක් හදන්නම්...'

'ඔයා බයිට් හදන්නෙපා... මං රෙස්ටුරන්ට් එකෙන් බයිට් ගේන්නම්... පුතේ ඔයා වේලාසන වතුමට එන්න... සල්ලි දෙන්නම්...'

චන්දනාගේ මුහුණ අද අමුතුය. පොඩි මාමා උන්න නිසා මට ඇය හා කතා කළ නොහැක.

'ඔයා එකොළහට සයිට් එකට යන්න ඕන... අර වොෂ් කරන බැරල් අද එනවා... ඒවා ඔක්කොම චෙක් කරලා ගන්න... බාස්ලගේ පඩි ටිකත් බේරලා ඉවර කරන්න... අපි හොඳ නැකතකුත් බලලා වැඩේ පටන් ගමු...'

අපේ එළවළු ඇසුරුම් පළේ වැඩ දැන් අවසානය. මේ දිනවල කළේ එහි එළවළු සේදීම හා පැකට් කිරීමේ කුඩා කුඩා යන්ත්‍ර කිහිපයක් සවි කිරීමය.

'මාමේ පත්තරේ දැන්වීම...'

'ඒක අපි පටන් ගත්තම දමු... ටෙලිෆෝන් එක තාම සෙට් කළේ නෑ නේද...'

'අද සන්ටෙල් එකෙනුත් එයි... මං ඔක්කොම බලාගෙන හවසට පොඩි මාමව හම්බවෙන්නම්...'

අසේ සැසේ නැත. මම පොඩි මාමා දෙස බැලිමි.

'උඹ අතේ සල්ලි නෑ නේද... ආ... කාඩ් එක දලා දහදහස් ගනින්...'





'එච්චර ඕන් නෑ පොඩි මාමේ...'

පොඩි මාමා චන්දනා අතද රුපියල් සුත්දහක් තිබ්බේය.

'උඹත් කෙල්ලේ හැමදම අපට උය උය දීදී ඉඳලා හරියන්නෑ... ඉන්නවනම් අපි ආසයි... ඒත් ඉතින්...'

'අන්කල්ට එපා දවසට කියන්නකෝ... එදට මං එන්නැතුව ඉන්නම්...'

පොඩි මාමා ගිය පසු මම යුවතිය දෙස බැලුවෙමි.

'කිරි හොද්ද හරි රසයි...'

'ම්...'

අද කතාවද අමුතුය. මගෙන් වූ වරදක් නම් නැත. ගැණු ළමයින්ගේ මුහුණු හරියට මේ බණ්ඩාරවෙල අහස වාගේමය. කළු කරන්නට ගන්නේ විනාඩි පහකි.

'මදනායක මුදලාලි එන්නේ තනියම නෙමේ...'

මගේ තේකට සීනිත් කිරිත් දමා කවලම් කරනා අතරවාරයේ චන්දනා කීවාය.

'එහෙනම්...'

'මදනායක මුදලාලිගේ නෝනා නැතිවෙලා ඒ නිසා යන යන තැන දූවවත් එක්ක යන්නේ...'

මේ මුහුණේ කළුකිරීම අද හවසට මදනායක මුදලාලිගේ දූවත් එන නිසාද...

'කෙල්ල ලස්සනයිද...'

මම ඇගේ සිතැඟි හඳුනාගන්නට පිහා ඇසුවෙමි.

'ම්... හරි ලස්සනයි...'

'ඇයි එයා මැරි කරලා නැත්ද...'



www.sinhalaelibrary.com

'කසාද බඳින වයසක් නෑ... ම..ගේ ව..ය..ස...'

'ඔයාගේ වයසේ අය බඳින්නේ නෑ කියලද හිතන් ඉන්නේ... මං පේන්නන්නම් ඔයාලගේ වයසේ බැඳලා බබාලත් හම්බවෙච්ච අය...'

පුටුවෙන් ඉස්සී මම ඇගේ අතින් තේක ගත්තෙමි. චන්ද්‍රා හිටගෙන පුටු පත්ත ඇඟිලි තුඩු වලින් අත පත ගාමින් බලා උන්නාය.

'ජයදේව අන්කල්ට කිව්ව නම් එයාට සංදේශ් අයියාව යාළු කරලා දෙයි... අන්කල් එක්ක ඒ ගර්ල් හරි යාළුයි...'

මේ සියල්ල කියද්දි ඇගේ දෑස් තීමට බරවී ඇත්තේ ඇයි. දෑසට දෑස තබා කතා කරන්නට බැරි හදවතේ යමක් ඔබාගෙන දෙඩද්දීය.

'මාමට කිව්වොත් වැඩේ ෂුවර්ද...'

'ම..ම්...'

'හොඳට බර තියෙනවද දන්නෑ... සල්ලි නැත්නම් කෙල්ල රෝස මල වගේ උනත් වැඩක් නෑ...'

මට මේවා කියන්නට අවශ්‍ය නැත. එහෙත් අසරණියගේ ඇතුළු හදවත අතගා දිවගා බැලීමේ කොලූකාර ආශාව මා තුළ විය.

'ම..ව... ඒ..ක ඇ..ක්..ක සංදේශ් අ..යියේ... ඒ..ත් හැම කෙල්ලෙකුම පිස් කරලා නැතේ...'

කෙල්ලගේ කදුළු දන් වැටෙයි. සංදේශ්ට හිතක් පපුවක් නැත. නැත්නම් කෙල්ලෙකුගේ කඳුළු බල බලා තව තවත් ඇයව අඬවන්නේ කවුද...

'හවස කෙල්ලව බලලා මාමට කියනවා... මාත්





බණ්ඩාරවෙලට ආපු දවසේ ඉඳලා බල බලා හිටියේ හොඳ බර කේස් එකක්...'

'ඒ..ක..නේ දෙන දෙයියෝ අයියට ගෙදරටම ගෙ..නත් දීලා...'

සුසුමක් හෙළා යුවතිය හැරුණාය. මම පුටුවෙන් ඉස්සී ඇගේ අත අල්ලා ගත්තෙමි. ඇය අත ගසා දමා දෑසද පොඩි කරමින් ගෙදරින් පිටතට දිව්වාය.

විකකට හෝ ඒ පපුව ගිනි තිබ්බේ අපරාදේ යැයි මට සිතුණි. කෙල්ලෙක් තරහ වූ පසුව යාළු කර ගැනීම හිතන තරම් පහසු නැත.

මම මිදුලට බැස චන්ද්‍රාගේ නිවස දෙස බලා උන්නෙමි. ඇය දැත් බැඳගෙන ගෙයි දෙරකඩ උළුවස්සට බරවී උන්නාය. ඒ දෙසට යම්දෝ නොයම්දෝයි සිතා මම මිදුලට වී කැවුනෙමි.

මගේ වචනවලින් අසරණ කෙල්ලගේ පපුව රිදෙන්නට ඇත. ජීවිතයේ පතුලටම වැටුණ යුවතියකට නැති බැරි කමින් මිරිකී ජීවත්වෙන යුවතියකට 'සල්ලි නැත්නම් කෙල්ල රෝස මල වගේ උනත් වැඩක් නෑ...' යැයි කීම පිහියෙන් ඇනීමකට සමානය. ආත්මානුකම්පාව විසින් නිරන්තරයෙන් පිච්චෙන අහිංසක කෙල්ලගේ ආත්මයට මං කළේ පිදුරු ගොඩක් දම්ම වැනි වැඩකි.

වත්පොහොසත් කම් වලින් පරම්පරාවෙන් ගේ දෙර දේපළ වලින් කෙල්ලෙකුගේ ආත්මය තේරුම් ගත හැකි යැයි මමද නොසිතමි. මම එලෙස හිතන්නට තරම් බොළඳ කොල්ලෙකු නොවීමි. කෙල්ලෙකුගේ ආත්මය සරසන එකම දේ ඇගේ හදවතේ ඇති පිරිසිදු කමත් මනුස්සකමත්ය.

වඩාත් ලස්සන විය යුත්තේ යුවතියකගේ හදවතය. එහෙත් හැම කෙල්ලෙකුගේම හදවත ලස්සන නැත. මතුපිටින්



www.sinhalaelibrary.com

පුසර උලාගෙන පොරොම්බල් කරන්න මෙන් ඉන්නා ඇතැම් ශුවතියගේ ආත්මය කුණු ගඳ ගහන පල් මඩ වලක් මෙන් විය හැක.

කොලඹදී මම කෙල්ලන් ඕන තරම් දැක ඇත්තෙමි. ඒ නිසා කෙල්ලෙකුව දැක කුලප්පු වෙන්නට තරම් අමාරුවක් මට නැත. මදනායක මුදලාලිගේ දුව බණ්ඩාරවෙල සිටින ලස්සනම යුවතිය විය හැක. එහෙත් ඇය මා මේ ලෝකයේ දුටු තවත් එක යුවතියක් පමණි. ඇය ගැන විශේෂයෙන් හිතන්නට තරම් දෙයක් නැත.

එහෙත් චන්දනා එසේ නොවේ. මම ඇයව රස වින්දෙමි. ඇය ළඟ සිටිද්දී මම රසබර සතුටක් ඇතුලාන්තයෙන් අත් වින්දෙමි. මීදුම පවා පහව නොගිය හිමිදිරියේ මිදුලට බැස මම චන්දනා එනතුරු දෙරකඩට වී බලා උන්නෙමි. හදවත විඳින්නට ආශා කළ යමක් හදවත නැවරෙන්නට ආශා කළ යමක් මේ පුංචි කෙල්ල සතුව ඇත.

තවම මමවත් හඳුනා නොගත් ඒ ආදරණීය හැඟීම... බැඳීම ඇල්ම ආදරයම දැයි මම නොදනිමි. එහෙත් මේ ආදරණීය ඇල්ම මට අලුතින් ජීවිතය ඉගැන්නුවේය. යන එන මං නොමැතිව අත් තටු කඩාගෙන බණ්ඩාරවෙල ආ මගේ පියාපත් වල අඳුන් ගැල්වූයේ මේ ඇල්මය.

ඒ ඇල්ම හදවතේ ඇතුළු කොනක අහිංසක ලෙස තැන්පත්ව සිටියි. රෑ නින්දට යද්දී මම කුරුළු පැටවෙක් ලෙන් පැටියෙක් ඇහැරවා ගන්නවාක් මෙන් ඒ ඇල්ම පුබුදුවාගෙන පපුවේ තබාගනිමි.

එසේ යළි යළිත් රස විඳිය හැකි දෙයක් ලොව ඇත්නම් ආදරය පමණි.

තවමත් චන්දනා දෙරකඩ දෑත් බැඳගෙන බලා ගත් අත බලා ගත් ගමන්ය. යුවතිය එක වරක් පමණක් හිස ඔසවා





මේ පැත්ත බලා යළි බිම බලා ගත්තාය. අප අතර අඩි විස්සක පමණ දුරක් ඇත. ඒතරම් දුරටත් මම ඒ මුහුණේ රෑ දුණු කුනී වේදනාබර බව හැඳින්නෙමි.

මම බෝගන්විලා ගස් මැදින් ඇතුලට ආවෙමි. වෙනදට ඇඳගෙන එනතුරු සාලයට වී මොනවා හෝ කියවන්නට අද ඇය නැත. මම සාළු තිවසේ ඒ අතට මේ අතට වට තුන හතරක් ගියෙමි.

හිතේ ඇති යමක් එළියට පැනගත නොහැකිව පපුවේ දහලයි. අත් පුඩියක් ගසා ඇයව ගෙන්වාගෙන කියන්නට යමක් ඇතිවාක් මෙන් හිත නොඉවසිල්ලෙන් පෙලෙයි. ජීවිතයේ බොහෝ දේ අහිමි වූ ගෑණු දරුවෙකුගේ ඉරණම මට වෙනස් කළ හැකිද. ඇස් ඉදිරියේ කඳුළු තබාගෙන ජීවත්වෙන අසරණියගේ ඒ කඳුළු සතුටු කඳුළු බවට මට පෙරළිය හැකිද.

මට හිතන්නට බොහෝ දේ විය. මට මාවත් නැති වන තරමට අතීතයේදී මම අවුල් උනෙමි. මා නිසා මගේ දෙමව්පියන්ගේ ජීවිත පවා අවුල් විය. මා චන්දනා වැනි යුවතියකට ආදරය කරනවාට අම්මා තාත්තා කැමති වේද... ඇය වැනි දුප්පත් යුවතියක් තම ලේලිය ලෙස බාරගන්නට අම්මාත් තාත්තාත් සතුටු වෙයිද.

දුප්පත් කෙල්ලගේ අනාගතය බිරර ගන්නට බැරි නම් ඇගේ ජීවිතයට අත තැබීම පාපයකි. අහිංසක කෙල්ලව ආදරයක පටලවා ගැනීම පහසුය. ඒ ඇස් දෙස මොහොතක් බලා සිටිද්දී ඒවා තෙත් වෙයි. ඒ දෑස් වල ඇත්තේ අහිංසක අවනතවීමකි. එකඟවීමකි.

දුප්පත් යුවතියකට අනාගතය ගැන බොරු බලාපොරොත්තුවක් දී ඇයව අනාථ කිරීම මට කළ නොහැක.

ඒ නිසාම ඇගේ කුඩා සිහින් ඇඟිලි වල පැටලෙන්නට



www.sinhalaelibrary.com

නලියන ඇඟිලි මම අත මිට මොළවා ගතිමි. ඇය ළඟ සිටිද්දී ඇයව වැළඳගන්නට හිතෙන... ඇගේ බඳ වටා වෙළෙන්නට කකියන දෑත් මම බැඳ ගතිමි. චන්දනා වැනි ආදරණීය යුවතියක් ඉදිරියේ එසේ හැඟීම් හිර කරගෙන සිටීම අමාරුය. මේ වැනි නිසංසල උදෑසනක ඇගේ උකුලට හිස තබාගෙන දෑස පියාගෙන මහේ නිදගන්නට මම ආශා කරමි.

www.sinhalaelibrar

# 22

ඕනාවටත් වඩා වෙලාවක් නෑව බව මට දැනුනේ තද සීතලක් දැනෙද්දීය. මම වෙව්ලන සිරුර තුවායෙන් වසාගෙන ගැහෙමින් කාමරයට ආවෙමි. සාලයෙන් එන හොටු සූරන හඬ චන්දනාගේය. ඇය සාලේ අතු ගාන්නේ අඬමින්ද...

මම තෙත පිටින්ම සාලයට ගියෙමි. සාලය මැදට පැමිණ ඇයට පෙනෙන්නට ඕනාවටත් වඩා මම වෙව්ලුවෙමි.

"වෙව්ලන්නෙ නැතුව පිහද ගන්නකෝ..."

කොස්සේ මිට මත නිකට තබා යුවතිය කීවේ අසතිප මූහුණෙනි. මම ඇය අතුගෑ බිමේ තෙත අඩි පාරවල් තබා ඇය වෙතට ගියෙමි.

'මොකෝ නිකං මූණ නගර සභාවේ කුණු ලොරිය වගේ කරගෙන... හිනාවෙලා ඉන්නවකෝ...'

අතේ ඉතිරිව තිබූ සීතල වතුර බිංදු ඇඟිලි වලින් ඇගේ මුහුණට විද මම කීවෙමි.

'අපේ මූණු කොහොමත් නගර සභාවේ කුණු ලොරිය වගේ තමා සංදේශ් අයියේ... බණ්ඩාරවෙල පිපිච්ච කානේෂන් මල් වගේ ලස්සන ගර්ස්ලා මිත තරම් ඉන්නෝ... හිහිත් ඒ වගේ කෙනෙකුට හිනාවෙන්න කියන්න...'

කෙල්ල එන්නේ ආරෝවටය. කෝන්පිය පිටුපස ඇත්තේ ආත්මානුකම්පාව සමඟ බැඳුණු දුකද...

'අද වහින්නෙම හරහට නේ...'

'මේ සාලේ තෙත බෙරෙනවා...'

මගේ වතින් ගැලූ වතුර බිංදු සාලය පුරාම වැටී ඇත. ඇය දන් සාලය තවත් වරක් මොබ් කළ යුතුය.

'සංදේශ් අයියේ...'

කාමරයට යන්නට ගිය මම යළිත් හැරුනෙමි.

'හෙට විතරක් වවුමෙන් කෑම ගෙනත් කන්න පුළුවන්ද...'

'ඇ..යි...'

'හෙට පෝයනේ... මං ආච්චිත් එක්ක සිල් ගන්නවා...'

ලෙහෙන්නට ගිය කුමාරයේ ගැටය ඇයට පිටුපා තද කරගෙන මම චන්දනා ළඟට ගියෙමි.

'සිල් ගන්නේ සංසාරේ කලකිරිලද...'

යුවතිය බිම බලාගත්තාය.

'න..ච..ම කලකිරිලා නම් නෑ... ඒත් කවදහරි ගොඩාක්



දුක් විඳින්න කලින් දන්ම හිත හදාගෙන සියා ගන්න එක හොඳයි නේ නේද...'

චන්දනාගේ වචන මගේ පපුවට වැදුනේ පත්තු කල පැටුල් බෝම්බ මෙනි.

'ඔයත් සිල් ගන්නව නම් මාත් අද පාන්දරම කොළඹ යනවා... හෙට පෝය කියලා මටත් අමතක උනා...'

චන්දනා ඇස් ලොකු කරගෙන හිස එසෙව්වාය.

'මං එහෙමනම් සිල් නොගෙන ඉන්නම්...'

අසරණ හඬකින් ඇය කීවාය. මගේ ඇඟිලි තුඩු වෙව්ලන්නට විය.

කොහොල්ලෑ බබෙකු මෙන් ඇයටම ඇලි ඇලී සංදේශ් මේ කරන්නට යන්නේ කුමක්ද... අහිංසක යුවතිය මගෙන් බැහැරව කුඩා ලෝකයක් හදගන්නට යද්දී මට ඊර්ෂ්‍යාවක් දනෙන්නේ ඇයි. ඇයව මා ළඟම තබා ගන්නට මේ තැටිම හිතට ආශාවක් ඇත්නම් තීරණයක් ගන්නට උත්සාහ නොගන්නේ ඇයි.

'කමක් නෑ... මං හින්ද සිල් නොගෙන ඉන්නෙපා...'

'ඕන් නෑ... ආච්චිව විතරක් යවනවා... ගියත් මට කම්මැලියි...'

බිමට පාත්වී ඇය අතු ගෑ කුණු රොඩු එකතු කළාය. ගැහැණු ළමයින් එහෙම පහත් වෙද්දී ඔවුන්ගේ දෙපා මැදින් විවෘත වේ. මම අහක බලා ගත්තෙමි.

'මාත් එන්නද ඔයත් එක්ක සිල් ගන්න...'

'සිල් ගන්න ඕන හිත එකඟ කර ගන්න පුළුවන්නම් විතරයි...'

www.sinhalaelibrary.com

'මගේ හිත අයාලේ යනවා කියලද ගෑණු ළමයා කියන්නේ...'

මේ උදෑසනේ ප්‍රථම වරට ඇය සිනාසුනාය.

'එක තැනකත් නෑනේ...'

'මං මගේ හිත ගිහින් නතර වෙච්ච තැන කියන්නද...'

'හා...'

මගේ දෑස් ඒ දෑස්වල පතුලටම කිඳ බැස්සේය. එහෙත් මුවට ගලා ආ වදන් මම ගොළු කර ගත්තෙමි.

'හූ... මං කිව්වේ ඒකනේ...'

ළඳ බොළඳ යැයි අප විසින් හඳුන්වන බොහෝ දේවල ඇති සෞම්‍ය මටසිලිටි බව ඇතුලාන්තයෙන් විඳින්නට කොතරම් ආශා කරන්නෙමුද... මේ ජීවිතය ගැන බරක් පතලක් නොහිතා මේ අරුමැසි බවේ පැටලෙන්නට මම ඇත්තටම ආශා කරමි.

'එහෙනම් මං සිල් ගන්නේ නෑ...'

චන්දනා කිව්වේ 'එහෙනම් කොළඹ යන්නත් බෑ' යැයි මට අණ කරන්නට මෙනි.

'ආච්චි සිල් ගන්නේ කොයි පන්සලේද...'

'ටවුමෙන් ටිකක් එහා... බිඳුණු වැව පැත්තට වෙන්න... හරි ලස්සන පන්සලක්...'

'ආච්චිට දානේ...'

'දානේ පන්සලෙන් දෙනවා... මං සිල් ගන්න දවස් වලට මාත් දානෙට මොනවා හරි හදාගෙන යනවා... ගිහින් බෙදනවා...'

'අපිනම් දානෙත් කනවා...'





'මාත් කව්වියෙ එක්ක දාන ශාලාවට වෙලා බත් ටිකක් කනවා... හරි රසයි...'

'ආච්චිට තනියෙන් සිල් ගන්න කියන්න... දවල්ට අපි දානෙත් අරගෙන යමු...'

මෘදු මදහසකින් යුවතියගේ කම්මුල් පිරුණි. ඒවා මත දෙතොල් තබන්නට හිතෙන හිතට මම තරවටු කළෙමි. තුනී පුයර තට්ටුවක් සහිත ගැහැණු ළමයෙකුටම ආවේණික මට සිලිටි බවකින් යුතු ඒ කම්මුල් දෙතොල් මට පැටලෙන්නට බලා සිටින්නාක් මෙන් මට පෙනෙයි.

මා බණ්ඩාරවෙලට එද්දී දුටුවාට වඩා අද චන්දනා ලස්සනය.

'දවල්ට කන්න එන්නේ නෑ නේද...'

'වැඩ ඉවරවෙද්දී හැන්දෑ වෙයි... මං මොනවා හරි කන්නම්...'

'මේ පැත්තේ තෝසේ කඩ වලින් එකපාර ගොඩක් කන්නෙපා...'

'ඇ..යි...'

'පුරුදු නැති කෙනෙක්ට බඩේ අමාරු එනවා...'

'බඩ යනවද...'

මම සිරියාවක් නොමැතිව ඇසුවෙමි.

'ම්...'

යුවතිය සිනාසුනාය.

'මං එහෙනම් නොකා ගෙදර එන්නම්...'

'අ..නේ එපා... බඩගින්නෙනේ...'



www.sinhalaelibrary.com

'මට මොනා හරි හවස හදලා තියනවද...'

'බත් උයලා කෙහෙල් කොළේක බෙදලා තියන්නද... පොල් සම්බෝල හදලා කරෝල තෙල් දලා...'

මගේ කටට කෙළ ඉනුවේ ඉබේටමය.

'එහෙනම් එහෙම හදලා තියනවද... මං නොකාම එන්නම්...'

'වේලාසන එන්න... මදනායක මුදලාලිගේ දූවට පේන්න හැඩ වෙන්නත් එපායැ...'

මට කතා කර ගත නොහැකි විය. යුවතිය දෙතොල අමුතුම ආකාරයට උල් කර සිනාසී ගියාය. හවස ඇයට මොනවා හෝ රැගෙන විත් යාළු විය යුතුයැයි මම සිතුවෙමි. වන්දනා අන් බොහෝ ගැහැණු ළමයින් මෙන් කුහකකම් පපුවේ තබාගෙන ඉන්නා යුවතියක් නොවේ. ඇගේ මුහුණ වීදුරු මෙන් මට පෙනෙයි.

උදේ ඇඳගෙන ගෙදරින් පිටවෙද්දී මගේ හිත තිබුනේ පාළුවෙනි. වැස්ස නැති උවද පරිසරයේ තිබුනේ තුනී අන්ධකාරයකි. සමහර විට රෑට වහින්නට පුළුවන.

# 23

ඒළවළු ඇසිරීමේ ව්‍යාපාරය පටන් ගත් පසු මේ පාළුව මැකී යනු ඇත. චන්දනාව මා ළඟම මේසයක් දමා ඇයව මා ළඟම තබා ගත යුතුයැයි මම සිතුවෙමි.

මේ ආදරණීය යුවතියව සදකාලයටම ළඟ තබා ගන්නට මට නොහැකිද. ආදරයක් යනු පහන් වැටියක් වැනි දෙයකි. එය හදවත මත්තේ තබා දල්වා ගත් විට ඉන් විහිදෙන අහිංසක ආලෝකයෙන් කෙනෙක් ජීවිතයේ අඳුර නිවා ගනී... අනාගතය ගැන තීරණ ගන්නට තවම වේලාසන වැඩි වුවද ඇස්මානයේ පෙති පෙතී මේ අහිංසක කෙල්ලට මගෙන් ඈත් වන්නට දිය නොහැක. දෙවන වතාවටත් ලෝකයේ ඇති සුන්දරම දෙයින් පරාජයට පත් වන්නට මට නොහැක.

කපරාරු නොකළ කැපී ඉතේ කුඩා බ්ලොක් ගල් නිවසේ තම මිත්තණියත් සමඟ අමාරුවෙන් ජීවත්වන චන්දනා වැනි යුවතියක්ව තම ලේලිය කර ගන්නට අම්මා කැමති වේද. තාත්තා කැමති වේද. ඇයව තම නෑනා කර ගන්නට නංගි කැමති වේද.

ආදරය ගැන හිතද්දී විවාහය ගැනත් ඒත් සමඟම මට සිතෙයි. එහෙත් මගේ වයසේ කොල්ලන් කෙල්ලන්ට ආදරය කරන්නේ කසාද බැදිල්ලක් ගැන දන්නේවත් නැතුවය. ආදරය කරන යුවතියව විවාහ කර ගත යුතු යැයි ඔවුන් නොසිතති. විවාහ වන යුවතියටම ආදරය කළ හැකි යැයිද ඔවුන් නොසිතති. ආදරය එකකි. විවාහය තවත් එකකි. මේ මතයට මම විරුද්ධවෙමි.

මම මට ආදරය නොකරන මම ආදරය නොකරන යුවතියකව විවාහ කර ගන්නට නොව ඇගේ අතකින්වත් අල්ලන්නට අකමැති වෙමි. මගේ ලේ වල දියවී ඇත්තේ ආදරය පිළිබඳ බරපතල හැඟීමකි.

චන්දනාට මම ආදරය කරමි. ඒ ආදරය වගකීමක් ඇති හැදිච්ච පවුලක කොල්ලෙකු ලෙස මා ඇයට කියනවා නම් එතැන් සිට ඒ ජීවිතයටද වගකිව යුතුය. එසේ කරන්නට බැරි වූ විට මම වේගයෙන් යන වාහන රෝදයකට හසුවූ පූස් පැටියෙක් මෙන් චප්ප වෙමි.

ආදරය වෙනුවෙන් මහා පරිමාණ දුකක් විදින්නට දත් සංදේශ් කැමති නැත.

හවස හතට පමණ යළි ගෙදර එද්දී සීතල දෙගුණ තෙගුණ වී තිබුණි. මම ඇඳගෙන ගියේ තුනී ටී ෂර්ට් එකක් නිසා ගිඩි ගිඩි ගා ගැහෙන ප්‍රමාණයට මට සීතල දනුණි. ඊටත් මේ වනතුරු මා උන්නේ බඩගින්නෙනි.

අද හාන්පස ඇත්තේ තද මීදුමකි. මේ තරමට සීතල





වැඩි වී ඇත්තේ පෝය දවස් ළඟ නිසාද... මා නිවසට ආවේ අත් දෙකම කිහිල්ලේ ඔබාගෙන දැත් බැඳගෙනය... මා හිතලේ ගැහි ගැහී එනු දුටු චන්දනා පහළ ගෙයි සිට උඩට දුවගෙන ආවාය. තරමක් කොට ගවුමක් ඇඳ උන් නිසාදෝ යුවතිය උඩ දගෙන දුවගෙන එද්දී දෙපා එහෙමම නිරාවරණය විය.

'හො..ඳ වැඩේ... මං කිව්වා පනකොට නිකං හරි ස්වීටරයක් ඇඟට දත් යන්න කියලා...'

'උදේ සීතලක් තිබ්බේ නෑනේ...'

මම ගැහි ගැහී ගෙට ඇතුල් උනෙමි.

'ගොඩාක් සීතලද සංදේශ් අයියේ...'

'ඔ..ව්... බ..ත් සීතලයි බඩගිනියි මහන්සියි...'

මම කට කට ගා ගැහෙන කට අමාරුවෙන් ඇර කීවෙමි. සීතල වෙලාවට කතා කිරීම අමාරුය.

'අ..නේ මං පිනාඩියෙන් බත් මුල අරගෙන එන්නම්... සීතල වතුර බොන්නෙපා... මං උණු වතුර බෝතලේකුත් ගේන්නම්..'

චන්දනා ගෙට දිව්වාය. මම ඇඳගෙන උන් ඇඳුම් මාරු කරගෙන දිග ඩෙනිම් කලිසමත් ස්වීටරයත් ඇඳගත්තෙමි. එළියට වඩා ඇතුළත සනීපය. උණුසුම්ය. මේ තරම් සීතලක් දනෙන්නට ඇත්තේ දවසම එළියේ උන් නිසාය.

ශීතකරණය ඇර පොඩි මාමා ගෙනත් දමා තිබූ බියර් කෑන් එකක් ගෙන මම බිගෙන බීගෙන ගියෙමි.

'හිස් බඩ ඇවිත් බියර් බොනවා...'

චන්දනා වතුර බෝතලයත් බත් මුලත් ගෙන ඇතුළු වූවාය.



www.sinhalaelibrary.com

'බියර් වලට සීතල යනවා...'

'බතුත් ටිකක් සීතල වෙලා තිබ්බා... මං ස්ටීමර් එක උඩින් තියලා ගෙනාවේ... හවසට හදපු මස් හොදිත් තිබ්බා ගෙනවා...'

මම පෙරේතයෙකු සේ බත් මුළ පුරා සෙට් එකේ ටීපෝව මතම දිග හැර ගත්තෙමි. ගම්මිරිස් දමා සැරට හද තිබූ පොල් සම්බෝලයත් වියළි ඉස්සත් බැදුමත් මගේ කටට කෙළ ඉනුවේය.

'මස් හොදි ටිකකුත් උඩින් දගෙනම කන්න... එතකොට රහයි...'

චන්දනා කුඩා ප්ලාස්ටික් හැන්දෙන් උණු උණු මස් හොදි ටිකක් බත් එක මතට බෙදුවාය.

'ඔයා කාලද ඉන්නේ...'

මම නිකමට ඇසුවෙමි. දන් වෙලාව අනාත් පසුවී ඇති නිසා ඇය වේලාසන කන්නට ඇත.

'තවම නෑ... අනික් අය බඩගින්නේ ඉද්දි අපට කන්න බෑනේ...'

මං කෑම නැවැත්තුවෙමි. කෙනෙකු බඩගින්නේ ඉද්දී තවත් කෙනෙකුට කන්නට බැරි නම් එතන බැඳීමක් ප්‍රබල බැඳීමක් තිබිය යුතුය.

'අපි මේ බත් එකම දෙපැත්තෙන් කමු...'

'එපා... සංදේශ් අයියට මදිවෙනවා... මං පැත්තකින් කටක් විතරක් කන්නම්...'

යුවතිය එසේ බත් එකේ කොනකට අත දමන්නට ගියාය. මම ඇගේ අත ඉවත් කළෙමි. පසුව කටක් ඇනුවෙමි.





'ආ...'

මම කටක් අනා ඇගේ මුවේ තැබුවෙමි.

'පුංචි කාලේ ආච්චි මට කැව්වට පස්සේ කවුරුවත් මට බත් කටක් කවලා නෑ...'

චන්දනා කීවේ දෙතොල් බොඳ කරගෙනය.

'තව කටක් ඕනද...'

'එපා බඩගින්නේ නේද ඉන්නේ... කන්න... ඉද්දිච අලිගැට පේර තියෙනවා... උදේ ගහෙන් කැඩුවේ... කිරි චුට්ටක් දලා සීනි ටිකකුත් දලා ගෙනත් දෙන්නද...'

'එහෙම රහද...'

'ම්... හරියට අයිස් ක්‍රීම් වගේ... සංදේශ් අයියා මාසයක් අලිගැට පේර කන්න මහත්වෙලා එයි...'

චන්දනා මේසයේ වැටී තිබූ ජල බිංදු ගෙන ඇඟිලි තුඩින් මේසය මත මල් ඇන්දය.

'ගිහින් කන්න... බඩගිනියි නේද...'

යුවතිය 'නැහැයි' කියන්නට මෙන් හිස දෙපසට වැනුවාය.

'සංදේශ් අයියගේ ලග්නේ මොකක්ද...'

'මිථුන...'

මම සිනාසී කීවෙමි. කේන්දර නැකැත් ග්‍රහ අපල ගැන මගේ කදබල විශ්වාසයක් නැත.

'ඇයි ඇහුවේ...'

'මේ දවස්වල සංදේශ් අයියට අපලද...'

එවර මම හිස ඔසවා බැලුවෙමි. අම්මා බණ්ඩාරවෙලට මා එවන්නට කලින් මගේ කේන්දරය ගල උඩ පන්සලේ



www.sinhalaelibrary.com

හාමුදුරුවන්ගෙන් බැගුවාය. මට ගෙවෙන්නේ සෙනසුරු ජීරාෂ්ඨකයකි. එකතැන ඉන්නට බැරි ඒ නිසාය.

'විතක් අපල.. මං නම් දන්නෑ.. අම්මා බලලා කිව්වා...'

'ප්‍රශ්න උනාද මොනවහරි...'

'ඔව්... මං ගැණු ළමයෙකුට ආදරේ කළා... ඒ ළමයා මුස්ලිම් අහිංසක ගැණු ළමයෙක්... ඒත් අපේ පවුල් දෙකෙන්ම ප්‍රශ්න ආවා... පස්සේ ඒ ළමයා මුස්ලිම් කොල්ලෙක්ව බැන්ද... මං බණ්ඩාරවෙල ආවා...'

මම අවංකව කීවෙමි. ජීවිතය සම්බන්ධයෙන් වංක වන්නට තරම් චන්දනා නරක කෙල්ලෙක් නොවේ.

'අ..නේ පව්... තාම අපල ඉවර නෑ...'

'නේරෙන හැටියට නම් ඉවර වෙගෙන වගේ යන්නෙ...'

'දන් හිතේ කරදර නෑ...'

'ඔයා සාස්තරත් කියනවද...'

චන්දනා දෙතොල් මුව තුළට ගෙන සිනාසුනාය. මම කෙසෙල් කොළය හුරා අන්තිම බත් කටත් කෑවෙමි.

'ඇයි අපල ගැන ඇහුවේ...'

'මේ පැත්තේ ඇවිදිනකොට පරිස්සමින්...'

'ඇයි...'

'නෑ නිකං...'

ඇය කුමක් හෝ සඟවාගෙන කතා කරයි.

'නිකං නෙමේ කියනවා...'

'මං දවල් චුට්ටක් නිදගත්තා.. හරි නරක හීනයක් දැක්කා...'





'දවල් හීන...'

'දවල් හීන තමයි... ඒත් ඒක හරි භයානකයි... ඒක මතක් වෙනකොටත් මගේ ඇඟ හිරි වැටෙනවා... මේ...'

සුවසිය කියන්නේ ඇත්තය. ඇගේ අත්වල වූ සිනිඳු රෝම ඉලිප්පී හිරි ගඩු පිපී ඇත.

'හීනේ මාත් උන්නද...'

'ඔව්...'

'මාව හොල්මනක් වත් දැක්කද මෙහෙම ගඩු පිපෙන්න...'

චන්දනා මුවට අත තබාගත්තාය.

'කිව්වොත් වල් කතාවක්... අමුතුවෙන් දකින්න ඕන නෑ... සමහරු උදේට ඉන්නේ එහෙම තමා... එයා පැත්තක සරම පැත්තක... අපි පව් කියලා පොරවලා යනවා...'

ලැජ්ජාව වූයේ මටය. මගේ නිදගැනීමේ කිසිම පිළිවෙලක් නැති බව මම දනිමි.

'හීනේ අහන්නෙපා... ඒක නරක හීනයක්.. කඳු පැත්තේ එහෙම යන්නෙපා... වැස්සේ නම් එළියට වත් බහින්නෙපා...'

'ඇ..යි...'

'ඇයි කියලා අහන්නෙපා... අයියගේ හොඳට කියන්නේ... මට බය මං දකින හීන ඇත්ත වෙන නිසා...'

'මොනවද ඇත්ත වෙච්ච හීන...'

'ගොඩාක් තියෙනවා... එකක් කියන්නම් හිනාවෙන්නෙපා...'

'බලමු හිනා යයිද කියලා...'

'මීට මාස හතරකට විතර කලින් රෑක මං හීනෙන්



www.sinhalaelibrary.com

දක්කා ලස්සන සුදු පාට හංසයෙක් මේ ගෙයි ඉස්සරහ තණ බිස්සේ ඇවිදිනවා... මහ රෑ හඳ එළියේ... ඇත්තටම දක්කා... හරි ලස්සන හංසයෙක්... ටිකක් ලොකුත් එක්ක... කිරිම කිරි පාටයි...'

මට තණ බිස්සේ ඇවිදින හංසයෙක්ව මැවී පෙනෙන්නට විය.

'ඉතින්... මොකක්ද ඒ හීනේ ඇත්ත උනාද... ඊට පස්සේ ඇත්තම හංසයෙක් ආවද මේ ගෙදරට...'

'ම්...'

'කෝ දන් ඌ...'

චන්දනා ඉඳගෙන උන් පුටුවෙන් නැගිට මම කෑ කෙසෙල් කොළය අතට ගුලි කරගෙන බැලුවාය.

'හංසයා ආවද චන්දනා...'

'ඔව්... ලස්සන හංසයෙක් ආවා...'

'මං අහන්නේ ඌ කෝ...'

'මේ ඉන්නේ ඒ හංස පැටියා...'

චන්දනා මගේ අත මත ඇඟිලි තුඩ තබා කීවාය.

'ම..ම...'

'ම්... අයියා බණ්ඩාරවෙලට ඉස්ඉස්සෙල්ලම ආවේ ඒ හීනේ දකපු දවසට පහුවෙනිද...'

ඒ ටික කියා ඇය දිව්වාය. මම වතුර බෝතලය කටේ තබාගෙනම පිටුපා යන ඇය දෙස බලා උන්නෙමි.

ඇයට මා පෙනෙන්නේ හංස පැටියෙකු ලෙසද... ඒ හංසයා ඇගේ ජීවිතය නම් දූප්පත් පොකුණට පාවී ආවහොත් ඇය කුමක් කියාවිද...

# 24

චන්දනාගේ ආච්චිට අසනීප වූයේ මහ රාත්‍රියේය. වැහි නොවැටුණු නමුදු තද සීතලක් පැවති ඒ රාත්‍රියේ ඇය ගෙදර ගියේ මාත් සමහ මිදුලට වී සෑහෙන වේලා කතා කර කර ඉඳිමිනි. අපි තැම්බූ මයියොක්කා කමින් කතා කළෙමු.

අත් නැති ගවුමක් ඇඳ උන් චන්දනාව මම ඒ රාත්‍රියේදී වෙනස්ම ලස්සනකින් දක ගත්තෙමි. හවස ඇය ඇහ සෝද වත ගැල්වූ පුයර බිඳක සුවඳ සීතල නිසාදෝ පරිසරයට කාන්දු වී තිබුණි.

'ආච්චි ඉන්නේ ටිකක් අසනීපෙන්... ඒ නිසා මං රෑට නිදගන්නෑ... සංදේශ් අයියට රෑට කෝපි එහෙම ඕන උනොත්



www.sinhalaelibrar

මට මිදුලට ඇවිත් අප්පුඩියක් ගහන්න.. මං හදන් එන්නම්...'

ඇය ගියේ මට එසේ කියාය. මම රාත්‍රියේ නින්දට ගියේ ඇගේ සුවඳ යංතම් විසිරී තිබූ මිදුලේ තවත් පැයක් පමණ ඇවිදීමෙන් අනතුරුවය. පොඩි මාමා නුවර ගොස් තිබුණි. ඔහු ආවේ රෑ එකොළහත් පසුවූ පසුය.

මට සනීප නින්දක් ගොස් තිබුණි. මා ඇහැරුණේ කිසිවෙකු ඉදිරිපස දොරට තදින් ගසද්දීය. මම සරම උස්සාගෙනම සාලයට ගියෙමි. පොඩි මාමා තද නින්දකට වැටී උන්නේය.

'චන්දනා... ඇ..යි...'

රෑ ඇඳුම පිටින්ම දොරකඩ හති දමමින් උන් යුවතිය උළුවස්සට අත තබා මා දෙස බැලුවාය.

'කියන්න ළමයෝ... ඇ..යි මේ...'

'අ..නේ සංදේශ් අයියේ... ආච්චිට අමාරුයි... පපුව හිරවෙලා වගේ ගොර ගොර ගානවා... අ..නේ...'

යුවතියගේ දෑසින් මදවිය ඇට තරම් කඳුළු කඩාගෙන ආවේය.

'ඉක්මනට හොස්පිටල් එකට ගෙනියමු...'

'ම..ට මොනාත් තේරෙන්නෑ... ම..ට හරි බ..ය..යි ආච්චිගේ ඇහම ගල් ගැහිලා වගේ...'

'අඩන්නෙපා... ඉන්න ටිකක්...'

මම ඇගේ උරහිසට අත තබා එසේ කියා පොඩි මාමාගේ කාමරයට ආවෙමි.

'මා..මේ... මා..මේ...'

'කොල්ලො ඇ..යි...'





'ආච්චිට සනීප නැතිවෙලා... අමාරුයිලු...'

'අනේ අසරණ ගෑණි... ඉක්මනට ඉස්පිරිතාලෙට උස්සගෙන යමු... උඹ කලිසමක් දාගනින්...'

චන්දනා දොරකඩ අඬමින් උන්නාය.

'අඬන්නැතුව ගිහිල්ලා ඔය නයිට්ටිය ගලවලා ඇඳුමක් ද ගන්න... ආච්චිව අපි හොස්පිටල් එක්ක යන්... ඉතින් යන්න ළමයෝ...'

කෙල්ල ගියේ මහ දිගට අඬමිනි. ඇය කඳුළු පෙරමින් මිදුල හරහා පල්ලම් බහින අයුරු මම මොහොතක් ඇවිලෙන නෙතින් බලා උන්නෙමි. සියල්ල වන්නේ දූප්පත් අහිංසක මිනිස්සුන්ටය.

'පව්... අපිට කෑම ටික අවුරුදු ගාණක් නිස්සේ හදලා දුන්න ගෑණි... ඒ ගෑණිට මොනාහරි උනොත් මේ කෙල්ල සදහටම තනි වෙනවා...'

පොඩි මාමා මුදල් පසුම්බියත් වාහනයේ යතුරත් රැගෙන එළියට බැස්සේය.

'පුතේ දොර වහලා උඹ ඔතනින් පහළට වරෙන්... මං පල්ලෙහයින් වාහනේ ගේ ළඟට අරගෙන එන්නම්...'

මම දොර වසා උඩින් උඩින් පැන චන්දනාගේ නිවසට ගියෙමි. කුඩා බ්ලොක් ගල් වලින් සෑදූ කාමරයේ ඇය අඬමින් ඇඳුම් අඳිමින් සිටිනු මම දොර රෙද්දෙන් යංතමට දැකගත්තෙමි. පපුව හාරාගෙන එන දුකකින් පිච්චුනෙමි. ඇය වැනි යුවතියකට මේ දෙන ගින්දර කොපමණ අසාධාරණද. ජීවිතය ඇත්තටම පුදුමාකාරය.

'හ..රි සංදේශ් අ..යි..යේ...'

www.sinhalaelibrary.com

මා ආ බව දැක ඇය ඇඳි ගවුම ඉනෙන් පහළට දමා කීවාය.

මම ඇතුළු කාමරයට ගියේ ඉන් පසුවය. ඇය කීවේ සැබෑවකි. ආච්චි තුඩා ඇඳේ වේගයෙන් හුස්ම ගනිමින් උන්නාය. ඇගේ දෑස් තද බොර පැහැයට හැරී තිබුණි.

ඇත්තටම තව විනාඩි කිහිපයකින් ආච්චි මිය යනැයි මට සිතුණි. ඇගේ ස්වභාවය එබඳුය.

'ආච්චියේ... අපි ඉස්පිරිතාලෙට යමු... අමාරුයිනේ...'

ඇය කතා බහක් නොකළාය. මා ආ බවක්වත් ඇය දන්නේ නැත.

'අනේ අ..යි..යේ...'

චන්දනා මා පිටුපස සිට ඇඬුවාය.

'බයවෙන්නෙපා... ආච්චිව අපි ඉක්මනට ඉස්පිරිතාලෙට අරගෙන යමු...'

පොඩි මාමාත් මමත් දෙපැත්තෙන් අල්ලාගෙන ගොස් ආච්චිව වෑන් රිය පසුපස අසුනට තැබුවෙමි. චන්දනා ආච්චිගේ හිස පැත්තෙනුත් මම ඇගේ දෙපා පැත්තෙනුත් අල්ලා ගත්තෙමි.

'අ..නේ අන්කල්... ඉක්මනට යන්...'

'උඹ බයවෙන්නැතුව හිටපන් කෙල්ලෙ... ආච්චිට මොනවත් වෙන්නෑ...'

'ම..ට ඉන්නේ මෙච්චරයි ජයදේව අන්කල්...'

ඇගේ දුක සාධාරණය. ජීවිතයේ බොහෝ දේද පිරිසද දෙමව්පියන්ද අහිමි මිනිසුන්ට පසුව මේ බිය ඇතිවේ. එය කිසිවෙකුට නැවැත්විය හැකි දෙයක් නොවේ.

වාහනයේ යද්දී මම චන්දනා දෙස බැලුවෙමි. ඇය වෑන් රිය ඉදිරිපස යකඩ පොල්ලට හිස තබාගෙන උන්නාය.



සුවසිය ඇසෙන්නට නාඩන නමුදු ඇගේ කඳුළු වෑන් රියේ රෙක්සින් කාපට් එක මතට ටක ටක ගා වැටුණි. මම ආච්චිගේ වත උඩින් අත දමා ඇගේ හිස මොහොතකට අත ගෑවෙමි.

'අ..නේ සංදේශ් අ..යි..යේ ම..ගේ ආච්චි..'

ඇය ආච්චිගේ වියපත් මුහුණ අතගාමින් ඇඬුවාය. ආච්චි බොර පැහැගත් දෙනෙත් ඇර අමාරුවෙන් තම මිණිපිරිය දෙස බැලුවාය...

'අඬන්නෙපා ළමයෝ...'

චන්දනා කඳුළු නවත්වා ගත්තේ වෑයමෙනි. ආච්චිගේ මුහුණ අතගාන චන්දනාගේ සුරත වෙව්ලනු මට පෙනුණි.

බණ්ඩාරවෙල රෝහල් පරිශ්‍රයේ මිදුලේ පොඩි මාමා වාහනය නතර කළේය... අපි දෙදෙන පැත්තෙන්ම අල්ලා ආච්චිව ට්‍රොලියක තබා ඇතුළට ගෙන ගියෙමු. ට්‍රොලියේ පැත්තකින් චන්දනා දුව ගියේ අඩමිනි.

බණ්ඩාරවෙල රෝහලේ බොහෝ දෙනෙක් පොඩි මාමාව දන උන්නෝය. ඒ නිසා නේවාසිකව ඉන්නා වෛද්‍යවරයෙක්ව ඒ මොහොතේම රෝහලට ගෙන්වා ගන්නට අපට හැකි විය. ඕ.පී.ඩී. එකේදී ඔහු ආච්චිව පරිස්සමින් පරීක්ෂා කළේය. ආච්චි ළඟ චන්දනා තබා අපි පිටතට පැමිණියෙමු.

'පව්... පොඩි කෙල්ල හොඳටම බයවෙලා...'

පොඩි මාමා ඕ.පී.ඩී. එක අසළ වූ දිග ලී බංකුවට බර වී කීවේය.

'බය නැත්ද මාමේ... ආච්චිට මොනවා හරි උනොත් ඒ කෙල්ලට මේ ලෝකේ කව්රුවත් නෑ... ඒක මහ මූසල අත්දැකීමක් පොඩි මාමේ...'

www.sinhalaelibrary.com

'ආච්චිට මොනවත් වෙනවට නොමේ ලොකු පුතේ... ඒත් ජීවිතේ කියන දේ ෂුවර් නෑ... එහෙම උනත් අපි මේ කෙල්ලව බලාගන්න ඕන... ඒකි මැරි මැරී අපි ගැනමයි බැලුවේ... අපට අසනීප උනත් ළඟමයි... සමහර වෙලාවට දරුවෙක් වත් එහෙම ආදරෙන් බලාගන්නෑ...'

පොඩි මාමාගේ හැඟීම මගේ හදවතට සහනදායී බවක් ගෙන ආවේය. ඇගේ ජීවිතයට එසේ පිහිට වූවාට පව් නැත. ඇය වැනි අහිංසක දරුවන්ව බලා ගන්නා අයවද දෙවියන් බලා ගනිති.

චන්ද්‍රනාගේ ජීවිතයට මීටත් වඩා බරපතල ලෙස මැදිහත් විය හැකි මගක් මම සෙව්වෙමි. හොයන්නට අවශ්‍ය නැත. එය හදවතේ ඇත.

'උඹට මොනවද ලොකු පුතේ හිතෙන්නේ...'

පොඩි මාමා හදිස්සියේ ඇසුවේය. මම ගැස්සී ඔහු දෙස බැලුවෙමි. මගේ පපුවේ ඇති යමක් ඔහු වීදුරුවකින් මෙන් බලා ගත්තාද.

'එක එක ඒවා හිතෙනවා පොඩි මාමේ...'

'උඹට හිතෙන්න ඕන... අපි පස්සේ කතා කරමු...'

ඕ.පී.ඩී. කාමරයේ දොර ඇරිණි. එයි බැලුවේ චන්ද්‍රනාය. ඇගේ ඇස්වල කඳුළුය.

'ජයදේව අන්කල්...'

'කෙල්ලේ...'

'ආච්චිව නවත්ත ගන්න වෙනවලු...'

අපි දුන්දෙනා මූණට මූණ බලා ගත්තෙමු.

'ක..ම..ක් නෑ පුතේ... අපි නවත්තමු... මෙහේ ඩොක්ටර්ස්ල





හරි හොඳයි...'

වෛද්‍යවරුන් හොඳ වුවද නරක් වුවද දුප්පත් මිනිසුන් වෙත කොහේ යන්නද.

'අ..නේ ම..ට බයයි අන්කල්...'

'උඹ බයවෙන්නෙපා... මායි කෙල්ලයි ඉන්නවනේ... කෝ දැන් ආච්චි...'

'දැන් ඩොක්ටර් ඉන්ජෙක්ෂන් එකක් දුන්නා... තව ටිකකින් වාට්ටුවට දානවා කිව්වා...'

ඇගේ හිත සැනසීම පිණිස කිව යුතු යමක් දැන් මටවත් සොයා ගත නොහැක.

'ආච්චි ළඟ ම..ට නවතින්න වෙනා..වා...'

චන්ද්‍රනා කීවේ බිම බලාගෙනය.

'ඔව්...'

'එතකොට සංදේශ් අයියේ අයියගෙයි අන්කල්ගෙයි කෑම බීම...'

මම අහිතක් නැතුව ඇය ළඟට ගියෙමි.

'අපිට මොනවා කන්න බැරිද... ඒ වගේද ආච්චිගේ ජීවිතේ... ඔයා ඕවා හිතන්නෙපා...'

'බලන්න සංදේශ් අයියේ වෙච්ච දේ...'

පොඩි මාමා ප්‍රධාන වෛද්‍ය කාමරයට ගියේය.

'දැන් ඉස්පිරිතාලේ නවත්තනව නම් ඇඳුම් රෙදි එහෙම ඕන නේද...'

'ඒවා ගන්න විදිහක් නෑ සංදේශ් අයියේ... මං උදේට දුවලා ගිහින් ගන්නම්...'



www.sinhalaelibrary.com

සියළු කරදර එකපිට එක කඩාගෙන වැටෙද්දී සාමාන්‍ය යුවතියක් හිස කෙළින් කරගෙන සිටින්නේ කෙසේද. මෙවැනි අවස්ථා වලදී පිරිමි පවා කඩා වැටෙති.

'පොඩි මාමාව ගෙදර යවලා මං හොස්පිට්ල් එකේ ඉන්නද...'

'අ..නේ සංදේශ් අයියා මේ ඉස්පිරිතාල වල දුක් විඳින්නේ කොහොමද... මට පුළුවන්... මේවා මට පුරුදුයි අයියේ...'

ට්‍රොලියක තබාගෙන ආච්චිව වාට්ටුවට රැගෙන ගියේය. ඇය මළ කඳක් වැනිය.

'මං එහෙනම් යන්නම් සංදේශ් අයියේ...'

'බයවෙන්නෙපා... අපි දන්මම යන්නේ නෑ... ටිකක් ඉන්න...'

මම චන්දනාව නවත්වා ගත්තෙමි. පර්ස් එක ගෙන එහි තිබූ එකම රුපියල් පන්සිය මම ඇය අත තැබුවෙමි. යුවතිය එය නොගෙන මා දෙස බැලුවාය.

'අ..නේ අයියේ... සල්ලි ඕන වෙන එකක් නෑ...'

'ඕන වෙනවා... ඔයා ආච්චි ළඟටම වෙලා ඉන්න... මං උදේට කෑමත් අරගෙන එන්නම්... ඉන්න දෙනව නම් මාත් ඉන්නවා...'

'ගෑනු වාට්ටුවේ පිරිමි අයව ඉන්න බෑ...'

කොරිඩෝවේ සෑහෙන දුරක් ගිය චන්දනා යළිත් හදිස්සියේ ඇවිදගෙන මා කරා ආවාය.

'ඇයි...'

'මේ..න කොහේ හරි පන්සලකට දනවද... නැත්නම් අයියා බුදු පහන ගාවින් තියන්න...'





රුපියලේ කාසියක් මා අත තබා චන්දනා කීවාය. සමහර විට ඇය මේ මා අතට දුන්නේ ඇගේ ජීවිතය රැකදෙන ලෙස කළ අවසාන බාරය වන්නට පුළුවන.

ඇත්තටම ආච්චි මිය යයිද... චන්දනා තනිවෙයිද...

ආච්චිවත් චන්දනාවත් බණ්ඩාරවෙල රෝහලේ තනිකර මාත් පොඩි මාමාත් ගෙදර ආවේ හිතකින් නොවේ. අපේ ළඟම කෙනෙකුට විපතක් වූවාක් වැනි මූසල හැඟීමකින් මගේ පපුවම කැවෙන්නට විය. අප රෝහලේ සිට බණ්ඩාරවෙල ටවුම හරහා එද්දී ටවුම තිබුනේ පාළුවටය. එලවළු ලොරි කිහිපයක රියදුරන් හා පෝටර්වරුන් පමණක් ඇහැරී පාර දිගේ සිගරට් උරමින් උන්නෝය.

කෙවිල්ලක් දවිල්ලක් නොවේනම් බියක් මගේ හදවතට දැනෙයි. මේ ආච්චි මගේ ජීවිතයට කොහෙත්ම සම්බන්ධ කෙනෙක් නොවීය. එහෙත් ආච්චිගේ ජීවිතයේ කෙළවර චන්දනා විය.

බැඳීම් වැඩිවෙද්දී දුක වැඩි යැයි බුදුන් වහන්සේ කියා ඇති කතාව සම්පූර්ණ ඇත්තය. එක බැඳීමක් නිසා පපුවෙන් අඩක් පුච්චාගෙන ආ මම දන් තවත් බැඳීමක් වෙනුවෙන් පපුව ගින්නට අල්ලාගෙන උන්නෙමි.

බණ්ඩාරවෙලදී මේ යුවතිය මට හමු නොවුනා නම්... ඇය මේ තරම් හොඳ යුවතියක් නොවුනානම්... අප අතර අතගා බැලිය හැකි තරම් ඝනකම් යමක් ඇති නොවුනා නම්... ඇය දුප්පත් කමේ පතුලේ තනිවූ අසරණියක් නොවුනා නම් මේ අද දැවෙන දවිල්ල පපුවේ නැත.

කව්රුන් කුමක් කීවද ජීවිතයේ ඇති එකම නොවෙනස් දර්ශනය දුක පමණි. අපි පිච්චෙමින් තව තවත් පිච්චෙමින් පිච්චෙන්නට සිහින දකිමින් ජීවත් වන්නෙමු.

පොඩි මාමා බණ්ඩාරවෙල ටවුමේ ඇර තිබූ රෑ කඩයකින්

www.sinhalaelibrary.com

කෝපි දෙකක් ගත්තේය. ඔහු කෝපි එක එක අතකින්ද දුම් වැටිය තවත් අතකින්ද ගෙන දිග කල්පනාවක උන්නේය.

අවාසනාවන්ත පුවතක් දන් දන් ආරංචි වේ යැයි සිතීමෙන් අපි නිහඬව උන්නෙමු.

'ආච්චිට මො..කා..ක් හරි වෙයිද පොඩි මාමේ...'

'කියන්න බෑ ලොකු පුතේ... වයසක මිනිස්සුනේ...'

ජීවිතය ඇත්තේ තණ අග පිනි බිඳකය. එය අසුරු සැනින් වියැකී යයි. ඒ මරණයේ දුක ඇත්තේ ජීවත් වන්නවුන්ටය.

'මං උදෙන්ම කඩේට යනව... උඹ පාන්දරම හොස්පිට්ල් එකට පලයන්... මං සල්ලි ටිකකුත් දෙන්නම් කන්න බොන්න දෙයක් අරගෙන බෙහෙත් මොනාහරි පිටින් ගෙනත් දෙන්න තියෙනව නම් ඒවත් අරගෙනම දීලා වරෙන්...'

මම හිස වැනුවෙමි. පොඩි මාමා ඒ අතින් හොඳ මිනිස්කම් දන්නා කෙනෙකි.

නිවස ඉදිරිපිට වාහනය නවත්වද්දී පාණ්ඩු පැහැගත් සඳ රැස් වැටුණු චන්ද්‍රනාගේ කුඩා බිලෙක් ගල් නිවස අපට දිස්විය. එහි ජීවත් වූ අසරණ මිත්තනියගේත් අහිංසක මිනිපිරියගේත් ජීවිත වලට ලෝක පාලන දෙවියන්ගේ බැල්ම වැටේවායි මම ඉත සිතින් පැතුවෙමි.

මට නින්ද ගියේ නැත. සරමක් ඇඳගෙන මම යළිත් දෙරකඩට ආවෙමි. අද පින්නක් තිබුණෙන් මට එක පිට එක කිවිසුම් පහක් ගියේය.

චන්ද්‍රනා රෝහලේ ගිලන් ඇඳ අසළ සිට මාව සිහිකරනවාද... එසේනම් ඇයටද කිවිසුම් යා යුතුය. දෙදෙනෙකුට එකවර ඔවුනොවුන්ව සිහි වන්නේ එක්කෝ ජම්මාන්තර වෛරයක් තිබුණ විටය. නැතහොත් සංසාරගත





ආදරයක් තිබෙනා විටය.

පොඩි මාමා නිදි ගත්තේය. මම හෙමිහිට ඔහුගේ සිගරට් පැකට් එකෙන් සිගරට්ටුවක් ගෙන දල්වාගෙන මිදුලට බැස්සෙමි. පින්න අහගා බැලිය හැකි තරම් ඝනය. ඇඳි උන් සිල්ක් කමිසය පලාගෙන සීතල කටු ඇඟ මෙන් ලයට කඩා වැටෙයි.

මම මගේ හිතට එකඟව චන්ද්‍රනා ගැන හිතන්නට පටන් ගත්තෙමි. ඇය ශෛලමය ගල් තලාවක් වූ මගේ පපුවේ ගල් කටුවකින් ආදරයේ රන් සන්නස දත් ලියා හමාරය. ආත්මය රවටාගෙන ජීවිතය පිළිබඳ දර්ශන දිග හැරීම බොරුවකි. පිළිතුර ඉතා සරලය.

සංදේශ් චන්ද්‍රනාට ආදරය කරයි.

එය මහා පුදුමාකාර ලෙස පපුවේ හටගත් ආදරයකි. ඒ ආදරය පපුවට වැඩියේ පපුවේ ඇට මිදුළු ආදරය නිසාම කුඩු පට්ටම් වී ගිය අනුවේදනීය විරහ වේදනාවකදිය.

චන්ද්‍රනා වැනි යුවතියක් සමඟ ජීවත්වීම පහසු යැයි මට සිතෙයි. අද සමාජයේ ඉන්නා බොහෝ යුවතියන් සමඟ විවාහ ජීවිතයක් ගත කිරීම කෙසේ වෙතත් විනාඩි දහයක් කතා කිරීම පවා අපහසුය.

චන්ද්‍රනා වැනි යුවතියකගේ ජීවිතය පාමුළ සමනල බලාපොරොත්තු හා සුරංගනා සිහින මවා පළක් නැත. ඇගේ ජීවිතයට අද අවශ්‍ය බරපතල මැදිහත් වීමකි.

මට ඇයව අද නැතත් කවද හෝ විවාහ කර ගත හැකිද. එය අමාරු දුෂ්කර හා වේදනා සහගත වැඩක් නම් මම මගේ ප්‍රේමය දෙවන වතාවටත් භූමි දානය කරමි.

පොඩි මාමාට කිවහොත් ඔහු අම්මාත් තාත්තාත් සමඟ කතා කරනු ඇත. චන්ද්‍රනා ගැන ප්‍රශ්නයක් නැත. මම ඇය ගැන හොඳින්ම දනිමි. මගේ අත දිගු කරන පමාවෙන් ඇය ඒ සුරත මත ඇගේ සුරත තබනා බව මට විශ්වාසය.



www.sinhalaelibrary.com

එවැනි තදබල බැඳීමක් මේ මාස තුන හතරට අප අතර ඇති විය.

කෙනෙක් විවාහ විය යුත්තේ හොඳින්ම තේරුම් ගත් කෙනෙකු සමඟය. එවිට ගෝරියක් දමාගෙන හෝ පවුල් ජීවිතය පවත්වාගෙන යා හැක. එහෙත් අනෙකාගේ හදවතේ භාෂාව නොදන්නා විට තත්වය බැරෑරුම්ය. එය. ඇමරිකාවේදී හමුවූ දෙමළ වැසියෙක් හා ජර්මන් මනුස්සයෙක් මෙනි. ඔවුන්ගේ භාෂාව ඔවුන් දෙදෙනා දන්නේ නැත. එකිනෙකාව තේරුම් කර දෙන්නට වටේ ඉන්නා අය දන්නේද නැත. අවසානයේ වෙන්වෙති.

වෙන්වී යන්නට නම් ගිලිහෙන්නට නම් මුදු පැළඳිය යුතු නොවේ.

www.sinhalaelibrar

# 25

මම පාන්දරම මගේ අලුත් තුවායකුත් ටී ෂර්ට් එකකුත් කොට්ට රෙද්දකුත් පොරවනයකුත් බෑගයට දමා ගත්තෙමි. ගෙදර තිබූ උණු වතුර බෝතලයද සෝදගෙන එයට දමා ගත්තෙමි.

පොඩි මාමා පාන්දරම ගියේ තොග ලොරි කරුවන් දෙදෙනා එන නිසාය. ඔහු මට ටවුමේ ත්‍රී වීලරයක් ගෙදරට එවා තිබුණි.

මම සියල්ලම ගෙන ඩෙනිමට උඩින් ටී ෂර්ට් එක දමාගෙන ත්‍රී වීලරයට ගොඩ උනෙමි.

තවමත් හිරු පාත්වී නැත. පරිසරය පුරාම ඇත්තේ තුනී අන්ධකාරයකි.

බණ්ඩාරවෙල ප්‍රධාන පාරේ කාගේදෝ මරණයකට එල්ලා තිබූ සුදු කොඩි වැල් පාන්දර මන්දලෝකයෙන් මට පෙනුණේ මූසල ලෙසිනි. මම හිත දැඩි කරගෙන රෝහල අභියසින් බැස්සෙමි.

වාට්ටුව කොනක කහ පාට සමර ගෑ කුළුණකට බරවී චන්දනා උන්නේ පරවී ගිය මුහුණිනි. ඒ තරම් දුකක් මං කෙදිනකවත් ඇගේ මුහුණින් නොදක්කෙමි. බලාපොරොත්තු සුන්වූ හිස් මූසල බැල්මක් ඒ දෑස් වල විය.

ඇය මාව දැක කුළුනෙන් මෑත්වී අසරණ ලෙස සිනාසුනාය. ඒ සිනහව මෙතෙක් උන් චන්දනාගේ සිනාහව නොව බලාපොරොත්තු සුන් වූ හිස් යුවතියකගේ සිනාවක් විය.

'අ..යි..යේ.. ඇ..යි මේ පාන්දරම කරදර වුනේ...'

තුවායත් කොට්ට උරත් තිබූ බෑග් එක මම ඇගේ අත තැබුවෙමි. ඒ දෑස් බිමටම බරවිය.

'ආච්චිට කොහොමද...'

'තව අඩුවක් නෑ සැංදේශ් අයියේ... හරි හයියෙන් හුස්ම ගන්නවා... මට හරි බයයි...'

මම කෙටි හාප්පය උඩින් ආච්චි දෙස බැලුවෙමි.

'පාන්දර ඉන්ජෙක්ෂන් එකක් ගැහුවා... ඊකට ඔය තිප්ද ගිහින්... රෑ පුරා තිත්දක් නෑ... මං පපුව අත ගගා උන්නේ...'

දූප්පත් කෙල්ල මුහුණ දී ඇත්තේ එසේ මෙසේ දුකකට නොවේ.

'මං ඔයාට ටී ෂර්ට් එකක් ගෙනාවා... මූණ සෝදගෙන මේක ඇඳගන්න... තවම කඩවල් ඇරලා නෑ... මං තව ටිකකින් ගිහින් කෑම අරගෙන එන්නම්...'





'මැ..ට බ..ඩ ගිත්තක් නෑ අ..යියේ...'

යුවතිය අඬන්නට ආසන්නය.

'හිත ශක්තිමත් කර ගන්න ළමයෝ... ආච්චිට මොනවත් වෙන්නේ නෑ... තොකා නොබී ඉඳලා ඔයාත් ලෙඩ වෙන්නෙපා... මේ ඉස්පිරිතාල වල විෂබීජ පිරිලා... ඇඟ දුර්වල උන ගමන් ලෙඩ හැදෙනවා... ගිහින් මූණ හෝදගෙන මේ ටී ෂර්ට් එක දගන්න...'

රෝහල් කොරිඩෝව පුරා ඇත්තේ මලපොළ මූසල පාළුවකි.

'අ..යි..යා මේ ඉස්පිරිතාල ගානේ රස්තියාදු වෙන්නෙපා... මං කො..හො..ම..ද අයියව මහන්සි කරන්නේ...'

'ඔයා අපි වෙනුවෙන් මහන්සි වෙන්නේ... පණ්ඩිත කම් කියවන්නෙපා... කරදරයක් උනහම නැති මිනිස්සු පොල් කොටන් වලිනුත් කපා ගන්න පුළුවන්...'

මම ඇය දෙසම බලා උන්නෙමි. ජීවිතයේ එළඹි අපමණ දුක් කන්දරා දරා ගත් මේ යුවතිය ජීවිතයෙන්ම පදම් වූ කෙල්ලෙකි. එහෙත් ඒ කිසිදු කරදරයකට ඇගේ අහිංසක ගැහැණුකම කඩා වඩා ගන්නට හැකි වී නැත.

හොඳ බිරිඳකට ඊට වඩා සුදුසුකමක් තව ඇත්ද...

'මොනවද කන්නේ...'

'අයියලා අද තේ වත් බිව්වේ නැත්ද...'

'පාන්දරමනේ ආවේ...'

'මං හවසට ඇවිත් උයන්නම්...'

'පිස්සු නැතුව ඉන්න... මොනවද කන්නේ කියන්න...'

'අයියා හොඳට කාලා මට බනිස් ගෙඩියක් ගෙනත්



www.sinhalaelibrary.com

දෙන්න...'

එසේ කීවත් මේ මොහොතේ ඇය නොකන බව මම දනිමි. එහෙත් මගේ ප්‍රිතුකමක් ඇත.

'බිත්තර බනිස් එකකුයි කිරි පැකට් එකකුයි ගේන්නම්... කෑනාව නේද...'

යුවතිය අසරණ සිනාවක් පා හිස වැනුවාය.

'අයියා කාලම ගේන්න... මෙහේ හෝටල් වල එළකිරි තේ තියෙනවා... ඒකකුත් බොන්න...'

ජීවිතය කවියක් නම් මේ දිනවල ගැයෙන්නේ එහි තවත් වේදනාබරම පද කිහිපයකි. මේ පද මීට වඩා සුන්දරලෙස ගයන්නට අත්වැල් ගායනයක් අවශ්‍යය. සියල්ලටම වඩා ඇයට අවශ්‍යය.

සමහර විට ආච්චී මිය යනු ඇත. උදේ ඇය දෙස බලද්දී මට එසේ සිතුණි.

වැහිබර සතියක් නිසා පැහැදිලි අහසක් බණ්ඩාරවෙලට ඉහළින් තිබුණද සැන්දෑවේ සිට තිබුණේ තද සීතලකි. සඳ රැස් කුට්ටි පිටින් වැටුණු කඳු යාය හදවතට මිහිරකුත් මේ තද සීතල ලයට පාළුවකුත් එක්තර ලන්නට විය.

චන්ද්‍රා රෝහලේ ගත කරන දෙවන රාත්‍රිය අදයි. ඇය සවස් වරුවේ ඇඳුම් ගන්නට ආ මොහොතේ තේත් හදගෙන මා වෙත ආවාය.

'දවස් දෙකක් නිදි මරලා ඇවිත් මොකටද වැඩ කරන්නේ... විනාඩි දහයක් වත් ඇලවෙලා ඉන්න තිබ්බනේ...'

යුවතිය සිනාසුනේ මලානික පැහැයෙනි.

'නිදිමතයි මහන්සියයි ඔක්කොම යන්න කියලා හිනාගෙන සීතලක් නොබලා නැවා...'





ඇගේ කොණ්ඩයෙන් තෙත බේරෙන බව මා දුටුවේ එවිටය.

'දවල්ට කොහොමද කෑවේ...'

රෝහල් වාට්ටුවේ බංකුවක වාඩිවී බඩගින්නේ වේල් ගණනක් දුක් වින්දද ඇය අහන්නේ අපේ කෑම එක ගැනය.

'දවල්ට කොහොම හරි කෑවනේ... දන් මට කියන්න ඔයාට ගෙනත් දුන්න බත් එක කෑවද...'

චන්ද්‍රා නෙත් බිමටම ඔබා ගත්තාය. රෝහල් වාට්ටුවක බත් එකක් දිගහැර ගෙන කෑ නොහැක.

'අයියා හැමදම කෑම ගේන්නෙපා... මට බිස්කට් මොනවා හරි කාලා ඉන්න පුළුවන්...'

'එහෙනම් ගෙදර ආවට පස්සේ ඔයත් අපේ කෑම ගැන හොයන්නෙපා...'

'ඒ ම...ම...නේ...'

අසරණ යැයි දුක්බර යැයි කිව හැකි තුළැටි සිනහවක්ද සහිතව චන්ද්‍රා මගේ අතින් හිස් තේ කෝප්පය ගත්තාය.

'හවස මං යන ගමන් පන්සලටත් ගිහින් යන්නේ... ආච්චිට සනීප වෙන්න කියලා බාරයක් වෙනවා...'

ඇය දන් නාඩා සිටින්නේ කෙසේ දැයි මටද ප්‍රශ්නයකි.

'බය වෙන්න එපා... ආච්චිට ඉක්මනට සනීප වෙයි...'

'ම...ට හ...රි බ...ය...යි... ආච්චි ගැන හරි දුකයි... එයාගේ ජීවිතෙ වැඩි කාලයක් කළේ මං වෙනුවෙන් දුක් විඳපු එක...'

'අපි කාටත් කවදමහරි ජීවිතය දලා යන්න වෙනවා චන්ද්‍රා...'

'ඇ...ත්...ත ඒක තාත් කවිරුන් නැති කෙනෙක්ට ඒක ලොකු පාඩුවක්... පු...ර...ව...ත්...ත අමාරු වෙයි...'

මම නෙත් කොණින් යුවතිය දෙස බැලුවෙමි. ඒ මොහොතේ ඇගේ බැල්මේ වූ අසරණකම, පාළුව හා බලාපොරොත්තු සුන්වූ හැඟීම අන් කවර දිනයකදීවත් මම ඇය වෙතින් නොදුටුවෙමි.

මම ස්විටරයද උඩින් දමාගෙන පැමිණ පඩිය උඩ ඉඳගත්තෙමි. හාත්පස පරිසරය පුරා ඇත්තේ බලා සිටින්නට ආස හිතෙන සොඳුරු දර්ශනයකි.

තැඹිලි පැහැයට හුරු ජර්සියක් ගවුමට උඩින් ඇඳගෙන මෙවන් අනන්ත රාත්‍රීන් වලදී ඇය මා සමඟ දෙඩමළු වූවාය. ඒ හැම මොහොතකම අප කතා කළේ කුමක්ද කියා දැන් මතක නැත්තේ ඒ හැම රාත්‍රියකම මා නින්දට ගියේ හිතේ දහසකුත් එකක් සිතුවිලි තරපාගෙන බව මට මතකය.

පොඩි මාමාගේ වාහනය පැමිණ මිදුලේ රෝස පඳුරු වලට එහායින් නතර විය. ඔහු ගේ දෙසට ආවේම මගේ මුහුණ දෙස බලාගෙනය.

'උ...ඹ...ට පාළුයි...'

ඔහු ඇසුවේය.

'ඔව් පොඩි මාමේ...'

'මේ වෙලාවේ මතක් කර කර හිටියේ පොඩි කෙල්ල ගැන...'

මම හිස වැනුවෙමි.

'ප්‍රේමතෝ ජායතේ සොකෝ... ප්‍රේමය නිසා දුක උපදී...'

ඔහු ගෙට ගියේ එසේ කියමින් සිනාසෙමින්ය. පොඩි මාමා කියන්නේ හැබෑය. ප්‍රේමය නිසා දුක උපදී. මට



දනෙන්නේ ඒ දුකය.

චන්දනාගේ ආච්චිව පේරාදෙණිය මහරෝහලට හෝ කොළඹ ජාතික රෝහලට මාරුකළ යුතුයැයි වෛද්‍යවරු තීරණය කළේ සෙනසුරාද උදෑසනය. ආච්චිට වැළඳී තිබුනේ තරමක් බරපතල හෘදරෝගයකි. එවැනි හෘදරෝග සඳහා ප්‍රතිකාර කරන්නට බණ්ඩාරවෙල රෝහල සතුව පහසුකම් තිබුණේ නැත. පුදුසුම දේ ඇයව කොළඹ ජාතික රෝහලේ හෘද සත්කාර ඒකකයට මාරුකිරීම යැයි වෛද්‍ය වරු තීරණයකර ඇත.

තීරණය ගත් උදෑසන බණ්ඩාරවෙල රෝහලේ ගැහැණු වාට්ටුව අභියස චන්දනා බලාඋන්නේ අරමුණකින් තොරව බෙරපැහැගත් දෙනෙතෙනි. ඉතාමත් දුෂ්කර තත්වයක් යටතේ ජීවිතය දරාගත් මේ දුප්පත් මිත්තණියත්, මිණිපිරියත් අදින් පසුව ජීවිතයට මුහුණ දෙන්නේ කෙසේද.... ආච්චිව කොළඹ රැගෙන ගිය පසු මේ අහිංසක යුවතිය ජීවත් වන්නේ කොහේද.. ආච්චිව බලාගන්නේ කවුද... මේ සියල්ල චන්දනාගේ හදවතේ පෙරලි කරන්නට ඇත.

අහිංසක යුවතිය මේ දෛවය විලාපනම බලාපොරොත්තුවෙන් උන්නාය. ඉඳහිට හැන්දෑවක හිරු බැසයන මොහොතක මම මුහුණත් හෝදගෙන ඇගේ නිවස පැත්තට යන්නෙමි. චන්දනා දෑත්බැඳගෙන උළුවස්සට බරවී අහසපොළොව ගැටලන්නට මෙන් කල්පනාකරමින් ඉන්නීය. ඇගේ දෑස්වල එවැනි සවස්යාමයක මළඉරක පාණ්ඩු පැහැයමෙන් සටහන්ව තිබුනේ මේ කරුමක්කාර දෛවයේ අඳුරු සෙවනැලිය.

සෙනසුරාද උදෑසන වාට්ටුවට යද්දී ඇය මාත් සමඟ විකවේලාවක් යනතුරු කතානොකළාය. කිහිපවතාවක් යමක් කියන්නට හිස එසවූ නමුදු ඒ හැම වාරෙකම චන්දනාට

www.sinhalaelibrary.com

ඇඳුම් ආවේය.

'කොළඹ ගෙනියන්න කියන්නෙ ආච්චිගෙම හොඳටනේ.. ඇයි මේ අඬන්නෙ..'

සතියක් තිස්සේ නිරාහාරව වැටිවුවේ ලී බංකු උඩ දුක්විඳි ඇගේ මුහුණේ තිබුනේ බලාපොරොත්තු බිඳීගිය වේදනා බර බවකි.

'මං...මං... කොහොමද සංදේශ් අයියේ මේව කරන්නෙ.. මගේ ආච්චි ළඟ මං ඉ...න්...නෙ...න.. ඒත් කොළඹ අරන් ගියාට පස්සේ.. අනේ මන්ද..එක්කො ආච්චියි මමයි දෙන්නම එකපාර මැරෙන්න ඕන.. එතකොට සැනසීමයි...'

චන්දනා ලේ පැහැයට හැරී තිබූ දස් අත වූ පොඩිවූ ලේන්සුවෙන් වසාගත්තාය. ජීවිතය මොනතරම් කරුමක්කාර බලාපොරොත්තුවක්ද.. මේ සංසාරයේ ඇත්තේ දුක පමණකැයි අභිමවීම් පමණකැයි බුදුන් වහන්සේ කියා ඇත්තේ කොතරම් සත්‍යයක්ද...

ජීවිතයේ අවාසනාවන්ත ඉරණමක කෙළවර තනිවී සිටින මේ අහිංසක යුවතිය වෙනුවෙන් සංදේශ්ට කළ හැක්කේ කුමක්ද.. මම බරපතල ලෙස සිතන්නට ගත්තෙමි.

'මොනව කරන්නද අයියේ.. මම ආච්චි ළඟම වැටිලා ඉන්නවා. ආච්චි සනීප වෙනකන් කොළඹ මහ ඉස්පිරිතාලෙට වෙලා ඉන්නවා...'

මම වේදනාවෙන් ඉවත බලාගත්තෙමි.. මගේ දස් අසාමාන්‍ය ලෙස බොඳව යනු මට දනෙයි.

'කීයටද ආච්චිව අරගෙන යනව කිව්වෙ...'

'වෙලාවක් කිව්වෙ නැහැ.. දොළහෙන් පස්සෙ අරගෙන





යයි.. අනේ.. මට වාවන්නෙ නෑ අයියේ...'

චන්දනාගෙන් දෑස් වසන්කරගෙන මමත් නෙත් පොඩිකර ගත්තෙමි.

'කලබල වෙන්න එපා.. ඉන්න චුට්ටක් මම වත්ගාලා වවුමට ගිහින් පොඩි මාම හම්බවෙලා එන්නම්.. තේරුනාද...'

මගේ සුරත නොදනුවත්වම චන්දනාගේ හිස මතට ගියේය. යුවතිය හිස වැනුවේ දෙතොල් පට තදකරගෙනය.

මම දුවගෙනමෙන් රෝහල ඉදිරිපිටට ආවෙමි. එහි නවත්වා තිබූ ත්‍රීවිලරයකට පැන වවුම දෙසට පදවන ලෙස මම කීවෙමි.

පොඩි මාමා උන්නේ තේපෙ කඩේ තේ බොමිනි. ඔහු කලබලයෙන් එන මා දක එළකිරි වීදුරුවත් රැගෙනම නැගිට්ටේය.

'ලොකු පුතේ...'

දුවගෙන ආ වේගයට කියන්නට ගිය දේ පවා මට කියවුනේ නැත.

'ඔහොම ඉඳගනින් පුතේ.. ඉඳගෙන නිවීහැනහිල්ලෙ මට කියපන් මොකක්ද කාරණේ කියලා...'

'ආච්චිව කොළඹ අරගෙන යන්න හදන්නේ..'

එය කියද්දී මේ විපත මාගේ ආච්චිට වූවාක් මෙන් මගේ ළය කකියන්නට විය.

'අනේ.. පව්.. දුප්පත් ගෑණිට අමාරු ඇති එහෙනම්..'

පොඩි මාමා අවංකවම කැවුනු හඬින් කීවේය.

'අතනා අර කෙල්ල මැරෙන්න යනවා පොඩි මාමේ...

මං මේ... බලා ඉන්න බැරුව පොඩි මාමව හම්බවෙන්න

ආවේ...'

පොඩි මාමා තලලට ඇඟිලි තුඩු තබාගෙන කල්පනා කළේය.

'පොඩි මාමේ... පුළුවන්නම් පොඩි මාම කතාකරලා කෙල්ලව අපේ ගෙදර නතර කරන්න... මට තාත්තගෙනුයි අම්මගෙනුයි අහන්න ලැජ්ජයි...'

මම හිතේ තිබූ අදහස අවංකවම කීවෙමි. පොඩි මාමාගේ මුහුණට සැහැසිලි දයක පෙනුමක් ආවේය.

'ගෙදර නැවැත්තුවා කියමු... පුතා හිතන්නේ මේ කෙල්ලට ඔය කොළඹ පාරවල් වල තනියම රස්තියාදු වෙන්න පුළුවන් කියලද...'

මගේ හිත යළිත් අසරණකමින් කකියන්නට විය. පොඩි මාමා කියන්නේ ඇත්තය. කොළඹ යනු බණ්ඩාරවෙල මෙන් සරල නගරයක් නොවේ. අසරණ යුවතිය කොළඹ මං මාවත් මැද අතරමං වෙනු ඇත.

'අපට කන්න ටික හදලා දුන්නා... පාත්දරද මහ රැද කියලා බලන්නැතුව තේ කෝප්පි ඇද්දා... අසනීප උනාම කොත්තමල්ලි වෙනිවැල්ගැට ටික තම්බගෙන ආවා... කිළුටු ඇඳුම් ටික සේදුවා... ඒ ඔක්කොම කරපු කෙල්ලනේ මාමේ මේ...'

'උඹ හිතන්නේ මං පුතේ මනුස්සකම් දන්නෑ කියලද... ටිකක් හිටපන් විදිහක් කල්පනා කරන්න...'

පොඩි මාමා දුම් වැටියක් දල්වා ගත්තේය. මම පොඩි මාමා ඉතුරු කළ එළකිරි තේ බාගය බීගෙන බීගෙන ගියෙමි. ඒ තරමටම පිපාසයය.





'මං කියන්නද කොල්ලෝ... උඹත් සතියක් විතර කොළඹ පලයන්... බිස්නස් එකේ වැඩ සතියක් දෙකක් පරක්කු කරලා පටන් ගමු... කාරියක් නෑ...'

එතනද ප්‍රශ්නයක් ඇත. චන්දනාව රෝහලට එක්කාගෙන යන්නේ මාද... එවිට අම්මාත් තාත්තාත් කුමක් සිතාවිද.

'පො..ඩි මාමේ අ..ම්..මයි තා..ත්..තා..යි...'

මම අසරණව ඇසුවෙමි.

'උඹට ලැජ්ජද...'

එය ලැජ්ජාවක්ම නොවේ. දෙමව්පියන් දැනුවත්ව ගැණු ළමයෙකු හා තනි මඟ යද්දී හිතට එන්නේ වෙනත් අදහසකි.

'මං නංගී එක්ක යවන්නම්...'

'ඒකත් ඇත්ත පොඩි දුවත් ඉන්නවනේ... ඒත් උඹත් තැවතියන්... මං හිතන විදිහට...'

එසේ කියා පොඩි මාමා මා දෙස බැලුවේය.

'ඇ..යි පොඩි මාමේ...'

'ආච්චි ජීවත් වෙන එකක් නෑ පුතේ...'

මටද එය සිතුනේ වරක් දෙවරක් නොවේ.

'පො..ඩි මාමේ එහෙම වුනොත්...'

'ඒක එවෙලෙට බලමු... කොහොම උනත් මොනා උනත් අපි මේ කෙල්ලව බලාගන්නවා... මං ඒකව මගේ දුවෙක් වගේ හදගන්නවා... උඹටත් ඕන නම්...'

මම කිසිවක් නොකියා නැගිට්ටෙමි. පොඩි මාමාද මා අනුව නැගිට හෝටලයෙන් පිටතට ආවේය.

'ආච්චිව කියවද අරගෙන යනවා කියන්නේ...'



www.sinhalaelibrary.com

'දෙළහෙන් පස්සේ...'

'හරි... අපිත් හවස කොළඹ යමු... උඹ ගෙදර ගිහින් ලෑස්ති වෙයන්... මගේ ඇඳුම් දෙක තුනකුත් ලෑස්ති කරපන්... කෙල්ලටත් ගිහින් කියපන්...'

'මෙකි කැමති වෙයිද... කාටවත් කරදර කරන්න කැමති නෑ...'

'ඒකි කැමති උනත් අකමැති උනත් මීට වඩා වෙන විසඳුමක් නෑ... මං තාත්තට කතා කරලා මේ වග කියන්නම්...'

මම බලාපොරොත්තු සහගතව පාරට ආවෙමි. කවර තත්වයක් මැද වුවද චන්දනාව අපේ ගෙදර ගෙන යාමට ලැබීම සතුටකි. ඇයට නංගිගේ කාමරයේ ඇගේ ඇඳේ නිදගැනීමට පුළුවන.

# 26

යළි රෝහල ළඟට යද්දී උදේ දහයට පමණ විය. ඒ ලෙඩුන් බලන වේලාව නොවූයෙන් මම ඇටෙන්ඩන් කෙනෙකුට රුපියල් විස්සක් දී වන්දනාට පිටතට එන ලෙස පණිවිඩයක් යැව්වෙමි. ඇය ඉක්මනින් ආවාය.

'උදේට තේවත් නොබී නේද ඉන්නේ...'

රෝහල අසළ වූ කුඩා කඩයට ඇයව එක්කාගෙන ගොස් මම තේ එකක් අරගෙන දුන්නෙමි.

'ආව්විට සිහි කල්පනාවක් නෑ සංදේශ් අයියේ...'

'බයවෙන්නෙපා දන් කොළඹ එක්කං යනවනේ... එහේ හොඳ ඩොක්ටර්ස්ලා ඉන්නවා...'

මම මොහොතක් මේ අසරණ යුවතිය දෙස බලා උන්නෙමි. ඇගේ දෙවයේ ඇති අසරණකම විනා ඇගේ වතේ එවැනි අසරණ පාටක් පෙනෙන්නට නැත. සැපවත් පවුලක ඉපදුනා නම් මේ මට ළඟින් ඉන්නවත් වරම් නැති කෙල්ලෙකි.

'මං පොඩි මාමා එක්ක කථා කළා...'

'අයියා කරදර වෙන්නෙපා... මං හිතුවේ ඉන්න දෙනවනම් මේ උන්නා වගේම ආච්චි ළඟට වෙලා ඉන්න... බැරිනම් දවසක් ඇර දවසක් බණ්ඩාරවෙල ඉඳලම ගිහින් ආච්චිව බලනවා...'

'පිස්සුද ඔයාට... කොළඹ හොස්පිට්ල් එකේ එහෙම තවත් අයට ඉන්න අමාරුයි... බණ්ඩාරවෙල ඉඳලා කොළඹ යන එක මෙතන ඉඳලා බදුල්ලට යනවා වගේ කියලා හිතුවද...'

මම කේන්තියෙන් කීවෙමි. එක අතකට එහෙම බැණීම අසාධාරණය. අසරණ ඇය ඉන් එහා කුමක් කරන්නද.

'අපි අපේ ගෙදර නවතිමු... මාස් සතියක් විතර ගෙදර ඉන්නවා... නංගිත් ඉන්නවනේ... අපි අපේ ගෙදර ඉඳලා ආච්චිව බලන්න යමු... දවසට තුන් පාරක් බලන්න දෙනවනේ තුන් පාරම බලන්න පුළුවන්... ඕන නම් රෑට ආච්චි ළඟ නවතින්න පුළුවන්... දවල්ට ඇවිත් ටිකක් නිදාගන්නත් පුළුවන්...'

'අ..නේ මං කොහොමද සංදේශ් අයියලට එහෙම කරදර කරන්නේ... මේ අයියා කරන දේවල් හොඳටම ඇති... සංදේශ් අයියගේ අම්මයි තාත්තයි අයියටත් බනී...'

'අපේ අම්මයි තාත්තයි එහෙම කරන අය නෙමේ





චන්දනා... එයාලත් එයාලගේ පුතා වගේම තමයි පේරුණාද... පණ්ඩිතකම් නැතුව තව ටිකකින් ගෙදර ගිහින් ඇඳුම් ටික ලෑස්ති කරලා මට දෙන්න... මං වැන් එකට දගත්තම්... ආච්චි ඉස්පිරිතාලේ වාහනේකනේ කොළඹ ගෙනියන්නේ... අපි මේ වාහනේ කොළඹ යන්... ගිහින් බලමු...'

චන්දනා ඇස් වල මතුවූ කඳුළු බිංදු ඇඟිලි තුඩින් පොඩි කළාය.

'මං... මං වගේ කෙ..ල්..ලෙ..ක් මො..ක..ට ඉ..ප..දුනා..ද මන්ද සං..දේ..ශ් අයියේ...'

ඕනිසුත් ඉදිරියේ ඇයව සනසන්නට බැරි කමට මම උරහිසට අත තබා සෙලෙව්වෙමි.

'ඔක්කොම අමතක කරලා කොළඹ යමු... හැම දෙයක්ම විසඳෙන්න ඕන විදිහට විසඳෙයි... ඔයා ජීවිතේ ප්‍රශ්න වලට මූණ නොදුන්න කෙල්ලෙක් නෙමෙයිනේ... ඇයි දැන් මේ කඩා වැටිලා...'

'මූණ... දු..න්..නා එතකොට ආච්චි වත් මං ගාව උ..න්..නා..නේ...'

'දැ..න් මං ඉ..න්..නා..වා කියලා හිතන්න... පේරුණාද...'

මම තීරණාත්මක හඬින් කීවෙමි. කෙල්ලෙකුට මෙවන් වචනයක් කීමේදී සැහෙන්න සිතිය යුතුය.

එහෙත් ඇය අද ඉන්නා අසරණ තත්වයෙන් ඇයව ගොඩ ගන්නට මීට වඩා දෙයක් කියන්නට තිබුණද එයද මම කියමි.

'අයියට කරදරයක් නෑ නේද...'

'මට ඔයාව කරදරයක් වෙනවද ළමයෝ... දැන් ගෙදර

ගිහින් ඇඳුම් ටික මට දෙන්න...'

'මේ කරන උදව් වලට මම අයියට මොනවද කරන්නෝන...'

මම සිනාසුනෙමි.

'ආපහු ගෙදර ආපු දවසක මට හොඳ කිරි කෝපි එකක් හදලා දෙන්න ඒ ඇති...'

මම සැහැල්ලු ලෙස කීවෙමි. චන්දනා දවස් ගණනකට පසු සිනාසුනාය.

චන්දනාගේ ආච්චිව කොළඹ ජාතික රෝහලට රැගෙන ගියේ විශේෂ ගිලන් රථයකිනි. ආච්චිත් සමඟම යන්නට නොලැබීම ගැන චන්දනා කැවුණාය. ගිලන් රිය යන්නේ පේරාදෙණිය රෝහලේද දෙපැයක් නවතාය. ආච්චිව කොළඹ ගෙනයන්නට පෙර කොළඹට එක්කාගෙන යන බවට පොඩි මාමා චන්දනාට පොරොන්දු වූයේය.

වැසි ගතියක් නොවූවද හවස් යාමය අඳුරින් පිරී තිබුණි. සවස තුනටත් තිබුණේ හවස හයට පරිසරය ගිලගත් අඳුරය. කුඩා නිවසේ සිට ඇඳුම් බෑගයද ඔසවාගෙන යුවතිය ගල් පඩි තැග්ගේ කල්පනාබරවය.

ඇය ටික දුරක් පැමිණ යළිත් ඔවුන්ගේ කුඩා නිවස දෙස හැරී බැලුවාය. ඒවන්වන කෙනෙක් දමා එන්නාක් මෙන් ඇය දෙතුන් වරක්ම හැරී හැරී බැලුවාය. ඇගේ දෑස් වැස්සට ඇල්ලූ වීදුරු කැල්ලක් මෙනි. දිය බුබුළු මෙන් ඉන් කඳුළු එල්ලෙයි.

ගුරු පැහැති ගවුමක් ඇඳ උන් ඇය වෙනද මෙන් කෙටි වරලස උරහිස මතට ලස්සනට වැටෙන්නට දමාගෙන නැත. මුළු කොණ්ඩයම එක් කර බැන්ඩ් එකක් දමා උන් ඇගේ මුහුණේ තුනී පුයර තට්ටුවක් උඩින් පල්ලෙන් වැටි





ඇත. ඇත්තටම මට දුක සිතුණි. මේ උදව් ඇත්තේ මේ කෙල්ලගේ අපල කාලයක් විය යුතුය.

හැමෝටම එසේ අපල කාල... දුර්භාග්‍ය දවස් උදාවේ. මගේ ජීවිතයේද පසුගිය කාලය එවැනි දුර්භාග්‍ය සම්පන්න අඳුරු කාල පරිච්ඡේදයකි. සතුටක සැහසීමක ඡායා මාත්‍රයක් වත් පෙනෙන්නට නොවූ ඒ කාලය යළි සිහිකිරීමට පවා මම අකමැත්තෙමි. ඒ තරමට ඒ යුගය වේදනාබරය.

පොඩි මාමා එදා මාව බණ්ඩාරවෙලට ගෙනවුත් මගේ හිත හැදුවේය. ඒ මට පොඩි මාමා කෙනෙක් උන් නිසාය. අද... මේ කෙල්ලගේ හිත එසේ හදන්නේ කවුද.

ජීවිතය සන්තකව එවැනි කෙනෙක් සිටිය යුතුය. අප හැමටම අපේ හිත පවා වාරු නොවන දවස් එමට උදාවේ.

'දෙරවල් හොඳට වැහුවද...'

වාහනය ළඟටම ඇය ආ පසු මම ඇසුවෙමි.

'ඇරල දම්මයි කියලා ගන්න දෙයක් ගෙදර නෑ සංදේශ් අයියේ...'

'පණ්ඩිත කම් කතා නොකර කියන්න දෙරවල් වැහුවද...'

'වැහුවා... ඒ..ත් ම..ට හරි බයයි...'

'ඇ..යි...'

'මේ ගෙදර.. ම..ට...'

කියන්නට ගිය දේ ඇයට පිටවුනේ නැත. ඒ වෙනුවට යුවතියගේ මුවින් පිට වූයේ ඉකිබිඳුමකි.

'ඇයි මේ...'

'මට මේ ගෙදරට තනියම එ..න්..න වෙ..යි..ද කියලා ම..ට බ..ය..යි...'

'එහෙම වෙන්නෑ...'

එසේ කියා ඇගේ හදවත සැනසුවද ඇත්තටම එවැන්නක් සිදු වීමටද ඉඩ ඇත. ප්‍රශ්නය එතනින් එහා මේ කෙල්ල ජීවත් වන්නේ කෙසේද යන්නය. පොඩි මාමා ඉදිරිපස දෙරද වසා අප කරා ආවේය. ඔහු චන්දනාගේ හිසට අත තබා මෘදු ලෙස පිරිමැද්දේය.

'අපි යමු පුතේ... එන දේකට මුහුණ දෙමු... උඹට තනිවෙන්න අපි ඉඩ තියන්නෑ... ලොකු පුතේ මේ කෙල්ලට ඔය පිටිපස්සෙ දෙර ඇරලා දෙන්න...'

ඇයව පිටුපස අසුනට කර මම දෙර වැසුවෙමි. වාහනයට ගොඩ වූ පසුත් මම පසුපස හැරී බැලුවෙමි. පොඩි මාමාද වාහනය ඇද්දුවේ පසුපස අසුන දෙස බලාය.

'ඔයාගේ දුක අපට තේරෙනවා නොමේ පුතේ... අසනීප කියන ඒවා කාටද නොහැදෙන්නේ... ජීවිතේ හැටි එහෙම තමයි... ඒවා දරාගන්න ඕන...'

'ජයදේව අන්කල්ටයි සංදේශ් අයියටයි කොච්චර වදයක්ද...'

'හරි පුතේ... වදයක්ම තියමු... එහෙම තමයි ආදරේ කරන අය වෙනුවෙන් මිනිස්සු මීට වඩා වද විදිනවා... ඔයා අපි නිසා වද වින්දේ... ඇයි අපි ඔයා නිසා නොවිදින්නේ...'

'ආච්චිව කොළඹදී සනීප කර ගන්න පුළුවන් වෙයිද ජයදේව අන්කල්...'

පොඩි මාමා බැලුවේ මා දෙසය.

'අපි කරන්න පුළුවන් හැම දේම කරමු පුතේ... ඔයා බයවෙන්නෙපා... අපිත් සතියක් විතර කොළඹ ඉන්නවා...





මටත් ලොකු පුතේ කොළඹ කරගන්න වැඩ ගොඩාක් තියෙනවා... ඔයා කෙල්ලව බලා ගන්න ඕන...'

ඇයව බලා ගැනීම මට වදයක් නොවේ. චන්දනාගේ ජීවිතයට කුමක් හෝ දෙනෙන උදව්වක් කරන්නට මමද පසුගිය කාලයේම බලා උන්නෙමි. මේ ඇයට උදව් උපකාර හවිහරණ වඩ වඩාත්ම අවශ්‍ය මොහොතයි.

'පොඩි මාමේ... මේ ළමයා වේල් ගාණකින් කාලා නෑ...'

මම පුස්සැල්ලාව හරියේදි කීවෙමි.

'ඒක තමයි... අපිත් තවම දවල්වවත් කාලා නැතේ... බලලා මොනවා හරි කාලම යමු...'

'අයියයි ජයදේව අන්කලුයි කන්න මං මෙහෙම වැන් එකේ ඉන්නව... මට තේකක් ඇති...'

පොඩි මාමා අසරණව බලා අවන්හල ඇතුළට ගියේය. ඔහු මට අතින් කීවේ ඇයව එක්කගෙන එන්නට කියාය.

'යන්... මොනවා හරි කාලා එමු... එන්න...'

මම ඇගේ අතින්ම අල්ලාගෙන කීවෙමි. යුවතිය මට අවනත වී වාහනයෙන් බැස්සාය.

'අපි පුළුවන් විදිහට ප්‍රශ්න විසඳගමු... ඔයා අවුල් වෙන්නෙපා...'

වික දුරක් යනතෙක් මට ඇගේ අත අත්හරින්නට අමතක විය.

යුවතිය පළවෙනි බත් කට කටට ගනිද්දීම ඇගේ කඳුළු පිහානට වැටුණි. ජීවිතයේ මහා විපතක් පාමුල සිටිනා අසරණ කෙල්ලෙකුට බත් ඇට දෙක තුනක්වත් කෑම අමාරුය. චන්දනා මෙහෙමවත් කෙළින් ඉන්නේ දුප්පත්කම විසින් ඇයට ලබා



www.sinhalaelibrary.com

දුන් මහා ආත්ම ශක්තිය නිසාය.

'බත් කටවල් දෙක තුනක්වත් කන්න... කොළඹ ගිහින් හාමත් වෙලා ඉස්පිරිතාල ගානේ ඇවිදින්නේ කොහොමද...'

මම කී විට ඇය අමාරුවෙන් බත් ඇට එකතු කරමින් බත් කටවල් දෙක තුනක් කෑවාය. කිරි කොස් මාළු අගුණ කොළ මැල්ලුම් කරවිල සම්බෝල ආදී රසවත් ව්‍යාංජන උයා තිබුණද කෑම වේලේ රසක් නැත.

'කාලෙකින් රසට බත් කටක් කෑවේ නෑ... මේ කෑම අපේ කෑම තරම් රහ නෑ... නේද...'

එයට නම් ඇය සිනාසුනාය. වේල් ගණනක් කුසගින්නේ සිටීම නිසා ඇකිළී ගිය කම්මුල් පවා ඒ අසිරිමත් සිනහවට පිම්බී එයි. දෛවය මේ අහිංසක යුවතියගේ ජීවිතය අල්ලාගෙන නටනා නාඩගමේ තේරුම කුමක්ද. දෙවියන්ට පවා ලෝබ සිතෙනා තරම් වැදගත් ලෙස ජීවත් වන මේ කෙල්ලට දෙන දුක් ගිනි කොළඹ සක්කර වට්ටමකට නොදෙන්නේ ඇයි.

'මට ඇති අයියේ...'

බත් පිඟාන එහෙමමය. එහෙත් මම කිසිවක් නොකීවෙමි.

'අපි යන ගමන් බනිස් මොනා හරි කාලා තේ බොමු...'

පොඩි මාමා බිල ගෙවා එන තුරු අපි මිදුලට බැස පහළ පුස්සැල්ලාව කඳු යාය දෙස බලා උන්නෙමු. චන්ද්‍රා හෙමිහිට මා අසලට පැමිණ හිස එසෙව්වාය.

'සං..දේ..ශ් අයියේ... මං ප්‍රශ්නයක් අහන්න මට ඇත්තම කියනවද...'

ඇය මේ දන් අසන්නට යන්නේ කුමක්ද...

'මොකක්ද...'





'මගේ ආච්චි... ම..ට නැති වෙයිද...'

ඇය කොයියම්ම හෝ මොහොතක මේ ප්‍රශ්නය අසන බව මම දනා උන්නෙමි. අවංකවම කියනවා නම් අප මේ කොළඹ යන්නේ ආච්චිගේ මරණ සහතිකයද අරන් තබාගෙනය.

'ඔය මොනාවත් නොහිතා අපි යමු... කොළඹ යනකල් විකක් වාහනේ ඇලවෙන්න...'

මම හිතාමතාම ප්‍රශ්නය මඟහැරියෙමි. ඒ බැව් චන්ද්‍රාද දනා උන්නාය. ඇය කිසිත් නොකියාම වාහනයට ගොස් ඉඳගත්තාය.

ගෙදරත් නොගොස් අප කෙළින්ම ගියේ කොළඹ මහ රෝහලටය. අප යද්දී කොළඹ ගෙනා ආච්චිට ඇඳක් වත් ලැබී තිබුණේ නැත.

පොඩි මාමා කෙසේ හෝ දන්නා අඳුනන වෛද්‍යවරයෙකුගේ මාර්ගයෙන් ආච්චිට ඇඳක් ලබා දුන්නේය. හවස පහට අප වාට්ටුවට යද්දී ආච්චි ලෙඩ ඇඳ උඩ උන්නේ ඇත්තටම මළ කඳක් සේය. කොළඹ ගෙන ආ පසු තවමත් ඇයට කිසිදු ප්‍රතිකාරයක් කර තිබුණේ නැත.

'ආ..ච්..චි..යේ...'

චන්ද්‍රා කතා කළේ හඬමිනි. ආච්චි දෙනෙත් ඇරියේ අමාරුවෙනි. ඇගේ දෙනෙත් තුළින් මා දක්කේ එකම දෙයකි. ඒ මරණයයි. එහෙත් ඒ දුබල දෙනෙත් වල පවා කඳුළු බිඳු විය. නිසැක ලෙසම ඒ කඳුළු උපන්නේ ඇය තව ටික දවසකින් මේ ලෝකයේ සදහටම තනිකර දමා යන ඇගේ පුංචි මිණිපිරිය වෙනුවෙනි.

ආච්චිට කතා කරන්නට නොහැක. ඇය චන්ද්‍රාගේ අතින් අල්ලාගෙන යමක් කියන්නට හදනවා පමණි.

'එ..පා ආච්චියේ... කතා කරන්නෙපා... දන් අපි ඉන්නේ



www.sinhalaelibrary.com

කොළඹ ඉස්පිරිතාලේ... මෙහේ දොස්තර මහත්තුරු ආච්චිව සනීප කරනවා... බයවෙන්නෙපා... මාත් සංදේශ් අයියලා එක්කල කොළඹ ආවා... ආච්චි සනීප වෙනකල් මං සංදේශ් අයියලගේ ගෙදර ඉන්නවා... ආච්චි බෙහෙත් ටික බීලා සනීප වෙන්න...'

ආච්චි හිස හරවා මා දෙස බැලුවාය. තද අඳුරු පැහැයට හැරී තිබූ ඇගේ දෙතොල් මත කුමක් හෝ ලියවී තිබුණි.

'බයවෙන්නෙපා ආච්චී... අපි චන්දනාව හොඳට බලාගන්නම්... ආච්චි සනීප වෙන්නකෝ...'

ආච්චිට මම සහතික උනෙමි. සමහර විට ඇගේ පුංචි මිණිපිරියව ඇයටත් වඩා හොඳින් මා බලාගන්නට පුළුවන.

මේ සියළු කරදර මැද හදවතට වෙනද නොදනුණු රසබර බවක් දනෙයි. වාවාගත නොහැකි කටුක බෙහෙත් ගඳවල් එන ඉස්පිරිතාලයේදී පවා මට පිච්ච මල් සුවඳක් මෙන් කුමක්දෝ සුවඳක් හදවතට දනෙයි.

ජීවිතය ගැන තීරණයක් ගන්නට තවමත් වේලාසන වැඩිද... එක ආදරයක් නිසා මුළු පපුවම ලෙඩ වූයේ මේ ඊයේ පෙරේදාය. දැන් ඒ ලෙඩ පපුවෙන් තවත් ආදරයකට බලාපොරොත්තු ගොඩ ගැසිය හැකිද...

නෙත් අභියස පිපී සැලෙන මේ සුන්දර වනපස කුසුම තව දුරටත් මගේ කර නොගෙන ඉන්නට තරම් මට ඉවසීමක් නැත.

කොළඹ මහ රෝහලේ දොරකඩට ආ චන්දනාගේ දෙතොල් වල තිබුණේ බලාපොරොත්තු බිඳී ගිය මුහුණකි. ඒ තරම් දුකට මේ මුහුණ තිබෙනවා බලන්නට මා අකමැති වුවද මේ මොහොතේ යුවතියගේ ජීවිතය තිබෙනා තත්වය අනුව ඇය මෙහෙමවත් ඉන්න එක පුදුමය.





සාමාන්‍ය යුවතියකට වඩා දරාගැනීමේ ශක්තියක් චන්දනා තුළ තිබුණි. අනන්ත දුක් කන්දරා ප්‍රමාණයක් තම කෙටි ජීවිත කාලය පුරා විඳි ඇය සමහර විට අද පැමිණ ඇත්තේ එහි කටුකම තැනටය.

සමහර විට අද රාත්‍රියේ නොවේනම් හෙට උදෑසන හෝ ළඟදීම දිනයක ආච්චී මෙලොව හැර යනු ඇතැයි මගේ සිත මට කීවේය. ඒ බැව් අද ආච්චි ළඟදී චන්දනාද ඉවෙන් මෙන් තේරුම් ගෙන උන්නාය.

'අපි යං පුතේ...'

පොඩි මාමා ඇගේ හිස අතගා කීවේය.

'ඒ..ය..දේ..ව අන්කල්...'

කෙල්ල හැඬුවාය. ඉස්පිරිතාලය පාමුල ඇගේ කඳුළු සට සට ගා වැටුණි.

'ඇයි කෙල්ලේ...'

'අ..නේ අන්කල් ආ..ච්..චි...'

'අපිට අද රෑ ආච්චි ගාව ඉන්න බැනේ පුතේ... හෙට උදේම එමු...'

'පව්...'

චන්දනා වාහනයට නැග්ගේ එසේ කියමිනි.

'මොනා උනත් දැන් අපි ඉන්නවනේ...'

මම වාහනයේ පිටුපස අසුනට බර වූ චන්දනාගේ සුරත තදින් අල්ලා කීවෙමි.

පොඩි මාමා ගෙදර යන්නට පෙර මහ නවත්වා සුපිරි වෙළඳ සැලකට ගොඩ විය. මේ ඔහුගේ හැටිය. ඔහු කවදත් ගෙදර එන්නේ නත්තල් සීයා මෙන් බඩු රැගෙනය. මම පොඩි මාමා සමඟ නොගොස් වාහනයේ උන්නෙමි.



www.sinhalaelibrary.com

'ජීවිතේ හැම දෙයක්ම දරාගන්න... ඔයාට කවදහරි හරියනවා...'

මට කිව හැක්කේ මෙවැනි කතාවක් පමණි.

'මං දරාගන්න තරම් ලෝකෙ තවත් කෙල්ලෙක් දරාගත්තද දන්නැ අයියේ... මුලින්ම අම්මා තාත්තා... ඊට පස්සේ කොච්චරක් කියලද...'

'මීට පස්සේ කිසි දෙයක් නැතිවෙන එකක් නෑ...'

'මට අනාගතේ ගැන කිසිම බලාපොරොත්තුවක් නෑ අයියේ...'

මම නිහඬ වීමි. මේ මොහොත අනාගතය ගැන කතා කළ හැකි මොහොතක් නොවේ. ජීවිතයේ සියළු බලාපොරොත්තු බිඳී සියල්ල අහිමි වී අනාථව අසරණව තනිවූ මොහොතක හිතක් අනාගතයක් දෙස බලන්නේ කෙසේද...

'අපි ගෙදර ගිහිල්ලා ටිකක් විවේක ගමුකෝ... රෑට ඕනනම් පන්සල් යන්...'

'සංදේශ් අයියට පින්... මමත් කියාගන්න බැරුව හිටියේ... කොහොම මතක් උනාද මන්ද පන්සල් ගැන කතාවක්...'

ඇගේ කතාවෙන් මම සතුටු වීමි.

'මම එහෙමයි... අනිත් අය හිතන ඒවා තේරෙනවා...'

'මං අහලා තියෙනවා බෙල්ලන්විල පන්සල ගැන...'

'ඔව්... අපේ ගෙදර ඉඳලා ටික දුරයි... රෑට එක්කං යන්නං...'

'සංදේශ් අයියගේ අම්මයි තාත්තයි හිනාවෙයි... හිතන කෙල්ලෙක්ව එක්කං ඇවිත් පිස්සු නටනවා කියලා...'



'ඔයා මට හිතන කෙල්ලෙක් නෙමේ...'

මං කීවේ එපමණකි. ආදරය මොන තරම් ගැඹුරු බැඳීමක් ඇති දෙයක්ද... එය පසුවට ආ පසු ඊට වඩා දෙයක් දනොන්නේම නැත.

'මං පන්සලුත් එක්කං යන්නම්... මේ දවස් ටිකේම ආච්චිව බලන්න එක්කනුත් යන්නම්... හැබැයි රෑට බත් ටිකක් කන්න ඕන... නොකා නොබී ප්‍රශ්න විසඳන්න බෑ...'

'ක..න්..න..ම් නැත්නම් මාත් ලෙඩ වෙයි...'

ඇත්තටම එසේ වීමටද බැරි නැත. ආච්චි අසනීප වන්නට කලින් ඇය හොඳට කෑවාය... බිව්වාය... දිව්වාය... වැඩ කළාය... සාමාන්‍ය සතුටකින් සැහැල්ලුවකින් ජීවත් වූවාය. ටිකක් මහතටද සිටියාය. අද ඒ කිසිවක් නැත.

පොඩි මාමා ආවේ ෆුඩ් සිටි වෙළඳ සංකීර්ණයෙන් පිටි සීනි ඇපල් නූඩ්ල්ස් හා වෙනත් බඩ රැසක් රැගෙනය.

'දුක වෙලාවේ අයිස් ක්‍රීම් කන්න බෑ... ඒත් පුතේ දිව කට වේලිලා අපි මේක කකා යන්...'

ඔහු ෆුඩ් සිටි එකෙන් එලිෆන්ට් හවුස් ඔරේන්ජ් අයිස් පලම් තුනක් ගෙන අපටද බෙදා දෙමින් කීවේය.

'කන්න...'

මම ඇගේ පලම් එකේ ඇසුරුම ඉවත් කොට ඇයට දුන්නෙමි. පොඩි මාමා කීවා හරිය. මුළු දවස නිස්සේම කටේ වූ වියළි පිපාස ගතිය අයිස් පලම් එකෙන් දුරුවිය.

'පොඩි මාමේ වන්දනාට රෑට පන්සලට ටිකක් යන්න ඕනෙලු...'

'ඒකත් හොඳයි... උඹේ හිතේ සහනේ තමයි ඔතේ... මං

www.sinhalaelibrary.com

කියන්නද ලොකු පුතා පොඩි දුවවත් දගෙන කෙල්ලවත් එක්කං යන්න... මං ටිකක් ඇලවෙනවා... අම්මයි තාත්තයි එක්ක කතා කරන්නත් ඕනනේ...'

ඔහු එසේ කීවේ මා දෙසද අමුතුම ආකාරයට බලාය. අම්මාත් තාත්තාත් සමඟ පොඩි මාමා මොනවා කතා කරනවාදැයි මම ඇත්තටම නොදනිමි.

'උඹ බයවෙන්නෙපා මං එහෙම දේවල් කතා කරන්නැ...'

මගේ සිතැඟි හඳුනාගෙන මෙන් පොඩි මාමා කීවේය.

www.sinhalaelibrar

# 27

ගෙදර උන්නේ අම්මාත් නංගීත් පමණි. වාහනය තිවස අසළ නවත්වද්දීම වාගේ මට බැලුනේ ශහීනලාගේ ගෙදරය. ඒ ගෙදර කුලියට දුන් බව නංගී කීවාය.

මට හිල්ලින. ජීවිතයේ ප්‍රථම වසන්ත කාලය සොරා ගත් රාමලාත් සඳ පායා ආවේ මේ තිවසේ සඳළුතලයෙනි. ඇය දැන් මොනවා කරනවා ඇත්ද... ශහීනාට මාව මතක් වෙනවා ඇත්ද... මම නොදනිමි.

'මේ අපේ ගෙදර...'

මම වාහනයෙන් බැස කීවෙමි. යුවතියගේ මුහුණේ සියුම් බියමුසු බවක් විය.

'ල..ස්..ස..න ගෙයක්...'

ඇය තොල් පට මුමුණමින් කීවාය.

'ඔයා කොළඹ ගෙවල් දැකලා නෑ මේ ගිනිපෙට්ටි මාළිගාවට ලස්සනයි කියන්නේ...'

'අනේ නෑ සංදේශ් අයියේ ඇත්තටම ලස්සනයි... සීදේවි පාටයි...'

ගෙදර උන්නේ අම්මාත් නංගිත් පමණි. ගේට්ටුව ඇර අපව පිළිගත්තේ නංගීය. ඇය ආ හැටියේම චන්ද්‍රනාගේ අතකින් අල්ලා ගත්තාය.

'ඔයා මෙහේම ආපු එක හොඳයි... අයියා මට විස්තර කිව්වා... බයවෙන්නෙපා දැන් අපි ඉන්නවනේ...'

නංගීගේ මේ වචන චන්ද්‍රනාට වඩා මට සහනයක් ගෙන දෙන්නට විය.

'මං ආපු එක ක..ර..ද..ර..යක්ද දන්නෑ...'

චන්ද්‍රනා අසරණ හඬින් කීවාය. ඇගේ ඇස්වල ඇත්තටම කඳුළු විය.

'හරි කරදරයක්ම කියමු... ඒත් ඉතින් කමක් නෑනේ... අපිට මතකයිනේ අපි එහේ ගියාම සැළකපු හැටි... අපේ අයියට පොඩි මාමාව ඔයා සැළකපු හැටි...'

අම්මා කාමරයේ සිට ආවාය.

'ආ කට්ටියම ඇවිත් ඉන්නේ...'

අම්මාව දුටු මොහොතේම චන්ද්‍රනා පහත් වී අම්මාට වැන්දය. මගේ පවා පපුව උණුවිය.

'නැගිටින්න දුවේ... ආච්චි සනීප වෙන කල් ඔයා මෙහේ ඉන්න...'





ඒ අම්මාගේ අනුමැතියයි. ඊටත් පසු... ඊටත් පසු චන්ද්‍රනාව ගෙදරම තබා ගන්නට බැරිදැයි මට අම්මාගෙන් අසන්නට සිත් විය.

'අයියා ආවේ නැද්ද අක්කේ...'

'ආවා... ඇවිත් මල්ලිලා එනව කිව්ව නිසා බඩු ටිකක් ගේන්න මීගොඩට ගියා...'

මම චන්ද්‍රනා දෙස බැලුවෙමි. ඇය තවමත් ඉන්නේ අලුත් පංතියකට දැමූ අසරණ කුඩා දරියක් මෙන් අසරණවය. ඇයව එහෙම අසරණ කිරීම ඇත්තටම පවිය.

'නංගී චන්ද්‍රනාට ඔයාගේ කාමරේ පෙන්නන්න...'

'යන්...'

නංගී චන්ද්‍රනාව අතින් අල්ලාගෙන ඇගේ කාමරයට ගියාය. ඇය ගියවනාම අම්මා බැලුවේ මා දෙසය. මම ලැජ්ජාවට බිම බලා ගත්තෙමි.

'ඉලන්ද්‍රියා මොකද නිකං මූණ අමුතු කරගෙන...'

අම්මා අසද්දී මම අසරණව පොඩි මාමා දෙස බැලුවෙමි. සැබෑ ලෙසම අද අපේ සාලය මැද මාද අසරණව ලැජ්ජාවට පත්ව ඇතැයි මට සිතුණි.

හවස් වරුවේ චන්ද්‍රනාගේ ආච්චි වෙනුවෙන් බෝධි පූජාවක් තබන්නට මාත් නංගීත් ඇයවත් එක්කාගෙන බෙල්ලන්විල පන්සලට ගියෙමු.

'අන්තිමට අපි බෙල්ලන්විල පන්සල් ආවේ අයියගේ ඒ ලෙවල් එක්සෑම් එකට කලින්... අයියට මතකද...'

පන්සල ළඟින් බහිද්දී නංගී කීවාය. ඇය බැස්ස මොහොතේ සිට චන්ද්‍රනාගේ අතකින් අල්ලාගෙන උන්නාය.

'ඇයි මතක නැත්තේ...'



www.sinhalaelibrary.com

වන්දනා පන්සල ඉදිරිපිටදී මගේ දෑස් දෙස බලා සිනාසුනාය. අපි බණ්ඩාරවෙලදී පන්සල් ගිය අයුරු ඇයට සිහිවෙන්නට ඇත.

'සංදේශ් අයියා පන්සල් ගියාම වඳින්නෑ... බුද්ධ රූපේ දිහා බලන් ඉන්නවා විතරයි...'

බලාපොරොත්තු නොවූ ලෙස වන්දනා කීවාය. නංගී මා දෙස බලා සිනාසුනාය.

'ඒ කියන්නේ බණ්ඩාරවෙලදී දෙන්නත් එක්ක පන්සලුත් ගිහින්...'

'දවසක් ගියා... ජයදෙව අන්කල් අලුතෙන් එළවළු බිස්නස් එකට ගත්තු ගෙවල් එහා පැත්තේ තියෙන්නේ පන්සලක්...'

කෙල්ලන්ට රහස් සඟවාගෙන සිටිය නොහැක. කොයි මොහොතක හෝ ඔවුන්ගේ කටින් එය පිටවෙයි.

'හරි හරි වැඩ තමා එහේ වෙලා තියෙන්නේ නේද...'

'නෑ මොනවත් විශේෂ දෙයක් උනේ නෑ...'

මම මල් කඩය අසලදී කීවෙමි.

'ජේතවා ඒක... අපි තමා මෙහෙට වෙලා පාළුවෙන් ඉන්නේ... දන් ආච්චි සනීප උනාම ආයිත් යයි කට්ටියම බණ්ඩාරවෙලට...'

'ඔයාටත් ආසද එහේ එන්න...'

වන්දනා ඇසුවාය.

'එන්නනම් හරි ආසයි... ඒත් බෑනේ අම්මයි තාත්තයි තනියම්නේ...'

'ටික දවසකට හරි එන්න... අපිට මුළු බණ්ඩාරවෙලම



ඇවිදින්න පුළුවන්... ස්වීටරයක් ඇඳගෙන...'

යළිත් ඉක්මනින්ම බණ්ඩාරවෙල යන්නට ඇත්නම් යැයි මටද සිතුණි. එහේ ඇත්තේ වෙනමම ජීවිතයකි.

අපි එකටම ගොස් මල් පූජා කළෙමු. නංගී හිතාමතාම වන්දනාටත් මටත් විහාර ගෙට යන්නට දී එළියේ නතර වූවාය.

'පන්සල් ගිය කතාවක් නංගිට කිව්වේ ඇයි...'

නෙළුම් මල් ආසනය මත තබද්දී මම හිමිහිට ඇසුවෙමි. යුවතිය සිනාසුනේ නොපිට පෙරළී ගිය මල් මෙපිට පෙරළමිනි.

'පන්සල් ගියා කියන්නේ නරක වැඩක්යැ... පින් අනේ හොඳ වැඩක්නේ...'

'ඒ වුනාට...'

'ඇයි...'

'කෙල්ලෙකුයි කොල්ලෙකුයි පන්සල් යන්නේ ඒ කෙල්ලයි කොල්ලයි යාළු නම්නේ...'

මගේ කතාවට යුවතිය තොල් පට තද කර ගත්තාය.

'ඉතින් මං සංදේශ් අයියා එක්ක හරි යාළුයිනේ... ඔයා හොඳ යාළුවෙක්... නැත්නම් මට මෙහෙම උදව් කරාවියැ...'

'මම යාළුවෙක් විතරද... තවත් යාළුවෝ ඇතිනේ... නේද...'

මම ඇයට වඳින්නට දුන්නේම නැත.

'මට යාළුවොත් නෑ... සහෝදරයොත් නෑ... උන්නත් අයියා වගේ හොඳ යාළුවෙක් හම්බ වෙන්නෙත් නෑ... කොච්චර හොඳද කියනවනම් මේ බුදුන් වඳින ගමන් මට හිතෙනවා ඔය කකුල් දෙක අල්ලලා වඳින්න...'

www.sinhalaelibrary.com

මං නොසිතූ විලස ඇගේ දෑසින් කඳුළු කඩා වැටුණි. ඒ වචන ටිකට මගේ පපුවම පිච්චී ගියේය. වරක් ආදරය කළ බව ඇත්තය. එහෙත් මෙසේ පපුව දැවී ගොස් නැත.

'අඬන්න එපා...'

'දැන් අඬන්නේ දුකට නොමේ...'

'එහෙනම්...'

'හොඳ කෙනෙක් ගැන සිහිකරන එකත් ලොකු සතුටක්...'

'කාලෙක අමතක වෙලත් යයි...'

ඇය පුදුම වී මෙන් මා දෙස හැරී බැලුවාය.

'මට නොමේ... අයියට නම් මේ හිහන කෙල්ලව අමතක වෙලා යයි... ඒත් මම ජීවිතේ පවතින තුරා අයියා වගේ කෙනෙක්ව මතක් කර කරම ඉන්නවා... ඒක එහෙමමම තමයි...'

'මතක් කරන්නේ ජීවිතේ හැමදම ඉන්නේ නැති අයව...'

'අතීත් අයව...'

'මතක් නොකර ළඟ තියාගන්නවා...'

ඇය නිහඬව බුදුන් වැන්දාය. අපි බර කර ගත් හදවත් වලින් විහාර ගෙයින් එළියට ආවෙමු.

'ඇයි ඔයා බුදුන් වඳින්න ආවේ නැත්තේ...'

චන්දනා විහාර බිමේදී නංගීගෙන් ඇසුවාය.

'අපිට තාම ජෝඩු දලා බුදුන් වඳින්න කවුරුවත් හම්බ වෙලා නැතේ... තනියම වඳින්න කම්මැලියි...'

නංගීගේ කතාවට චන්දනා සුදු වැලි ඇතිරූ බිමේ පා ඇඟිලි වලින් ඉරි ඇන්දය.

චන්දනා කතරගම දේවාලයට ගොස් ආච්චි වෙනුවෙන්



බාරයක්ද වූවාය.

'මේ කෙල්ල දිහා බලන් ඉද්දදී හරි පව් කියලා හිතෙනවා...'

චන්දනා බාරය රැගෙන කතරගම දේවාලයට ගිය පසු නංගී කීවාය.

'ආච්චී නැතිවෙයි කියලා චන්දනා හරි බයෙන් ඉන්නේ...'

'කාත් කවුරුත් නැති උනාම හිතට මොනවද වෙන්නේ කියලා අපට තේරෙන්නෑ... නේද අයියේ...'

'ඔයයි මායි කවදවත් එහෙම තනිවෙලා නැතේ නංගී...'

'එක පැත්තකින් දුප්පත්කම... අනිත් පැත්තෙන් අසරණකම... ඔක්කොටම වඩා කාත් කවුරුත් නැති කම...'

නංගී මේ සියල්ල කියවන්නේ මගේ මුහුණ දෙස බලාගෙනය.

'කවදහරි හිතාවෙලා ඉන්න පුළුවන් දවසකුත් දෙයියෝ මේ කෙල්ලට දෙයි...'

මම සුසුමක් හෙලා කීවෙමි.

'දුක් දීලා දීලා ඉන්න අයවත් නැති කරලා තනි කරන්නේ ලෝකේ ඉන්න හොඳම කෙනෙක් දෙන්න වෙන්න ඇති නේද...'

ඇය මා දෙස බැලුවේ ඒ කෙනා මා යැයි හිතන්නාක් මෙනි.

'ම්...'

මම ඕනාවාට එපාවට හූම්ට් තැබුවෙමි.

'අයියා අවංක නෑ...'

නංගී හිටිවනම කීවාය. මේ මොහොතේ මගේ කටින්

www.sinhalaelibrary.com

මොනවා හෝ පිටවෙතැයි නංගී හිතන්නට ඇත.

'ඇයි එහෙම කියන්නේ...'

'එහෙම තමයි...'

'සමහර දේවල් කියාගන්න බැරි එක අසරණකම.. ඒකට වංක කම කියන්නෙපා...'

'අන්න එහෙම කියන්න... මං දන්නවා...'

පන්සලෙන් පිටවෙන මකර තොරණ ළඟදී මම වන්දනා දෙස බැලුවෙමි. එද්දීට වඩා ඒ මුහුණ දන් පින් පාටය.

www.sinhalaelibrary

# 28

පසුද ජාතික රෝහලට යන්නට නංගීද අපට එකතු වුණාය. අපි උදෑසනින්ම ත්‍රී වීලරයකින් රෝහලට ගියේ අම්මා හද දුන් කෑමද රැගෙනය. අනුන්ගේ වුව දුකකදී උණුවෙන හදවත් ඇති දෙමව්පියන් ලැබීම ගැන මට තිබුණේ සතුටකි.

'මට හරි බයයි සංදේශ් අයියේ... ඊයේ රෑ මං නරක හීනෙකුත් දක්කා...'

යුවතියගේ බිය සාධාරණය. ආච්චි උන්නේ මරණාසන්නවය.

'අපි බෝධි පූජාවකුත් කරන්නම් නංගී... බයවෙන්නෙපා...'

'මට ළඟ ඉන්න දෙන්නෙවත් නැහේ... පව්...'

ලෙඩුන් බලන වේලාව පැමිණි පසු අපි කඩිනමින් ආච්චිගේ වාට්ටුවට ගියෙමු. කොරිඩෝව දිගේ චන්දනා යන්නේ දුවගෙන මෙනි. ජීවිත චාලුකාව මැද අහිංසක කෙල්ලෙක්ව මේ තරම් අසරණ කිරීම දෙවියන්ට පවා නොතරම් වැඩකි.

ආච්චිගේ ඇඳ තිබුනේ හිස්වය.

'සං..දේ..ශ් අ..යි..යේ ආ..ච්..චී...'

චන්දනා වෙව්ලමින් මගේ අතින් අල්ලා ගත්තාය.

'වෙන වාට්ටුවකට මාරු කළාද දන්නැහේ... අපි බලමු...'

මම වාට්ටුව කෙළවරේ හෙදිය අසළට යද්දී චන්දනා හඬමින් මගේ අතක එල්ලී උන්නාය.

'නංගී... මේ ළමයව ටිකක් අල්ලගන්න...'

මම නංගී දෙස බලා කීවෙමි. නංගී පැමිණ චන්දනාව අල්ලා ගත්තද ඇය මගේ අත අත් හැරියේ නැත.

'එක්ස්කියුස් මී මිස්... මේ ඇඳේ හිටපු පේෂන්ට්...'

මම ප්‍රධාන හෙදියගෙන් ඇසුවෙමි. ඇය අප තිදෙනා දෙස මාරුවෙන් මාරුවට මොහොතක් බලා උන්නාය.

'අ..නේ කි..ය..න්..න..කෝ අ..ක්..කේ...'

චන්දනා කෑ ගැසුවාය.

'කලබල වෙන්නෙපා... එයා අද පාන්දර තුනට විතර...'

ඉතිරි ටික නෑසෙන තරමට චන්දනා කෑ ගැසුවාය. ඊළඟ මොහොතේදී ඇය සිහි නැතුව මගේ වතටම බර වූවාය. මම එහෙමම ඇයව අල්ලාගෙන බිම දණ ඔබා ගත්තෙමි.

චන්දනාගේ ආච්චිව මිහිදන් කළේ බණ්ඩාරවෙලම අඳුරු

www.sinhalaelibrary.com



මන්දරමකින් කළු ගැසී තිබූ සැන්දෑවක සුඩා සුසාන භූමියකදීය. අප ටික දෙනා ඇරෙන්නට අසල්වාසීන් කිහිප දෙනෙක් පමණක් උන් ඒ අසරණ අවමංගල සැඳෑව මට ජීවිතය ගැන පුදුමාකාර දුකක් වේදනාවක් එක් කළ සැඳෑවක් විය.

අන්ධකාර ගොම්මන් අඳුර සමඟ හීන් වැහි පොදක් හමා ගිය ඒ සැඳෑවේදී අහිංසක යුවතිය තම ජීවිතයේ උන් එකම ආදරණීය නෑදෑයා ළේ ඥතියා දමා යා නොහැකිව පස් ගොඩැලි වලින් වැසූ වළ අභියසට වී ඇඬුවාය.

අප කිසිවෙක් ඇයව එතැනින් නැගිට්ටවන්නට නොගියේ ඒ දුක එසේවත් පිට නොකරන්නේ නම් ඉන් මත්තට ඇයට හිත හද ගත නොහැකි නිසාය.

ජීවිතයේ මේ දුෂ්කර ඉරණමට අවුරුදු දහනමයක් තරම් බාල වයසකදී මුහුණදුන් චන්දනාගේ හදවත මේ මොහොතේ පවතින්නේ කොතරම් දුක්බරවද්දැයි මට පවා සිතාගත නොහැකි විය.

ආච්චිගේ මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ සිට බණ්ඩාරවෙලට ගෙනෙනා තුරුම ඇය කළේ හැඬීමය. අවමංගල්‍යයට වියදම් දැරුවේ පොඩි මාමාය. අසරණ යුවතියට කරන්නට පුළුවන් වූ එකම දේ ඇගේ දුප්පත් ආච්චිගේ සිරුර බදාගෙන හැඬීමය.

ඒ පුංචි නිවසේ ඔවුන් දෙදෙනා තනිවම ජීවිතය දරා ගත්තෝය. ජීවිතයේ බොහෝ නොලැබීම් අහිමිවීම් ඔවුන් දරාගෙන උන්නේ පුදුමාකාර ලෙසිනි.

ආච්චී ඇගේ පුංචි මිණිපිරියව දමා ගියේ ඒ දුක වැඩි නිසාම වන්නට ඇත.

ඔවුන් ඒ කුඩා නිවස ඇතුළට වී කොතරම් බඩගින්නේ සිටින්නට ඇත්ද... කොතරම් දුක් ගින්දර උහුලන්නට ඇත්ද...

පොදය අනෝරාවක් වන ලකුණු වටින් පිටින් පෙනෙන්නට විය. කනත්තට ආ බොහෝ දෙනා ගියේ අසරණ කෙල්ල තනිවුනා කියමින් ඇය ගැන දුක්බරව කතා කරමිනි.

'පුතේ... අර ළමයව දැන් ගෙදර එක්කගෙන යන්... ඔහොම හිටියොත් කෙල්ල තව පාරක් සිහි නැතිව යනවා...'

අම්මා කීවේ කරුණාවෙනි. අද දිනය තුළ චන්දනා තුන් වරක්ම සිහිසුන්ව ඇද වැටුණාය.

'යන්න පොඩි දුවයි පුතයි ගිහින් කතා කරගෙන එන්න... අර වැන් එකට යන් අයියේ...'

අම්මාත් තාත්තාත් පොඩි මාමාත් වාහනයට ගියේ වැස්ස වැඩි කළ නිසාය. නංගීත් මමත් කුඩය ඉහළාගෙනම ආච්චිගේ සිරුර භූමිදානය කළ වළ අසළට ගියෙමු. චන්දනා උන්නේ ඒ වළ අසළ බිම වැටී අත දරුවෙකු මෙන් හඩමිනි.

'ක..තා කරන්න අ..යි..යේ...'

නංගීද උන්නේ කම්පනයට පත්විය. මම චන්දනා උන් ආච්චිගේ වළ අසළ බිම පාත් උනෙමි. නංගී අප දෙදෙනාම අහුවන ලෙස කුඩය ඉහළවූවාය.

අවට දෙදරවමින් මහ වැසි වැටෙන්නට විය. එය කුඩයකින් මුවා කළ හැකි වැස්සක් නොවීය.

'අ..පි යන් නංගී...'

මම ඇගේ දෙඋරිනම අල්ලා ගත්තෙමි.

'අ..නේ.. සං..දේ..ශ්.. අ..යි..යේ... ම..ගේ ආ..ච්..චි... නො..මෙ..ා..ව..නේ...'

ඉකිගසමින් ඇය කියද්දී මගේ කඳුළුද අලුත් විය. මරණය කොතරම් දුකක්ද... එය දුකක් වන්නේ ජීවත් වන්නවුන්ටමය.





'අපි හෙට ආච්චි බලන්න එමු... දැන් යන්... දැන් වැඩත් තියෙනව..නේ...'

'අ..නේ මං... ම..ගේ දු..ප්..ප..ත් ආ..ච්..චි දාලා කොහොමද ය..න්නේ ර..ත්තරන් අ..යියේ...'

'අපි යන් නංගී... හොඳ ළමයනේ...'

මම ඇගේ දෙඋරින් අල්ලා නැගිට්ටවූයෙමි. නැගිට්ට පසුත් ඇය යළිත් බිම දණ ඔබා ආච්චිගේ වළට වැන්දය.

'මං.. ය..න..වා ම..ගේ රත්තරන් ආ..ච්..චි..යේ...'

නංගිගේ මුහුණේ වැහි වතුර මෙන් කඳුළු පිරෙන්නට විය.

'අ..නේ ආ..ච්..චි මං..වත් එක්කරගෙන ගි..යේ නැ..නේ...'

ඇය හොන්තුවාවෙන් මෙන් කියවද්දී නංගීත් මමත් ඇයව දෙපසින් වත්තන් කරගෙන වාහනය වෙත ආවෙමු. අම්මාත් තාත්තාත් පොඩි මාමාත් වාහනය තුළ සිට අප තිදෙනා දෙස බලාගෙනම උන්නෝය.

දැන් මේ ජීවිතය තනිකර දමා මට යා නොහැක. මම අම්මාත් තාත්තාත් දෙස බලා දෑස් වලින් එය කීවෙමි.

ආච්චිගේ හත් දවසේ දානයෙන් පසු චන්දනා පුංචි ගෙදර තනිවිය. අවමඟුලට ආ අම්මාත් තාත්තාත් නංගීත් අද උදේ කොළඹ ගියෝය. බණ්ඩාරවෙලම පාළුවට ගියාක් වැනි පාළු හැඟීමක් මට දැනුණි.

අදින් පසු චන්දනා මේ කුඩා නිවසේ තනිවම ජීවත් වන්නේ කෙසේද... මට තිබූ විශාලම ප්‍රශ්නය එයයි. පැත්තකින් මහා දුප්පත්කමය. තවත් පැත්තකින් ජීවිතේ කාත් කව්රුත් නැති දුකය. සියල්ලටම වඩා ගැහැණුකමේ අසරණකමය.

රාත්‍රිය පුරාම මටද නින්දක් නොවීය.

පුරුද්දකට මෙන් චන්දනා පැමිණ කුස්සියේ තේ හදන්නට පටන් ගෙන උන්නාය. මම කාමරයට වී බොහෝ වෙලා උන්නෙමි. ඇත්තටම කිවහොත් මේ උදෑසනේ ඇගේ දුක්බර මුහුණ බලන්නට මට දුකය.

'සං..දේ..ශ්.. අ..යි..යේ...'

බිත්තිය පැත්තට හැරී මා ඇඳට වී කල්පනා කරමින් සිටිද්දී චන්දනා දෙර අසළට ආවාය. මම හැරී බැලුවෙමි. යුවතිය පරඬැලක් වූ ගානය. පසුගිය සතියේම ඇය කිසිවක් කෑවේ නැත. කන්නට පුළුවන් කමක්ද නැත. ජීවිතය සන්තක වූ සියල්ල අහිමි වූ කල බඩට පමණක් යමක් දමා ගත නොහැක.

'තේ කාමරේට ගේන්නද...'

පහත් හඬින් ඇය ඇසුවාය.

'යත්... මං එන්නම්...'

තවත් මොහොතක් මා දෙස බලා සිට ඇය කුස්සියට ගියාය. මම කමිසයක් ඇඟට දමාගෙන ඇය පිටුපස ගියෙමි.

'ජයදේව අන්කල්ව නැගිට්ටවන්නෙපා නේද... මහන්සියට නිදි ඇති...'

'ඔව්... පස්සේ ඇහැරවමු...'

එළකිරි වීදුරුව මා අතට දී යුවතිය උළුවස්සට බරවී ඇත කඳු දෙස බලාගත්තාය.

'අද ඉඳලා වත් කන්න බොන්න...'

'මං පස්සේ බොන්නම්...'

'බැහැ... දැන්මම කිරි එකක් හදාගන්න...'

යුවතිය මගේ අණට කීකරුව ඇයටද එළකිරි වීදුරුවක්





හදාගත්තාය. ඒ දෑස් වල බලා ඉඳිද්දී කඳුළු පිරෙමින් තිබුණි.

'මං දන්නවා හිතේ තියෙන දුක... ඒත් නොකා නොබී ඉන්නෙපා...'

'මං... මං...'

ඇයට ඇඩුණි.

'උත්තර හොයන්න ප්‍රශ්න ගොඩක් තියෙනවා කියලා මං දන්නවා... ඉස්සෙල්ලා හිත ටිකක් හදාගන්න... පස්සේ ප්‍රශ්න ගැන කතා කරමු...'

'ම..ට හා..රි පා..ළුයි සං..දේ..ශ් අ..යි..යේ...'

'කවදහරි ඒ පාළුව දරාගන්න වෙනවනේ ළමයෝ... අපේ අම්මලා තාත්තලා පවා අපිව දාලා දවසක යනවා... ඒ දුක කවදහරි විඳින්න වෙනවා...'

'උත්සාහ කරන්නොත් හිත හදාගන්න නමා...'

'එක දෙයක් විතරක් කියන්නද...'

යුවතිය නෙත් ඔසවා මා දෙස බැලුවාය.

'ම්...'

'කාත් කව්රුත් නැති උනා කියලා හිතන්නෙපා... ඔයා එච්චර අවාසනාවන්ත නෑ...'

මම ඒ තරම් බරපතල දෙයක් කීවේ ඇයිදැයි මම නොදනිමි. යථාර්ථය නම් මේ මොහොතේ ඇගේ ජීවිතයට කාත් කව්රුවත් නැති බවය. මේ ජීවිත කාලය පුරාවටම ඇය අන්ත අසරණ වූ බවය. එහෙව් හිතකට මා බලාපොරොත්තුවක් දුන්නේ හිතාමලාද...

'මොනවද ඔයා කියන්න කට හදන්නේ...'



www.sinhalaelibrary.com

'ම..ට ගෙ..ද..ර ඉන්න හිතෙන්නෑ... වෙලාවකට හිතෙනවා ගාමන්ට් එකක රස්සාවක් හරි හොයාගෙන කොළඹ යන්න...'

මගේ හිත ඇවිළී ගියේ නොදනීමය.

'ඔයාගේ ජීවිතේ ඔයාට එහෙම තීරණ ගන්න දෙන්න බැහැ...'

එසේ කියන්නට මා ඇගේ කවුද...

'ම..ට..ත් මො..ක..ක් හරි ජීවිතයක් තියෙන්න ඕ..න අ..යි..යේ...'

'මං දන්නවා...'

'මේ හැම දේකින්ම ඈත්වෙලා ඉන්න මට ඕන...'

'හැ..ම දේ..කි..න්..ම...'

ඒ ප්‍රශ්නයට ඇගේ නෙත් බිමට බරවිය.

'හැම දේකින්ම එහෙම ඈත් වෙන්න පුළුවන්ද...'

උත්තර නැත. මම ඇය ළඟටම ගියෙමි.

'කියනවා... පුළුවන්ද හැම දේකින්ම ඈත්වෙලා ඉන්න...'

'බැහැයි' කියන්නට මෙන් චන්ද්‍රා හිස වැනුවාය.

'කරන්න බැරි දේවල් කියන්නෙපා... හැම දේකටම උත්තර ලැබෙයි... තේරුණාද...'

'ඒ..ත්...'

'ප්‍රශ්න එපා... අපි මොනවද උදේට කන්නේ...'

'මොනවද හදලා ඕන...'

'අද ඉඳලා ඔයත් කන්න ඕන...'

'ක..න්..න..ම්...'





'එහෙනම් ඉඳි ආප්ප කමුද...'

ඇගේ මුහුණේ දවස් ගාණකින් පසු තුනී හසරැල්ලක් වැවුණි. ඒ ඇයිදැයි මම ඇත්තටම නොදනිමි.

'එහේ උයන්නෙපා... මේ කුස්සියේ උයන්න...'

චන්ද්‍රාව මේ ගෙදර නවත්වා ගත හැකිද... කොහොමත් ඇයට අද රාත්‍රියට තනිවම ඒ ගෙදර නිදාගන්නට දිය නොහැක. එහෙත් ප්‍රශ්නය වූයේ පිරිමි දෙදෙනෙකු පමණක් ඉන්නා ගෙදරක යුවතියක්ව නවත්වා ගනිද්දී ඇතිවන ප්‍රශ්නය.

මට මා විශ්වාසය. මම මගේ නංගිගේ නිර්මලත්වය රකින තරමටම චන්ද්‍රාගේ පවිත්‍රත්වය වෙනුවෙන්ද පෙනී සිටිමි. සමහර විට අසරණ යුවතිය සතුව මේ වෙද්දී තිබෙන එකම වත්කම ඇගේ ජීවිතයේ නිර්මලත්වය පමණි.

චන්ද්‍රා රතු කැකුළු ඉඳිආප්ප පිටි බෝල් එකකට දමා අනන්නට ගත්තාය. මම කුස්සියේ උළුවස්සට බරවී ඇගේ තනියට උන්නෙමි. දෛවය සමහර විට මේ අසරණියව තවත් අසරණ කළේ ඇගේ ජීවිතය සම්බන්ධයෙන් බරපතල තීරණයක් දෙන්නට විය හැක.

එය කොළඹ ජාතික රෝහලේදී ආච්චි මිය ගිය මොහොතේ සිට මගේ හිතට වදදෙන දෙයක් විය. එය වදයකට වඩා හදවතට ආදරණීය බරක් වූ දෙයක් විය. එනම් මේ මොහොතේ සිට මේ යුවතියගේ ජීවිතයේ එකම බාරකාරයා මා බව මට දිගින් දිගටම සිතිමය.

තවමත් විසි එක් හැවිරිදි වියේ සිටින මට ගැහැණු දරුවෙකුගේ ජීවිතය බාර ගත හැකිද... දෙමව්පියන්ගේ සෙවනේ වැඩෙන කිසිදු දවසක ආදරය කිරීම පසුවට බරක් වෙන දෙයක් නොවේ.

එහෙත් මේ ලෝකෙ තමන්ගේ කියන්නට කාත් කවුරුවත් නැති යුවතියකට ආදරය කිරීම ඊට වඩා වගකීමකි.



www.sinhalaelibrary.com

චන්ද්‍රනාගේ ජීවිතය අද තිබෙන ප්‍රශ්න සියල්ලටම විසඳුම ආදරය නොවේ. විවාහයය. ආදරය කිරීමෙන් පමණක් මේ අසරණියගේ ජීවිත ප්‍රශ්න වලට විසඳුම් නොලැබේ. ඇයට ආදරය කරන කෙනෙක් ඇගේ මුළු ජීවිතයම බාරගෙන ආදරය කළ යුතුය.

මට හිතෙන්නේ එහෙමය. එහෙත් තවමත් ජීවිතයට හරි හැටි අඩිය තියාවත් නැති සංදේශ්ට විවාහයක් ගැන සිතිය හැකිද... මගේ දෙමව්පියන් තම ලොකු පුතාගේ විවාහය ගැන සිතා සිටින්නේ කෙසේද...

අම්මාත් තාත්තාත් චන්ද්‍රනාට අනුකම්පා කරන බව සැබෑය. ඒ අනුකම්පාව අසරණ දුප්පත් කෙල්ලෙක්ට කරන අනුකම්පාව විය හැක. ඒ දුප්පත් කෙල්ලව ලේලි කරගන්නට අම්මාත් තාත්තාත් කැමති වෙයිද...

මේ සියළු ප්‍රශ්න වලට විසඳුම් ලබාගත යුතුය. ඒ විසඳුම් කෙසේ හෝ වේවා මට මේ යුවතියව බණ්ඩාරවෙල තනිකර කොළඹ යා නොහැක. මා ශනීනාට ආදර කළ බව ඇත්තය. එහෙත් ඒ ඇයව බිරිඳ කර ගැනීමේ තදබල ආශාවකින් නොවේ. අතහැර යා නොහැකි ආදරයක් ශනීනා තුළ විය. මා බැඳුනේ ඒ ලෝබකමටය. එහෙත් මා චන්ද්‍රනා තුළින් දකින්නේ මගේ අනාගත බිරිඳවමය. මට ජීවිතය වෙනුවෙන් සටන් කළ හැක. එසේ සටන් කරන්නට අවශ්‍ය වන්නේ මටද මහමෙරක් මෙන් ආදරය කරන මට කවන පොවන බිරිඳකි. මගේ දරුවන්ව බඩේ බැඳගෙන හදන අම්මා කෙනෙකි.

ඒ චන්ද්‍රනාමය. ඇගේ ළඟින් මට හිත ගන්නට නොහැක්කේ ඒ නිසාය.

'මොනවද සංදේශ් අයියා කල්පනා කරන්නේ...'

චන්ද්‍රනාගේ හඬින් මම ගැස්සී ගියෙමි. ඇය ඉඳි ආප්ප තැම්බූ ටික මේසය මත තබාගෙන මා දෙසම බලා උන්නාය.





'මූණ හරි කරදර පාටයි... එච්චර හිතන්න දෙයක් සංදේශ් අයියගේ ජීවිතේ නැහේ...'

යුවතිය අසරණව කීවාය. හිතන්නට දෙයක් මගේ ජීවිතේ නැති බව සැබෑය. මට හිතන්නට ඇත්තේ ඇය ගැනය. ඇගේ ජීවිතය ගැනය.

හිත තාත්තා කෙනෙකුගේ හිතක් බවට පෙරලී ඇය සම්බන්ධයෙන් දුවෙන හිත සනසන්නට මෙන් සිනාමින් සිටියෙමි.

'කතා කරන්නෙත් නෑ...'

'නෑ... එහෙම නෑ... ඉඳි ආප්ප කන්න මොනාද හදන්නේ...'

'පරිප්පු තෙම්පරාදුවක් හදලා ඒණු ටිකක් තෙල් දන්නද...'

'බිත්තර තුනකුත් හදන්න...'

ඇයට උයන්නට දී මම පොඩි මාමාගේ කාමරයට ආවෙමි. පොඩි මාමා අවදි වී උන්නේය. අපි කතා කරන හඬ ඇසී චන්ද්‍රනා පොඩි මාමාගේ තේ එක ගෙනමින් උන්නාය.

'මේ කෙල්ල ඇදිලා ගිහින් පුතේ...'

පොඩි මාමා දුකෙන් කීවේය. චන්ද්‍රනා සිනාසුනා පමණි. ඇය කොහොමත් හිටියයින් බාගයකි. චන්ද්‍රනා ගිය පසු පොඩි මාමා කෙලින්ම මගේ මුහුණ දෙස බැලුවේය.

'උඹේ මූණ ලොකු පුතේ ප්‍රශ්න පත්තරයක් වගේ...'

මම පොඩි මාමාගේ ඇඳෙන් ඉඳගත්තෙමි.

'හිත නම් ටිකක් බරයි තමයි පොඩි මාමේ...'

'උඹට කෙල්ල ගැන දුකයි නේද...'



www.sinhalaelibrary.com

'නැහැයි කියන්නේ කොහොමද... ඒ වගේ තත්වයක් මට උනානම් මටත් මාර දුකයි...'

'උඹ මොනවද හිතන්නේ කියලා මට කියපන්...'

පොඩි මාමාට මේ මොහොතේ වංක විය නොහැක. අම්මාටත් තාත්තාටත් වඩා අද මගේ හිත කියවන්නේ ඔහුය.

'ම...ට පොඩි මාමේ...'

'උඹ මොනවා හරි හිතන් ඉන්නවද...'

'මට පොඩි මාමා එක්ක කතා කරන්න ඕන...'

'උඹ හරි හොඳ කොල්ලෙක් බං... අපි රෑට කතා කරමු...'

'අපි හිතන කරුණු කොහොම උනත් මේ කෙල්ලට අර ගෙදර තවට තනියම ඉන්න දෙන්න බෑ පොඩි මාමේ...'

'කව්ද බං ඒ කෙල්ලව එහේ තියන්නේ... මෙහෙ ඉන්න සක්කිලි මැව්වියන්ගේ හැටියට රෑට ගෙදරට පැනලා කෙල්ලට කරදරයක් කරයි...'

'ඒකනේ...'

'කතා කරපන් කෙල්ලට...'

මං කුස්සියට ගොස් චන්ද්‍රාව අඬ ගහගෙන ආවෙමි. ඇය කාමරයට ආවේ අසරණ මුහුණකිනි.

'උදේටම ගිහින් කෙල්ලේ ඔයාගේ ඇඳුම් ටිකත් අරගෙන මෙහෙට එන්න ඕන... අර කුස්සියත් එක්කම තියෙන කාමරේ ඔයා ගන්න... මං ඒකට ඇඳක් අද ගෙනත් දෙන්නම්... ඒ ගෙදර වහලා දාන්න...'

'ම... ජයදේව අන්කල්ටයි සංදේශ් අයියටයි කරදරයක් නේ...'





'ආ... අපට කරදරේ... එතකොට උඹට මොකෙක් හරි ඇවිත් මොනවා හරි කරලා ගියාම... එතකොට අපි පිච්චෙන්න ඕන...'

අසරණිය සිනාසුනාය.

'උඹ මේ ගෙදර හිටියේ කෙල්ලේ... ඉස්සර ඉඳන් මං ආසයි උඹ මේ ගෙදර ඉන්නවානම්... අපි කොච්චර පාළුවෙන්ද ඉන්නේ... උඹ ඇවිත් මේ ගේ ඇත්තටම ගෙයක් කරපන්...'

එය කළ හැක්කේද ඇයට පමණි.

'ඇඳන් ඕන නැහැ අන්කල්... මං බිම නිදාගන්නම්...'

'අපි ඇඳවල් වල නිදාගනිද්දී ඔයා බිම නිදාගන්න...'

මම සැර කර කීවෙමි.

'මේකිගේ පණ්ඩිත කම වැඩියි... අද ඉඳලා ඔයා මේ ගෙදර කෙනෙක්... මේ ගෙදර ඔයා කව්ද කියලා මං පස්සේ කියන්නම්...'

පොඩි මාමා කීවේ මා දෙසද බලාය. ගෙදරට ගෙනවා නම් ඇයට තනතුරක් තිබිය යුතුය. පොඩි මාමා කීවේ එයයි.

ඇය මේ නිවසේ කවුරු විය හැකිද...

උදේ වරුවේ චන්ද්‍රා ඇගේ ඇඳුම් අස් කරගන්නට ඇයත් ආච්චීත් ජීවත් වූ කුඩා නිවසට ගියාය. ඇයව තනියම ඒ පාළු නිවසට යවන්නට මට දුක සිතුණි. මා ඇගේ පස්සේ ගියේ ඒ නිසාය.

'අපිට හරියට ප්‍රශ්න තිබුණා... අඟහිඟකම් තිබ්බා... ඒත් ආච්චියි මමයි මේ පුංචි ගෙදර සැනසිල්ලේ ජීවත් උනා සංදේශ් අයියේ...'

පාළු නිවස පුරා නෙත් අරිමින් යුවතිය කීවාය. ඇය



www.sinhalaelibrary.com

කියන්නේ බොරුවක් නොවේ. බණ්ඩාරවෙලට ආ මුල්ම දවසේ මට හමුවූ චන්ද්‍රනාව මට මතකය. එදා උන්නේ අදට වඩා සතුටින් උන් සුන්දර දැරියකි.

'සමහර දවස් වලට අපට උයන්න සල්ලි නෑ... එහෙම දවස් වලට ආච්චියි මායි හාල් හුණ්ඩුවක් ලිපේ තියාගෙන සාරණ නිකං ලුණු විතරක් දලා තම්බලා බත් එක්ක කාලා තියෙනවා...'

ඇගේ දෑසට කඳුළු පිරුණි.

'ඒ.ත් අ..යියේ ඒ බත් ඕ.ංග උනත් හරි රහයි...'

මේ මිහිපිට මේ තරම් දුක් විඳින මිනිසුන් සිටිය හැකිදැයි කෙනෙකුට පුදුම විය හැක. එහෙත් ජීවන සත්‍ය එයයි.

'දැන් ඇඳුම් ටික ගන්න... අපි පස්සේ දවසක ඇවිත් මේවා අස් කරමු...'

'මට ඇඳුම් කියලා මහ ගොඩක් නෑ...'

ඇය ඇඳුම් දමාගෙන උන්නේ කුඩා කබඩ් එකකය. එහි වූයේ ඇත්තටම ඇඳුම් කිහිපයක් පමණි.

'ඔයා ගන්නකෝ...'

මා ඉදිරිපිට ඒ දුප්පත් ඇඳුම් අඳින්නට අසරණ කෙල්ලට ලැජ්ජයැයි සිතා මම සාලයට ආවෙමි.

මොහොතකින් ඇසුණේ කුඟි ඉකිබිඳුම් හඬකි. මම කුඩා කාමර කැල්ලට එබී බැලුවෙමි.

'ඇයි අමයෝ මේ...'

'මං... මං... කො..හො..ම..ද අ..යියේ අයියලට බරක් වෙන්නේ... මීට වඩා පුංචි කාලෙදි මට තනිවෙන්න සිද්ද වෙන්න තිබ්බේ... එහෙම උනා නම් මට අනාථ නිවාසයකටවත්





යන්න තිබ්බා...'

ලොකු වූ පසු අනාථ නිවාස වලින් වත් බාරගන්නේ නැත.

'අනාථ නිවාසයකට යන්න තරම් ඔයා අනාථ වෙලා නෑ...'

'මං වැඩකාරයෙක් කියලා හිතන්න සං..දේ..ශ් අ..යි..යේ... මට මෙහෙම සළකන්නෙපා... අනේ එතකොට පපුව පිච්චෙනවා... මං මොන හිඟන කෙල්ලෙක්ද... මා..ත් ලොකු ගෑණියෙක් වගේ ජයදේව අන්කල්ට අන්කල් කියනවා... අයියට අයියේ කියනවා... එහෙම කියන්න මං කවුද... මං අදින් පස්සේ එහෙම කියන්නෑ...'

ඇගේ හදවත මේ තත්වයට පත් වීම ස්වභාවිකය. ඇය ඉන්නේ අසරණකමේ පතුලේය.

'එහෙනම් ඔයා මෙහෙම ඉන්න...'

'අ..නේ මට අයියට පුංචි මහත්තයා කියලා කියන්න දෙන්න...'

ඇය ඇඳුම් කබඩ් එක පාමුළ බිම ඉඳගෙන මට දෑත් එක්කොට කීවාය. මම ඇය පාමුළ ඉඳගෙන ඇගේ දෑතින්ම අල්ලා ගත්තෙමි.

'හැම දෙයක්ම අමතක කළත් ඔයා මගේ නංගිගේ වයසෙම කෙල්ලෙක්... මට ඔයාගෙයි නංගිගෙයි වෙනසක් නෑ...'

'අ..නේ ඒත් ම..ට අ..යි..ය..ව දෙයියෙක් වා..ගේ...'

'ඔයාට පිස්සු දරුවෝ... මං මේ කොළඹ හිටපු පිස්සු කොල්ලෙක්... මං කොහොමද දෙවියෙක් වෙන්නේ...'

'ඒ..ක මං දන්නවා...'

මගේ සුරත ඇගේ හිස මතට ගියේ ඇයිදැයි මමම නොදනිමි.

'ඇඳුම් ටික ගන්න... අපි යන්...'

යුවතිය අසරණව හිස වැනුවාය.

ඇය ඇඳුම් වලට අමතරව ඒ නිවසින් ගත්තේ තව එක් දෙයක් පමණි. ඒ ඇගේ පුංචි බුදු පැලේ. බුදු රුවය.

'අපි අද ඉඳලා එහේ බුදු පහන පත්තු කරමු...'

ඇය අභිංසකව හිස වැනුවාය. බොහෝ දුරක් ගිය පසු පිටගැට පෙළේ සිට චන්දනා හැරී බැලුවාය.

'ජීවිතේ හැම දෙයක්ම මේ වගේ දාලා යන්න වෙන්නෑ...'

මම කීවෙමි... එහෙම කියන්නට මට ඇති සාක්ෂිය කුමක්ද කියා මමම නොදනිමි.

'දාලා යන්නවත් දන් මගේ කියන්න කිසිම දෙයක් නෑ සංදේශ් අයියේ...'

'අපිට තියෙන දේවල් සමහර විට අපිවත් දන්නෑ...'

'ඇ..යි එහෙම කියන්නේ...'

චන්දනා පුදුමයෙන් මෙන් ඇසුවාය.

'යන් ගෙදර...'

මා කියන්නේ මොනවාද කියා ඇත්තටම මමවත් නොදනිමි.

www.sinhalaelibrar

# 29

පොඩි මාමා ඇඳක් එව්වේය. මම ඒ ඇඳ ඇයට කාමරයේ සවිකර දුන්නෙමි.

'හිමිහිට ඇඳුම් අල්මාරියක් ගමු...'

'අනේ මේ ඇති... මේ ඇඳුම් වුව්ට දගන්න මොන අල්මාරිද අයියේ... ජයදේව අන්කල්ටත් කරදර කළා හොඳටම ඇති...'

'අපි ජීවිතේ හැමදම කරන්නේ කාට කාට හරි කරදර කර කර ඉන්න එක තමයි වන්දනා...'

ඒ කතාවට ඇය දෑස් ලොකු කර බැලුවාය.

'අයියා කාටද කරදර කරන්නේ...'

'මං කවුදහරි මං බඳින කෙල්ලට හරියට කරදර කරනවා...'

මගේ කතාවට ශ්‍රුතිය බොහෝ කාලයකට පසු සිනාසුනාය.

'ප..චි..නේ...'

'ඉන්න දෙන්නෙම නෑ...'

'මොනාද කරන කරදර...'

ඇය මූව අතින් වසාගෙන ඇසුවාය.

'ඒවා දන්මම කියන්න බෑ...'

පොල් පට තද කරගෙන උන් චන්දනා බිත්තියට දැත තබා එයට බරවී යටැසින් මදෙස බැලුවාය.

'අයියා වගේ කෙනෙක් ලැබෙනවනම් කෙල්ලෙක් ඕන කරදරයක් විඳගෙන ඉඳියි...'

ඇය එසේ ස්ථිර ලෙසම කියන්නේ කෙසේද... මම නොදනිමි. ඒකේ ඇති විශේෂත්වයක් නැතැයි මම සිතාගෙන උන්නෙමි.

ඒ රාත්‍රිය සීතල වැඩි රාත්‍රියක් විය. චන්දනා රෑට උයන්නට පටන් ගත්තාය.

'මං පොල් ටික ගාලා දෙන්නද...'

මම ඇය ගැන දුක සිහි ඇසුවෙමි. ඇත්තටම සිටහොත් ඇය මේ ගෙදරට ආ පසු වැඩ කරන්නේ මෙහෙකාරියක් ලෙසිනි. මාවත් පොඩි මාමාවත් එසේ නොසිතුවද ඇයම ඒ තත්වයට වැටී වැඩ කරන්නට වූවාය.

'අ..නේ මං ගාගන්නම්... ඒක මොකක්ද...'





'මොනවද උයන්නේ...'

'මීට බෝල්ස් මස් වගේ උයලා අල කරි හදලා ගොටුකොළ සම්බෝල... ඇතිද...'

ඇය මගේ මුහුණ දෙස බලා එසේ අසද්දී මට සිනාගියේ ඉබේටමය.

'ඇයි හිනාවුනේ...'

'නෑ නිකං...'

මට ඇත්තටම හිතුනේ අප විවාහ වී ඉන්නා බවකි. මට සිනහ ගියේ ඒ සිතුවිල්ලටය. හිත පවා හිතන්නේ පුදුමාකාර ලෙසිනි.

'පොඩි එකෝ...'

පොඩි මාමා කුස්සියට ආවේ එසේ කියාගෙනමය.

'ආ... උඹත් දන් උයන්න උදව් වෙනවද... හොඳයි හොඳයි...'

'උදව් වෙන්න තමයි ඇහුවේ... එපා කියන්නේ...'

'උඹත් මහන්සි වෙනවා වැඩියි කෙල්ලේ...'

'මේක මහන්සියක් නෙමේ ජයදේව අන්කල්...'

'ලොකු පුතා යන් එළියට... මට උඹත් එක්ක කතා කරන්න ඕන...'

පොඩි මාමා කතා කරන්නට කතා කළ විගසම චන්දනා හිස ඔසවා දැස් ලොකු කර බැලුවාය.

'උඹ කෙල්ල ඒ පැත්ත පළාතෙවත් එන්නෑ... මේක අපි දෙන්නාගේ කතාවක්...'

ඇය අසරණව සිනාසුනාය.

'අත්කල්ට බයිට් එකට මොනා හරි ඕනද...'

පොඩි මාමා බියර් එකක් ශීතකරණයෙන් ගනිද්දී වත්දනා ඇසුවාය.

'එපා පුතේ... උඹ උයන දේකින් මට කට ගැස්මක් දීපන්...'

'මීට් බෝල්ස් එක ඉදුනු ගමන් මම ගෙනත් දෙන්නම්...'

මම පොඩි මාමා පසුපස නිහඬව ගියෙමි. අපි මිදුලේ බංකුව උඩ වාඩි වුනෙමු. සීතල තද වුවද මා ඇඳ උන් ස්වීටරයට සීතල දනුනේ අඩුවෙනි. පොඩි මාමා බියර් බෝතලය කඩා වීදුරුවට දමාගත්තේ කල්පනා කරමිනි. මම ඔහුගේ මුව දෙසම බලා උන්නෙමි.

'කෙල්ල දැන් ටිකක් නෝමල් වෙලා නේද ඉන්නේ...'

'ඒ වුනාට හිතින් හරියට දුක් විඳිනවා... එයාට බයයි...'

'ඇයි...'

'ඒ කෙල්ලක් ඒකිගේ අනාගතේ ගැන හිතනවා ඇති පොඩි මාමේ... තනිකර අතරමං වෙලා වගේනේ...'

'ම්... කෙල්ල විතරක් නෙමේ මට් පේන විදිහට අතරමං වෙලා ඉන්නේ...'

මම සිනාසුනෙමි.

'උඹත් ප්‍රශ්නෙන් අතරමං වෙලා නේද...'

'ඔව්...'

මම අවංකව කතා කළෙමි. මෙවැනි ගැඹුරු ප්‍රශ්නයකදී හදවතට එකගව කතා කළ යුතුය. හදවතට නිදහසක් ලැබෙන්නේ එවිටය.

'අපි පුතේ කෙලින්ම ප්‍රශ්නයට බහිමු... එතකොට කතා





කරන්න ලේසියි...'

'මාමා කියන්න මාමේ...'

'මාමා නෙමේ පුතේ උඹයි මට කියන්න ඕන...'

සැබෑය. ප්‍රශ්නය මගේය. කතා කළ යුත්තේ මාය. මම මොහොතක් නිහඬව රෑ අහස දෙස බලා උන්නෙමි. වළාකුළින් තොර අහස පැහැදිලියි.

'උඹ කතා කරන්නැත්තේ... එහෙනම් මං උඹෙන් අහන්නම්... උඹ මේ කෙල්ලට ආදරෙයි... එහෙම නේද...'

පොඩි මාමා හාවාගේ පපුවටම ඇත්තේය. මම හිම බලාගෙන හිස වැනුවෙමි.

'ඔළුව වනලා බෑ කොල්ලෝ... මට වචන වලින්ම කියපන්...'

'මං මේ කෙල්ලට හරි ආදරෙයි පොඩි මාමේ...'

'එච්චරද...'

'නෑ...'

'එහෙනම්...'

'ඒකව මගේ ගෑණි කරගන්න මට ඕනේ...'

මගේ ශබ්ද කෝෂයේ ඇති සරලම පහසුම අව්‍යාජම වචන ටිකෙන් මම කීවෙමි. ඒ මගේ හදවතේ එකම නිමල වූ නිර්මල ප්‍රාර්ථනාවය.

'උඹ හරි හොඳයි... උඹ අවංකයි... මං උඹට ආදරෙත් ඒකයි... උඹත් හරියට මං වගේ... තමන්ගේ පපුවට බොරු කරන්නේ නෑ...'

'මට බෑ පොඩි මාමේ මේ කෙල්ල ලඟින් අඩියක් වත්

හොල්ලෙන්න... ඒකිව මට ඕනෙමයි...'

'උඹ ඔය තීරණේ ගත්තේ ගොඩාක් හිතලද...'

'ඔව් පොඩි මාමේ... මං පහුගිය මාස කීපයේම හිතුවා... ගොඩාක් හිතුවා... මට ජීවත් වෙන්න පුළුවන් මේ වගේ අහිංසක කෙල්ලෙක් එක්ක තමයි... මට ඕන නෑ කෙල්ලෙක්ව යටත් කරගන්න... ඒක්...'

'උඹ ආසයි උඹේ හොඳ ගේලයෙක් වගේ උඹේ ගෑණි ඉන්නවනම්... නේද...'

'ඔව් පොඩි මාමේ... මට ආදරේ හිතෙන්නේ එහෙම උනාම තමයි...'

'උඹට හිතෙනවද මේ කෙල්ල ගැන උඹ දන්න ටික උඹට ඇති කියලා...'

පොඩි මාමා අමුතු ප්‍රශ්නයක් ඇසුවේය. මම මොහොතක් කල්පනා කළෙමි.

'ඒ කියන්නේ...'

'නෑ මේ කෙල්ලගේ අතීතේ... දෙමව්පියන්ගේ ප්‍රශ්න...'

'මං ආදරේ කරන්නේ මේ කෙල්ලට තනිවෙච්ච කෙල්ලට... අද ඒ කෙල්ල ඉන්න තත්වේ ගැන හැම දෙයක්ම මං දන්නවා... මට ඒ ඇති...'

'ආදරේ කරද්දී එහෙම තෙමේ පුතේ බැන්දහම...'

'මං කවදාවත් මේ කෙල්ල ගැන ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ගැන හිතන විදිහට හිතුවේ නෑ පොඩි මාමේ...'

'එහෙනම්...'

'මගේ ගෑණි උනොත් මේ කෙල්ල... කොහොම ජීවත්





වෙයිද කියලම තමයි මං හිතුවේ... එහෙම හිතද්දී තමයි මට හිතුනේ මේ කෙල්ල එක්ක ජීවත් වෙන්න ලේසියි කියලා...'

පොඩි මාමා මා දෙස බැලුවේ බියර් වීදුරුව හිස් කරලීමෙන් අනතුරුවය.

'ඔව්.. උඹ හරි... ජීවත් වෙන්න තෝරගන්න ඕන දවස් ගානේ ඇන්දත් පරණ වෙන්නේ නැති අපහසුතාවයක් නැති ඇඳුමක්...'

'මඟුල් ගෙවල් වලට අඳින් යන ඇඳුම් වගේ ගෑණු ජීවිතේට වැඩක් නැහේ මාමේ... ඒ වගේ ඇඳුම් පිටට හොඳයි... ලස්සනයි... ඒත් ගෙදරට පහසුවෙන් ඇඳන් ඉන්න බෑ... දඩිය දානවා... හිරයි... හරිම අපහසුයි...'

ඔහු මගේ උරහිසට තට්ටු කළේය.

'උඹලා අපිට වඩා දියුණුයි... උඹට ඔය අද තියෙන ජීවන අවබෝධය මට උඹේ වයසෙදි තිබ්බේ නෑ පුතේ...'

'කෙල්ල එනවා...'

චන්දනා මිදුලට පැමිණ දොරකඩට වී අපි එන්න කියන තුරු බලා උන්නාය.

'වරෙන් කෙල්ලේ...'

ඇය ආවේ ඉන් පසුවය. රැට කන්නට ඉසූ මිරිස් බෝල්ස් එකෙන් කැබලි කිහිපයක් ඇය පිරිසියකට දමා ගෙනවිත් බංකුව උඩ තැබුවාය.

'උයල ඉවරද පුතේ...'

'තව ගොටුකොළ සම්බෝලේ තියෙනවා අන්කල්...'

'හරි පුතේ ගිහින් හදන්න... උයලා ඉවර වෙලා ඔයත්

මූණ කට හෝදගෙන අලුත් ඇඳුමක් එහෙම දලා ටිකක් ලස්සනට ඉන්න...'

පොඩි මාමා කරුණාවෙන් කීවේය. ඇය හිස වනා ගියාය.

'මං උඹට හරි ගරු කරනවා... උඹ මේ කෙල්ල එක්ක කවදාවත් යාළු උනේ නෑ... උඹට දුකයි ඒකිව යාළු වෙලා අත් අරින්න උනොත්... උඹ මේකිව බඳින්න පුළුවන් කියලා හරියටම දනගෙනම තමයි යාළුවෙන්නේ.. නේද... ඒක ගොඩාක් හොඳ මනුස්සකමක්.. කෙල්ලෙක්ගේ ජීවිතයක් කියන්නේ ලොකු දෙයක්...'

එය කියා පොඩි මාමා සෑහෙන වේලාවක් කල්පනා කළේය.

'දැන් පුතේ මට කරන්න මොකක්ද තියෙන්නේ...'

මෙතන විශාලම කාර්යභාරය ඇත්තේ පොඩි මාමාටය. අම්මා තාත්තා මට සිහිවිය. ඔවුන් මා ගැන කෙසේ සිතාගෙන සිටිනවාද...

තාත්තා ශහීනාගේ ප්‍රශ්නයේදී ඔහුගේ බරපතල විරෝධය ඒට පළ කළේය. තාත්තාත් අම්මාත් නංගිත් ශහීනාව හොඳ කෙල්ලෙකු ලෙස පිළිගත්තෝය. ඒ පිළිබඳව ඔවුන්ට ප්‍රශ්න තිබුනේ නැත. එහෙත් ඒ අහිංසක මුස්ලිම් යුවතියව තමන්ගේ ලේලිය කරගන්නට තාත්තාත් අම්මාත් කැමති වූයේ නැත.

මා බණ්ඩාරවෙලට ආවේ ඒ ප්‍රශ්නයේ ගිනි දළු පිටිනි.

'උඹට බයද අර මුස්ලිම් කෙල්ලගේ ප්‍රශ්නෙදි වගේම මේ ප්‍රශ්නෙදිත් තාත්තයි අම්මයි විරුද්ධ වෙයි කියලා...'

'තාත්තයි අම්මයි මං ගැන කොයි විදිහකට හිතාගෙන ඉන්නවද කියලා මට තේරෙන්නේ නෑ පොඩි මාමේ...'



'උඹ හිතනවද තාත්තා උඹට විකක් දැවැද්දක් ලැබෙන හයිය අත්තකින් කෙල්ලෙක්ව බලනවා කියලා...'

'තාත්තා එහෙම බලනව නම් වැරදියි...'

'ඇයි...'

'අපිත් මහ ලොකු දේවල් තියෙන මිනිස්සුද පොඩි මාමේ... මාමත් උදව් කරලා බැංකු ලෝන් එකකුත් ගැහුවට පස්සෙයි අපිට ඔය කුරුළු කැලේ ගේ වත් හදාගන්න පුළුවන් උනේ... තවම ඒකට ණය ගෙවනවා... අපි මෙහෙම හිතමු පොඩි මාමේ...'

'කොහොමද...'

'දැන් අපේ නංගි ඉන්නවා... ඒකිගේ පොතේ දලා තිබ්බ සල්ලිත් ගේ හදද්දි ගත්තා... දැන් නංගිගේ පොතේ සල්ලි නෑ... මහ ලොකු කණකරත් ඒකිට නෑනේ...'

'ඉතින්...'

'අපේ නංගිව දෙද්දි ඒ කොල්ලත් මේවා බැලුවොත්... තාත්තවයි අම්මවයි හිරවෙනවා නේද...'

පොඩි මාමා කල්පනා කළේය.

'නංගිව එච්චර බාල්දු කරලා මං පිටට දෙන්නෑ පොඩි මාමේ... ඔය ඉන්න ගේත් නංගිට දෙන්න කියලා තමයි මං අම්මටයි තාත්තටයි කියලා තියෙන්නේ.. මාත් හම්බ කරලා කීයක් හරි ඒකිගේ පොතේ දානවා...'

'අපි මේ ප්‍රශ්නේ ගැන කතා කරමු... උඹට මෙහෙම හිතන්න බැරිද... මේ කෙල්ල ඇත්තටම අහිංසකයි... ලස්සනයි... උඹ කියනවා වගේ ගෙදරකට හරි සිරියාවයි... මිනිහෙක්ට

www.sinhalaelibrary.com

මෙහෙම ගෑණියෙක් තමා ඕන... කවදහරි උඹේ අම්මටයි තාත්තටයි උනත් ආදරෙන් සලකගෙන ඉදියි... දරුවෝ ලැබිච්ච කාලෙක උන්වත් බඩේ බැඳගෙන හදයි...'

පොඩි මාමා වන්දනා ගැන කියන ආකාරයට මගේ හිතේ ඇය ගැන ඇති ලෝබකම තවත් දැල්වෙයි. මේ සියල්ලටම ඇගේ හදවතේ මා ගැන ඇති ආදරය භක්තිය එකතු කළ විට කොතරම් සුන්දරද...

'ඉතින් උඹ මේ කෙල්ලව බඳින්න ඕනෙයි කිව්වහම අම්මයි තාත්තයි ඒවත් හිතයි...'

'හිතන් නැත්නම් පොඩි මාමේ...'

'හිතන් නැත්නම් මං හිතවන්නම් බං... වෙන මොනවා කරන්නද...'

පොඩි මාමා කීවේ සැහැල්ලුවෙන් සිනාසෙමිනි. ඔහු කොහොමත් අභියෝග බාර ගන්නේ සිනාසෙමිනි.

'මේ කෙල්ලගේ දුප්පත් කමයි කාත් කව්රුත් නැති කමයි ඇරෙන්න වෙන නුසුදුසුකමක් නෑ පොඩි මාමේ... ඒ නුසුදුසුකම් දෙකම බැන්දට පස්සේ අවශ්‍ය නැති. සුදුසුකම් දෙකක්...'

'ඒ කිව්වේ...'

'කෙල්ල දුප්පත් උනත් පොහොසත් උනත් මට ආදරේ නම් බැන්දට පස්සේ මගේ තත්වය අනුව තමයි ජීවත් වෙන්න ඕන...'

'ඔව්...'

'කෙල්ලට කාත් කව්රුත් හිටියත් නැතත් ඒකි බැන්දට පස්සේ ජීවත්වෙන්න ඕන මාත් එක්ක... කාත් කව්රුත් ඉන්න





එකවත් නැති එකවත් පවුල් ජීවිතේට වැදගත් නෑ... මේක දෙන්නෙක් යන ගමනක්... තඩයක් ඕනේ නෑ...'

පොඩි මාමා හිස වැනුවේ මගේ කතාව අනුමත කරමිනි.

'ඔව් පුතේ... උඹලා දෙන්නාට හොඳ ලස්සන ෆැමිලි ලයිෆ් එකක් හදාගන්න පුළුවන්... මටත් ආස උඹලා එහෙම ජීවත් වෙනවා දකින්න තමයි... කවදහරි කාලෙක මටත් ආසයි උඹ ළඟ වැටිලා ඉන්න...'

පොඩි මාමා වයසට ගොස් නැත. එහෙත් ඔහුට බැරි කාලයකදී ඔහුව ආදරයෙන් බලා ගත යුතුය. කාටත් වඩා එය මගේ යුතුකමකි.

'පොඩි මාමා ළඟ මං හැමදාම ඉන්නවා...'

'උඹයි පොඩි දුවයි කවදාවත් උඹලගේ අනාගතේ ගැන බයවෙන්නෙපා... මගේ දේවල්නුත් උඹලා දෙන්නාට තමා... මොකද මට දරුවෝ ඉන්නවා කියලද...'

'එහෙම හිතන්නෙපා පොඩි මාමේ... මම පොඩි මාමට තාත්තට වගේ ආදරෙයි...'

එය කියද්දී මගේ දෑස් තෙත් විය.

'මං දන්නවා පොඩි එකෝ... දැන් කියපන් මං කවද්ද තාත්තගෙනුයි අම්මගෙනුයි මේක අහන්න ඕන...'

හෙටම වුවද කම් නැත. මේ ආදරය මෙහෙම පපුවේ තබාගෙන දුක් විඳීම පහසු නැත.

'පුළුවන් ඉක්මනට පොඩි මාමේ...'

'උඹට ඉක්මනට බඳින්නත් ඕනද...'

'බැන්දේ නැතත් පොඩි මාමේ මේ කෙල්ලගේ හිතට

මොනවා හරි දන්න ඕනේ... නැත්නම් පව්... ජ්කී ඉන්නේ කොටි ගහපු ගමක තනිවෙච්ච දරුවෙක් වගේ...'

'අහනවා නම් මං කොළඹ යන්න ඕන... එතකොට උඹලා දෙන්නා මේ ගෙදර තනියම... මට එහෙම දාලා යන්න බයක් නෑ... ඒත් අම්මයි තාත්තයි එතකොට මං ගැන වැරදියට හිතනවා...'

'මං දන්නවා පොඩි මාමේ...'

'කෙල්ලව දාලා උඹටයි මටයි යන්න විදිහකුත් නෑ... කෙල්ල තනියම...'

'අම්මටයි තාත්තටයි නංගිටයි මෙහේ එන්න කියමු...'

අපි අවසානයට එසේ කරන්නට සිතා ගත්තෙමු.

'එහෙනම් මේ ඉරිදට කැමකුත් ලෑස්ති කරලා එන්න කියමු...'

මම සැහෙන වෙලාවක් අහස දෙස බලාගෙන උන්නෙමි.

'ලොකු පුතේ...'

'පොඩි මාමේ...'

'උඹට බයද...'

'ටිකක් විතර... තාත්තයි අම්මයි ඒ කසාදේ කරන්නෙපා කිව්වොත් මේ කෙල්ල පව්...'

'උඹ බයවෙන්නෙපා... මං උඹට කොහෙම හරි කැමැත්ත අරන් දෙනවා... මං උඹට සහිතක වෙනවා...'

'මං කියන්නෑ අර කෙල්ලට විතරක් අනුකම්පා කරලා මේ කසාදේ කරලා දෙන්න කියලා... මේ කෙල්ල ලැබුණොත් ඒක මගෙත් ලොකු වාසනාවක් මාමේ...'





'ඔව් පුතේ... එහෙම ලැබිච්ච එක වාසනාවක් කියලා හිතෙන ගෑණියෙක් තමා ළඟට ගන්න ඕන... එතකොට තමා ජීවිතේට සැනසීමක් එන්නේ...'

පොඩි මාමා මගේ හිස මත අත තබා කොණ්ඩය අවුල් කරමින් කීවේය.

# 30

**දැ**න් වෙලාව රාත්‍රී එකොළහටත් ආසන්නය. බණ්ඩාරවෙලට අද තද සීත දවසකි. දෙක තුන් හතර වතාවක්ම මම නිදගන්නට උත්සාහ කළෙමි. එහෙත් නින්ද අහලකටවත් එන්නේ නැත.

මට නිදි ගන්නට නොදෙන්නේ මගේ හිතය. යංතමට ඇහැ පියවෙද්දී මගේ හිත මාව කුද්දවා මොනවා හෝ පෙන්නා මාව කිති කවයි. තාත්තාත් අම්මාත් වන්දනාට කැමති වුවහොත් මැවෙන සුන්දර ජීවිතය මට මගේ සිත මවා මවා පෙන්නයි.

මම ඇත්තම කියමි. නිදගන්නවාට වඩා මට ඒ සිතුවම් දෙස බලා සිටීම සුන්දර වැඩකි. මම වන්දනාට තරම් ශහීනාට





වත් ආදරය නොකළෙමි. ශහීනාට ආදරය කළද ඇය සමඟ විවාහ වී ගෙවන ජීවිතයක් ගැන මොහොතකුදු මට මැවී පෙනුණේ නැත.

එසේ වූ පළියට ශහීනාට පෙම් කළේ නැතැයි ඒ කුළුදුල් හැඟීමට ගරහන්නටද මට හිත් නොදෙයි. මේ තරම් ගැඹුරින් හෘදයාංගමව ආදරය කරන්නට මට ඉගැන්වූයේ ඒ අහිංසක මුස්ලිම් කෙල්ලයි.

සංදේශ් ආදරය ගැන දත උන් කෙහෙල්මලක් නැත. මගේ කාමරය ඉදිරිපිට සඳළුතලයට වී හැම රැකම මට ඒවා ඉගැන්වූයේ ඒ රැම්ලාත් සදයි. අද ආදරය ගැන මට දනෙන ගැඹුරු හැඟීම තනිවම දරාගන්නට තරම් මට ශක්තියක් නැත.

අපට විවාහ වූ පසුව කොහේ ජීවත් වීමට බැරිද. කුරුළු කැලේ ගෙදර වුවද කම් නැත. එහෙත් මේ සීත කඳුකරයේ පුංචි නිවහනේ අලුත් ජීවිතයක් පටන් ගන්නට මම ආශාවෙන් උන්නෙමි.

මේ සීතල... මේ මිහිදුම... දවස තිස්සේ වැටෙන මේ වැස්ස අපට තව තවත් ළං කරනු ඇත.

ආදරය හිතකට ගෙන එන්නේ කෝපි කෝප්පයක උණුසුමට වඩා ගැඹුරු උණුසුමකි. එය විඳ ඇති නිසාම මම එය හඳුනමි.

පොරවනය මෑත් කර ස්වීටරයද දමාගෙන මම පිටතට ආවෙමි. පොඩි මාමා ඉන්නේ තද නින්දකය. මම සාලයේ දොර ඇදගෙන පඩිය උඩ වාඩිවී පැහැදිලි සඳ රැසින් ප්‍රභාවත් වූ කඳු දෙස බලා උන්නෙමි.

කඳු මත සරන ඇතැම් සුදු වළා කැටිති සඳ එළියෙන් තවත් සුන්දරව ඇත. සඳ එළියට මීදුම වැඩි වේ යැයි මම අසා ඇත්තෙමි.

කුස්සියට ගොස් කෝපි එකක් හදගන්නට මට සිතුණි. එහෙත් කුස්සියේ මං සද්ද කළහොත් චන්දනා ඇහැරේ යැයි මට බිය සිතුණි.

අවසානයේ පැය බාගයකට පමණ පසු මම සෙමෙන් අඩි තබා කුස්සියට ගියෙමි. අහිතක් තරකක් කිළුටක් නැතද ඇගේ කාමරය පසු කර යද්දී දෙර රෙද්ද මෑත් කර ඇය නිදන අයුරු නොබලා යන්නට තරම් මම තෘෂ්ණාවත් ප්‍රහීන කළ තවුසෙකු නොවූයෙමි.

කාමරයේ වූයේ සාලයේ සිට ආ තුනී ආලෝකය පමණි. මම මොහොතක් බිත්තිය පැත්තට හැරී ඇය නිදන අයුරු බලා උන්නෙමි. සෙමෙන් ගොස් ඒ ඇඳමත ඉඳගෙන ඇය සමඟ කතා කර කර ඉන්නට ඇත්නම් යැයි මට සිතුණි.

එහෙත් මේ වැනි රෑක යුවතියකගේ කාමරයකට ගොස් එසේ කතා කර කර ඉන්නේ ඇයි... අහිතක් තරකක් හිතේ නැතද ඒ සිදුවීම ඒ තරම් හොඳ නැත.

මම තවත් මොහොතක් ඇය දෙස බලා ඉඳ දෙර රෙද්ද පහළට දමා කුස්සියට යන්නට හැරුණෙමි.

'සං..දේ..ශ් අ..යි..යේ...'

චන්දනාගේ හඬින් මම ගැස්සී උන් තැනම නැවතුණෙමි. රාත්‍රී නිහඬ පරිසරය මැදින් ඇගේ හඬ ඇසුනේ හීයක් බඳුවය.

දෙර රෙද්ද මෑත් කර මා ඇය දෙස බලා සිටිනවා ඇය දකින්නට ඇත. මට දැනුනේ ලැජ්ජාවකි. ගෑණු ළමයින් නිදනා දෙස එසේ හොරෙන් රෑට පැමිණ බලන්නේ තරක අදහසක් ඇතිවය.

'නිදි නැද්ද ඔයා...'

මම අසරණව ඇසුවෙමි. යුවතිය රෑ ඇඳුම පිටින්ම





උළුවස්ස ළඟට පැමිණ සිනාසුනාය.

'මාත් අහන්නේ ඒක නමයි... අයියත් නිදි නැතේ...'

සැබෑය. ඇය නම් උන්නේ නිදගෙන පොරවාගෙන ඇස් පියාගෙනය. මා ඉන්නේ ගෑණු ළමයින්ගේ කාමර වලට හොරෙන් එබී එබී බලමිනි.

'නිදි මතක් නෑ... කෝපි එකක් හදගන්න කියලා ආවෙ...'

ඇය යමක් අසන්නට ගියාය.

'මට කතා කළා නම් හදලා දෙනවනේ...'

'පව්නේ...'

ඒ දෑස් දිලිසෙයි.

'ඇයි පව්...'

'පොරවගෙන නිදගෙනනේ හිටියේ...'

'එහෙම ඉන්නව දක්කහම දුක හිතෙනවද...'

ගෑණු ළමයි අහන්නේ පුදුමාකාර දේවල්ය.

'දුක හිතෙන් නෑ...'

'එහෙනම්...'

මට කියවෙන්නට ගියේ කුණු හරුපයකි. මම සිනාසී දෙකොල් පට තද කර ගත්තෙමි.

'බය උනාද මං කාමරේට එබෙනකොට...'

'කවුද.. මම...'

'ඔව්... රෑ එනකොට... වෙන... මො..ක..ක..ට හ..රි...'

ඇය කොල් පට තද කරගෙන සැප්‍රුවම මගේ දෑස් දෙස බලාගෙන නැතැයි කියන්නට මෙන් හිස වැනුවාය.

'අයියා එහෙම කෙනෙක් නොමේ... ඒ..ක දන්නේ අ..ද



www.sinhalaelibrary.com

නෙමේ... ගොඩාක් දවසකට කලින්...'

මට සැනසීමක් දැනුණි. සංවර කරගත් ඉඳුරන් පාලනය කරගත් ආශාවන් නැත්පත් කරගත් සිතුවිලි ජීවිතයට කොතරම් ආලෝකයක්ද...

'කිරි කෝපි නේද ඕන...'

මම හිස වැනුවෙමි. යුවතිය පැමිණ කේතලය තබා කෝපි හදන්නට පටන් ගත්තාය. මම පැත්ලියට හේත්තු වී බලා උන්නෙමි.

ඉරිද අම්මාත් තාත්තාත් එන බව දන්මම ඇයට කියන්නට මට සිතුණි. ඒ එන්නේ කුමක් ගැන අහන්නදැයි ඇයට කියන්නට සිතුණි. එහෙත් දන්මම මේ පපුවට ඒ බර නොදැමිය යුතුය. හදිස්සියේ මගේ අම්මාත් තාත්තාත් මේ කසාදයට කැමති නොවුනහොත්.

'ඇයි සංදේශ් අයියේ නින්ද යන් නැත්තේ...'

කඩා වැටුණු කොණ්ඩය එක මිටක් ලෙස අල්ලා දෙතුන් වරක් අඹරා කොණ්ඩ ගුලියක් හදමින් ඇය ඇසුවාය. එවිට ඇගේ මුහුණට එන්නේ මහ ගැම්ඹුරු පෙනුමය.

'හිත හරි බරයි...'

'අයියගේ හිතේ මොන බරක්ද... බර වෙන්න ඕන අපේ හිත්නේ...'

'ඊකට ඔයත් නිදි නැත්තේ...'

'කොහොමත් රෑ එක විතර වෙනකල් මට නින්ද යන්නෑ... මට අදත් හිතුණා සංදේශ් අයියගේ කාමරේට ඇවිත් අර මේසෙ උඩ තියෙන නවල් එකක් ගන්න... අයියා ඇහැරෙයි කියලා නිකං හිටියා...'

'එන්නනේ තිබ්බෙ...'

ඇය යමක් කියන්නට ගොස් හිලගත්තාය.

'සෙනසුරාද විතර ගෙදරට බඩු ටිකක් ගේන්න වෙයි නේද අයියේ...'

'ඈ..යි...'

'අයියගේ අම්මයි තාත්තයි නංගියි එනවනේ... හොඳට උයලා කන්න දෙන්න එපැයි... මස් මාළු ටිකක් එහෙම ගේන්න ඕන...'

අම්මාත් තාත්තාත් නංගීත් එන බව පොඩි මාමා ඇයට කියන්නට ඇත.

'මං ඔයාට කියන්න හිටියේ...'

'ඇයි අයියේ හදිස්සියේ එන්නේ... අයියව එක්කං යන්නද...'

චන්දනා බියෙන් මෙන් ඇසුවාය. මම සිනාසුනෙමි.

'සමහර විට මාවත් එක්කං යයි...'

මම ඇයව බිය කරන්නට සිතා කීවෙමි. යුවතියගේ දෑස් බිමට බර විය.

'ඈ..යි හ..දි..ස්..සි..යේ...'

'දන්නෑ... කතා කළොත් මං යන්නද...'

ඒ දෑස් මා ඉදිරිපිට අමු අමුවේම තෙත් විය.

'අයියට යන්නෙපා කියන්න මං කවුද...'

'මං කවදවත් බණ්ඩාරවෙල දලා යන්නෑ... යනොත් යන්නේ...'

මම කියන්නට ගිය දේ නොකීවෙමි. ඇගේ දෑස් විශාල විය.

'යනොත් යන්නේ... කියන්න අයියේ...'

'නෑ මුකුත් නෑ...'

'යකොත් යන්නේ අයියා කසාද බඳින්න බලාගෙනනේ... ඒක කියන්න නේද ගියේ...'

'මං කාවවත් බඳින්නෑ...'

මගේ වචන වල දෙවෙනි තේරුමද ඇක.

'අයියා ගියොත් මාත් යනවා...'

'කොහෙද...'

'මං කිව්වේ... කටුනායක... ගාමන්ට් එකක...'

චන්දනා ගොත ගසමින් කීවාය. ඇත්තටම මා බණ්ඩාරවෙලින් සමුගතහොත් ඇගේ ජීවිතයට යන කල දසාව කුමක්ද...

'මං විහිළුවට කිව්වේ... අම්මලා එන්නේ නිකං නිවාඩුවට... එයාලටත් යන්න තැනක් නෑනේ...'

මේ රැයේ අසරණ යුවතියගේ පපුව ගිනි තබන්නට බැරි නිසා මම කීවෙමි.

'සෙනසුරාද එන නිසා සිකුරාද මාළු ටිකකුයි පොලොස් ගෙඩියකුයි ගෙනාව නම් මට ඇඹුල් තියල් හදලා එහෙම තියන්න පුළුවන්... අච්චාරුවකුත් හදලා තියන්න පුළුවන්...'

'මඟුල් ගේකට වගේ ඕන නෑ...'

'දුර ඉඳලා ආවම අල්ල පනල්ලේ කන්න දෙන්නත් බෑනේ... ගෙදර බඩු මුකුත් නෑ...'

'හෙට බඩු ටිකක් ගේමු...'

ඇය කිරි කෝපි හද මගේ කෝප්පයට පිරෙන්නට දම්මාය.





'ඔයාට...'

'මට චුට්ටක් ඇති...'

මම කුස්සියේ දොර වසා කිරි කෝපි කෝප්පය අතට ගන්නට යනවාත් සමගම විදුලිය ඇණ හිටිණ.

මුළු නිවසම කළු ඝනාන්ධකාරයක ගිලී ගියේය.

'ලයිට් ගියානේ... මොනවත් පේන්නෑ...'

ඇය උගුරෙන් මෙන් කීවාය. මම අත පත ගා කුස්සියෙන් සාලයට පිවිසෙන දොර සොයාගන්නට මහන්සි ගත්තෙමි. මට හසුවූයේ දොර නොව චන්දනාගේ වතය.

'මං දොර කියලා හිතුවේ...'

මගේ අත තිබුනේ ඇගේ උරහිස මතය. මම එහෙමම අත ලිස්සා යවා යුවතියගේ පුරතින් අල්ලා ගත්තෙමි. වචනයක්වත් ඇගේ මුවින් පිට නොවුණ නමුදු ඇගේ සුසුම් හඬ රැ නිසල බව මැදින් වඩාත් උස් හඬින් ඇසුනි.

'සං..දේ..ශ් අ..යි..යේ...'

චන්දනා ගොරෝද හඬකින් කතා කළාය.

'අපි සාලෙට යන්... සාලේ හද එළිය තියෙනවා...'

යුවතිය මට කීකරුව අඳුරේම දොර සොයාගෙන මාවත් එක්කාගෙන සාලයට ආවාය. අනීයට ඇගේ මුහුණ මතුවූයේ එවිටය. තවමත් මා ඉන්නේ ඇගේ අත අල්ලාගෙන බව මට සිහිවූයේ එවිටය. මම සෙමෙන් ඒ පුරත මුදා හැරියෙමි.

'නිදිමත නම් ගිහින් නිදාගන්න...'

දොරකඩ අසළ වාඩිවී සඳ එළිය කප්පරක් ගලා එන කඳු දෙස බලාගෙන මම කීවෙමි.

චන්දනා කතා බහක් නොමැතිව පැමිණ පඩිය උඩින් වාඩි වූයේ දැස්ද පියාගනිමිනි. ඇය ඉන්නේ දෙරේ වම්



www.sinhalaelibrary.com

උප්වස්සට බර විය. මා ඉන්නේ දකුණු උළුවස්සට බරවිය.

'අ..ර...'

ඇය මට පෙන්වූයේ කඳු මැදින් යන රාත්‍රී බදුලු කෝච්චියයි. ඒ දෙස බලා සිටීම සුන්දරය. කළුවර කඳු මැදින් එළිය පෙට්ටි ටිකක් එක පෙළට යන්නාක් බඳු වූ ඒ දර්ශනය බණ්ඩාරවෙලට ආ පසු මා දුටු සුන්දරම දර්ශනය විය.

'අයියා බදුලු කෝච්චියේ නේද බණ්ඩාරවෙලට ආවේ...'

'ඔව්...'

'තනියම එනකොට පාළු නැද්ද...'

'පාළුයි...'

'මොනාද කරන්නේ...'

'ෂටර් එක ඇරගෙන ඔහේ කඳු දිහා බලාගෙන කල්පනා කර කර ආවා...'

'මොනා ගැනද...'

'එනකොට ආවේ බණ්ඩාරවෙලට ඇවිත් පටන් ගන්න අලුත් ජීවිතේ ගැන... කොළඹ ඉඳලා බදුලු කෝච්චියේ එද්දී මට සමරසේකර කියලා සිංහල සර් කෙනෙක්ව හම්බ උනා...'

චන්දනා දිග කතාවක් අහන්නාට මෙන් දෙපා මත දෑත් තබා ඒ මත නිකට තබා හරිබරි ගැසුණාය.

'ඉතින්...'

'ඒ සර්ටත් ගොඩාක් දුක් විඳලා ජීවිතේ තේරුම් ගත්ත කෙනෙක්... මං කොළඹ ඉඳලා එද්දී මගේ හිත හරියට රිදිලා තිබ්බේ... සමහර දේවල් මතක් වෙලා ට්‍රේන් එකේදි මට





ඇඬුණත් එක්ක...'

'අර මුස්ලිම් අක්කගේ ප්‍රශ්නෙටද...'

'ඔව්... මගේ කඳුළු දකලා ඒ සර් මං එක්ක කතා කළා... එයාගේ කතාව මට ඔක්කොම කිව්වා... සර් කිව්වෙ ජීවිතේ වට්ටගන්න එපා කියලා... මේ වැටිච්ච පල්ලමම ජීවිතේ උඩට එන්න හයියක් කරගන්න කිව්වා... මේ ඇස් වලින් ගලන කඳුළු වලින්ම ජීවිතේ දිනන්න කිව්වා... කවදහරි මෙහෙම අඬ අඬා බණ්ඩාරවෙලට ආපු මල්ලී ජීවිතේ ගොඩාක් දේවල් ලබාගෙන සුඛෝපභෝගී කාර් එකකින් කොළඹ යනවා කියලා හිතන්නත් කිව්වා... ඒ කතාව මගේ හිතට හරියට වැදුනා... ජීවිතේ දිගටම අඬ අඬා ඉන්න හිටපු මට සමරසේකර සර්ගේ වචන බුදු බණ වගේ වැදුනා... කොහොම හරි කොටුව ස්ටේෂන් එකෙන් නැගපු සංදේශ් නොමේ බණ්ඩාරවෙල ස්ටේෂන් එකෙන් බැස්සේ...'

'ප..ස්..සේ...'

දහැනකට සමවැදුනාක් මෙන් යුවතිය තොල් පට මිමිණුවාය.

'බණ්ඩාරවෙල ස්ටේෂන් එකේ ඉඳලා පොඩි මාමා එක්ක මේ ගෙදරට ආවට පස්සේ ජීවිතේ ගොඩාක් දේවල් වෙනස් උනා...'

'මොනාද...'

'ගොඩාක් දේවල්... ඒවා වචන වලින් කියන්න බෑ... මට ජීවිතේ ගැන ලොකු ආදරයක් ඇති උනා... ජීවත් වෙන්න ආස හිතුනා... කොළඹදී අරම දුක් වින්දේ අපරාදේ කියලත්



www.sinhalaelibrary.com

හිතුණා...'

'ඇයි ඒ...'

'බණ්ඩාරවෙලදී මං ගොඩාක් ලස්සන දේවල් දක්කා... ගොඩාක් අහිංසක දේවල් දක්කා...'

මට ඇගේ දෑස් දෙස බැලුණි. චන්දනාගේත් මගේත් දෑස් එකට ගැටුණද ඇය දෙනෙත් ඉවතට ගත්තේ නැත. බණ්ඩාරවෙලදී දුටු අහිංසකම දේ ලස්සනම දේ මේ දෑස් යැයි මේ මුහුණ යැයි කියන්නට මට සිතුණි.

'මොනාද...'

මම සිනාසුනෙමි. යුවතියගේද තොල් පට මැත් විය.

'ඒ..ක කියන්න බෑ... හිතේම තිබ්බදෙන්...'

'කිව්වනම් අපිත් ඒ ලස්සන දේවල් දිහා බලලා හිත හදගන්නවනේ...'

නැවත මට සිනා ගියේය.

'ඔයාට බෑ කවදවත් ඒක බලන්න...'

කෙනෙකුට තමන් දෙසම බලා සතුටක් විඳගත නොහැක. ඒ සතුට එන්නේ වෙනත් කෙනෙකුටය.

'ඇයි ඒ...'

'බෑ කිව්වනේ...'

'ඒත් ඉතින් අයියා කවදහරි බණ්ඩාරවෙල දල යනවනේ...'

යුවතියගේ කතාවට මට දෙන්නට පිළිතුරක් නැත.

'කවදහරි අයියා බැන්ද කාලෙක...'

ඒ ටික ඇය කියන්නට ගත්තේ මගේ ඇස් වලින් දෑස් වසන් කරගෙනය.





'ඉතින්...'

'අයියයි අයියගේ නෝනයි බබාලයි ජයදේව අන්කල්ව බලන්න එයි... බබාල එහෙම මේ වත්තේ සෙල්ලම් කරයි...'

ඒ දෑසින් කඳුළු දත් දත් වැටෙන තරමට දෑස් බොඳව තිබුණි.

'අයියා නෝනත් එක්ක මේ මිදුලේ ඇවිදිනකොට... අ..පේ පු..ච් ගේ අයියට පෙ..නෙ..යි... සමහර විට අයියා නෝනට කියයි මේ ගෙදර ඉස්සර කෙල්ලෙක් හිටියා අපට කෑම එහෙම හදලා දෙන්න කියලා... දන් කොහෙද කියලවත් දන්නෑ කියයි...'

බලාපොරොත්තු නොවූ මොහොතක යුවතියට ඉකි බිඳුණි. ඇය එහෙමම දෙරකඩින් නැඟිට මුව වසාගෙන මා දෙස බැලුවාය.

'ම..ට නිදිමතයි... මං යන්නම් අ..යි..යේ...'

මම ගල්ගැසී බලා සිටිද්දීම චන්දනා කාමරයට දුවගෙන ගියාය. තවමත් විදුලි බලය පැමිණ නැත. ඇය කියූ සියල්ල මට යළිත් සිහිවිය. ඒ ටික මවා ගනිද්දී කෙල්ලගේ හිතට දුකක් ඒම සාධාරණය.

මම තවත් පැය කාලක් පමණ බලා උන්නෙමි. කර කියා ගත හැකි දෙයක් නොමැතිව මම මොහොතක් සාලය පුරා සක්මන් කර අඳුරේම ඇගේ කාමරය සොයා ගියෙමි. කාමරයට ඇතුළු වී අතපත ගා ඇගේ ඇඳ සොයාගෙන මම එහි ඉඳගත්තෙමි. කෙල්ල තවමත් ඉන්නේ අඬමිණි.

මම අඳුරේම රෑ ඇඳුමින් විවර වී තිබූ ඇගේ උරහිස් තලය මත සුරත තැබුවෙමි. යුවතියගේ වතින් ආවේ තුනී රස්නයකි. ඒ රස්නය පිරිමි ඇඟකින් එන රස්නයක් නොවේ.



www.sinhalaelibrary.com

'ඇ..යි අ..ඩ..න්..නේ...'

මම පහත් වී ඇසුවෙමි. මේ තරම් තද අන්ධකාරයේදීත් ඇගේ කුඩා දෑස් දිලිසෙනු මම දුටුවෙමි.

'මං.. අ..ඩ..න්..නෑ අ..යි..යේ...'

එසේ කියමින් ඇය කළේද හැඬීමය. මගේ ඇඟිලි තුඩු ඇගේ උරහිස් තලය මත මෘදුව එහාට මෙහාට ගියේය. ඒ ඇඟිලි තුඩු ඇගේ මුහුණ මත වූ තෙත කඳුළු මතට ගියේ කෙසේදැයි මමවත් නොදන්නෙමි.

'ඔයා ජීවිතේ ඇඬුවා වැඩියි... තව අඬන්නෙපා...'

ඇඟිලි තුඩු වලින් ඒ තෙත කම්මුල් පිසිමින් මම කීවෙමි. මා නොසිතූ මොහොතක චන්දනා මගේ අත ගෙන තදින් ඇගේ දෙකොලතරට තබාගෙන දැඩිව සිපගත්තාය.

යුවතියට ඉකි බිඳුණි.

'අ..නේ අ..යි..යේ...'

ඇය ඉන්නේ යමක් කියාගන්නට බැරුවය. මේ අසරණයා ඉන්නේ ඊටත් වඩා දෙයක් කියාගන්නට බැරුවය.

'මට ආදරේදැයි' අසන්නට මට සිතුණි. මේ අඳුර... මේ රාත්‍රිය... මේ සීතල... මේ නිහඬ බව... මේ දනෙන අසීමිත ආදරණීය බව එවැනි දෙයක් අසන්නට පුදුම තරම් බල කරයි. එහෙත්...

'නිදාගන්න... ඕනතම නින්ද යනකල් මං ඉන්නම්...'

යුවතියගේ මුහුණ පමණක් ඉතුරු වන ලෙස ඇගේ වතම පොරවනයෙන් වසා මම කීවෙමි. ඇය පොරවනය පසුවෙන් පහතට දමා මා දෙස බලා කඳුළු අතරින් සිනාසුනාය.

'එක දෙයක් කරන්න පුළුවන්නම් මං මොනාත් හිතන්නැතුව





සනීපෙට නිදාගන්නවා...'

ගැහැණු ළමයෙක් එසේ මහ රෑක කියද්දී හද කිළිපොළා නොයන පිරිමි ළමයා කවුද...

'මොනවද...'

'කරන්න දෙනවද කියන්න...'

'හා...'

මම ගොළුවෙකු සේ හිස වැනුවෙමි. චන්දනා පොරවනය මෑත් කර ඇඳෙන් බැස මා ඉදිරියට ආවාය. මට නැගිට්ටුනේ ඉබේටමය. ඇය ඊටත් පසු කුඩා ගැණු ළමයෙකු මෙන් මා අසල දණ ඔබා මගේ දෙපා වැන්දය.

හදවත ඇතුළාන්තයම පිච්චී ගියේ ඉබේටමය. චන්දනාගේ දෙකොල් වල වූ තෙත මගේ දෙපා මතුපිටට දනෙනු මට හොඳින් දැනුණි. ඒ තරම් ආදරයකින් මේ ආත්මයේ කිසිවෙකු මගේ දෙපා වැඳ නැත.

'බු..දු.. ස..රණයි...'

මගේ මුවින් ඉබේටම කියවිණි. ඇයව දෙපා පාමුලින් නැගිට්ටවා ඒ බාහු දෙකෙන් අල්ලාගෙන මම මොහොතක් ඒ දෑසට ගිලුනෙමි.

'ඇ..යි...'

මා බලා සිටිද්දී ඇය ඇසුවාය.

'නෑ...'

'ඇයි කියන්නකෝ...'

'මුකුත් නෑ.. නිදාගන්න...'

යන්නට ගිය මගේ අතින් ඇය අල්ලාගත්තාය.

'ම..ට මො..නා..ත් දෙ..න්..නෑ...'



www.sinhalaelibrary.com

ඇය අසද්දී මගේ දෙතොල් මෑත් වන්නට ඇත. මා සිතුදේ ඇය ඉල්ලුවේ කෙසේද...

මම යංතමට මගේ දෙතොල් ඒ නළලත මත පටලා මගේ කාමරයට ආවෙමි. ඇඳට වැටුණු විගස මම පොරවනයෙන් තදින් හිසම වසාගෙන ගුලි උනෙමි.

www.sinhalaelibrar

www.sinhalaelibrary

# 31

අම්මාත් තාත්තාත් නංගීත් එන්නට උන්නේ සෙනසුරාදය. ඒ නිසාම මමත් චන්දනාත් සිකුරාද ටවුමට ගොස් දවස් දෙක තුනක් උයන්නට බඩු ගෙන ආවෙමු. චන්දනා කොතරම් හුරුබුහුටි ලෙස ජීවිතයට හැඩ ගැසී ඇත්දැයි මට අමුතුවෙන් තේරුම් ගන්නට අවශ්‍ය නොවීය. එහෙත් මාවත් රැගෙන බඩු ගන්නට යද්දී ඇය දෙසම මම උවමනාවෙන් බලා උන්නෙමි.

ඇය ළඟ බඩු ලිස්ට් එකක් නැත. එහෙත් එවැන්නක් ළඟ තබාගෙන ඉන්නාක් මෙන් ඇය බඩු ගනියි. හැම කෙල්ලෙකුටම මේ දක්ෂතාවය නැත. විශේෂයෙන් එවැනි දක්ෂතා පිහිටන්නේ ජීවිතයට දැඩිව ආදරය කරන පිළිවෙලක්

ඇති යුවතියකටය.

'මාගරින් ලොකු පැකට් එකක් දෙන්න... තව කජු දෙසීයකුයි ග්‍රීන් පීස් සීයකුයි දන්න... සුප් කැට තියෙනවද...'

'තියෙනවා...'

'එහෙනම් විකත් සුප් කැට හතරක් විතර දන්න... බිස්කට් කුඩු පැකට් දෙකකුත් ඕන...'

මම සිනාසෙමින් ඇය දෙස බලා උන්නෙමි. මම සිනාසෙනු ඇය දුටුවාය.

'ඇ..යි හිනාවෙන්නේ...'

චන්දනා මා අසලට පැමිණ පහත් හඬින් ඇසුවාය.

'නිකං...'

'මටයි හිනාවුනේ... ඇයි කියන්න...'

'ලිස්ට් එකකුත් නැතුව ඔහොම බඩු ගන්නේ කොහොමද...'

'ලිස්ට් එකක් තියෙනවා...'

'කෝ...'

'ඒක තියෙන්නේ මගේ හිතේ...'

'මාගරින් මොකටද... බටර් තියෙනවනේ...'

'බටර් දාලා ෆ්‍රයිඩ් රයිස් නූඩ්ල්ස් එහෙම හදන්න සංදේශ් අයියේ... ඊකට මාගරින් ඕන... කජුයි ග්‍රීන් පීසුයි ගත්තේ කහබත් එහෙම හදද්දී දන්න...'

'සුප් කැට...'

'ෆ්‍රයිඩ් රයිස් එහෙම හදද්දී සුප් කැට දනවා... විස්කෝතු කුඩු ගත්තේ මාළු දවටලා බදින්නයි කට්ලට් බදින්නයි... හරිද...'



චන්දනා මේ සියල්ල සමඟින් මට අඩගසන්නේ ජීවිතයටයි.

'මුදලාලි මේ කැකුළු ඇරෙන්න වෙන රතු කැකුළු නැද්ද...'

ඇය රතු කැකුළු හාල් මුට්ටියෙන් මිටක් ගෙන බලා ඇසුවාය.

'ඇයි ඕක හොඳයි...'

'මහ්... මේක බතට හොඳයි... මේකෙන් කිරිබත් රස නෑ...'

'මේක බලන්න...'

මුදලාලි ඇතුලේ තිබූ කැකුළු හාල් මුට්ටියක් විවර කර ඉන් මිටක් ඇය අතට දී ඇසුවේය.

'ඒකනේ... ඒක හොඳයි... මුදලාලි ඇතුලේ හොඳ ඒවා තියන් දෙන්නැත්තේ...'

අහිංසක පාටට හිටියට කෙල්ලගේ කටද ඇත.

'දන් කාලේ කවුද ළමයෝ හාල් තෝරලා ගන්නේ.. කෝක තිබ්බත් අරන් යනවා... මේක කිරි බතට හොඳද...'

'ම්... මේ හාල හරි කිරි රහයි...'

'එහෙනම් මාත් ටිකක් ගෙදර අරන් යන්න ඕන...'

'මේ පොඩි හාල් මැස්සන්ගෙන් දෙසීය පනහක් දෙන්න...'

බඩු සියල්ල ගෙන ඇය මල්ලක් අතට ගන්නාය. ගත්ත බඩු වල හැටියට මල්ල බරය.

'කෝ ඕක මට දෙන්න...'

මම මල්ල වෙත අත සබා කීවෙමි.

'මට ඒක පුරුදුයි... අයියා සල්ලි දෙන වැඩේ කරන්න...'

www.sinhalaelibrary.com

අප දෙදෙනා එකට සමාන්තරව මාකට් එකේ යද්දී මගේ හිතට දනුනේ වෙනස්ම සතුටකි. එය ජීවිතය මෙසේ බෙදාහදාගැනීම සම්බන්ධ සතුටකි.

'ජයදේව අන්කල් එළුයි අලයි මාළුයි ගේනවා කිව්වා... අපි මස් ටික ගමු...'

අපි කුකුලන් දෙදෙනෙක් ගත්තෙමු.

'තව මොනවද ගන්න ඕන... මඟුල් ගේකට උයන්න වගේ යන්නේ...'

'ඉතින් හොඳයිනේ... අයියා නම් බදින්නේ ගෙදර නොමෙනේ නේද... ලොකු හෝටලේක වෙඩින් එක ගනී... ආ..යි..ස් අ..ප්..පා මට මැවිලා පේනවා...'

ඉන් පසු ටික වෙලාවක් යනතුරු ඇය කතා කළේ නැත. මම ඇයට ඇඟිල්ලකින් ඇණ කතා කළෙමි.

'මොකද...'

'නෑ මොනවත් නෑ...'

ඒ ඇස් බරය.

'මොනවද තව ගන්න ඕන...'

'බිත්තර ටිකකුයි සොසේජස් ටිකකුයි තව පොඩි පොඩි ඒවා ටිකක්...'

'යන්ද පුඩ් සිටි...'

'මං කවදාවත් ඒවලින් බඩු අරන් නෑ...'

'අද යන්... මං හරි ආසයි ඒ වලින් බඩු ගන්න ට්‍රොලියක් තල්ලු කරන් ගිහින්...'

'මාත් ආසයි...'





අපි බණ්ඩාරවෙල පුඩ් සිටියට ගියේ ගත් බඩු සියල්ලම වාහනයට දැමීමෙන් අනතුරුවය. පොඩි මාමා බඩු ගන්නට වෑන් රිය දුන්නේය.

'ඉස්සෙල්ලා මයාට ඕන බඩු ගන්නකෝ...'

මම ට්‍රොලියක් ගෙන චන්දනාට කීවෙමි.

'ඇයි අයියටත් ගන්න බඩු තියෙනවද...'

'පණ්ඩිතයා නොවී කියපු දේ කරන්නකෝ...'

චන්දනා ගත්තේ සෝස් එකක් සොසේජස් පැකට් දෙකක් එළවළු තෙල් බෝතලයක් පපඩම් පැකට් දෙකක් වැනි දේවල්ය.

'අයියලගේ අම්මයි තාත්තයි නංගියි තෝසේ කන්න ආස වෙයිද...'

උළුඳු පිටි පැකට් දෙකක් අතට ගනිමින් ඇය ඇසුවාය.

'කොළඹ ශාන්ති විහාර් කියලා ඉන්දියන් හෝටලයක් තියෙනවා... අපි ඒකෙන් ගෙනත් කනවා...'

'එහෙනම් එක දවසක තෝසේ හදන්නද... තෝසෙයි සාම්බාරු හොදියි වඩෙයි සම්බෝලයි...'

'දන්නවද...'

'හොඳට දන්නවා... ඉස්සර ආච්චිගේ යාළුවෙක් හිටියා රාසම්මා කියලා... ගෙදර ආවම එයා මට තෝසේ හදන්න කියලා දෙනවා... හදනකොට කියනවා...'

යමක් කියන්නට ගොස් ඇය එය ගිලගත්තාය.

'ඉතින් මොනවද කියන්නේ...'

'හදිස්සියේ දෙමළ කොල්ලෙක්ව බැන්දොත් ඉගෙනගෙන තියෙන එක හොඳයිලු...'



www.sinhalaelibrary.com

'ඇත්තටම දෙමළ කොල්ලෙක්ව බඳියිද දන්නෑ... නෝද...'

'ම්... කියන්න බෑ... මට ආදරේ කරන්න සිංහල කොල්ලෙකුත් නැගේ...'

ඇය එය කියාගෙන උළුදු පිටි පැකට් දෙක ට්‍රොලියට දැම්මාය. මට සිනා ගියේ ඉබේටමය.

පොඩි මාමා කාමරයට එබුනේ මම ඇඳට වී දහ අතේ කල්පනා කරමින් සිටිද්දීය. මගේ ජීවිතයේ බරපතලම තීරණයක් අභියස සිටින මට කල්පනා නොකර ඉන්නට බැරි විය. සංදේශ්ට වූයේ පුදුමාකාර දෙයකි. මට සිදුවූයේ කුමක්දැයි තවම මටවත් සිතා ගත නොහැක.

'පොඩි මාමේ...'

මම ඇඳමත ඉඳගනිමින් කතා කළෙමි.

'නිකං පුතේ... මං බැලුවේ උඹ මොනාද කරන්නේ කියලා...'

'නිකං පොඩි මාමේ හිටියේ...'

පොඩි මාමා ඇඳ මත ඉඳගෙන මා දෙස බලා සිනාසුනේය.

'මොකද කෙල්ල කියන්නේ...'

'එහෙම මොනවත් කිව්වේ නෑ පොඩි මාමේ...'

'උඹ මොනාත් කිව්වේ නැද්ද...'

'මං එහෙම කියන්නේ කොහොමද පොඩි මාමේ... මොනා හරි කියලා අහිංසක කෙල්ලගේ පපුවට බලාපොරොත්තු දීලා... පව්...'

'ඔව් ඒකත් ඇත්ත තමයි... ඒත් මං උඹට කොහොම හරි අම්මගෙනුයි තාත්තගෙනුයි කැමැත්ත අරන් දෙනවා...'





අම්මාත් තාත්තාත් වත්දනාට කැමති වෙතැයි විශ්වාසයක් මගේ හිතේද විය. ඇය ජීවිතය පුරා අවාසනාවන්ත ඉරණම් රැසකට මුහුණ දුන් බව සැබෑය. එහෙත් ඇගේ මුහුණ පිත් පාටය. එවන් යුවතියක් තමන්ගේ ලේලි කරගන්නට අම්මාත් තාත්තාත් අකමැති නොවෙනු ඇත.

'කෙල්ල දගෙන උයනවා...'

'පොඩි මාමා කියන්නේ මගුල් ගේකට වගේ බඩු ගත්තේ...'

'ඒකිටත් ආස ඇති වෙච්ච දේවල් අමතක කරලා ටිකක් හරි සැනසීමෙන් ජීවත් වෙන්න... පව්...'

'අපි හිටියෙ නැත්නම් ඒ කෙල්ලට මොනා වෙයිද...'

මම ඇසුවෙමි. පොඩි මාමාද තලෙල රැළි කර ගත්තේය.

'උඹල දෙන්නව බන්දලා දෙන්න පුළුවන් උනොත් ඒක මටත් ලොකු සැනසීමක්...'

'මටත් මාර සැනසීමක් පොඩි මාමේ...'

මම අවංකව මගේ තත්වය කීවෙමි. ඇයව නොලැබුණහොත් මා ජීවත්වන්නේ කෙසේදැයි මටවත් සිතා ගත නොහැක. අප තවත් කෙනෙකුව පපුවට ගන්නේ දෙවෙයක් ගැන ඉරණමක් ගැන වැඩිමනක් නොහිතාය. එන කෙනා පපුවේ පතුලටම යයි. අවසානයට පපුවෙන් ඈත් කරන්නට වූ කල හදවත් දෙකක ගිනි ගොඩවල් දෙකකි.

'මං කඩේට යනවා පුතේ... හෙට කඩේට යන්න වෙන්නැගේ ඔක්කොම ගණන් හිලව් ටික බේරලා දන්න ඕනේ... පොඩ්ඩක් කෙල්ල ඉන්න පැත්තත් බලපන්...'

පොඩි මාමා නොකිවද මං උන්නේ කුස්සියට යන්නටය.

තාංගී කතා කළේ පොඩි මාමා ගිය පසුය.



www.sinhalaelibrary.com

'අයියේ...'

'කොහේ ඉඳන්ද බබා කතා කරන්නේ...'

'මේ ළඟ ගෙදරකට ආවා... එහෙනම් හෙට උදේම අපි එනවා හොඳේ... අතට මෙහේ කෝච්චියේ නගින්නේ...'

'ආදරයෙන් බණ්ඩාරවෙලට පිළිගන්නවා...'

මම සිනාසී කීවෙමි.

'අ..යි..යේ...'

නංගිගේ කටහඬ අමුතු විය.

'ඇයි...'

'හදිස්සියේම ඇයි පොඩි මාමා අම්මටයි තාත්තටයි බණ්ඩාරවෙල එන්න කියන්නේ...'

නංගී ඇසූ දෙයින් මාව අසරණ විය.

'නිකං... එහෙම දෙයක් නෑ...'

'අයියා මට බොරු කියනවා... නංගිලට බොරු කියන්න හොඳ නෑ...'

'පොඩි මාමා මොනවා හරි දේකට එන්න කියනවා ඇති...'

'නෑ.. නෑ... විශේෂ හේතුවක් ඇති... තමුන්ට ඉන්නේ එක නංගි කෙනයි නේද...'

'ම්...'

'කවදාහරි අයියගේ බබාලට පොඩි නැන්දේ කියලා කියන්න ඉන්නේ මං විතරයි නේද...'

'ඒකනේ...'

'ඉතින් එහෙව් එකේ ඒ නංගිට බොරු කියනවද... මෙතන





කවුරුවත් නෑ... මට ඇත්ත කියන්න...'

මං මොහොතක් නිහඬව උන්නෙමි. ඇත්තටම නංගිට යමක් සැඟවීමට හොඳ නැත. ඇය මගේ ජීවිතය එහෙම පිටින්ම දත් සොයුරියකි.

'මං ඇත්තම කියන්නම්... බබා අම්මටයි තාත්තටයි මේ බවක් අහවන්නෑ කියලා පොරොන්දු වෙන්න...'

'අ..යි..යේ මේ ඔයාගේ ඔරිජිනල් නංගී... ආයේ මැරුණත් එහෙම කරනවද... අපි ඉස්සර වීල් නොකරපු දෙන්නෙක් වගේනේ කතාව...'

නංගී සිනාසෙමින් කීවාය. ඇය කියන්නේ ඇත්තය. අප අතර රහස් මීතා තරම් ඇත.

'මට ඇත්තම කියන්න...'

මම සියල්ල නංගීට කීවෙමි. අම්මාත් තාත්තාත් බණ්ඩාරවෙලට ගෙන්නා ගැනීමේ අරමුණ වන්දනා බව මම ඇයට කීවෙමි.

'ආයේ පපුවේ මොනාත් නෑ... ඔන්න ඇත්තම කිව්වා...'

නංගී නිහඬව ටික වෙලාවක් උන්නාය.

'මං ඒ කෙල්ලට හරි ආදරෙයි නංගී...'

මට ඒ වචන පිට වූයේ තරමක් ගැඹුරු හඬිනි.

'අයියගේ ෆස්ට් ලව් එකටත් ඉස්සෙල්ලම වින් කළේ මම... ඒක තනිකරම කඳුළින්ම කෙළවර උනා... ඒත් කමක් නෑ... අයියාගේ මේ ලව් එකටත් මං මගේ මුළු හදවසින්ම සුබ පතනවා... තව දෙයක් කියන්නද...'

'හා...'



www.sinhalaelibrary.com

'මේ කතාව පළවෙනි කතාව වගේ කඳුළින් කෙළවර වෙන එකක් නෑ...'

'ඔයා කොහොමද ඔබා එහෙම කියන්නේ...'

'මං යමක් දන්න නිසා එහෙම කියන්නේ...'

'එත් ඇත්ත මන්ලි අයියට ඒක කියන්නැද්ද...'

'නෑ අයියේ... මට දැනෙනවා... අම්මයි තාත්තයි විතරක් නෙමේ මං මගේ නෑන විදිහට ඒ කෙල්ලව ඇද ගත්තේ අපි බණ්ඩාරවෙලට ආපු පළවෙනි දවසේ... මං බලාපොරොත්තු උන මගේ අභි-සක නෑනා තමයි ඒ...'

'ඒත් බබා ඒ කෙල්ල තාත් කවිරුත් නැති අනාථ...'

මගේ වචන කැඩි කැඩී එන්නට විය.

'ඒ කෙල්ලට දත් කාක් කව්රුත් නෑ කියලා කියන්න බෑනේ... අයියා ඉන්නවනේ... ඔයා වගේ කොල්ලෙක් කෙල්ලෙක්ට හිටියාම ඇති... සේනාවක් හිටියා වගේ තමා...'

නංගිගේ වචන මට මහා ශක්තියක් විය.

'ඒත් මම ඉන්නේ හරි බයෙන් නංගී...'

'බයවෙන්නෙපා... අයියට කෙල්ලව ලැබෙයි... එහෙම ලැබීමක් මටත් පේනවා... අම්මයි තාත්තයි එද බණ්ඩාරවෙල ඉඳලා එද්දි ඒ කෙල්ල ගැන කතා කළේ ලොකු පැහැදීමකින්... ඒ පැහැදීම සාමාන්‍ය එකක් නෙමේ...'

නංගීට මට වඩා තේරුම් ගැනීමේ ශක්තියක් ඇති බව මම එද සිටම පිළිගත්තෙමි.

'එහෙනම් බබා හෙට එන්න...'

'සැනසීමෙන් අද රෑ නිදාගන්න... කෝ කෙල්ල ළඟ





ඉන්නවද...'

'තාම එයා මේ මොනවත් දන්නෑ... කිසිකෙනෙක් ගැනුව බලාපොරොත්තු දෙන්න බෑනේ...'

'ඔව් ඒක ඇත්ත...'

'එයා ඔයාලට කන්න ඇඳ ඇඳලා උයනවා... මෙළු දනවා... ඇඳිල් කියල් හදනවා... අච්චාරු දනවා... ඒක විනෝදයයි...'

'ඉතින් බලන්න කමින්ගේ නැන්දම්මටයි මාමණ්ඩිටයි නෑනටයි සලකන්න එහෙම නැහෙන කෙල්ලෙක් මගේ අයියටයි අයියගේ ගියාල්ලටයි කොහොම නැතෙයිද... නේද...'

නංගීගේ තර්කය මට මහා සතුටක් ගෙන ආවේය.

'මං දෙන්නද...'

'එපා... මං හෙටම ඇවිත් කෙල්ලව අල්ල ගන්නම්... මං මකක් කළා කියන්න... මං කියන්නම් අයියේ... සුබ ඇතුම් හොඳේ...'

'තෑන්කියූ බබා...'

මම දුරකතනය තබා සැහෙන වේලාවක් සාලයට වී කල්පනා කළෙමි. චන්දනා කුස්සියේ උයන හඬ මට මෙතනට ඇසෙයි. මට නංගීගේ වචන රැව් පිළිරැව් දෙන්නට විය.



www.sinhalaelibrary.com

# 32

චන්දනා කුස්සියේ පිහින මාළු ඇඹුල් තියලේ සුවඳ මුළු නිවස පුරාම විහිදෙන්නට විය. සුදු බත් ටිකක් දුන්නානම් ඒ සුවඳ සමඟ පිඟානක්ම කන්නට තිබුණි. ඇයට මේ අත්ගුණය කොහෙන් ආවාදැයි මම සිතුවෙමි.

මගේ හිතේ පිදී එන අලුත් බලාපොරොත්තු... අනාගතය පිළිබඳ මිහිරි සිහින... ජීවිතය පිළිබඳ සොඳුරු අපේක්ෂා තවමත් මේ අහිංසක යුවතිය නොදනී. දන්නවානම් ඇය කුස්සියට වී ඉකි ගසා අඬනු ඇත. අනාථ අසරණ වූ තමාගේ ජීවිතයට ඉහළින් එවන් රැකවරණයක් හෙවණක් මැවේයැයි දුප්පත් කෙල්ල හිතන්නේ නැත.

ඇය දන්නා එකම දේ තමා මේ ලෝකයේ සදාකාලයටම





තනිවූ බවය. දෛවය තමාව තනිකළ බවය.

ඇඹුල් තියලේ සුවඳ දිගේ මම කුස්සියට ගියෙමි. තීතියට කැපූ එම්බටු ගොඩක් තෙලට දන්නට සූදානමින් ඇය ලුණු කහ වල අතගාමින් උන්නාය.

'මං හෙට බඳින්නෑ...'

මම විහිළුවට කීවෙමි.

'ඇඹුල් තියල් එක හදලා ඉවරයි... අ..යි..යේ පොඩ්ඩක් ලුණු ඇඹුල් බලනවද...'

'ඇයි හදපු කෙනාට බැරිද ලුණු ඇඹුල් බලන්න...'

'පාටට ආවා... මං කියනවට චුට්ටක් බලන්නකෝ..'

ඇය පොල් කටු හැන්ද දමා ඇඹුල් තියල් හට්ටියෙන් පරිස්සමෙන් මාළු කැල්ලකුත් ඉස්ම ටිකකුත් පීරිසියකට දමා මට දුන්නාය. රස බලන්නට අවශ්‍ය නැත. මාළු ඇඹුල් තියල් ඉහළම තත්වයේ ඇත. එය ඇඹුල් තියලේ පාටින්ම සුවඳින්ම කිව හැක.

'හො..ඳ..ද...'

යුවතියගේ දෑස් නැටවෙයි.

'පාන් බාගයක් නැද්ද...'

'අ..නේ පාන් ගෙනාවේ නෑ... මං හිතුවේ උයලා ඉවර වෙලා සුදු හාල් ටිකක් උයලා පොල් සම්බෝල හදන්න... ඇඹුල් තියල් ටිකක් දන් කන්න පුළුවන්නේ... මං වස් ගාලා බත් ටික හදලා දෙන්නද...'

'හිමිහිට හදන්න...'

'හොඳද කිව්වේ නැනේ...'



www.sinhalaelibrary.com

කුඩා දරිවියක මෙන් ඇය ඇසුවාය. මම මහපටැඟිල්ල උලුක් කර ඇයට පෙන්වූයෙමි.

'ලකුණු සීයෙන් සීයයි... දෙන්නත් එක්ක දමුද හෝටලයක්...'

'ම්... ඉං තමයි හැබැයි උයන්නේ අයියා අතින් වැඩ බලාගන්න ඕනේ...'

'හෝටල් වල උයන්න ඕන නෑ... කවදහරි මහත්තයටයි බබාල ටිකටයි විතරක් රහට උයලා දෙන්න...'

මම ඇගේ දෑස් පරීක්ෂා කරමින්ම සිටෙමි. චන්දනා දෑස් බිමට ඔබා ගත්තාය.

'ම..ට ඉ..හි..න් මහත්තයෙක් ලැබෙයිද දන්නෑනේ...'

බලාපොරොත්තු නොවූ දුබල හඬින් යුවතිය කීවාය.

'හම්බවෙනවා...'

'කොහොමද දන්නේ...'

'මට සාස්තර කියන්න පුළුවන්...'

'ඉතින් අයියා මගේ අත බැලුවේ නෑනේ...'

'මං කියන්නේ අත බලලා නෙමේ...'

'එහෙනම්...'

'මූ..ණ බ..ල..ලා...'

'ඕ..ය ඇහුවමයි... තව මොනවද මගේ මූණේ තියෙන්නේ...'

ජීවනයම ඒ මුහුණේ ඇත. මා වැනි කොල්ලෙකුට ජීවත් වන්නට ඕනා තරම් දේ ඒ මුහුණේ ඇත.

'මෙහෙම බලන් ඉඳලා අමාරුයි... නිස්කලංක තැනකට ගිහිල්ලා පැයක් විතර බලන් ඉන්න ඕන... හොඳට නාලා





නෙත කොණ්ඩේ පිටින් සුදු රෙද්දක් ඇඳගෙන පිච්ච මල් වට්ටියකුත් අරන් මං ඉස්සරහ ඉන්න ඕන... ඊට කලින් මගේ කකුල් දෙක අලල්ලා වඳින්න ඕන... එතකොට තමයි සාස්තරේ කියවෙන්නේ...'

අහිංසක කෙල්ල මගේ බොරුව විශ්වාස කළාය.

'අ..යියා ඇත්තමද කියන්නේ...'

'ඔව්... ඉර නගින්න ඉස්සර වෙලා නාලා එන්න ඕන...'

'මං නාලා එන්නම් මට කියනවද...'

'අම්මයි තාත්තයි ගියාම කියන්නම්...'

තාච්චිය ලිප තබා ඇය එයට තෙල් බෝතලයෙන් භාගයක්ම දම්මාය. මම ලිප ළඟ දෑත් බැඳගෙන බලා උන්නෙමි. චන්දනා ලුණු ඇඹුල් අල්ලන්නට දමා තිබූ වම්බටු තීරු දැතින්ම මිරිකා තෙල් රත්වන තුරු බලා උන්නාය.

'අයියා චූට්ටක් අහකට වෙන්න තෙල් විසිවෙයි...'

රත්වූ තෙලට ඇය එකවර වම්බටු ටික දම්මාය. පෙණ උතුරමින් වම්බටු බැඳෙන්නට විය.

'මෝජු හදන්නද...'

'ම්... වම්බටු ටික බැදලා පස්සේ හාල් මැස්සොයි මිරිසුයි ඇණුයි බදින්න ඕන...'

වම්බටු බැඳෙන මිහිරි සුවඳ මොහොතකින් එන්නට විය. ඒ අතරවාරයේ ඇය හාල් මැස්සන් ටිකට දෙහි ඇඹුල් මිරිකුවාය.

'ඇඹුල් තියලයි සිංහල අච්චාරුවයි හදලා ඉවරයි... තව තියෙන්නේ මෝජු එකයි සීනි සම්බෝලෙයි විතරයි...'



www.sinhalaelibrary.com

'හදලා ඉවර වෙද්දී රෑ වෙයිනේ...'

'කමක් නෑ... මං ආසයි උයන්න...'

'තව මොනවවද ආස...'

කට කපු ලෙල්ල මෙන් පස්සට කර චන්ද්‍රනා සිනාසුනාය. ඒ සිනහව කීවේ ඇය ආශා කරන තව බොහෝ දේ ඇති බවය.

'එව්වා ඕන නැතේ...'

'එකක් කියන්න...'

'බෑ...'

'මට කියපන්...'

මම සැර කළෙමි.

'කියන්නද...'

'තටමන් නැතුව ඉකින් කියපන්...'

'බබාල හදන්න... බබාලව නාවන්න... බබාලට කවන්න... නිදියන කරවන්න... හරි ආසයි... ඉස්සර මං වටේ පිටේ ළමයි ගෙනල්ලා දවසම හියාගන්නවා...'

මම ආශාවෙන් ඇය දෙස බලා උන්නෙමි.

'බබාල හදන්න කනියම බෑනේ...'

'ඇ..යි...'

මා ඇසූ දෙය චන්ද්‍රනාට පත්තු වූයේ ටිකකට පසුය. ඇය අහක බලාගෙන සිනාසුනාය.

'මං කාගේ හරි බබෙක් අරන් හදන්නේ...'

'ඇයි කාගෙවත් බබාල හදන්නේ... මයාගේ බබෙක් හදන්න ආස නෑ...'





'ආසයි...'

මම තත්පරයෙන් තත්පරය යුවතියගේ දෑස් පරීක්ෂා කළෙමි. ඒ බැල්මක් බැල්මක් ගානේ ඇය වෙතින් දිස් වන්නේ අලුත් ජීවිතයකට කැප වෙන්නට පෙරුම් පුරන සුදනම් වන ලාබාල ගැහැණියකගේ සුන්දරත්වයය.

රත්වන් පාටට හැරුණු එම්බටු ටික චන්ද්‍රනා කිරි ගොට්ටට දම්මාය. මං බැදුණු එම්බටු තිරුවක් ගෙන මුවේ තබාගත්තෙමි.

'මාත් හරි ආසයි බැදපු එම්බටු කන්න...'

'රෑට කනකොටත් වුට්ට වුට්ට ගමු...'

යුවතිය සෑහෙන වේලාවක සිට කට හදගෙන ඉන්නේ යමක් අසන්නටය.

'මොනාවද අහන්න යන්නේ...'

'මම...'

'ඔව්...'

'කොහොමද දන්නේ...'

'මං කිව්වේ මට පුළුවන් කියලා...'

'ඒක නමයි... ඇත්ත වෙන්නැති...'

'මොනාවද අහන්න ගියේ...'

'බඩුවක්...'

'ඉකින් බඩුව කියන්න...'

'අර මෙසේ උඩ කවියක් ලියලා තියෙනවා නේද...'

ඇය අස් කරද්දී මා ලියූ කවිය දකින්නට ඇත. ඒ කවිය මා ලිවේ ඇය ගැන සිතාය.



www.sinhalaelibrary.com

'ඉතින්...'

'සා..ට..ද ලි..වූ..වේ.. අර අක්කටද...'

කෙල්ලගේ ඊර්ෂ්‍යාකාරය.

'නෑ...'

'එහෙනම්...'

'වෙන කෙනෙකුට...'

'හරි ලස්සනයි... ලිව්ව එක්කෙනාටම දුන්නනම් අයියා ගැන හරියට ආදරේ හිතෙයි...'

මගේ කවිය ඒ තරම් සාර්ථක යැයි මම නොසිතුවෙමි.

'ඔයා ඒක කියෙව්වද...'

'ම්...'

'ඔයාට ආදරේ හිතුනද...'

මම අමු අමුවේම ඇසුවෙමි. චන්දනා හිස ඔසවා දෑස් විශාල කර බැලුවාය.

'මං ප්‍රශ්නයක් ඇහුවා...'

මම ඇගේ අදහස දැන ගන්නට ආශාවෙන් ඇසුවෙමි.

'මට උත්තරේකුත් තියෙනවා...'

'ඉතින් කියන්න...'

'අයියා ගැන කෙල්ලෙක්ට ආදරේ වෙන්න කවි ලියන්න ඕන නෑ...'

'මං සාලිය කුමාරයා නෙමේනේ... නිකං පිස්සු කොල්ලෙක්...'

මගේ කතාවට කෙල් හැන්ද අල්ලාගෙන ශුවනිය සිනාසුනාය.





'මොකද තෝ හිනාවෙන්නේ...'

'වි..ක..ක් විතර පිස්සු නම් තමා...'

'මට පිස්සු කියලා කොහොමද දන්නේ... පිස්සු කොල්ලන්ට මොකටද ආදරේ කරන්නේ...'

'පිස්සු උනාට හරි හොඳයි...'

'ඇයි මට පිස්සු කියන්නේ...'

'මං විහිළුවට කිව්වේ...'

තෙල් භාජනය ඇති ලිපේ දල්ල අඩු කර මද වෙලාවක් තබා ඇය මිරිස් කරල් ටික තෙලට දමුවාය. ඉවීම කලාවකි. එයට වෙනමම අත් ගුණයක් තිබිය යුතුය.

'කවිය පත්තරේකට ඇරියනම් හරි...'

මගේ කවිකාර කම ගැන මට දැන් ආඩම්බරයක් දනෙයි. දැන් මගේ කවියට රසිකාවියක් ඇත.

'ඒක එච්චර ලස්සන නෑ... පද ගැලපෙන්නේ නෑ...'

'නෑ... හරි ලස්සනයි... කවියක් ලියපු කෙනාට ඒක රස විඳින්න බැහැ...'

'එහෙනම්...'

'ඒක කියවන කෙනාට තමයි රස... ඒ.. පද කියවන කෙනා තිතින් ගළපගන්න ඕන...'

ඇගේ සාහිත්‍ය දැනුම මට වඩා ඉහළය. හොඳ සාහිත්‍ය දැනුමක් නැති කෙනෙකුට හොඳ රසිකාවියක් විය නොහැක.

'ඔයා ගළප ගත්තද...'

ශුවනිය හිස වැණුවාය.

'මොනාද හිතුණේ...'

'මං හිච්චේ හරි ආදරේ හිතුනා කියලා...'

'මං ගැනද... කවිය ගැනද...'

'කා..වි ලියපු හිත ගැන...'

අපේ ඇස් යළිත් හමුවිය.

චන්දනා දෙස බලා සිටිද්දී මම මගේම අනාගතයට ආදරය කරන්නට පටන් ගත්තෙමි. ඇය තුළින් මම සුන්දර සැහැල්ලු අනාගතයක් මවා ගත්තෙමි. මට අවශ්‍ය වූයේ මටත් මගේ දරුවන්ටත් දෙගොල්ලන්ටම හොඳ අම්මා කෙනෙක් විය හැකි කෙනෙකි. මේ ඒ අම්මාය.

'අ..යි..යේ...'

මම සිතුවිලි දහැනින් අවදි උනෙමි.

'කොහෙද ගිහින් හිටියේ...'

ගැහැණු ළමයින්ට අපූරුවට හිත් කියවිය හැක.

'වෙලාවකට ලොකු කල්පනාවකට වැටෙනවා... ඒ වෙලාවට මේ ළඟින් යනවා ජේන්තු...'

මට එවැනි රෝගයක් ඇත. අම්මාත් මේ කතාව කියන්නීය.

'දන් මොනවද ඔය කරන්න හදන්නේ...'

'සීනි සම්බෝල් හදන්න...'

'දෙන්න ඔය උම්බලකඩ ටික මං කුඩු කරලා දෙන්නම්...'

අඩියක් පමණ දිග් වූ උම්බලකඩ කැල්ල මා ගන්නට යද්දී ඇය එය පස්සට කළාය.

'අනේ එපා... පව්නේ... මං තලා ගන්නම්... ඔහොම ඉන්න එක මට ඇති...'



'හරි... මං තලන්නම්... මං ආසයි...'

'එක්කෝ තලලා දෙන්න... ඒවත් පුරුදු වෙලා තියෙන්න ඕන... බැඳපු කාලෙක තෝනටත් උදව් කරන්න ඕනනේ... නැත්නම් ඒ කෙල්ල පව්... අනේ සංදේශ් මේක ටිකක් තලල දෙන්න කියලා කිව්වොත් නේද...'

සියල්ලමත් හරිය. ඇගේ කටත් හරිය.

'බැන්දට පස්සේ කොහොමත් මං ගෑනිට සතියම උයන්න දෙන්නෑ...'

'ඇවිත් උදව් කරනවා...'

'මං පොල් ගාලා දෙනවා...'

'ම්...'

'ළූණු සුද්ද කරලා දෙනවා...'

'ම්...'

'මාළු කපලා දෙනවා... කුකුලෙක් ගෙනාවම කපලා දෙනවා...'

'ම්.. තව...'

'ඉඳි ආප්ප හදනකොට මිරිකලා දෙනවා...'

'තව...'

'ඉඳි ආප්ප මිරිකන ගමන් තව ඒවත් මිරිකනවා...'

මම ඇහට පහට නොදනී කීවෙමි. කෙල්ල සිනහව තවත්වා ගත්තේ අමාරුවෙනි. අවසානයේ ඇගේ දෙනෙත් වල කඳුළුද මතුවිය.

'නෝ..නා කියයි..'

ඇයට කියන්නට ගියදේ පවා හරි හැටි කියවෙන්නේ නැත.

'ඉතින් නෝනා මොනා කියන්නද...'

'මට.. හම්බවෙලා තියෙන්නෙත් හරි වල් හස්බන්ඩ් කෙනෙක් කියයි...'

'ඉතින් මොකද... හස්බන්ඩ් නෝනත් එක්ක වල් වැඩ නොකර එහා ගෙදර ගෑණි එක්ක වල් වැඩ කරන්නයැ...'

යළිත් ඇගේ සිනහව කුස්සිය පුරා විසිරී ගියේය.

'හරි... හරි... අයියා දිනුම්... ඒ..ක..ට..ත් ඉතින් වෙලාවක් තියෙන..වනේ...'

'හැහිම් ඇවිස්සෙන්නේ වෙලාවක් කියලා නෙමේ...'

මගේ ඇස්වල හිතුවක්කාර කමට ඒ මොහොතේදී දෑස් හියේ බිම ඉඳගෙන උන් ඇගේ නිරාවරණය වූ දෙපා දෙසටය. මටම පසුව ලැජ්ජාවක් ඇතිවිය.

'නෑ.. නෑ... අයියට එහෙම වෙන්නෑ... මං දන්නවනේ...'

චන්දනා කියද්දී මගේ ලැජ්ජාව නැති විය.

'ඉතින් තව මොනාද නෝනාට කරලා දෙන්නේ...'

'ඉරිදට ගේ අස් කරන්න උදව් කරනවා...'

'ම්...'

'එයාගේ පිට අතුල්ලනවා...'

ඇය අතින් කට හදගත්තේ ඒත් සමඟම මා යමක් කියාවි කියාය.

'හොඳට සබන් ගාලා පිට අතුල්ලනවා...'





'හරි... හරි... ඒක හරි...'

'ඇඟ අතුල්ලන ගමන්...'

කට හද කර සිනාසෙමින් යුවතිය මට දඹරැහිල්ල දික් කළාය.

'නෑ මං කිව්වේ කොණ්ඩේ පැමිණි දනාවා කියලා...'

එහෙත් මා කියන්නට ගියේ එය නොවේ.

'හොඳ ළමයා... පස්සේ...'

'රෑට නිදාගන්නකොට...'

'ඇති ඇති... ඊට පස්සේ එපා... මට හිතාගන්න පුළුවන්...'

'නෑ මං කිව්වේ රෑට නිදාගන්නකොට මළව අතගානවා කියලා...'

සුන්දර යැයි... ඉතාම සුන්දර යැයි කිව හැකි සිනහවක් ඒ මොහොතේදී චන්දනාගේ ඇස් වල විය.

'ඔච්චර හොඳ මහත්තයෙකුට කොහොමද සලකන්න ඕන කියලා නෝනාට නම් හිතාගන්න බැරුව යයි...'

'ඒක නෝනා දනගන්න ඕන...'

යුවතිය දෑස් බිමට බර කරගෙන දිගටම ඇඹුල් කැපුවාය. ඇය තොල් හූරමින් අඩන බව මට තේරුණේ පසුවය.

'අඩනවා නේද...'

'ඇඹුල් සැරට අයියේ...'

එහෙත් ඇය අඩන්නේ ඇඹුල් සැරට නොවන බව මම දනිමි.

'ඒ..යි මේ...'

මම පාත්වූනෙමි. කෙල්ල හිස එසවූයේ නැත.



www.sinhalaelibrary.com

'අඩන්නෙපා...'

'මං අඩන්නෑ කිව්වනේ... ඇණු සැර...'

'එහෙනම් ඔළුව උස්සනවා...'

'බෑ...'

'ඔය යට කලිසමත් පේනවා...'

මා කීවේ මා දුටු දේය. චන්ද්‍රනා දෙතොල් පට තද කරගෙන මට ගැසුවාය.

'ඕන නැති ඒවා බලන්නැතුව යන්න...'

මම සිනාසෙමින් නැගිට්ටෙමි. ඇය අද ඇඳි සාය අනුව ඇය කොහේ ඉඳගන්නද බාගයක් එළියේය...

'හරි හරි මං බලන්නෑ... දඟලන්නැතුව ඉන්න...'

අප කතා කරමින් සිටි මේ පැයට දෙකට ඇය රස වම්බටු මෝජුවක් මාළු ඇඹුල් තියලකුත් සීනි සම්බෝලයකුත් හැදුවාය.

'අයියා යන්න... මං පොල් සම්බෝලයක් හදලා බත් උයලා මේවා අස්කරලා එන්නම්...'

'මං ඉන්නකොට වදේ නේද...'

ඇය හිස ඔසවා අපූරුවට සිනාසී හිස දෙපසට වැනුවාය...

'වද දෙන අය කොච්චර හොඳද කියලා තේරෙන්නේ ජීවිතේ වද දෙන්නවත් කෙනෙක් නැති උනාම තමා...'

මට වඩා ගැඹුරින් චන්ද්‍රනා ජීවිතය තේරුම් ගෙන ඉන්නීය. කොහොමත් ගැහැණු ළමයින්ට පිරිමි ළමයින්ට වඩා වේලාසන ජීවිතය තේරුම් යයි...

# 33

සෙනසුරාදාට පහන් විය. මගේත් චන්දනාගේත් ජීවිත දෛවයේ සැහෙන කොටසක් විසඳෙන්නේ අදය. අම්මාත් තාත්තාත් නංගීත් දවල් කෑමට පෙර බණ්ඩාරවෙලට එනු ඇත. මම පාන්දරම නැඟිට සරමට උඩින් ජර්සියද දමාගෙන කුස්සියට ගියෙමි. කෙල්ල පාන්දරම සිට වැඩය.

'උදේට පානුයි පරිප්පුයි විතරයි හැදුවේ... ඕනනම් සීනි සම්බෝල ටිකකුත් තියන්නම්... නැත්නම් දවල්ට උයන්න වෙලා මදිවෙනවා...'

ඇය කීවේ අසරණවය. තවමත් ලාබාල යුවතියක් වූ ඇය මේ කරන්නේ අම්මා කෙනෙක් කරනා වැඩය.



www.sinhalaelibrar

'ඔයාට පිස්සුනේ දගෙන ඔක්කොම හදන්නේ... දෙකක් තුනක් පිඹිනාම ඇති...'

'හරි හරි... මං හදගන්නම්... මෙන්න ජේ... ගිහින් මූණ හෝදගන්න...'

ඇය ඉණට අත් දෙකද තබාගෙන කුස්සිය මැදට වී කියද්දී මට සිනා ගියේය. අද අම්මාත් තාත්තාත් එන්නේ අපේ දෛවයේද විශාල තීරණයක් රැගෙන බව මේ කෙල්ල නොදනී.

'ඔක්කොම හදලා තියනවා... බත කන්න ලංවෙලා උයනවා... ඇයි හිනාවෙන්නේ...'

'නෑ මුකුත් නෑ...'

අල තැම්බෙන්නට දමමින් ඇය මට රවිවාය. මමද ඇගට ඇද කර සාලයට ආවෙමි.

අද වැහි අඳුරින් තොර ලස්සන දවසකි. සාමාන්‍යයෙන් බණ්ඩාරවෙලට මෙහෙම දවස උදාවෙන්නේ අඩුවෙනි. මම සාලයේ මේසය දෙස බැලුවෙමි. චන්දනා උදෑසනින්ම කපාගෙන ආ කානේෂන් රෝස හා ජර්බරාස් මල් රැසක් මේසය මත විය. ඇය මේ මල් ගෙනෙන්නට ඇත්තේ ගෙය සරසන්නටය.

මම මිදුලට බැස ඇවිද්දෙමි. කුනී සීතලක් තිබුණද කාලගුණය සනීපය. පොඩි මාමා පෝකද රැගෙන මිදුලට ආවේ ඒ මොහොතේය.

'උඹ අද ඉන්නේ මේ ලෝකේ නෙමේ නේද...'

පොඩි මාමා මං දෙස බලා සිනාසී කීවේය.

'මේ පාරත් මං ආදරේ කරපු කෙල්ල මට ලැබුනේ නැත්නම් ආයේ කවදාවත් ගෑණියෙක් දිහා බලන්නෙවත් නෑ...'





'ගෑණුන්ව එපා කරවගන්නෙපා... ඊට පස්සේ ජීවිතේ කිසි ලසාවක් නෑ... කලාවක් නෑ...'

'මට ගෑණු ගොඩාක් ඕන නෑ පොඩි මාමේ... ආදරේ කරන එක ගෑණියෙක්ව මට ලැබුණ නම් ඇති...'

'ගොඩාක් උන්ට නැති වෙන්නෙත් ආදරේ කරපු ගෑණිව තමා බන්...'

පොඩි මාමා මට ලං විය.

'මොකද කෙල්ල කියන්නේ...'

'ඒකිට ඉව තියෙනවා...'

'ඒ කියන්නේ...'

'මගෙන් ඇහුවා ඇයි අම්මයි තාත්තයි හදිස්සියේ එන්නේ කියලා... මට මඟුලක් කතා කරන්න වෙන්න ඇති...'

'ඇත්තනේ ඉතින් මඟුලක් කතා කරන්නනේ එන්නේ...'

'ඒකනේ... පොඩි මාමේ... අනේ...'

මම බැගෑපත් උනෙමි.

'හරි බන්... මං උඹට කිව්වනේ...'

'මගේ ජීවිතේ... මොනා හරි වචනයක් හරි ගැස්සුනොත්...'

'උඹේ අම්මයි තාත්තයි නරක මිනිස්සු නෙමේ...'

පොඩි මාමා ගෙට ගියේ එසේ කියා මගේ පිටට තට්ටු කරය. මම එහෙමම මිදුලේ කොන්ක්‍රීට් බංකුවේ වාඩිවී ඈත කඳු දෙස බලා උන්නෙමි.

'සං..දේ..ශ්... අ..යි..යේ...'

චන්දනා මිදුලට බැස කතා කළාය. මං හිරු රැසින් රත්වූ කම්මුල් පිරිමදිමින් ඈ දෙස බැලුවෙමි. චන්දනා උන්නේ



www.sinhalaelibrary.com

ඉරට පිටුපා නිසා ඇය මට පෙනුනේ සිතුවමක් ලෙසිනි.

'එ..ත්..න වුව්ට..ක්...'

මම චන්දනා ළඟට ගියෙමි.

'ඇ..යි...'

'එන්නකෝ බඩුවක් පෙන්නන්න...'

මම චන්දනා පිටුපස ගියෙමි. සාලයේ ටීපෝව මත ඇය සෑදූ අලංකාර මල් සැරසිල්ලක් විය. කැපූ අලුත් මල් වලින් තනා තිබූ ඒ මල් සැරසිල්ල හදවත පැහැර ගන්නා සුළුය.

'ල..ස්..ස..න..ද...'

'නියමයි... මල් ඩෙකරේෂන් ඉගෙන ගෙන තියෙනවද...'

'ඉගෙන ගෙන නම් නෑ... ගෙදර ඉද්දී මං මල් කපං ඇවිත් නිකං ආසාවට කරනවා... ඇත්තටම ලස්සනද...'

මැජෙන්ටා සහ සුදු කානේෂන් මිශ්‍ර කර පයිනස් අතු සොදගෙන කර තිබූ මේ සැරසිල්ලේ මැද රතු රෝද මල් තුන හතරක් විය.

'රෝසස් මදි... තව රෝසස් තිබ්බ නම් ලස්සනට හදන්න පුළුවන්...'

'නෑ මෙහෙම ලස්සනයි... ඒක මෙතනටම තමයි ලස්සන...'

මම හදිස්සියේ මෙන් චන්දනා වෙතට නෙත් හෙළුවෙමි.

'මං බණ්ඩාරවෙලට ගිහිල්ලා ඕන නම් තව මල් ටිකක් අරන් එන්නම්... දවල්ට තව එකක් හදමු...'

'හා... තිබ්බ නම් ෂෝක්... අතනට...'

ඇය පෙන්වූයේ සාලයත් කෑම කාමරයත් අතර වූ





පැසේජයේ වූ රවුම් කැඩපත අසල වූ කුඩා ටීපෝව පෙන්වාය.

'එතනට ලස්සන කහ හරි රතු හරි රෝස ඇරේන්ජ් මන්ට් එකක්... මොනා හරි චූටි මල් ජාතියක් එක්ක රෝස ටිකක් අයියා ගේන්න...'

රෝස... රතු රෝස... ආදරයේ නිර්මල සංකේතය. මගේ ජීවිතය රතු රෝස දමා සරසනවාද සුදු රෝස තබා භූමිදනය කරනවාද කියා තීරණය කරන්නේ අදය...

'අ..යි..යේ...'

කාමරයට ආ පසුව යුවතිය කාමරයට එබුණාය. මා උන්නේ තුවාය ඇඳගෙනය.

'එ..න්..න...'

ඇගේ පෙනුම බැරෑරුම්ය.

'ම..ට හිතෙන දෙයක් මං කිව්වට කමක් නැද්ද...'

'කියන්න...'

චන්දනා මා අසළ සමාන්තරව සිට ගත්තාය.

'එ..ක්කෝ මේ දවස් දෙකේ ගොඩාක් සතුටු වෙන දෙයක් වෙයි... පුදුම සතුටක් වෙන දෙයක් නැත්නම්...'

'නැ..ත්..න..ම්...'

මම බියෙන් ඇසුවෙමි.

'නැ..ත්..නම් හරියට දුක හිතෙන පසුව පිච්චෙන දෙයක් වෙයි...'

මගේ දෑස් බිමට කඩා වැටුණි.

'නෝද...'

යුවතිය මගේ දෑස් වලටම එබී ඇසුවාය. මම ගොළුවෙකු



www.sinhalaelibrary.com

සේ හිස වැනුවෙමි.

'අම්මයි තාත්තයි එන්නේ මොකක් හරි විශේෂ හේතුවකට නම් ඇයි මට කියන්නැත්තේ...'

යුවතිය අසරණ හඬින් ඇසුවාය. මට කියන්නට දෙයක් නොමැතිව මොහොතක් බලා උන්නෙමි.

'එක අතකට කියන්න මං කවුද නේද...'

'කවුද කියලා කියන්න තවම වෙලාව වැඩියි...'

මට එකපාරටම එසේ කියවිණ. චන්ද්‍රා දෑස් විශාල කරගෙන බලා උන්නාය.

'ඔයා හිතුවා හරි... අද අම්මයි තාත්තයි එන්නේ විශේෂ හේතුවකට තමා... එයාලා එනවා නෙමේ...'

'එහෙනම්...'

'මං කියලා පොඩි මාමා ගෙන්නුවා...'

වියළී ගිය පොල් පට දිවගින් තෙමා චන්ද්‍රා දිග සුසුමක් ගත්තාය.

'මං නාම උදේ පහන තිබ්බේ නෑ... කියලා මං එක දෙයක් ප්‍රාර්ථනා කරනවා...'

'මොකක්ද...'

'මං වෙනුවෙන් දන් මං මොනාත් ඉල්ලන්නෑ... බුදු සාදු මට මොනාත් දෙන්නෙත් නෑ... දෙයියෝ දෙන්නෙත් නෑ... ඒත් මං අයියා වෙනුවෙන් දෙයක් ඉල්ලනවා...'

'මොකක්ද...'

'අයියගේ ජීවිතේට හොඳක්ම වෙන්න කියලා...'

දෙයක් හරියන්නට නම් ප්‍රාර්ථනාව හොඳ එකක් විය





යුතුය.

'අදට විතරක් ඔයත් මොනා හරි ඉල්ලන්න...'

'ඇයි අද විතරක්...'

යුවතිය දෑස් ඔසවා ඇසුවාය. ඒ දෑස් පුංචිය. එතරමටම තියුණුය.

'මං කියන දේ අහලා ඉල්ලන්නකෝ...'

'ම්...'

ඇය පද්ද පද්ද හිස වැණුවාය.

'මොනවද ඉල්ලන්නේ...'

මම ඒ දෑස් වලින් දෑස් නොගෙනම ඇසුවෙමි.

'ඒක මං හිතින්ම ඉල්ලන්නම්... ලැබුණත් නොලැබුණත් ඉෂ්ට උනත් නොවුනත් එතකොට ඒක මම විතරයි දන්නේ...'

'මාත් අද උදේ නැගිට්ට ගමන් එක දෙයක් ඉල්ලුවා... කවදවත් දෙයියන්ගෙන් මං මොනවත් ඉල්ලලා නෑ...'

'මොනාද ඉල්ලුවේ...'

ඇය හුරතල් වී ඇසුවාය.

'තෝ ඉල්ලපු දේ කියපන්... එතකොට මාත් කියන්නම්...'

'බෑ...'

'එහෙනම් මටත් බෑ...'

ඇය මල් කපන්නට ගත් පිහිය ඇඹිලි තුඩ මත තබා හිස එසෙව්වාය.

'පිහිය ගන්නවා අතකට...'

චන්ද්‍රා කුස්සියට ගියේ මට ඇඳ කරමිනි.



www.sinhalaelibrary.com

# 34

අම්මාවත් තාත්තාවත් නංගීවත් බණ්ඩාරවෙල ස්ටේෂමෙන් එක්කාගෙන එන්නට දුම්රිය පලට මා ගියේ තනිවමය. දුම්රිය බණ්ඩාරවෙල ස්ටේෂමට ළඟා වූයේ දවල් දොළහට කිට්ටු කරය. විශාල සෙනඟක් බණ්ඩාරවෙලින් බැස්ස නිසාදෝ මට එකවරම අම්මාවත් තාත්තාවත් සොයා ගන්නට නොහැකි විය.

'ලොකු පුතේ...'

අම්මාගේ කටහඬ ඇසී මම දුම්රිය වේදිකාවේ කෙළවර දෙස බැලුවෙමි. අම්මාත් තාත්තාත් නංගීත් දුම්රිය වේදිකාවේ කෙළවර බලාගෙන උන්නෝය. ඔවුන් දෙසට යද්දී එකවර ඔවුන් දෙස බලන්නට බැරි ගතියක් මට දැනුණි.





තුන්දෙනාම එක එල්ලේ බලා උන්නේ මා දෙසය. මට සිනා ගියේ ඉබේටමය. නංගී ඇසක් ගැසුවාය. මම ඇයට රැ විවෙමි.

'අම්මේ... තාත්..තේ...'

වේදිකාවේදීම මම අම්මාටත් තාත්තාටත් වැන්දෙමි.

'ම්.. තුණුරුවන් සරණයි... පොඩි මාමා ආවේ නැද්ද ලොකු පුතේ...'

'නෑ තාත්තේ... පොඩි මාමා ටිකක් දවල් වෙලානේ නිවාඩු දවසට ඇහැරෙන්නේ...'

අම්මා මගේ දෙපාත්තයේ සිට හිස දක්වා බලාගෙන ගියාය.

'බලං ඉද්දී ලොකු පුතා උස යනවනේ...'

ඇය කීවේ ආදරයෙනි.

'උස ගිහිල්ලා විතරක් නම් කමක් නෑ... නළුවා වගේ ලස්සන වෙලා...'

නංගී අම්මාගේ උරහිසට නිකට තබා සිටියාය. මම ඇගේ නහය මිරිකුවෙමි.

'යන් තාත්තේ... මං වාහනේ අරගෙන ආවා...'

මම තාත්තා අතින් බෑග් එක ගත්තෙමි.

'උදේට කාලද අම්මේ ඉන්නේ...'

'අපි පේස්ට්‍රි වගයක් අරන් කෑවා පුතේ...'

'හරි බඩගිනියි අයියේ... ලන්ච් රෙඩි වෙනවා ඇති නේද...'

'වෙනවා වෙනවා...'



www.sinhalaelibrary.com

'මොනවද කෙල්ල හදලා තියෙන්නේ...'

'මොනවද කෙල්ල හදලා තියෙන්නේ...' ප්‍රථම වරට වන්දනාව කතාවට ඇදුණි. මගේ පපුව දඩ දඩාස් ගා වෙව්ලන්නට විය.

'කෑම හදනවා... හිහින් බලන්නකෝ...'

'පව් කෙල්ල මහන්සි වෙනවා ඇති...'

ඒ කිව්වේ අම්මාය. ඒ වචන මගේ පපුවට සීතල දිය පාරක් මෙන් විය.

තාත්තා වැන් රියේ ඉදිරිපසට ගොඩ විය. අම්මාත් නංගීත් පසුපස ආසනයට ගියෝය. මම මවුන්ව නග්ගා පැමිණ රියදුරු අසුනට බර උනෙමි.

බණ්ඩාරවෙල නගරය මැදින් මම වාහනය පදවාගෙන එද්දී තාත්තා ආඩම්බරයෙන් මෙන් මා දෙස බලා උන්නේය.

'ලොකු පුතා දැන් ඩ්‍රයිවින් ලයිසන් එකත් ගත්ත නම් හරි...'

තාත්තා ආශාවෙන් කීවේය.

'කොළඹ ආපු වෙලාවක ගන්න ඉන්නේ තාත්තේ... පොඩි මාමා ඉන්නේ ජීප් එකක් ගන්න... එතකොට මේක මට දෙනවා කිව්වා...'

'මයා පොඩි මාමා කියන විදිහට ඉන්න... ඔයාට වරදින්නෑ...'

'මට දැන් බිස්නස් පුළුවන් තාත්තේ... එළවළු එක්ස්පෝට් වැඩේ පටන් ගන්නට පස්සේ අපට ගොඩාක් හොඳයි...'

'කසාදෙකුත් මය ගමන්ම බන්දලා දුන්නානම් තාත්තේ අයියගේ වැඩ ඉවරයි... නේද අම්මේ...'

නංගී කල්යල් බලා කීවාය. සුක්කානම අල්ලා ගෙන





උන් මගේ අත පවා වෙව්ලන්නට විය.

'මං ලොකු පුතාගේ සෝන්දරේ බලලමයි මේ ගමන ආවේ...'

අම්මා තීරණාත්මක හඬකින් කීවාය. මගේ දිවත වියළිණ.

'පුතාගේ අපල කාලේ ගිය විසිපස්වෙනිදයින් ඉවරයි... දැන් ඉඳලා දිගටම හොඳයි...'

'ඔවා මේ වෙලාවේ කතා නොකර ඉන්න... ගිහිල්ලා හිමිහිට කතා කරන්න...'

තාත්තා කීවේය. මම දහසක් බලාපොරොත්තු පපුවේ සඟවාගෙන වාහනය ගෙයි මිදුලේ නැවැත්තුවෙමි.

ඒත් සමඟම වන්දනා දොරකඩින් එලියට්ය. පුදට හුරු පසුබිමේ ලා වොක්ලට් පාට මල් වැටුණ සායක් සහ රෝස පැහැගත් බ්ලවුසයක් ඇඳ උන් ඇය සිනාමුසුවේ පුදුමාකාර ලෙසිනි. අම්මාත් තාත්තාත් වාහනයෙන් බැස කෙලින්ම බැලුවේ ඇය දෙසය. මාද කරගත හැකි දෙයක් නොමැතිව වන්දනා දෙසම බලා උන්නෙමි. යුවතිය එහෙමම පඩි බැස පැමිණ අම්මාටත් තාත්තාටත් දණ මඩා වැන්දය.

'කුණුරුවන් සරණයි... නැගිටින්න මැණිකා...'

අම්මා පුදුමාකාර ආදරයකින් ඇයව නැගිට්ටෙව්වාය. මට නංගී දෙස බැලිණි.

'මොනවද කර කර හිටියේ... උයනවද...'

අම්මා කරුණාබරව ඇසුවාය.

'උයලා ඉවරයි... බත විතරක් තියෙනවා තියන්න... මෙහේ බත් ඉව්ව ගමන් සීතල වෙනවනේ...'

අම්මා ගෙට ඇතුල් වූයේ ඇගේ හිස අතගාගෙනමය.

නංගී හැමෝටම පිටුපසින් සිට මගේ අත තද කර අල්ලා ගත්තාය.

'කමින් කලර් සෝ සෝ ගුඩ් නෝ...'

'ම්...'

ඇය කිවූ දේට මම හුම්ටි තැබුවෙමි.

'අයියා අද තිවාඩු දම්මද අයියේ...'

පොඩි මාමා තාත්තාත් අම්මාත් සමඟම සැටියට බර වෙමින් ඇසුවේය. අම්මාත් තාත්තාත් ආ මොහොතේ සිට මගේ පපුවේ ගැස්ම එතරම් හොඳ නැත. පෙරමඟ සලකුණු සුබ බව සැබෑය. එහෙත් හිත ඇත්තේ බියෙනි.

'සඳුදත් තිවාඩු දම්මා මල්ලි... දරුවන්ගේ වැඩ වලට ඉසින් තිවාඩු අරන් හරි එන්නෙපායැ...'

තාත්තා කිව්වේ මා දෙස බලා නොවේ. ඔහු වෙනුවෙන් මා දෙස බැලුවේ අම්මාය. මගේ යටි පතුලේ සිට සීතල විය.

'මොනා හරි බීලා වොශ් එකක් එහෙම දලා කෑම ටික කමු අයියේ... අක්කට කියන්න අක්කේ මේ දවස් දෙකේ මේ ගෙදර හිටියේ හරි අමාරුවෙන්...'

පොඩි මාමා කුස්සිය දෙස බැලුවේ හොරැහිනි. චන්දනා නංගීත් එක්කාගෙනම ඒ පැත්තට ගියාය.

'ඒ මොකද මල්ලී...'

'අහන්නකෝ ලොක්කගෙන්... වෙලාවකට සීනි සම්බෝල සුවඳ එනවා... මායි ලොකු පුතයි පාන් පෙත්තක් සීනි සම්බෝල එක්ක කනවා... වෙලාවකට ඇඹුල් තියල් සුවඳ එනවා... එතකොට මං ගිහින් හට්ටියට අත දලා කැල්ලක් කනවා...





වෙලාවකට මෝජු සුවඳ එනවා... හරියට මහල් ගෙදරක වගේ...'

පොඩි මාමා ලෝබකමක් නොමැතිවම ඇයට සහතිකයක් දුන්නේය. ඕනාවාට වඩා ඇයව වර්ණනා කරද්දීත් මට බියක් එයි.

'කෙල්ලගේ කෑම හරි රහයි තමා...'

පොඩි මාමා දත් දත් මොනවා හරි කියාවි යැයි මට බිය සිතුණි. ඒ කතා කතා කළ යුත්තේ මෙසේ නොවේ. හිමිහිට නිස්කලංකයේය.

චන්දනා තේ බන්දේසිය අරගෙන ආවේ එවිටය. සුදු තේ මග් එක වටා සීනි කිරි සහ කෝප්ප වෙන වෙනමම ඇය රැගෙන ආවාය.

'හදලම ගේන්න තිබ්බනේ පුතේ...'

එසේ කීවේ පොඩි මාමාය.

'ජයදේව අන්කල් කියලා තියෙනවනේ විශේෂ අමුත්තන් ආවම එහෙම ගේන්නෙපා කියලා...'

ඇය අහිංසකව කීවාය. තාත්තා පවා ඒ කතාවට සිනාසුනේය.

'ඒ ඉතින් පුතේ මෙහේට දියවැඩියාකාරයෝ එනකොටනේ... අපට නාම එහෙම ලෙඩ නෑ නේද අයියේ...'

චන්දනා තේ ටීපෝව මත තබා එනනාම දණ ඔබා ඉඳගත්තාය. ඇය මුලින්ම එළකිරිත් තේත් මිශ්‍ර කර තේ හැදුවේ තාත්තාටය. ඊට පසු චන්දනා ඇය රැගෙන ආ කුඩා කේක් කයිමද සමඟ තේත් තාත්තා අතට දුන්නාය. තාත්තා පරිස්සමින් ඇය දෙස බලා සිටිනු මම බලා උන්නෙමි. ඇත්තටම තාත්තා ඇය වැනි අහිංසක ලේලියක් බාර ගනීවිද...

'මේ එළකිරිද දුවේ...'

'ඔව්... වතුර දලා නෑ... සංදේශ් අයියා උදේට ඔය වගේ කෝප්ප තුනක් විතර බොනවා...'

ඇය මගේ කැරවිටුව පෑවාය.

'මේ අපේ ලොකු පුතා...'

'ඔව්... සංදේශ් අයියා මහත් උනේ එළකිරි වලට තමා...'

ඇත්තටම මං බණ්ඩාරවෙලට ආ පසු මහත් විය. වැඩිමනක් මහත් වූයේ ඇය හදන රස කෑම බඩජහරි කමට කෑම නිසාය.

'ලොකු පුතා බණ්ඩාරවෙලට ආවට පස්සේ මහත් උනා තමයි...'

අම්මාද කීවාය.

'ජෝක රහයි...'

තාත්තා සම්මානය දුන්නේය. යුවතිය අහිංසකව සිනාසුනාය. ඇය ඊට පසු කේක් සමග තේ ඇල්ලුවේ අම්මාටය.

'පොඩි දුව උස ගිහින් නේද අක්කේ...'

පොඩි මාමා නංගීගේ අත් දෙක කර උඩින් එක්කර ඇයව ඔහු උන් පුටුවේ වාඩි කරවාගෙන කීවේය.

'මං ටි..ක..ක් උස ගිහින් ඒකට අපේ අයියා... එළකිරි බීලද මන්ද පාට වැටිලා සුදු වෙලා...'

'එහෙනම් උඹත් මෙහේ නතර වෙයන්... එළකිරි බීලා උඹවත් එළකිරි පාටට ගන්නම්...'

'පොඩි මාමා අයියව බණ්ඩාරවෙලට ගත්තා... ගත්තම තමයි... දැන් අපට අයියා දකින්න මෙහේ එන්න ඕනා...





ඔහොම ගිහිල්ලා මාවත් ගත්තොත් අම්මයි තාත්තයි තනිවෙනවා...'

'කාලෙක අම්මවයි තාත්තවයිත් ගමු...'

'ඒකනම් හොඳ අදහස... මං කැමතියි...'

මම උඩ පැන කීවෙමි.

'මේ ගෙවල් දොරවල් පාළුවට ගිහින් තිබ්බෙ අක්කේ... මේ කෙල්ල ආවට පස්සේ තමයි මේවා අස් කරලා පින් පාටට ගත්තේ...'

අම්මාත් තාත්තාත් මුහුණට මුහුණ බලාගනු මම දුටුවෙමි.

'බලමුකෝ... ඉස්සෙල්ලා මේ දෙන්නගේ වැඩ ඉවරයක් කර ගන්න ඕන මල්ලී...'

ඉන් පසු කතාව නැවතිණ. මම අම්මාවත් තාත්තාවත් කාමරයට එක්කාගෙන ගියෙමි. චන්දනා කාමර අපූරුවට අස්කර ඇඳ කබඩ් මත ලස්සන මල් වාස්ද තබා තිබුණි. අම්මා ගිය ගමන් අතගෑවේ මල් කළඹය.

'මේ මොන මල්ද පුතේ...'

'එක මලක් කියලා නෑ අම්මේ... මෙතන තියෙනවා කානේෂන් ජර්බරාස් ලිලි ඔක්කොම...'

'ලස්සන ඇරේන්ජ්මන්ට් එක හදලා මේ ගෙන්නාපුවද...'

මම බිම බලාගෙන සිනාසුනෙමි.

'නෑ... අර ළමයා හදලා... මං මල් ගෙනල්ලා දුන්නා...'

අම්මාගේ දෙනුවන් මගේ මුහුණට විවර වී තිබෙනු මට දැනෙයි.

'හැම දේකටම කළින් මට ඔයත් එක්ක කතා කරන්න



www.sinhalaelibrary.com

ඕන... අපි කාලා කතා කරමු... හොඳේ ලොකු පුතේ...'

අම්මා මගේ බාහුව අතගා ආදරයෙන් කීවාය.

'හොඳයි අම්මේ... මං අම්මලා කියන දේ..ය..ක් ක..ර..න්..නේ...'

අවසන් වචන ටික කියද්දී මට ඇඬෙන්නාට මෙන් ආවේය.

'බයවෙන්නෙපා... ආයෙත් ඔයාව අපි අඬවන්නෑ... ඔයාට දුක් දීලා අපට සතුටක් නෑ... ඔයා සතුටින් ඉන්නවා දකින්නයි අපට ඕන...'

'මං උණු වතුර ටික ටබ් එකට පුරවන්නම් අම්මේ... තාත්තටත් නාගන්න කියන්න...'

මම උණු වතුර කරාමයත් සීතල වතුර කරාමයත් ඇර ටබ් එකට මඳ රස්නේ ඇති වතුර පිරවූයෙමි. තාත්තා තුවායක් ඇඳගෙන නාන කාමරයට එබුනේ එවිටය.

'ලො..කු පු..තේ...'

ඒ හඬ ගැඹුරුය.

'වතුර මං පිරෙව්වා තාත්තේ... ඇවිත් නාගන්න...'

'උණු වතුර ටිකකින් නාගන්නත් හරි ආසයි...'

තාත්තාගෙන් කොතරම් දැස් වසන් කරගන්නට හැදුවද අවසානයට අපේ දෑස් හමුවිය. මම සිනාසී බිම බලාගත්තෙමි.

'පුතාට අපි බඩුවක් ගෙනාව අම්මා ගාව ඇති බලන්න හොඳද කියලා...'

තාත්තා සෙනෙහසින් කීවේය. මම කාමරයට ගොස් අම්මා ඇලවී උන් ඇඳ මත ඉඳගත්තෙමි.

'මොනවද මට ගෙනාවේ... කෝ මට බලන්න ඕන...'





'තාත්තද කිව්වේ...'

'ඔව්...'

'දෙන්නකෝ...'

අම්මා ඇඳෙන් නැගිට ගොස් ඇගේ හෑන්ඩ් බෑගය උකුලට ගෙන එහි තිබූ කුඩා සිදු පැහැගත් කවරයක් දිග හැරියාය.

'මො..ක..ක්..ද අම්මේ...'

මම උනන්දුවෙන් ඇසුවෙමි. ඇය ඒ ස්වර්ණාභරණ පෙට්ටිය විවර කළේ ආශාවෙනි.

'ආ...'

ඒ සුන්දර අත් වෙන් පටකි. මම ආශාවෙන් එය අතට ගත්තෙමි.

'ඉන්න මං දාන්න...'

අම්මා මගේ දකුණතේ බ්‍රේස්ලට් එක දැමුවාය. අතම ප්‍රභාවත් විය.

'කවදද අම්මේ ගත්තේ...'

'ඊයේ හවස...'

'අපරාදේ මට ගත්තේ... නංගිටනේ රත්තරන් බඩුවක් අරන් දෙන්න ඕනා...'

'නංගිටත් ගත්තා පුතේ... එයාට මුද්දක් ඕන කිව්වා... පස්සේ අරන් දුන්නා... ඔය දත් ඉන්නේ...'

මම අත කරකවමින් හැඩ බැලුවෙමි. අම්මාත් තාත්තාත් හදිස්සියේ මට තෑගි ගෙනාවේ ඇයි...

'තාත්තමයි හිතලා කිව්වේ මොනවා හරි ගමු කියලා...

ඔෆිස් එකෙත් මොකක්ද බෝනස් එකකුත් හම්බ වෙලා...'

'ඔව්...'

මට ඉබේටම කියවිණ. අපට ලස්සනට අන්ද අම්මාත් තාත්තාත් පරණ ඇඳුම් පැළඳුම් අඳිමින් ජීවත් වෙති. ඔවුන්ට යමක් අරන් දිය යුතු යැයි මම සිතාගත්තෙමි.

අම්මාටත් තාත්තාටත් නාන්නට සූදනම් කර දී මම රන් බ්‍රේස්ලට් එකේ හැඩ බලමින් කුස්සියට ගියෙමි. නංගීත් චන්ද්‍රනාත් කුස්සියේ අත් වැල් පටලාගෙන කුටු කුටු ගාමින් උන්නෝය.

'මෙහේ දෙනවා අත...'

මම හොරෙන් මෙන් නංගීගේ දකුණත චන්ද්‍රනාගෙන් උදුරා ගත්තෙමි. පසුව ඇගේ අත මගේ අත්ල මත තබාගෙන තාත්තා ඇයට රැගෙන දුන් රන් මුදුවේ හැඩ බැලුවෙමි. එය කුඩා දම් පැහැයට හුරු ගලක් ඇල්වූ රන් මුදුවක් විය. නංගීගේ අතට ඒ මුදුව ලස්සනය.

'මෙහේ දෙනවා දන් ඔයාගේ අත...'

නංගීද මගේ දකුණත ගෙන ඉහළට එසවූවේය. අත්වෙන් පට සුන්දරව එල්ලෙන්නට විය.

'අම්මයි තාත්තයි ඒයේ ගත්තේ... මේක පේරුවේ මම... ලස්සනද අයියේ...'

'ලස්සනයි...'

'මං දන්නවනේ ඔයා ආස විදිහ...'

'ඒක ලස්සනයි තමා...'

මෙතෙක් වෙලා නිහඬව උන් චන්ද්‍රනා කීවාය. අත කණකර පාට අභිංසක කෙල්ල ඉදිරියේ රත්තරන් පෙන්වීම හොඳ නැති බව මට සිහිවූයේ පසුවය.





'මේ ටීත්ශ් එකත් ලස්සනයි...'

'අයියේ අයගේ අත් වලටත් ඔහොම යදී මුදු වැටෙයි...'

නංගී කීවේ අප දෙදෙනා දෙසම බලා නොවේ. චන්ද්‍රනාවත් මමවත් කතා නොකළෙමු.

'අම්මයි තාත්තයි මාලියෝ ස්වර්ණ මහල් ගියේ...'

නංගී තතනමින් යමක් කියන්නට ගියාය.

'ඉතින්...'

'ඉතින් තවත් දෙයක් ගත්තා... ඒ මොනාද කියලා මං කියන්නෑ...'

ඒ කුමක් විය හැකිද... මම අසන්නටද නොගියෙමි.

'අම්මයි තාත්තයි නානවා... නංගී ඔයත් නාගන්න බබා...'

'මං පස්සේ නානවා... මං..ට සීතලයි... සීතලට මං මෙහෙම මේ බදාගෙන හිටියේ...'

තෙල් හැන්ද අත දරාගෙන උන් චන්ද්‍රනාව නංගී යළිත් වතාවක් බද ගත්තාය.

'ඔන්න දන් තෙල් හැන්දට පිච්චෙනවා...'

'අම්මයි තාත්තයි නාලා ගමන් කන්න එයි... බත් ලිපේ තිබ්බද...'

'ඒක හරි...'

'දන් මොනවටද ඔය තෙල් ලිපේ තියන්නේ...'

ඇගේ වැඩ කෙරවිය්ති.

'කට්ලට් බදින්න...'

නංගී චන්ද්‍රනා පිටුපස සිට මට සිනාසුනාය.

'වැඩි නැද්ද...'

'ඉතින් මං කට්ලට් හදලා ෆ්‍රිජ් එකේ දාලනේ තියෙන්නේ... අරන් බදින්න විතරයි තියෙන්නේ...'

ඒ මොහොතේ ඇය ගොස් ශීතකරණය ඇර එහි රඳවූව අපූරුවට සාද ලූ මිටි එකකින් වසා තිබූ කට්ලට් පිඟාන ගන්නාය. මේ වැඩ ඇය කොහොම පුරුදු වූවාදැයි මටම ප්‍රශ්නයකි.

'අයියා මෙහෙට වෙලා එළකිරි බිබී... රට ශීතලේ කිරි කෝපි බිබී මේසියගේ කෑම හොඳට අඹර අඹර සැපට ඉන්නව නේද...'

'අයියෝ බබා ඔයා ඔච්චරද දන්නේ... මෙහේ තව කොච්චර සැප තියෙනවද...'

'මොනාද සැප...'

නංගී ඉණට දෑතම තබා ගනිමින් ඇසුවාය.

'විස්තර කරන්න බැරි සැප...'

චන්දනා කට්ලට් අටක් දහයක් පමණ පරිස්සමින් රත්වූ තෙලට දම්මාය. අම්මා නාගෙන කුස්සියට ආවේද ඒත් සමඟය. ඇය මගේ උරහිසට උඩින් චන්දනා කට්ලට් තෙලට දමන අපූරුවත් ඒවා චිරි චිරි ගගා බැදෙන ලස්සනත් බලා උන්නාය.

චන්දනා අම්මාව දැක්කේ පසුවය. ඇය කට්ලට් ටිකට පරිස්සමින් තෙල් වඩමින් අම්මා දෙස බලා ගෞරවාන්විතව සිනාසුනාය.

'ඇයි ලොකු පුතා මේ ළමයට මෙච්චර මහන්සි කරන්නේ... පව්නේ... අපිට දෙකක් තුනක් හැදුවනම් ඇතිනේ...'

දැන් අම්මා චෝදනා කරන්නේ මටය. මම චන්දනා දෙස බැලුවෙමි.





'නෑ ඇන්ටි... සංදේශ් අයියා කිව්වා මෙහෙම හදන්නෙපා කියලා... මා..යි හැදුවේ...'

'මඟුල් ගේකට වගේනේ දුවේ...'

'මං ආ..ස..යි ජයදේව අන්කල්ත් කිව්වා හදන්න කියලා...'

කට්ලට් එක රන් පැහැයට හැරී ඇත. යුවතිය තෙල් හැන්දෙන් තෙල් බේරා බැදුණු කට්ලට් ටික පරිස්සමින් කඩදාසි කොළයක් එළූ කිරි ගොට්ට මත තැබුවාය. බැදුණු කට්ලට් වල සුවඳට මගේ කටට කෙළ තලියක් ඉනුවේය.

'මං එකක් කනවා...'

මං උණු උණු කට්ලට් එකක් ගත්තෙමි.

'මටත් ආස හිතුණා කට්ලට් එකක් කන්න... මාළු වලින්ද දුවේ හැදුවේ...'

'ඔව්... තලපත් මාළු වලින්...'

'බලමු...'

අම්මා උණුවෙන්ම කට්ලට් එක කෑවාය. ගම්මිරිස් අල මාළු පදමට තිබූ කට්ලට් එක රසය...

'ඔයාට ආච්චිගේ අත් ගුණේ නම් හොඳට තියෙනවා...'

යුවතිය අහිංසකව සිනාසුනාය.

'දන් ආච්චිගේ තුන්මාසේ දානේ එනවා නේද...'

'ඔ..ව් ලබන මාසේ විසිහතර වෙනිද...'

'ජයදේව අන්කල්ටත් කියලා හොඳට දානේ දෙන්න...'

'පොඩියට හරි හදලා දෙනවා...'

ඇය ඇගේ ජීවිතය ගැන හිතන්නේ එහෙමය.

අම්මා සාලයට ගියේ තවත් කට්ලට් එකක් රැගෙනය.



www.sinhalaelibrary.com

'කට්ලට් සීයක් විතර කන්න පුළුවන්...'

නංගීද කට්ලට් එකක් ගනිමින් කීවේ රූපවාහිනී වෙළඳ දැන්වීමක් පොඩි එකෙක් කියන කතාව අනුකරණය කරමිනි.

www.sinhalaelibrar

# 35

"අ...යි..යේ... අපි වත්ත පැත්තට ටිකක් යන්..."

නංගි මගේ අතකින්ද අල්ලාගෙන කතා කළාය. ඇය මේ යන්නේ කුමක් හෝ කියන්නටය.

'අපි ඉක්මනට එන්නම් හොඳේ...'

ඇය චන්ද්‍රනාට කීවාය.

'හරි හරි... මං මෙසේ දනවා...'

වත්ත පැත්තට යද්දී නංගී මගේ අත අතහැර අත් වකුටු කරගත්තාය. දවල් වෙද්දී සීතල වැඩිවෙයි.

'අයියගෙන් මං පොඩි බඩුවක් අහන්න එක්ක ආවේ...'

'මොකක්ද...'

'මේ ප්‍රශ්නේ තාත්තයි අම්මයිත් ඔයාගෙන් අහනවා...'

'හරි බබා මොකක්ද...'



www.sinhalaelibrary

'අයියට දැන් විස්සයි...'

'ඔව්...'

'කොල්ලෙක්ට විස්සක් කියන්නේ බඳින වයසක් නෙමේ...'

'මං දන්නවා...'

'අම්ම කෙනෙක් තාත්ත කෙනෙක් භාරකාරයෙක් නැති අනාථ වෙච්ච කෙල්ලෙක්ව නිකං ආශ්‍රය කර කර සෙල්ලම් කරන්නත් බෑ...'

'හරි බබා... මං දන්නවනේ ඒක...'

'අයියගෙන් එක ප්‍රශ්නයක් අම්මයි තාත්තයි අහයි...'

'මොකක්ද...'

'අම්මයි තාත්තයි මෙහෙම කියයි... හරි ලොකු පුතා අපි මේ කෙල්ලව බාරගන්න කැමතියි... ඔයා දන්මම මේ කෙල්ලව බඳිනවද කියලා...'

මෙවැනි ප්‍රශ්නයක් ගැන ඇත්තටම මම සිතා නොමැත්තෙමි.

'අයියා මේ ඊයේ පෙරේද ඒ ලෙවල් වලට ලියපු කොල්ලා... ඔයා විස්සෙන් බැන්දොත් ඔයාට විසි එක වෙද්දි පැටියෙකුත් ඉන්නවා... ඔයා තාත්තා කෙනෙක් වෙනවා... මවා ගන්න මේ සංදේශ් කියන පොඩි කොල්ලා බබෙක්ව වඩාගෙන ඉන්නවා...'

මම මවා ගත්තෙමි. මට සිතා ගියේ ඉබේටමය.

'ඇයි හිනාවුනේ...'

'මට මැවිලා පෙනුණා...'

'හරි... මට කියන්න මෙච්චර පොඩි වයසින් ජීවිතේ





ඔක්කොම වගකීම් ටික ගන්න අයියා කැමතිද... මේ කෙල්ල වෙනුවෙන්...'

මම නංගී දෙස මොහොතක් බලා උන්නෙමි.

'මේ වගේ පොඩි ලස්සන කෙල්ලෙක්ව දක්කහම ඕන කොල්ලෙක්ට ආස හිතෙනවා. ඊටත් මේකි හරි ගුණ යහපත් කෙල්ල... ඒකත් ඇත්ත... ළමයෙක්කමට නිකං ආසාවට මේ කෙල්ලව බඳින්න කියල අයියට තීරණේ කරන්න පුළුවන්... ඒත් කසාද බඳිනවා කියන්නේ එහෙම ලේසි පාඩු දේකට නෙමේ... කසාද බඳින්නේ අයියා විතරත් නමා... ඒත් මම අම්මා තාත්තා පොඩි මාමා මේ ඔක්කොම ඒ කසාදේ ඇතුළේ ඉන්නවා... ඔයා බැඳලා ලස්සනට සතුටින් හිටියොත් අපි ඔක්කොම සැනසීමෙන් ඉඳී... ඒ වගේම නමා ඔයා ඔයාගේ කසාදේ අනාගත්තොත් අපේ ජීවිත වල මල්වෙඩි පිපිරුවත් වැඩක් නෑ... එහෙම නේද...'

'ඔව්...'

නංගී අද කතා කරන්නේ මහ අම්මණ්ඩියෙකු සේය.

'බැඳලා ටික කාලෙකින් අයියට හිතෙයි මං තරුණ කාලේ මේ කෙල්ලෙක්ව එල්ලගෙන දුක් විඳිනවා කියලා... පවුල් ජීවිතේ බර විස්සයි තිහයි කියලා නෑ... ඒක බරක්ම තමයි... අයියට හිතෙයි මට මොනාත් කරන්න බෑ මාව මේ කසාදෙට හිරවෙලා කියලා... එතකොට අයියා අවුල් වෙයි... ඔයා ඔයාගේ ඔහොම ගිහින් අන්තිමට ආදරේත් නැතිවෙයි... ඔයා ඔයාගේ ජීවිතේ ගැන ඊට පස්සේ හිතුවක්කාර තීරණ ගනී... ඒකෙන් මේ කෙල්ලත් අනාථ වෙනවා... සමහර විට පැටියෙකුත්



www.sinhalaelibrary.com

එක්ක... අම්මත් දුක් විඳී... තාත්තත් දුක් විඳී... ඒ වලින් මාත් දුක් විඳී...'

මම බිම බලාගෙනම උන්නෙමි. මේ ප්‍රශ්නයේදී මම ආදරය ගැන හැර අන් කිසිවක් ගැන නොසිතුවෙමි.

'මං මේ අයියව බය කරනවා නෙමේ... ඒත් අයියා අයියගේ හිතට තට්ටු කරලා අහන්න මං මේ කෙල්ලව බඳින්නේ ඇත්තටම ඒ කෙල්ලට ආදරේ නිසාද කියලා... එහෙමනම් ප්‍රශ්නයක් නෑ... ඒත් නිකං ආසාවට නම් කසාදයක් ගැන හිතන්නෙපා... ඒ කෙල්ලගේ ජීවිතේ එක්ක සෙල්ලං කරන්නත් එපා...'

'නංගී ම..ම...'

'හරි සුදු අයියේ මං දන්නවා ඔයා එහෙම කෙල්ලෙක්ගේ ජීවිතයක් එක්ක සෙල්ලම් කරන කොල්ලෙක් නෙමේ කියලා... විහිළුවට මං ඔය අනම් මනම් කිව්වට මං හොඳටම දන්නවා අයියා තවම මේ කෙල්ලව කිස් කරලවත් නැතුව ඇති...'

'ඔව්...'

'මං පිළිගන්නවා... ඔයා එහෙම කොල්ලෙක්... ඒත් කොල්ලෙක්ගේ ජීවිතයට කෙල්ලෙක් ආවට පස්සේ ඒ කෙල්ලට ඉතින් වෙන ලෝකයක් නෑ... පස්සේ කාලෙක අතෑර කරලා දාන්න හිතාගෙන දැන් ආදරේ කරලා වැඩක් නෑ අයියේ...'

නංගී කියන කතාව සම්පූර්ණ ඇත්තය.

'දැන් මට කියන්න අයියේ... පෙරහැරවල් හතම යන්න කැමති නම් විතරක් කරඬුව පිටට ගන්න... නැත්නම් දියවත් නොකපා ඉන්න...'



නංගී කීවේ මගේ බාහුව මත සීතල ඇඟිලි තුඩු තබාය.

'මං අයියව අවුල් කරන්න හැදුවා නෙමේ...'

'මං දන්නවා...'

'ඔයා මගේ අයියා... ඔයා දුක් විඳිනවා මට බලන් ඉන්න බෑ... ඒ වගේම තමයි...'

'මොකක්ද...'

'ඔයාට සැපක් තියෙනවනම් මං ආසයි ඔයා ඒ සැප ලස්සනට විඳිනවා දකින්න...'

'මං දන්නවා...'

'අපේ ජීවිතේ විසඳෙන්නේ අපි හිතන් හිටපු හැටියට නෙමේ... තාත්තා හිතන් උන්නා ඔයාව කැම්පස් යවන්න... ඒක බැරි උනා... දැන් ඔයා බිස්නස් කරනවා... ඒ හැටි... දෛවයට දොස් කියලත් බෑ... ජීවිතේ විසඳෙන්නේ ජීවිතයට ඕන විදිහටනේ...'

'අපි ඒක පිළිගන්න ඕන...'

'ඇත්ත... ඒත් සුදු අයියේ නාස්ති වෙලා කුඩු වෙලා යන්නත් බෑ...'

දැන් නංගී මගෙන් අසනා ප්‍රශ්නය මේ කසාදය නිසා මං කුඩු වෙනවාද නාස්ති වෙනවාද යන්නය.

'නංගී ඇහුවනේ මං මේ කෙල්ලට ඇත්තටම ආදරේද කියලා...'

'ඔව්... ඇත්ත ආදරේ මොකක්ද කියලා අයියා මට වඩා දන්නවා...'

'ඇත්තටම මං මේ කෙල්ලට ආදරෙයි... එක ආත්මයක්

www.sinhalaelibrary.com

තොමේ ආත්ම ගාණක් මාත් එක්ක දුක සැප බෙදාගන්න මේ කෙල්ල හොඳයි කියලා මට හිතෙනවා...'

'ම්...'

'අපි අද බඩා ගෙයක් දෙරක් හදාගෙන හිටියට අපිත් හරි සාමාන්‍ය මිනිස්සු...'

'ඔව්...'

'ඔයා මම හරි අහිංසකයි... මේ ලෝකේ ගොඩාක් කොල්ලෝ වගේ මං ආඩම්බර නෑ...'

'ඒක ඔයාගේ මූණ බැලුවාම පේනවනේ අයියේ...'

'ඔයත් එහෙමයි... ඔයාව මට පේන්නේ මේ රටේ ඉන්න ගොඩාක් කෙල්ලන්ට වඩා හරි පිරිසිදු කෙල්ලෙක් විදිහට... ඒ වගේම තමයි මට මේ කෙල්ලව පේන්නෙත්...'

මම නංගීගේ අකින් අල්ලාගෙන උයනේ පහළ මිටියාවතට ගියෙමි.

'මං ජීවත් වෙච්ච විදිහ නංගි දන්නවා... ඔයයි මමයි පුංචි කාලේ සෙල්ලම් කරපු හැටි මට තාම මතකයි...'

'මටත් මතකයි... අම්මගේ නැඹිලි පාට සාරිය සිවුර වගේ ඇඳගෙන අයියා බණ කියන හැටි මට තාම මතකයි... මං වැඳගෙන අහන් ඉන්නවා...'

නංගීගේ ඇස්වල කඳුළු මතුවිය.

'මං හරි ආසයි ලස්සනට ජීවත් වෙන්න... මං ලස්සනට ජීවත් වෙනවා නම් මට ඔයාව ඕනා... අම්මව ඕනා... තාත්තව ඕනා... පොඩි මාමව ඕනා...'

'ඔව්...'





'මං බඳින්නත් ඕනා ඔයාල ඔක්කොමල්ලට මං වගේම ආදරේ කරන්න පුළුවන් ගෑනියෙක්ව... එහෙම උනොත් මේ සම්බන්ධය දිගටම ලස්සනට තියෙයි... කයාදේ කියන්නේ දෙමව්පියන්ට දරුවෝ නැතිවෙන ගිවිසුමකට නෙමේ... සහෝදරයන්ට සහෝදරයන්ව නැතිවෙන ගිවිසුමකට නෙමේ... එහෙම වෙනවනම් එතන ප්‍රශ්නයක් තියෙනවා...'

'අයියා කියන දේ මට තේරෙනවා...'

'මට තියෙන ප්‍රශ්නේ මං කසාද බැඳලා ගෑනිගේ ලෝකෙට යනවද නැත්නම් ගෑනියෙක්ව මගේ ලෝකෙට ගේනවද කියන එක...'

'මේ කෙල්ල අයියගෙ ලෝකෙට එයිද...'

'නිකං නෙමේ මේ කකුල් දෙක අල්ලලා වැඳලා එනවා... මගේ විතරක් නෙමේ අම්මගේ තාත්තගේ පොඩි මාමගේ ඔයාගේ කකුල් දෙක අල්ලලා වැඳලා එනවා... ඒ විතරක් නෙමේ එයාව අපේ ලෝකෙට ගත්තම එයා ජීවිත කාලෙම අපට පින් දෙනවා...'

'මට තේරෙනවා...'

'මං කියන්නේ එක දෙයයි නංගී... මලක් පිපිලා තියෙනවා... ඒ මල අද කඩා ගත්තත් හෙට කඩා ගත්තත් දෙකම එකයි... ඒ නිසා මං මගේ පෙරහැරවල් හනම යන්න මං ලෑස්තියි... ඒ නිසා මං මගේ අතින්ම කරඬුව මගේ පිටේ තියාගන්නවා... ඔයා කියන්නේ ඇත්ත... මේ අවුරුද්දේ බැන්දොත් මං ලබන අවුරුද්දේ තාත්තා කෙනෙක් වෙනවා... ඔයා දන්නැති දේකුත් මං කියන්නම් මං ඊට පස්සේ අවුරුද්දෙත් තාත්තා කෙනෙක් වෙනවා... මං

කියන්නේ එක දෙයයි නංගියේ... ජීවිතේ හම්බ වෙච්ච හොඳම කෙල්ලව මං නැති කරගන්නේ නෑ... කසාදේ කියන්නේ ගෑණියෙක්ව ගෙනත් ඒ ගෑණිට සැප දෙන එකට නෙමේ... ගෑණියෙක්ගෙන් සැප ගන්න එකටත් නෙමේ... දෙන්නම එකතු වෙලා සැපක් හොයාගන්න එකට... මගේ සැප හොයාගන්න පුළුවන් මේ කෙල්ලත් එක්ක විතරයි...'

මම හුස්මක් වත් නොගෙන කියාගෙන ගියෙමි.

'එහෙනම් අයියා හිතාගන්න ඒ සැප අයියට ලැබෙනවා කියලා... අයියා මේ බර දරන්න කැමති නම් ඔයාට මේ කෙල්ලව ලැබෙනවා... අම්මලා මේකට කැමතියි... හැබැයි ඔයා ජීවිතේ කවදහරි මේ කෙල්ලව තනි කළොත් ඒ පපායට ඔයාට විතරක් නෙමේ අපිටත් වන්දි ගෙවන්න වෙනවා...'

'ඒක කවදාවත් වෙන්නෑ...'

'මං දන්නව අයියා ගැන.. ඔයා එහෙම කරන කොල්ලෙක් නෙමේ...'

නංගී මගේ අතකින් අල්ලා කීවාය. අප දෙදෙනාම අක්වැල් බැඳගෙන නිවස වෙතට ආවෙමු.

අප එන තුරු චන්දනා කුස්සියේ දොරකඩට වී උන්නාය. නංගිත් මමත් එක එල්ලේම කෙල්ලගේ දෑස දෙස බලාගෙනම පිටගැට පෙළ නැග්ගෙමු. ඇය අසරණව සිනාසුනාය. සමහර විට මේ ලෝකයේ ඉන්නා අහිංසකම යුවතිය චන්දනා විය හැක. ඇය ගැන මට හිතෙන්නේ එහෙමය.

'අයියයි නංගියි කොහේ ගිහින්ද කියලා මං බැලුවා...'

අප අවසාන පඩි ගැටවට පය තබද්දී චන්දනා කීවාය.

'අපි ගියා අපේ පොඩි පුයිවට් කතා බහකට...'





නංගී කියද්දී චන්දනා අසරණ ලෙස මා දෙස බැලුවාය. 'බයවෙන්න එපා' යැයි මට කියන්නට සිතුණි.

'මට උඹත් එක්කත් තියෙනවා තනිකරම පුයිවට් කතාවක්...'

චන්දනාගේ අතකින් අල්ලාගෙන නංගී කීවාය.

'මා එක්ක...'

'ඔව්... කාලා බීලා ඉවර වුනාම මං උඹව අල්ලගන්නම්කෝ...'

මේ වන්නේ කුමක්දැයි අසරණ ඇයට තේරුම් ගත නොහැක. නොවේනම් ඇය මේ සිදුවන දේවල් වලින් තැතිගෙන උන්නාය.

'අනේ කෙල්ල බයවෙලා... බයවෙන්නෙපා හරකී... කාලා අස් කරලා ඉවර උනාම අපි ගාඩින් එක පැත්තට යන්...'

'හා...'

'මට ඔයාට ගොඩක් දේවල් කියන්න තියෙනවා... ඒ ටික කියන එක මගේ යුතුකම...'

'අ..නේ මන්ද... මට නම් මොනාත් තේරෙන්නෑ...'

' රෑ වෙනකොට තේරෙයි... ඒවා වැඩක් නෑ... හරි බඩගිනියි කෙල්ලේ...'

'ඒකනේ අම්මයි තාත්තයිත් ඉඳගෙන ඉන්නේ... සංදේශ් අයියයි ඔයයි එනකල් බලන් ඉන්නේ...'

'යන් යන්... අයියා කියන්නේ මං උදේට කෑවෙත් නෑ... දවල්ට හොඳට කන්න ඕන නිසා...'



www.sinhalaelibrary.com

# 36

අම්මාත් තාත්තාත් පොඩි මාමාත් කෑම මේසයේ වාඩි වී උන්නෝය. ඇය අම්මාත් තාත්තාත් වෙනුවෙන් පිළියෙල කර තිබුනේ ඇටහෝම් ගෙයක වැනි කෑම මේසයකි.

'කොහෙද දෙන්නත් එක්ක ගියේ...'

අම්මා අත සෝදගනිමින් ඇසුවාය.

'ඉස්සර නම්යි අයියලා නංගිලට උපදෙස් දෙන්නේ... මං හොඳ දෙයක් අයියට කතා කරලා ඉන්නේ...'

නංගි අම්මණ්ඩියෙකු සේ කීවාය. මම හොරැහින් අම්මා දෙසත් තාත්තා දෙසත් බැලුවෙමි. අම්මා සිනාසී අහක බලාගත්තාය.





'තාත්තේ බෙදන් කන්න...'

මම කීවෙමි. ඒ අපේ පුරුද්දය. ඔහු බත් බෙදාගන්නා තුරු අපි බලා සිටිමු...

'මං ලොකු පුතේ මේ කල්පනා කළේ කොහෙන් පටන් ගන්නද කියලා... මේ දරුවා ගොඩාක් හදලනේ...'

චන්දනා වතුර රැගෙන එද්දී තාත්තා කීවේය. ඇය තොල් පට තද කරගෙන සිනාසුනාය.

'කෙල්ල ඊයේ ඉඳන් ලැස්ති උනේ...'

'තාත්තට මං බෙදන්නම්...'

මම තාත්තාගේ පිඟාන රැගෙන කෑම බෙදුවෙමි.

'පුතේ වම්බටු මෝජුවෙන් ටිකක් වැඩිපුර දාන්න...'

තාත්තාගේ ආසම කෑම තුන වම්බටු මෝජුත් අල හොද්දත් පපඩමුත්ය. ඒ තුනම අද ඇත.

'තාත්තා අම්මව බලන්න ආච්චිලාගේ ගෙදර ආවනේ...'

පොඩි මාමා අතීතය ඇදගත්තේය. අම්මා කට තද කර පොඩි මාමාට රැව්වාය.

'ඉතින් ඉතින් පොඩි මාමේ...'

නංගී පොඩි මාමාව කුලප්පු කළාය.

'ඒ කාලේ අම්ම මාර ලස්සනයි... කොටින්ම පොඩි දුවට වඩා හැඩයි... පොඩි ටිකේ පාටකුත් තිබ්බා...'

අපි සියල්ලෝම එකවර සිනාසුනෙමු.

'මා..ල්..ලී...'

අම්මා පොඩි මාමාට සැර කළාය. තාත්තා කරබාගෙන උන්නේය.

'ඒ කාලේ අම්ම තාත්තගේ හිත ගත්තෙත් ඔය වගේ හොඳ වට්ටක්කා ජෝඩුවක් කවලා තමා... මට අද වගේ මතකයි... මාර රහයි කිය කියා කෑවා...'

'හිත ගත්තම වැඩේ... ගෙදරටම අහත් ආපු නිසා ආච්චි දුන්න මිසක්...'

අම්මා කීවාය.

'අහන් ආවා කියලා ගෙදරට අරන් බන්දගන්න මිනිහා...'

තාත්තා කීවේ අප සියල්ලන්ම සිනාගන්වමිනි.

'හරි හරි... මං මේ තාත්තව බලෙන් බන්දවගත්තා... හරි එහෙම බලෙන් බන්දවගත්ත කියමු... ඒකෙන් කාටවත් වරදක් උනේ නැහැ... මං ඔක්කොම කරගෙන දුකත් විඳගෙන මේ නාම්බෙකුයි නැම්බියෙකුයි හදගෙන හිටියෙ නැද්ද...'

අම්මාගේ කතාව ඇත්තය. අපේ පවුල් ජීවිතය යාත්‍රාවක් නම් එහි නියමුවා තාත්තා නොව අම්මාය. ජීවිතයේ බර තිබුනේ ඇගේ දෑත මතය.

'ඇත්ත පුතේ... උඹලගේ අම්මා උඹලට හොඳ අම්මා කෙනෙක් උනා... අයියට හොඳ නැණියෙක් උනා... මට හොඳ අක්කා කෙනෙක් උනා... ජාති ජාතිත් මං නම් පතන්නේ මේ අක්කා මගේම අක්කා වෙලා උපදින්න කියලා...'

පොඩි මාමා ඒ වචන ටික කියද්දී ඔහුගේ දෑස් වල කඳුළු පිරී ගියේය. මම පසෙක සිටගෙන උන් චන්දනා දෙස බැලුවෙමි. ඇගේ ඇස් වලද කඳුළුය.

'මෙන්න් ටික හරි රහයි පුතේ...'

තාත්තා චන්දනා දෙස බලා කෘතඥ පූර්වක ලෙස කීවේය. ඇය අභිංසක ලෙස සිනාසුනාය.





'මට නම් ඔක්කොම රහයි... ඔයා මෙච්චර රහට මාළු ඇඹුල් සියල් දන්න ඉගෙන ගත්තේ කොහොමද...'

අම්මා අසද්දී ඇය ලැජ්ජාවෙන් මා දෙස බැලුවාය.

'ආච්චි හදනවා බලන් ඉඳලා...'

'ඔයාව බඳින කොල්ලා නම් දුවේ මාසෙන් මහත් වෙයි...'

අම්මා කියද්දී නැඟීත් පොඩි මාමාත් කැමිත් තවත්වා මා වෙතට හැරුණේය. මම කලබල වී හොටුකොළ සම්බෝල දිසිය සෙව්වෙමි.

'අක්කලා දන්න හොඳ කොල්ලෙක් නැද්ද අපේ මේ කෙල්ලට බන්දලා දෙන්න... අම්මපල්ලා මං බලලා ඔක්කොම කරලා දෙන්න ඉන්නේ...'

පොඩි මාමා කියද්දී මගේ පපුව පිච්චිගෙන ගියේය. ඔහු එය කියුවේ විහිළුවට බව සැබෑය. මම යාන්තමට ඇය දෙස බැලුවෙමි. චන්දනා කෑම මේසයේ තිබූ හිස් වූ මාළු ඇඹුල් සියල් දිසිය ගෙන හැරුණාය.

'කෙල්ලට කොළඹ කොල්ලෝ ගැලපෙයිද කියලා කවුද දන්නේ...'

අම්මා කීවාය.

'මෙ..හේ.. එ..න්න...'

නැඟී යන්නට ගිය ඇගේ අතින් ඇද්දය.

'ම..ම... මා..ළු අ..රන් එ..න්..නා..ම්...'

චන්දනා ඒ වචන පිට කළේ ඇඬුම් වාවාගෙන බව මම දනිමි.

'කෙල්ලට දුක හිතුණා...'

පොඩි මාමා කියුවේ එපමණකි. මේ සිදුවීමෙන් අම්මාත් තාත්තාත් ඉදිරිපිට වඩාත් අපහසුතාවයට පත් වූයේ මාය.

'තාත්තේ තව බත් ටිකක්...'

මා ඇසුවේ ඇතිවූ අපහසුතාවය වසා ගන්නටය.

'දන් දෙපාරක්ම කෑවා... තව හැන්දක් විතර දන්න පුතේ අල හොද්ද ටිකක් එක්ක...'

තාත්තා මෝජු දිසිය දෙස බැලුවා පමණි. ඒවා ඕනා කියා කියුවේ නැත. මම මෝජු හැඳි දෙකකුත් බෙදුවෙමි.

මාළු ගෙනෙන්නට ගිය චන්ද්‍රා යළි ආවේ මුහුණ සඟවාගෙනය. අප සියල්ලෝම ඇය දෙස බැලුවෙමු.

'අනේ දුවේ ඔයා කන්නැද්ද...'

පොඩි මාමා කරුණාබරව ඇසුවේය.

'මං... පස්සෙ කන්නම් අන්කල්...'

පොඩි මාමා ඇස්වලින් ඇඟෙන් කරනද කියා ඇසුවේය. කෙල්ල රැව්වාය.

හැන්දෑවේ ඇඟ සෝදමින් සිටියදී නංගී නාන කාමරය අසළට ආවාය. මම තුවායද ඇඳගෙන නාන කාමරයේ දොර ඇරියෙමි.

'ඇඟ හෝදගෙන අයියට එන්නලු...'

නංගී බරපතල හඬකින් කීවාය.

'ඉන්ටවීව් එක කරන්න යන්නේ...'

'ඔයා මාව බය කරනවා...'

මම අහිංසක හඬකින් අසරණව කීවෙමි.

'අයියන්ඩිය බිය නොවන්න...'





නංගී විහිළු කළාය.

'මං කෙල්ලත් එක්කත් කතා කළා...'

'මං ගැන...'

මම සිතලේ වෙව්ලමින් ඇසුවෙමි.

'ඔයා ගැන මං විශේෂයෙන් කතා කළේ නෑ... ඒත් ඒකි වචන දහයක් කතා කළොත් නවයක්ම ඔයා ගැන... අයියා හිතන්නේ මේ වෙන්නේ මොනවද කියලා දෙන්න දන්නෑ කියලද...'

'මං මගේ පොඩි මාමටත් කිව්වේ නෑ...'

'මාත් කිව්වෙ නෑ... ඒත් කෙල්ලට මොනාහරි තේරෙනවා... ඒකි හිතන්නෑ ඒ ඒකි ගැන කතා කරනවා කියලා... ඒකි හිතන්නේ ඔයාගේ කසාදේ ගැන මොනා හරි කියන්න අම්මලා ඇවිත් කියලා...'

මම ඇයව විවාහ කරගනී යැයි ඇය කොහෙත්ම හිතන්නේ නැත.

'ඇඟ හෝදගෙන ඉක්මනට එන්න... අම්මයි තාත්තයි පොඩි මාමයි මිදුලේ පුටු තියාගෙන ඉන්නේ... ඔයාගේ පුටුව විතරයි හිස්...'

'මං පට ගාලා එන්නම්...'

මම ඉක්මණින්ම ඇඟ සෝදගෙන මගේ සුදු සරමක් ටී ෂර්ට් එකක් ඇඳ ගත්තෙමි. ඊට උඩින් ජර්සියද දමාගෙන මම කැඩපත අසළට ගියෙමි.

සැබෑය... සංදේශ් තවම පොඩි කොල්ලෙකි. හරියටම කියනවා නම් මගේ තවම රැවුලවත් හොඳින් මුහුණ පුරා එන්නේ නැත. රැවුල එන්නේ කට වටා ටික පමණි. ඉඳුරු

හරියේ රැවුල එන්නේ අරියාදුවට ගොයම් හිටෙව්වාක් බදුව කැතිත් නැතය.

හිසට ඕඩික්ලෝන්ද, මුහුණට පෙයාර් ඇන්ඩ් ලව්ලිද, අතට බේබි ක්‍රීම්ද ගාගෙන මම සැරසුනෙමි. මේ වයසේදී මහුලක් කතා කරන්නට යාම කොතරම් බරපතල දෙයක්දැයි මට හරියට වැටහෙන්නේ දන්ය.

ජීවිතයේ වගකීම් ගන්නට වයසක් අවශ්‍ය නැත. මම මද්දුම බණ්ඩාර සේ සෙරෙප්පු දෙකද දමාගෙන කාමරයෙන් පිට උනෙමි.

මිදුලේ රෝස පඳුරු වලින් මැදි වූ තණකොළ බිස්ස මැද වේවැල් පුටු තබා මැද රවුම් ස්ටූල් එක තබා ඒ වටා අම්මාත් තාත්තාත් පොඩි මාමාත් නංගීත් උන්නෝය. එක අසුනක් හිස්ව තිබුණි. ඒ මගේ අසුනය.

මම ඔවුන් කරා යද්දී හතර දෙනාම එක වර මා දෙස බලා උන්නෝය. ලැජ්ජාවකට කෝල බවකට අපහසුතාවයකට සමාන හැඟුමකින් මම බිම බලා ගත්තෙමි.

'පුතා මේ හැන්දෑවේ නැවද...'

අම්මා ඇසුවාය.

'නෑ අම්මේ... ඇඟ සේදුවා...'

'ඔය නාලා වගේ පේන්නේ අම්මේ අයියා කොණ්ඩේ ජෙල් ගාලා... ඒකයි...'

නංගී රහස එළි කළාය.

'ඔය අනම් මනම් ගාලා අන්තිමට අඩු වයසින්ම කොණ්ඩේ සුදු වෙනවා..'

මම කරබාගෙන ඉඳ ගත්තෙමි.

'තේ එකක් බීලම අපි කතා කරමු අයියේ...'





චන්දනා හැන්දෑවේ තේ වලට සැමන් පේස්ට් දමූ සැන්ඩ්විච්ස් හදා තිබුණාය. ඊට අමතරව පොඩි මාමා ගෙනවිත් තිබූ බටර් කේක් එකක්ද ඇය කපාගෙන ආවාය.

'ලස්සන බ්ලවුස් එකක් ඇඳලා තියෙන්නේ... කොහෙන්ද දුවේ ඕක...'

තැඹිලි පැහැයට හුරු ඒ බ්ලවුස් එක බණ්ඩාරවෙලින් ඇයට ගෙනත් දුන්නේ මාය... ඒ මීට මාස දෙකකට පමණ පෙරය.

අම්මාට උත්තර දෙන්නට ප්‍රථම 'කියන්නදැයි...' කියා අසන්නට මෙන් යුවතිය මා දෙස බැලුවාය.

'ඇඳුම් ගන්න ගිය වෙලාවක සංදේශ් අයියා මට ගෙනත් දුන්නේ... අදයි ඇන්දේ..'

හැම දෙයකටම අද හසුවන්නේ මාවය. මා බණ්ඩාරවෙලට ගිය කලේ මේවාදැයි අම්මාත් තාත්තාත් ඇසුවොත් මට පොළව පලාගෙන යන්නට සිදුවෙනු ඇත.

'ජයදේව අන්කල් මාතලෙන් ගෙනාපු හොඳ කෝපි වගයක් තියෙනවා... ගෙදර බැදලා කුඩු කළේ... ඒ කෝපි හදන්නද...'

'ඔව් පුතේ කෝපි හොඳයි...'

තාත්තා ආදරයෙන් කීවේය. තාත්තාත් අම්මාත් සැන්ඩ්විච්ස් ගෙන කෑවෝය. මං නංගීට පීරිසියකට සෝස් දමා සැන්ඩ්විච්ස් පෙති කීපයක් දුන්නෙමි.

බණ්ඩාරවෙලට ටිකෙන් ටික අඳුර කඩා වැටෙන්නට විය. එහෙත් මිදුලේ අඳුරක් නොවූයේ මිදුලේ සවිකළ විදුලි පහන් වල ආලෝකය සුන්දරව මිදුලට වැටී තිබුණ නිසාය.

'අපි මේක කතා කරලා ඉවරයක් කරමු අයියේ...



www.sinhalaelibrary.com

නැත්නම් මේ කොල්ලා බොරුවට පිච්චෙනවනේ... මං දන්නවනේ ලොකු පුතාගේ හැටි...'

පොඩි මාමා කතාව පටන් ගත්තේය. මම ස්විටරයේ ගාංචුව සමඟ සෙල්ලම් කරමින් නෙත් බර කර ගත්තෙමි.

'ලොකු පුතා බණ්ඩාරවෙලට මං එච්චේ මල්ලී එක ප්‍රශ්නයක් වෙලා එයා මළුව අවුල් කරගෙන ඉන්නකොට...'

තාත්තා කීවේය. මට පුංචි ගැස්මක් ඇතිවිය. තාත්තා මුලින්ම අසුබ දෙයක් කීවේ ඇයි.

'ඒක අපි කව්රුත් දන්නවනේ අයියේ... එතනදිත් මං නම් ලොක්කට දොස් කියන්නෑ... අක්කයි පොඩි දූවයි කිව්ව විදිහට ජාති ආගම් ප්‍රශ්නේ ඇරෙන්න ඒ කෙල්ල හොඳ කෙල්ලෙක්...'

පොඩි මාමා මාව බේරා ගත්තේය.

'ඔව්... ඒ දරුවා අහිංසක දරුවෙක්... අපේ ජාතියේ උන්නනම් මං විරුද්ධ වෙන්නෑ...'

ශනීතා ඇත්තටම තරක යුවතියක් නොවේ. ඇය බොහෝ මිනිස්කම් හා ගුණ යහපත්කමේ සංකලනයක් වූ චරිතයකි...

'එතනදී අපිට එකක් තේරුම් ගන්න පුළුවන්...'

පොඩි මාමා මේ කියන්නට යන්නේ කුමක්ද...

'ලොකු පුතා හැමවෙලාවෙම ගුණ යහපත් කෙල්ලෙක්ව තෝරගන්නවා කියන එක...'

පොඩි මාමාගේ තර්කයට තාත්තාට එරෙහි විය නොහැක. ශනීතා මෙන්ම චන්දනාද ගුණ යහපත්ය.

'මොනදේ හරි වෙලා මං ලොකු පුතාව බණ්ඩාරවෙලට





එච්චේ මල්ලී එයාගේ ජීවිතේ පිළිවෙලක් කරවන්න... දිගටම ඉගෙන ගන්න ආසාවක් නෑ කිව්ව නිසා මල්ලී ළඟට වෙලා බිස්නස් ඉගෙන ගනී කියලා හිතලා තමයි මං එච්චේ...'

'හරි... පොඩි එකා මං ගාව හොඳට හිටියා... මගේ බිස්නස් හොඳට බලාගත්තා... ඇත්තටම කිව්වොත් අයියේ මේකට මිනිස්සු වශීවෙන ගතියක් තියෙනවා... බිස්නස් කරද්දි ඒක තියෙන්න ඕන... හොඟ කඩේට උනත් මිනිස්සු ආපු ගමන් අහන්නේ අද පොඩි මහත්තයා නැද්ද කියලා...'

පොඩි මාමා එසේ මා ගැන කියද්දී මට මා ගැනම මහා ආත්ම අභිමානයක් දනුණි.

'අනික ලොක්කා මං ගාවට ඇවිත් නාස්ති උනෙත් නෑ... එකා සතගෙවත් ජීවිතයක් නාස්ති කළෙත් නෑ... අක්කගේ පුතා නිසා කියනවා නෙමේ... ඒත් ලොක්කා ගොඩක් කොල්ලන්ට වඩා වෙනස්... උාට අපි කාටවත් නැති මහ හාස්කම් පිහිටලා තියෙනවා...'

මගේ දසට කඳුළු ඉනුවේය. ඒවා එහෙමමම ගලා හියේය.

'අඩන්නෙපා ලොකු පුතේ...'

අම්මාද හඬමින් කීවාය. දරුවන්ගේ ගුණ කියද්දී අම්මලාට ඇඬෙයි...

'ලොකු පුතා පින් කරලා අපේ පවුලේ ඉපදුනා නෙමේ... අපි පින් කරපු නිසා පොඩි එකා අපේ පවුලට ලැබුණා... මේකට දකිද්දී මට එහෙමයි හිතෙන්නේ...'

පොඩි මාමා එසේ කියන්නේ ඇයි. මම ඒ තරම් වටිනා පුතෙක්ද... මටවත් නොතේරෙන මගේ වටිනාකම කුමක්ද...



www.sinhalaelibrary.com

'අක්කයි අයියයි දන්නවනේ මං මේ සීතල බණ්ඩාරවෙලට වෙලා ගත කළේ මහ මුසල තනිකඩ ජීවිතයක්... ඇත්තටම සිව්වොක් අක්කේ මං කොල්ලා එන්න කලින් හැමදම හවසට බාගයක් බොනවා... බීලා ඇවිත් නිදාගන්නවා... නැත්නම් මේ මිදුලට වෙලා තවත් බිබී ඉන්නවා... අර කෙල්ල දන්නවා ජීවත් වෙච්ච විදිහ... ඒත් මේ කොල්ලා ආවට පස්සේ මගේ ජීවිතේ ගොඩාක් වෙනස් උනා... බාගයක් බීපු මම බියර් වීදුරුවට බැස්සා... අන්තිමට මම ඒකත් ඇත්ඇරියා... මං බිස්නස් එක උනාත් කරගෙන ගියේ ඕනාවට එපාවට... ඒත් මේකා ආවට පස්සේ මං එකත් උනන්දුවෙන් කළා... මට හිතුනා මගේ බිස්නස් එකට දන් උරුමක්කාරයෙක් ඇවිත් කියලා... මං ඌට මේ බිස්නස් ටික රැකලා දෙන්න ඕන කියලා මට හිතුණා...'

අප සියල්ලෝම අසා උන්නෙමු. පොඩි මාමා දිගටම කතා කළේය. ඔහු අද මේ තරම් කතා කරතැයි මම ඇත්තටම නොසිතුවෙමි.

චන්දනා කෝපි රැගෙන අප අතරට ආවේ ඒ මොහොතේය.

'ම්... කෝපි සුවඳ හොඳට එනවා...'

අම්මා කීවාය.

'ජයදේව අත්කල් ගෙනාපු කෝපි ඇට...'

'හොඳයි පුතේ ඔයා යන්න...'

පොඩි මාමා ඇයට ඇරලුවේය. මම කරබාගෙන සියල්ලන්ට කෝපි දුන්නෙමි.

'මේ කෙල්ල අනන්ත රෑ වල මේ ගෙදරට එනවා... මං





ගෙදර නෑ... මේකා විතරයි තනියම උන්නේ... අක්ක කියන්නේ මං බයවුනාද... මූ කොල්ලෙක්... මං දන්නැද්ද කොල්ලන්ගේ හැටි... මේ වගේ හුරුබුහුටි ලස්සන කෙල්ලෙක් තනියම හම්බවුනාම වරදක් වෙන්න බැරිද... අනික මේකිත් ලොකු පුතාට පැලෙන්න යන කෙල්ල... ඒත් මට බය හිතුනේ නෑ... මං දන්නවා ලොක්කා ගැන... ඌ එහෙම කොල්ලෙක් නෙමේ... කෙල්ලගේ ආච්චි මැරුණට පස්සේ මං කෙල්ලව මේ ගෙදරට ගත්තෙත් ඒක නිසා... මූත් දෙන්න කරන එකම වරද රෑට ඔත්ත බය පඩියට වෙලා කතා කර කර හිටපු එක විතරයි... අයියා අයියගේ පුතාට ආදරෙයි... ඒ තරමටම මම ලොක්කට ආදරෙයි... මූ වරදක් කරගෙන යනවා නම් අයියා ඒක නවත්තන්නේ කොහොමද එහෙමම තමයි මමත්... ඒත් මේ කොල්ලා එහෙම වරදක් කළේ නෑ... මට ඒක අයියයි අක්කයි පල්ල කියලා දිව්රලා කියන්න පුළුවන්...'

පොඩි මාමා මේ වර්ණනා කරන්නේ මගේ ආත්ම දමනය ගැනය. ඇත්තටම ඇය ගැන එහෙම හිතුන දවස් නැතුවා නොවේ. එහෙත් මම මගේ නංගී ගැන හිතනා තරම් හක්කිමත්ව ඇය ගැන සිතා මගේ සීමාවත් මමම පනවා ගත්තෙමි.

'කොල්ලෙක්ගේ හිතේ තියෙන වනචරකමයි අවලම් කමයි අහිංසක ආදරයයි අතර වෙනසක් තියෙනවා... තමන්ගේ හැඟීම් ආශාවන් ගැන විතරක් හිතලා කෙල්ලෙක්ගේ ජීවිතයක් එක්ක සෙල්ලම් කරන්න හැදිච්ච කොල්ලෙක්ට බෑ... ලොකු පුතා එහෙම කළේ නෑ... ඒත් අයියේ...'

ඔහු කතාව නවත්වා මා දෙස මොහොතක් බලා උන්නේය.

මම දිගටම කෝපි කෝප්පයේ දාරය වටේ ඇඟිලි තුඩු යවමින් උන්නෙමි.

'ලොක්කා කව්රුහරි කෙල්ලෙක්ට ආදරේ කරනවනම් ඒක නැති කරලා දන්න මට බෑ... අයියා දන්නවා අක්කා දන්නවා මං ආදරේ නිසා හරියට විඳෙව්ව මිනිහෙක්... අදටත් මට පවුලක් දරුවෙක් නැත්තේ ඒ තුවාල නිසා... එහෙම විඳෙව්ව මං අහිංසක කොල්ලෙකුගේ ආදරේකට අකුල් හෙලන්නෑ... ඒත්...'

පොඩි මාමා යළිත් කතාව නැවැත්තුවේය.

'මම මේකගේ පොඩි මාමා... අයියා මූව මං ගාවට එව්වේ යම් කාරණාවක් නිසා... ඒ නිසා මට වගකීමක් තියෙනවා මේකගේ ජීවිතේ ගැන... මූ බණ්ඩාරවෙලට ඇවිල්ලා නාස්ති උනොත් ඒකට වග කියන්නෝන මම...'

එහෙත් මම නාස්ති නොවූනෙමි. ආදරය කිරීම නාස්ති වීමක් නොවේ.

'ලොකු පුතා බණ්ඩාරවෙලට ආවට පස්සේ ගොඩාක් වෙනස් උනා... හිත තනිකරම සවුත්තු කරගෙන ආපු කොල්ලා ටික ටික හිත හදගත්තා... ඒකා ආශාවෙන් වැඩ කරන්න ගත්තා... අලුතෙන් මං පටන් ගත්ත යත එළවළු එක්ස්පෝට් කරන තැන වැඩ ටික කොල්ලා හොඳට බලාගත්තා... මූගේ වයසට වඩා දක්ෂකම් මූට තියෙනවා... ඒ ඔක්කොම මැද මට යංතමට තේරුණා ලොකු පුතා මේ කෙල්ල ගැනත් ටික ටික හරි හිතනවා කියලා... මං බාධා කළේ නෑ... මොකද මෙතන ගිනි ගන්නෑ කියලං මං දනං උන්නා... මේ කොල්ලා





වගේම මේ කෙල්ලත් හොඳයි... ඒකි ගැන මං වෙනම කියන්නම්... කොහොමහරි මේ කෙල්ලගේ ආච්චි නැති උනා... එතනදි මේ කෙල්ලගේ ජීවිතේ ගැන ඒකිගේ අනාගතේ ගැන ලොකු ප්‍රශ්නයක් ඉතුරු උනා... ඒක ගැන මාත් හිතුවා... මෙතන මේ කෙල්ල මාත් එක්කම හිටපු කෙල්ල... අක්ක කියන්නේ මේ කෙල්ල මට අසනීප වුන වෙලාවල් වල සිය වතාවක් විතර මගේ ඔළුවට ඔඩි ක්ලෝත් දලා අතගාලා තියෙනවා... දූවෙක් වගේ... ඒ නිසා මම ඒකි ගැන හිතුවා... ඒත් මටත් වඩා ඒ කෙල්ලගේ අනාගතේ ගැන ලොක්කා හිතුවා... මරණෙන් පස්සේ ලොක්කා මගෙන් ඇහුවා මේ කෙල්ලගේ ජීවිතේ අනාගතය මොකක්ද කියලා...'

ඇත්තටම මම පොඩි මාමාගෙන් එසේ ඇසූවෙමි. ඒ ආච්චිගේ හත් දවසේ දානයෙන් පසුවය.

'එහෙම අහනකොට මේකගේ මූණේ ඒකට උත්තරයකුත් තිබ්බා... මට පුළුවන්ද පොඩි මාමේ මේ කෙල්ලගේ අනාගතේ භාරගන්න වගේ උත්තරයක්... ඒත් අයියේ... අනාථ වෙච්ච කෙල්ලෙක්ට අනුකම්පා කරලා මට ඒකාගේ අනාගතේ අවුල් කරන්න පුළුවන්ද... එහෙම දෙයක් වෙන්නේ අනුකම්පාවට විතරක්ම නම් ඒකට ඉඩ දෙන්න පුළුවන්ද...'

'ඔව්... මල්ලී කියන එක හරි... අනුකම්පාවට ගැණු කරගන්න පිරිතක් නෑ...'

තාත්තා පැහැදිලිව කීවේය.

'හරියට හරි... ඒ වෙලාවේ මං ලොක්කව ඉන්වච්ච කළා... මං ලොක්කට කිව්වා උඹ මේ කෙල්ල ගැන



www.sinhalaelibrary.com

හිතන්නෙපා... මේ කෙල්ල දන් අනාථ වෙලා ඉන්න කෙල්ලෙක් කියලත් හිතන්නෙපා... උඹ බඳිනවනම් බඳින්නේ කොහොම කෙල්ලෙක්ද කියලා හිතපන් කියලා...'

'එතකොට...'

'මෙකා දිග උත්තරයක් කිව්වා... ඒක අයියා පුතාගෙන්ම අහගන්න... එයත් කතා කරන්න ඕනනේ.. කොහොමහරි ඒ කතාව ඇත්ත... අයියයි අක්කයි හැදුවේ නගරං කොල්ලෙක්ව නෙමේ... රස්තියාදුකාරයෙක්වත් නෙමේ... අද ඉන්න ගොඩාක් කොල්ලන්ට වඩා වෙනස් අහිංසක කොල්ලෙක්ව... දන් අයියා බලන්න මේ ටිකට මෙකා තුන් පාරක් අපි ඉස්සරහා ඇඬුවා... ඒ උගේ අහිංසකකම... අක්කා හිතනවද මේ මලක් වගේ ඉන්න කොල්ලව මොණරියක් වගේ ඉන්න කෙල්ලෙකුට ගැළපෙනවා කියලා... මේ කොල්ලව එහෙම කෙල්ලෙක් බලා ගනී කියලා... මං අහන්නේ එහෙම කෙල්ලෙක් එක්ක අයියට අක්කට පොඩි දුවට ජීවත් වෙන්න පුළුවන්ද... ලොක්කා හිතුවේ ඒක... ඌ දනන් උන්නා ඌ ඉපදිච්ච පවුල ගැන... තමන්ගේ අම්මා කාන්තා ගැන... නංගී ගැන... ඌට ඕන උගේ හොඳ ගුණ යහපත් කෙල්ලෙක්ව ගෙදරට ගේන්න... ජීවිතේ කියන්නේ අයියේ බැඳගෙන විඳින්න පුළුවන් දෙයකට නෙමෙයිනේ... බෙදාගෙන විඳින දේකට... අපේ ලොක්කට විතරක් නෙමේ කවදහරි පොඩි දුවටත් ගැළපෙන්නේ මේ ලොක්කා වගේම අහිංසක අපිටත් පොඩි මාමේ කියලා වඳින අපිත් එක්කම හැදිලා ඉන්න හොඳ කොල්ලෙක්ව... අපි හිතන්නෝන අපේ දරුවන්ට දැවැද්දට ලැබෙන දේපොල





ගැනවත් කසාදෙන් උන්ට ලැබෙන අතිජ් දේවල් ගැනවත් නෙමේ... අපි නැති කාලෙකත් උන් සැනසීමෙන් දරු මල්ලෝ හදාගෙන ජීවත් වෙනවද කියන එකයි... අක්කයි මායි අයියයි කොහොමත් මුන් දෙන්නට කලින් මැරෙනවා... එදාට මේ ලොකු පුතායි පොඩි දුවයි විතරයි ඉන්නේ... වෙන නෑදෑයෙක් වත් නෑ... එහෙම එකේ උන් තනිවෙන්න ඉඩ දෙන්න නරකයි... උන් දුක් විඳින තීරණ අපි ගන්න නරකයි... අපි තුන්දෙනාට සැනසීමෙන් මැරෙන්න තියෙන්න ඕන... මුන් දෙන්නාගේ දරුවෝ දේකුන් දෙනෙක්ගෙන් සීයා ආච්චි කියලා අහගෙන මැරෙන එක තරම් මටනම් සතුටක් නෑ අක්කේ... ඇ..ත්..ත..ට..ම.. නෑ...'

පොඩි මාමා ඒ වචන ටික කීවේ ගොරෝද්ද හඬකිනි. මට පසෙකින් උන් නංගීද ඇස් පිසදැමුවාය.

'ඉස්සරහට වෙන්නේ අදටත් වඩා අමාරු තිරිසන් කාලයක්... එහෙම ලෝකෙක මේ දෙන්නව තනි කරන්න හොඳ නෑ... උන්ට උන්ගේ ලෝකේ අහිංසකව හදාගන්න දෙන්නෝන... එයාලා පැළෙන්න යන ලෝකේ එයාලව දෙන්න ඕන... අපි අඩුපාඩුවක් තියේනම් හදලා දෙන්නෝන... එක දෙයක් ගැන සැනසෙන්න පුළුවන් අයියේ... මේ ළමයි අහිංසකයි... මල් වගේ... උන්ව අපි බලාගන්න විතරයි ඕනේ... කලන්න නරකයි...'

'මං එහෙම කරනවා කියලා කිව්වේ නෑනේ මල්ලී...'

කාන්තා කණගාටුවෙන් කීවේය.

'මං ලොක්කාගෙන් අද ගොඩාක් දේවල් ඇහුවා... ලොක්කා



www.sinhalaelibrary.com

ඒ හැම දේකටම අවංකව උත්තර දුන්නා... එක තැනකදී මං ලොක්කට හොඳට ඇදිත්තා... තේරුම් ගත්තා... මං එද කිව්වා උඹට ඕන නම් මේ කෙල්ල එක්ක යාළුවෙයන් කියලා... ඒකිගෙන් අහන්න විතරයි ඕනේ... අහන්න ඕනෙත් නෑ... ඒත් ලොක්කා කිව්වේ පුදුම කතාවක්... ආයෙමත් අම්මගෙයි තාත්තගෙයි වචනෙන් පිට කිරණ ගන්නෑ කිව්වා... හදිස්සියේ මේ කෙල්ල එක්ක යාළුවෙලා පස්සේ තාත්තා කිව්වොත් ඔක නවත්තපන් කියලා මේ කෙල්ල ජීවිතේ තවත් අනාථ වෙනවා කිව්වා... ඒ නිසා එහෙම ඒ කෙල්ලගේ හිතට බොරු බලාපොරොත්තු දීලා ඒකිව අනාථ කරන්නෑ කිව්වා... කවදාහරි එහෙම සම්බන්ධයක් ඇතිවෙන්නේ තාත්තයි අම්මයි හොඳ හිතින් කැමැත්ත දුන්නොත් විතරයි කිව්වා... ඒ මනුස්සකම අයියේ අපිටවත් නෑ... තමන්ට සදකාලිකව අයිති වෙන්නැති කෙල්ලෙකුට... ජීවිතයට වගකියන්න බැරි කෙල්ලෙකුට අත තියන්නැති කොල්ලෙක් හරි උකුම්... එහෙම කොල්ලෝ අද නෑ... තමන්ගේ හිතේ ආදරයක් තියෙද්දී ආසාවක් තියෙද්දී ඒක පාලනය කරගෙන හිටන්නියෙක් හරි කෙල්ලෙකුගේ ජීවිතයක් ගැන එහෙම හිතනවද අද ඉන්න කොල්ලෝ... එතකොට තමයි මං කිව්වේ එහෙමනම් ලොකු පුතේ අපි අම්මගෙනුයි තාත්තගෙනුයි අහමු කියලා... මෙක මෙච්චර ඉක්මනට මං කරන්න හිතුවේ මේ කෙල්ල ගැන හිතලා නෙමේ අයියේ... මේ කොල්ලා ගැන හිතලා... ඌ පිච්චෙනවා බලන් ඉන්න බෑ... හොඳ කොල්ලෙක්ව එහෙම පුච්චන එක හොඳ නෑ... එහෙම එකෙක්ට පුළුවන් උදව්වක් කරන්න ඕන... හොඳ දරුවෙක්ට හොඳ විදිහට උදව් නොකර හිටියාම





දෙවියොත් අපට දෙස් තියයි... මොකද මූ තරම එකෙක් නම් අපි මොනවා කිව්වත් ඌට ඕන දේ කරනවා... ලොක්කා එහෙම කළේ නෑ...'

පොඩි මාමා කතාව නිමා කර කෝපි එක අතට ගත්තේය. මගේ පපුව දිගටම තිබුණේ හිරවීය.



www.sinhalaelibrary.com

# 37

අප හතර පස් දෙනා අතර කෙටි නිහඬතාවයක් ගලාගෙන ගියේය. ඊළඟට කතා කළ යුත්තේ තාත්තාය. වඩාත් වැදගත් වන්නේ ඔහු කියනදේය. කවමත් මගේ දෛවයේ විසඳුම ඔහු තීරණයකර නොමැත.

ඒ නිසාම මම කරබාගෙන බිම බලාගෙන උන්නෙමි. වෙනදට මේ මිදුලේ සිටිද්දී කඳ සීතලක් දැනෙයි. එහෙත් ඒ තරම් සීතලකදීත් අද මගේ පපුවෙන් දහදිය බේරෙයි. ඒ තරමටම මා ඉන්නේ දෙගිඩියාවෙනි.

මම වරක් යාන්තමට හිස ඔසවා අම්මා දෙස බැලූවෙමි. ඇය යාන්තමට සිනාසුනාය.

'මං මේ ලොකු පුතාටයි පොඩි දුවටයි කියන්නේ... ඔයාලා දෙන්නට මට මහ සැපක් නම් දෙන්න බැරි උනා...





ඒත් මං ඔය දෙන්නව කවදාවත් බඩගින්නේ තිබ්බේ නෑ... මං ජොබ් එක කරන්න පටන් අරගෙන දැන් අවුරුදු විසි පහකට වැඩියි... ඒ අවුරුදු විසි පහේම මං කන්තෝරු බඩගාලා, දුක් විඳලා හම්බ කළේ ඔය දෙන්නා ගැන හිතලා... හම්බ කරලා හම්බ කරලා මට ගෙයක් හදාගන්න පුළුවන් උනේ මේ ළඟකදී... මං හරි ආසාවෙන් හිටියා ලොකු පුතාට කම්පියුටරයක් අරගෙන දෙන්න... බයික් එකක් අරන් දෙන්න... ඒත් මට පුළුවන් උනේ නෑ...'

තාත්තා අද කතා කරන්නේ කවදාවත් නොවූ තරම් පහත් ස්වරයෙනි. මේ තාත්තා හෙළි කරන්නේ අතිශය විඩාබර බවින් පිරුණු ඔහුගේ ජීවන ගීතයයි.

'ලොකු පුතා දන්නවනේ මං අසනීපෙකටවත් නිවාඩු ගන්නේ නෑ... ඒ මට ඔයාලව රැකබලා ගන්න තියෙන ලොකුම දේ මගේ රස්සාව නිසා...'

මගේ දෑසට කඳුළු පිරුණි.

'තාත්තා ඔහොම කි...ය...න්...නෙ...පා... තාත්තයි අම්මයි අපි වෙනුවෙන් දුක්විඳිනා හැටි මං දන්නවා...'

ඕනම අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් දරුවන් වෙනුවෙන් දුක් විඳියි. එහෙත් දරුවෙකුට වැදගත් වන්නේ තම දෙමව්පියන් තමන් වෙනුවෙන් විඳි දුකය.

'මට රිටායර් වෙන්න තව අවුරුදු හතරයි තියෙන්නේ... මං ඉන්නේ තව අවුරුදු පහක් ඉල්ලන්න... ඒ ලොකු පුතයි පොඩි දුවයි වැඩ ඉවර නැති නිසා...'

තාත්තාට තවත් වසර දහයක් කන්තෝරුවේ හිර කරන්නට මගේ හිත නොදෙයි. එවිට ඔහුගේ ජීවිතයම ගෙවී



www.sinhalaelibrary.com

ඇත්තේ කන්තෝරුවටය. කාලයක් ඔහු ගෙදරින් යද්දීත් අපි නිදිය. ඔහු ඕ.ටී. කර නැවත ගෙදර එද්දීත් අපි නිදිය. ඒ ආවද ඔහු කෙලින්ම එන්නේ මාත් නංගීත් නිදන ඇඳ වෙතය. ඔහු ඇඳුම ගලවන්නේ අපේ හිත අතගෑ පසුය.

බෝසත් පියවරු එහෙමය. 'පිතු සෙනේ පිය හදවතේ මිස පුතු හදේ නොම රැඳෙන්නේ' කියා සිංහබාහු නාට්‍යයේ කිවුණද මගේ තාත්තා මං වෙනුවෙන් විඳිදුක මගේ පපුවේ හොඳින් ලියවී ඇත.

'තාත්තා ජොබ් එක එක්ස්ටෙන් කරන්න එපා... තාත්තා කවදාවත් නිදහසේ හිටියේ නෑ... නංගි ගැන මට බලන්න පුළුවන්... තාත්තා රිටයර් වෙලා ගෙදර ඉන්න...'

මම අඬමින් කීවෙමි.

'ඔයාලා වෙනුවෙන් දුක්විඳින එක මට දුකක් නෙවී ලොකු පුතේ...'

'ඒත් අයියේ කොල්ලා කියන එක ඇත්ත... කොල්ලා කිව්වත් වගේ අයියා නිදහසේ ඉන්නවා මාත් දකලා නැහැ...'

පොඩි මාමාද කීවේය.

'අද නොවේ ලොකු පුතේ... ඒත් කවදහරි ඔයා නංගිවයි අම්මවයි බලාගන්න ඕන...'

තාත්තාගේ කතාවට මම පමණක් නොව නංගිද හඬන්නට වූවාය. අපේ පවුල තුළ මේ තරම් සංවේදී කතා බහක් මින් පෙර සිදුවී නැත.

'තාත්තා මොනවද මේ කියන්නේ නංගිවයි අම්මවයි මට බලාගන්න දීලා තාත්තා කොහේ යන්නද... මේ නංගීත් අඬනවා...'





තාත්තා කරබා ගත්තේය.

'තාත්තා එදත් ඔහොම කතාවක් කිව්වා... අම්මත් ඇඬුවා...'

'අයියට ඇත්තටම පිස්සුද අයියේ ආ... අයියා තව කොච්චර කාලයක් ජීවත් වෙනවද... මං හිතන්නේ කවදහරි ලොකු පුතාගේ දරුවෙක් කසාද බඳින දවසටත් අයියයි අක්කයි ඉන්නවා...'

පොඩි මාමා වේදනාත්මක ස්වරයෙන් තාත්තාට කීවේය.

'මං නංගිවයි අම්මවයි විතරක් නෙවී... තාත්තාවත් බලා ගන්නවා...'

මම එසේ කීවෙමි. මගේ ජීවිතේ මට වඩාත්ම වැදගත් වන්නේ මම ආදරය කරනා අයය. ඒ අයව මම කෙසේ හෝ රැකගත යුතුය.

'මං හරි ආසයි ලොකු පුතා කවදහරි හොඳට හැදිලා වාහනේකින් එහේ එනවට... කොල්ලෙක් හදපු ආඩම්බරේ තාත්තා කෙනෙක්ට තියෙන්නේ දරුවෙක් එහෙම හැදිලා ඉඳිද්දී...'

'කොල්ලව ඒ තත්වෙට ගේන එක අයියේ මං බලාගන්නම්... මේකා පිස්සෙක් නම් මාත් ඒක කරන්නෑ... ඒත් කොල්ලට බිස්නස් ඇහේම තියෙනවා... ඒකා නාස්ති වෙන්නෑ...'

'මාත් ඒක දන්නවා මල්ලි...'

'අපි කොල්ලව නාස්ති කරන්න ඕනෙත් නෑ... මේකයි අයියේ සමහරු බැඳලා ජීවිතේ පටන් ගන්නවා... සමහරු ජීවිතේ හදගෙන බඳිනවා... ඔය දෙකම එකයි...'

පොඩි මාමා එසේ කීවේ මා දෙසද බලාය.

'දැන් ලොකු පුතාට ඕන බැඳලම ජීවිතේ පටන් ගන්නද...'

දැන් ලොකු පුතාට ඕන බැඳලම ජීවිතේ පටන් ගන්නද... තාත්තා තීරණාත්මක ප්‍රශ්නයක් මගෙන් ඇසුවේය. මා පිළිතුරු දිය යුතුය.

'මං... මං... තා...ත්...තේ...'

'කියන්න ලොකු පුතා...'

පොඩි මාමා මාව ධෛර්‍යමත් කළේය.

'මං තා...ත්...තේ... පිළිවෙලකට ජීවිතේ හදාගන්න ආසයි...'

තාත්තාට මගේ පිළිතුර තේරුණේදැයි මම නොදනිමි. කසාද බැඳීමට මම ඔව් යැයි නොකීවෙමි. එහෙත් ජීවිතය පිළිවෙලකට හදාගත්තට පසු කසාද බැඳීම සමානාත්ම දෙයකි.

'හොඳයි... මාත් කැමතියි ඔයා කසාද බඳිනවට... අපි මෙහෙම ඉක්මනට ඔයාව බන්දලා දෙන්න හිටියේ නෑ... ඒ...ත්... අම්මත් කියනවා ඔයාගේ කේන්දරේ තියෙනවලු කසාදේ ප්‍රමාද කරන්නෙපා කියලා...'

එහෙම දෙයක් මම නොදන උන්නෙමි.

'ඇත්තද අක්කේ...'

පොඩි මාමා අම්මා දෙසට හැරී ඇසුවේය.

'අවුරුදු විසි තුන වෙන්න කලින් ලොකු පුතා නොබැන්දොත් ආයේ එයාට කසාදයක් හරියන්නේ තිස් පහෙන් පස්සේ...'

'අයියෝ අම්මේ... එතකොට අසීයා වයසට ගිහින්නේ...'

අම්මා බණ්ඩාරවෙලට එන්නට ප්‍රථම මගේ කේන්දරය බලා සියල්ලම දැන ගන්නට ඇත. විවාහය වැනි බරපතල ජීවන සිදුවීම් පිළිබඳව කේන්දරයෙන් කිව හැක.





'අඩු වයසින් කසාද බඳිනවා කියන්නේ කිසිම අන්දකමක් නෑ... මෝරලත් නෑ...'

මගේ කසාදයට මා මෝරාගිය තරම් ඇතිබැයි තාත්තාට කියන්නට මට සිතිණි.

'අඩු වයසින් බඳිනවා නම් ඒ කසාදේ අවුරුදු දහයක් යනකල්වත් පරිස්සමින් අරගෙන යන්න ඕන...'

'ඔව්...'

අම්මා මා අනුමත කළාය.

'දික්කසාදේ කියන්නේ ලොකු පාපයක්... ඒ පාපේ මගේ දරුවෝ කරනවට මං ආස නෑ...'

අම්මා දෙවන වතාවටද කීවාය.

මම ආදරය අදහමි. එසේ ආදරය අදහන මට ආදරය නරකක් කරාවි යැයි මම නොහිතමි. චන්දනා වැනි යුවතියක් ආදරය පමණක් නොව ඒ ආදරය පුදන මාවද අදහනු ඇත.

'ලොකු පුතාට ඇයි හිතුනේ මේ ළමයව බඳින්න...'

තාත්තා කෙළින්ම ඒ ප්‍රශ්නය අසතැයි මම නොසිතුවෙමි. එය උත්තර දීමට ලේසි යැයි හිතෙන එහෙත් පිළිතුරු දෙද්දී අමාරු වන ප්‍රශ්නයකි.

'මං.. තා..ත්..තේ... ඒ ළමයට ආදරෙයි...'

එය සරල පිළිතුරකි... එහෙත් මට එය සංකීර්ණය.

'ඔයා කලිනුත් ළමයෙකුට ආදරේ කළානේ පුතේ...'

'මං... තා..ත්..තේ ගොඩාක් හිතලා එහෙම ආදරේ කරන්නේ... මට හිතෙනවා නිස්කලංකේ ජීවත් වෙන්න මේ ළමයා හොඳයි කියලා... මං තා..ත්..තේ ආස නිස්කලංක ජීවිතේකට... කලබල ජීවිතයකට මං ආස නෑ...'



www.sinhalaelibrary.com

හදවතේ ඇය ගැන ඇති හැඟීම් වචනයකට පෙරළීම මේ තරම් දුෂ්කර යැයි මම නොසිතුවෙමි. සියල්ලෝම ඉන්නේ නිහඬවය.

'තිබෙන දේවල් වරදින්නත් පුළුවන් ලොකු පුතේ...'

'මං දන්නවා තා..ත්..තේ... තාත්තයි අම්මයි අකමැති නම් කෙලින්ම කියන්න මං තරහ නෑ... මං... මං... තා..ම එහෙම සම්බන්ධයක් පටන් අරගෙනත් නෑ... මං... තාත්තලා අකමැති නම් ම..ගේ හි..ත හ..දා..ග..න්..නා..ම් එ..ක පා..ර..කුත් මං එහෙම කළානේ...'

මට ඇඹුනි. මා බලාපොරොත්තු නොවූ ලෙස මට හැඬුණි.

'අඩ..න්..නෙපා මහත්තයෝ...'

'අම්මාද හඬමින් කීවාය.

'මං පුතේ එහෙම දෙයක් කිව්වේ නැහේ...'

'මාත් ජීවිතයක් එක්ක සෙල්ලං කරන්න ආසා නෑ... බඳිනවනම් ජීවිත කාලෙටම... නැත්නම් දිගටම මෙහෙම ඉන්නවා...'

මම හඬමින්ම කීවෙමි. මගේ මේ කඳුළු මගේ ජීවිතය උදෙසා පමණක් නොවේ. අහිංසක ඇගේ ජීවිතයද වෙනුවෙනි.

'නෝනා මේ කොල්ලට අඬන්නෙපා කියන්න...'

තාත්තා අම්මාට කීවේය.

'පු..තේ...'

'අම්මටවත් හිතෙන්නැද්ද ඒ කෙල්ලගේ මූණ දක්කහම ඒකි හොඳ කෙල්ලෙක් කියලා... හිතෙන්නැද්ද...'





මම ඇසුවෙමි.

'ඔයා අඬන්නැතුව ඉන්න මහත්තයෝ... ඔක්කොම හරියයි...'

නංගී මගේ හිස අතගෑවාය.

'ඒ දරුවගෙන් පුතා කවදාවත් මේ ගැන අහලම නැද්ද...'

'නෑ තාත්තේ... එහෙම දේවල් ඒ කෙල්ලගේ ඔළුවට පටවන්න මං ගියේ නෑ... බැරි වෙලාවත් මට ඒ ජීවිතයෙන් අයින් වෙන්න උනොත් ඒක ලොකු පවක්... මටත් එයාගෙම වයසේ නංගී කෙනෙක් ඉන්නවා...'

'ඔයා එහෙම කරපු එක ගැන මං ආඩම්බර වෙනවා...'

මට ඒ හොඳටම ඇසිය.

'ඇහුවොත් ඒ ළමයා පුතාට මොනවා කියයිද...'

'ඇහුවොත් ඒ කෙල්ල මොනාත් කියන්නෑ...'

'එහෙනම්...'

'ඉකී ගගහ අඬයි...'

මා ඒ ටික කීවේ පොඩි මාමා දෙසද බලාය.

'ලොක්කා කියන්නේ ඇත්ත... එහෙම ඇහුවොත් කෙල්ල අඬනවා...'

'ඇයි...'

'එහෙම දෙයක් ඒ අහිංසක කෙල්ලට දරාගන්න බෑ... එච්චරටම ඒ ළමයට මාව වටිනවා... මං ඒක දන්නවා... මං බඳින්නත් ආස එහෙම මාව වටින කෙල්ලෙක්ව... නිකම් ගෑණියෙක්ව නොමේ...'

ආදරය ගැන මගේ හදවතේ එන පරමාදර්ශ කොතරම්

දුරට ඇත්තදැයි මම නොදනිමි. මේ මට හිතෙනා හැටිය. කොහොමටත් මට වටින්නේ මට හිතෙනා දෙයම පමණි.

'අපි ඔයා ගැන දන්නවා ලොකු පුතේ... මෙච්චර කතා කරන්නේ මේ ඔයාගේ ජීවිතේ වැදගත්ම තීරණේ නිසා...'

එතනදී මම තාත්තා සමඟ එකඟ වෙමි. විවාහයක් යනු කෙනෙකුගේ ජීවිතයේ වැදගත්ම තීරණයයි. එතනදී අල්ල පනල්ලේ කතා කිරීම හොඳ නැත. ප්‍රශ්නය මගේ විවාහය නම් මම ඒ ගැන සිය දහස් වතාවක් සිතා ඇත්තෙමි. මවාගෙන ඇත්තෙමි.

'අනික පුතේ ඔයා මොන ගෑණු ළමයා බැන්දත් බැන්දට පස්සේ ඒ ළමයා අපේ පවුලේ කෙනෙක් වෙනවා... එයා මගෙයි අම්මගෙයි දුවෙක් වෙනවා... නංගීගේ සහෝදරියක් වෙනවා...'

'ඔව් තාත්තේ.. මං මෙහෙම ළමයෙක්ව තෝර ගත්තෙත් එහෙම අපි ඔක්කොටම එයා ආදරේ නිසා... ගෞරව කරන නිසා...'

'මං ඒක දන්නවා...'

එසේ නම් අවසාන තීරණය ප්‍රකාශයට පත් නොකරන්නේ ඇයි...

'මල්ලී අපි ඒ දරුවට ටිකක් කතා කරමුද...'

තාත්තා චන්දනාට කතා කරන්නට යද්දී මම කලබල වුනෙමි. තාත්තා ඇගෙන් මොනවා අහාවිද... අහිංසක කෙල්ල අසරණ වෙනු ඇත.

'පොඩි මාමේ පොඩ්ඩක් ඉන්න...'

පොඩි මාමා නැගිටිද්දී මම කීවෙමි.

'ඇයි පුතේ...'





'තාත්තේ... කෙරෙන්නැති දෙයක් නම් ඒ ළමයගේ ඔළුවට මොනවත් දන්නෙපා... පව්...'

'මල්ලී එන්න කියන්න... මං ළමයා එක්ක නිකං කතා කරන්නේ...'

පොඩි මාමා ගොස් චන්දනාව එක්කාගෙන ආවේය. ඈ ඇත්තටම ආවේ බියෙන් මෙනි. විදුහල්පති ඉදිරියට එන බාලාංශ ළමයෙකු මෙන් ඈ අත් පිටුපසට කරගෙන අප ඉදිරියට ආවාය. ඈ මා දෙසවත් නොබැලුවාය. එලෙස කළ එක ඇත්තටම හොඳය.

'දුව දැන් මොනවද කරන්න හිතන් ඉන්නේ...'

තාත්තා ඇසුවේ අහිංසක කෙල්ල අඬවන ප්‍රශ්නයකි. බලාපොරොත්තු වූවාක් මෙන්ම කෙල්ලගේ දෑසට කඳුළු ඉනුවේය. ඈ උදව් ඉල්ලන්නට මෙන් මාත් පොඩි මාමාත් දෙස බැලුවාය.

'සංදේශ් අයියගේ තාත්තා නිකං පුතේ අහන්නේ...'

පොඩි මාමා ඇයව සැනසුවේය.

'මං... මං... ජයදේව අන්කල් ගාව වැඩ කරනවා...'

ඒ කතාවට මගේ දෑසටත් කඳුළු ඉනුවේය.

'ඒත් පුතේ ඔයා ගෑණු දරුවෙක්නේ... ඔයාව කව්රුහරි බලාගන්නෝනා...'

සියළු දේම... සියළු දෙනාම අහිමි වූ යුවතියක්ව බලාගන්නේ කවුද... ඇයට පිහිටට ඉන්නේ කවුද...

අප බලා ඉඳිද්දීම චන්දනා හඬන්නට වූවාය. උත්තරයක් නැති ප්‍රශ්නයකට අඩනු ඇරෙන්නට අසරණිය වෙන කුමක් කරන්නද...



www.sinhalaelibrary.com

'අඬන්නෙපා දුවේ...'

අම්මා නැගිට ගොස් චන්ද්‍රාව වත්කන් කරගෙන ඇගේ හිස අතගෑවාය.

'ඔයාව බලාගන්න කවුරුවත් නෑ කියලා අපි දන්නවා...'

'හි... හි..ට..පු කෙනත් මා..ව ද..ලා ගි..හි..යා... අ..ම්..මේ...'

මගේ පපුව හෝස් ගා දුවී ගියේය.

'එහෙම කියන්නෙපා දුවේ... ඔයාව බලාගන්න කෙනෙක් ඔයාට ලැබෙයි...'

තාත්තා එසේ කීවේ ඇයි... මා ඇරෙන්නට අහිංසක කෙල්ලව බලාගන්නට එන්නේ කවුද... මම බියෙන් පොඩි මාමා දෙස බැලුවෙමි.

'ඔයාව බලාගන්න කෙනෙක් ලැබුණොත් එයාව ආදරෙන් බලාගන්නවද...'

හඬමින්ම ඇය හිස වැනුවාය.

'ඒ..ත් මං.. මං.. එච්චර පි..න් ක..ර..ලා නෑ...'

තොල් බෙරි කරගෙන චන්ද්‍රා කීවාය.

'හරි පුතේ... ඔයා පින් කරලා තියෙනවද පව් කරලා තියෙනවද කියලා ඔයාගේ ඔය පොඩි වයසෙන් කියන්න බෑ... තාම ඔයා ජීවත්වෙන්න ගත්තා විතරනේ...'

තාත්තා කියන කතාව ඇත්තය. සමහර විට ඇය අප සියල්ලන්ටම වඩා පින් කර තිබෙන්නට පුළුවන. මොන තරම් දුෂ්කර හා වේදනාබර දේවල් සිදු වුවද කෙල්ලගේ මුහුණේ ඇති පින් පාට වෙනස් නොවේ.

පින් නොකළ අයගේ මුහුණට මේ සිරියාවන්ත පාට එන්නේ නැත.





'මං අහපු ප්‍රශ්නෙට පුතා උත්තර දෙන්න... පුතාව බලාගන්න කවුරුහරි ඔයාට ලැබුණොත් ඔයා එයාව ආදරෙන් බලාගන්නවද...'

ඇය ඒ ප්‍රශ්නයට පිළිතුරු කල්පනා කරන්න මෙන් මොහොතක් ගත්තාය.

'මං... මං...'

ඇයට ගොත ගැසිණ. මගේ පපුව ඇකිළිණ.

'මං... එ..යා..ව දෙ..සි..යෙ..ක්..ට ව..ගේ ව..දි..න..වා... මේ... අ..ත් දෙ..කි..න්...'

මම තොල් පට තද කරගෙන ඇහිපිහාටු වලින් දැස් වසා ගත්තෙමි. නොවේනම් මට ඇඬෙන්නට තිබුණි. මටත් හරියන්නට මෙන් චන්ද්‍රා අඬන්නට වූවාය.

'ඔයාව බලාගන්න කෙනෙක් එහෙම ලැබෙයි කියලා කවදාවත් ඔයාට හිතිලා නැද්ද...'

'මං දුප්..පත් තනිවෙච්ච කෙල්ලෙක්... ම..ට මාව බලාගන්න කෙනෙක් ඕන නෑ... ම..ට බලාගන්න කෙනෙක් ලැබුණොත් ඇ..සි... ම..ට දුක් විඳින්න පුළු..වන්...'

ජීවිතයේ පල්ලමට වැටුණ මේ කෙල්ලගෙන් තවත් මොනවාවත් නාසනවානම් හොඳ යැයි මට සිතුණි.

'කවදාහරි බැන්ද කාලෙක උයාගෙන පිහාගෙන බබාලවත් හොඳට හදාගෙන මහත්තයවත් ආදරෙන් බලාගෙන ගෙවල් දොරවල් ලස්සනට තියාගෙන ඉන්න පුළුවන්ද...'

අම්මා ඒ ප්‍රශ්නය අසද්දී ලුවනිය අසරණ දෑසින් හිස එසෙව්වාය.

'ම.. ම..ට ක..ව..දා..ව..ත් එහෙම ල..ස්..ස..න ජීවිතයක්



www.sinhalaelibrary.com

ලැබෙන්නෑ.. අ..ම්..මේ..'

මං සිතුවා හරිය. චන්ද්‍රනා කිසිම දිනයක එවන් සුන්දර ජීවිතයක් තමාට ලැබෙතැයි සිතන් නැත.

'ලැබුණොත් පු..තේ..'

'එ..හෙ..ම ලස්සන ජීවිතයක් මට එපා අම්මේ... එහෙම ලස්සනට ඉන්න එක දවසක් මට දෙනවනම් ඒ දවස වෙනුවෙන් මම මගේ පණ උනත් දෙ..නා..වා.. ඒ..ත් ලැබෙයිද දන්නෑ...'

මගේ යටි පතුලේ සිට හිරි වැටිණ. බොහෝ යුවතියන් පවුල් ජීවිතය වෙනුවෙන් තමාගේ පණ තබා තමා අඳින ඇඳුම් විලාසිතාවක්වත් නැති කරගන්නට කැමති නැත. චන්ද්‍රනා මේ විත කියන්නේ එවන් යුවතියන් ඉන්නා ලොවකය.

සියල්ලොම උන්නේ කතා කර ගත නොහැකිවය.

ඇය එන්නට පෙර ඇය මෙවැනි පුදුමාකාර යුවතියක් බව මම සිතුවෙමි. ඒ තරමටම ඇය ගැන මම දන්නෙමි. ඇය ගැන තරම් මා දන්නා තවත් කෙනෙකු නැතැයි මට සිතුණි.

'හොඳයි පු..තේ... ඔයා යන්න...'

තාත්තා මෘදුව කීවේය. චන්ද්‍රනා යන්නට ප්‍රථම මා දෙස බැලුවාය. ඇගේ දෑස් වල තවත් ප්‍රශ්නාර්ථයකි. ඒ ප්‍රශ්නයට දුන්මම මට උත්තර බැඳිය නොහැක.

'පුතේ අපට තව තේ ටිකක් හදනවද...'

පොඩි මාමා කීවේය.

'හා අන්කල්...'

පිටුපා යන ඇය දෙස අප හතර පස් දෙනාම බලා උන්නෙමු. මේ සියල්ලමත් හරිය. ඇගේ වතේ සුන්දරත්වයත් ඇතිය. චන්ද්‍රනාට පිහිටා තිබුණේ කලාතුරකින් යුවතියකට





පිහිටන ආකාරයේ හැඩ සිරුරකි. එහෙත් මා ආදරය කළේ ඒ ශරීරයට නොවේ.

'ලොකු පුතේ...'

තාත්තා කතාවේ දෙවන වටය පටන් ගත්තේය.

'හොඳ ගෑණියෙක්ව හොයා ගන්න පිරිමියෙක්ට ඉවක් තියෙන්න ඕන...'

තාත්තා කියන දේ ඇත්ත නම් මා චන්ද්‍රනාව සොයා ගත්තේ ඒ ඉව ඔස්සේ ගොසිනි.

'ජීවත්වෙන්න හොඳ ගෑණියෙක්ව හොයාගන්න ඔයාට හොඳ ඉවක් තියෙනවා කියලා මං කියනවා...'

මට මේ සැඳෑවේ ප්‍රථම වරට සිනාවක් ගියේය.

'ඒ දරුවා එක්ක කතා කළාම එහෙම ලේලි කෙනෙක් මටත් හොඳයි කියලා හිතෙනවා...'

පහන් වී තාත්තාට වදින්නට තරම් සතුටක් මට දැනුණි. එහෙත් මේ අවසාන තීන්දුව නොවේ.

'ගෑණියෙක් කියන්නේ ඕන වෙලාවට ලස්සනට ලෝකෙට පෙන්නන්න පුළුවන් ජීවිතේ හැම දේකටම ගන්න පුළුවන් දේකට... ඒත් හැම ගෑණියෙක්ම එහෙම නෑ... සමහර ගෑණු ලස්සනට අරන් යන්න පුළුවන්... ඒත් ගෙදර ආවම මිනිහට ඒ ගෑණිගේ කිසි ලස්සනක් නෑ...'

මම තාත්තාගේ කතාව අනුමත කළෙමි. ගෑණියෙක් යනු ෂෝ කේස් එකක් නොවේ. එහෙත් ලෝකයේ මා තේරූ වඩාත්ම වටිනාම දේ මේ යැයි ලෝකයට පෙන්වන්නට හැකියාවක් තිබිය යුතුය.

'මේ කෙල්ල අපේ කොල්ලව හොඳට බලාගනී නේද...



www.sinhalaelibrary.com

අපිවත් බලාගනී... අපේ මුණුපුරාලක් බලාගනී... මට එහෙම හිතෙනවා...'

සාන්තා දෙවගේ ප්‍රකාශයට ඉහිය දුන්නේය. මට ඇහුණි.

'ලොකු පුතා අඬන්නේ ඇයි...'

මට ඇඬෙන්නේ ඇයිදැයි මමවත් නොදනිමි.

මේ ආත්මයේ මට ලැබෙන්නට යන වටිනාම දේ මට දන් ලැබෙන්නට යනැයි මට සිතුණි. එවන් මහාර්ඝ වූ දෙයක් ලැබෙන්නට යද්දී පපුව ඉහිරී නොයන්නේ කාගේද...

'ලොකු පු..තේ... අඬන්නෙපා මහත්තයෝ...'

අම්මා යළිත් මට කීවාය. මා මේ ලොව ආදරය කරනා එකම ජීවිත තුන හතර ඉදිරියේ මෙසේ ඇඬීම මට ප්‍රශ්නයක් නොවේ.

'මං... මං... තේ ගෙනාවා...'

චන්දනා කෝපි රැගෙන ආවේ මා අඬද්දීමය. ඇය ට්‍රේ එක, විසේව මත තබා පුදුමයෙන් මෙන් මා දෙස බලා උන්නාය.

'පුතා යන්න...'

පොඩි මාමා ඇයව පිටත් කර හැරියේය. කෙල්ල ගියේ පස්ස බලමිනි. මා හඬන්නේ ඇයව මට ලැබෙන්නට යන නිසා බව මේ අහිංසක කෙල්ල දන්නවානම්... ඇය විශ්වාස නොකරනු ඇත.

එහෙත් ඇත්ත එයයි.

මට මේ මොහොතේ ජීවත් වීමට ඇති එකම පූජනීය අයිතිය ඇගේ ආදරය යැයි මට සිතෙයි.

'එයා ඇත්තටම හොඳ කෙල්ලෙක් අම්මේ... මං හැමදම





හිතුවේ මට ඔය වගේ ආදරේ කරන ගෑණියෙක්ව බඳින්න...'

'මේ කෙල්ල මටත් වඩා හොඳට ඔයාව බලාගනී ලොකු පුතේ...'

අම්මා හැඟීම්බරව කීවාය. මගේ පපුවේ පැත්තක් කඩාගෙන යන්නාසේ මෙන් මට දැනුණි.

'අම්මට එහෙම හිතෙනවද අම්මේ...'

මම අඬමින්ම ඇසුවෙමි.

'මට ඒක ඒ කෙල්ලව දැකපු පළවෙනි දවසෙම හිතුනා පුතේ... මං සාන්තටත් කිව්වා...'

'ඔව් අම්මා කිව්වා...'

දෙවියනි... ඔබ මගේ ජීවිතයට මේ තරම් කාරුණික වූවාද... ඔබට මා පුද පූජා කළා මදි නොවේද...

'අ..පෝ සාන්..තේ මට කියන්න... මට ඒ කෙල්ලව බඳින්න සාන්තා ඉඩ දෙනවා නේද... කියන්න අම්මේ...'

අම්මාත් සාන්තාත් අසල හිඹ ඉඳගෙන ඔවුන්ගේ දෙපා වලට දෑත් තබා මම ඇසුවෙමි. අම්මාත් සාන්තාත් දෙපැත්තෙන් මගේ හිස පිරිමැද්දේය.

'අපි ඒක තීරණේ කරලා ඉවරයි ලොකු පුතේ... සාන්තා පොඩි මාමට කිව්වා... පුළුවන් ඉක්මනට අපි ඔයාවයි මේ කෙල්ලවයි බන්දලා දෙනවා...'

මට යළිත් හැඬුණි. මේ මා අද අඬනා කීවෙනි සැරදැයි මට මතක නැත.

'ඇ..ත්..ත..ද සා..න්..තේ... මං මේ කෙල්ලව බැන්දට කමක් නැද්ද...'



www.sinhalaelibrary.com

'අපි කැමතියි පුතේ... අපිට දුක ඔයා මෙච්චර අහිංසක හොඳ ලේලි කෙනෙක්ව අපට හොයලා දුන්න එක ගැන...'

'ඒ කෙල්ල ඇත්තටම අහිංසක කෙල්ලෙක් තමා අම්මේ... මං.ට තාමත් හිතාගන්න බැහැ...'

මම නංගි දෙසත් පොඩි මාමා දෙසත් බැලුවෙමි. නංගීගේ මුහුණේ තිබුණේ ආදරණීය සිනහවකි.

'කොහොම කොහොම හරි මටත් හොඳ නෑනා කෙනෙක්ව හම්බ උනා... චන්දනාව දක්ක පළවෙනි දවසේ මටත් හිතුනා කවදහරි මේ කෙල්ල මගේ නෑනා වෙයි කියලා... ඒක එහෙම උනා... අම්මටයි තාත්තටයි ඇත්තටම පින් මේ කසාදෙට කැමැත්ත දුන්නට...'

නංගිගේ දෑස් වලද වූයේ කඳුළුය. ඇය හැමදම මගේ සතුට අපේක්ෂා කළ සොයුරියකි.

'ඔය දෙන්නා මගේම අම්මයි තාත්තයි වෙලා ලබන ආත්මෙත් ඉපදෙන්න ඕන...'

එසේ කියා මම අම්මාටත් තාත්තාටත් වැන්දෙමි.

'දන් නැගිටින්න පුතේ... ඔයාලා ලස්සනට ජීවත් වෙන්න ඕන... ලස්සන පැටව් ටිකක් හදන්න ඕන... ආයේ කවදාවත් සතුටකට මිසක් දුකකට අඬන් නැතුව ජීවත් වෙන්න ඕන... එතකොට තමයි අම්මයි මායි සතුටින් මැරෙන්නේ...'

තාත්තා මාව නැගිට්ටවමින් කීවේය.

'නෑ... ඔයාලා කවදාවත් මැරෙන්නෑ...'

මම නැඹිඹරව කීවෙමි.

'දැන් කොයි කාලෙද අයියේ අපි මේ දෙන්නගේ වෙඩින්





එක ගන්නේ...'

'ඉක්මනට බලලා ලෑදිම ගමු... මට තවත් එක්කෙනෙකුගේ වැඩ බලන්නත් තියෙනවනේ...'

තාත්තා කීවේ නංගී දෙසට නෙත් යොමාය.

'නෑ... නෑ... මගේ වැඩ දන්මම බලන්න ඕන නෑ... මං බඳින්නේ අයියගේ දෙවෙනි බබත් ඉපදුනාට පස්සේ...'

අප සියල්ලෝම ඒ කතාවට සිනාසුනෙමු. මගේ දෑස් වලින් වැගිරුනේ සතුටු කඳුළුය. ජීවිතය කොතරම් සුන්දරද...

'එහෙම බෑ... මටත් හොඳ මස්සිනා කෙනෙක් ඕන...'

'මං නම් හොයන්නේ අපේ අයියා වගේ කොල්ලෙක්ව... ඉන්නවද දන්නෑ...'

'මූ වගේම කොල්ලෝ තව ඉඳියිද දන්නෑ පොඩි දුවේ...'

'ඒක නමා මටත් සැක... හිමිහිට බලනවා...'

නංගී හොරැහින් අම්මා දෙස බලා කීවාය.

'එදාට ඔත්ත මගේ කසාදෙටත් මෙහෙමම කැමැත්ත දෙන්නෝන... විරුද්ධ වෙන්නේ එහෙම නෑ...'

'මනුස්සකමක් දන්නේ නැති රස්තියාදුකාරයෙක්ව ගෙනාවොත් අපි කැමති වෙන්නෑ...'

'මං එහෙම එකෙක් එක්ක යාළුවෙන්නෑ...'

නංගී ස්ථිර ලෙසම කීවාය.

'අපි මල්ලී දන් මේ කෙල්ලට කියන්නේ නැද්ද...'

තාත්තා අලුත්ම ප්‍රශ්නයක් ගෙන ආවේය. දන් මොහොතකට පෙර ප්‍රකාශයට පත් වූයේ චන්දනාගේ ජීවිතයේද ඉරණම තීන්දුවයි. එය ඇය දනාගත යුතුය. එය දනගන්නා මොහොතට



www.sinhalaelibrary.com

ඇය අඩන අයුරු බලා ඉන්නට මම ඇත්තටම ආශාවෙන් උන්නෙමි.

'කෙල්ලට එකපාර ඒක කිව්වොත් ඒකි පැලිලා මැරෙයි මෙතන... ලොකු පුතාම හිමිහිට කෙල්ලට කියන්න... එහෙම නේද අක්කේ හොඳ...'

'කියන්න දේකුත් නැතුව ඇති...'

අම්මා කීවේ අඩමාණයටය.

'මං එහෙම කළේ නෑ අම්මේ...'

'මම විහිළුවට පුතේ කිව්වේ...'

'කිව්වත් ඒ කෙල්ල එකපාර විශ්වාස කරන එකක් නෑ...'

'මම්ම හිමීට කියන්නම් අම්මේ...'

ඒ අසිරිමත් මොහොත මටම තබා ගන්නට මම ආශා කළෙමි. සඳ පායා ඇති සීතල රාත්‍රියක මේ මිදුලේ ඇයව තනි කරගෙන ඒ සුන්දර රහස ඇයට කියන්නට මම ආශා කළෙමි.

එසේ කියා මගේ ජීවිතයේ එකම පාද පරිචාරිකාව මේ පපුවේ තුරුල් කරගන්නට මම ආශා කළෙමි.

'අයියා ලොකු පුතාගේ වැඩ වලට යන වියදම් හිතන්නෙපා... ඒවා ඔක්කොම මම බලාගන්නම්... අපි කොළඹ රිසෙප්ෂන් හෝල් එකක දෙන්නගේ වෙඩින් එක ගමු...'

'ඊට පස්සේ අයියා කෙල්ලව කැන්දගෙන බණ්ඩාරවෙල එනවා... එහෙම නේද...'

'මං මෙහේ ජීවත් වෙන්න ආසයි නංගී...'

'කොහේ හරි කමක් නෑ... ඔයා ලස්සනට ජීවත් වෙන්නයි ලොකු පුතේ ඕන...'

තාත්තා මගේ හිස පිරිමැද නැගිටිමින් කීවේය.

www.sinhalaelibrar

# 38

අම්මාත් තාත්තාත් පොඩි මාමාත් මිදුලේ සිටියදී මමත් නංගීත් ගෙට ආවෙමු. ඒ එද්දීත් මගේ ඇස්වල තුනී තෙතමනයක් විය. ඒ ඇයිදැයි මමම නොදන්නෙමි.

නංගී සාලයට ආ විගසම මගේ අත් දෙකින් අල්ලා ගත්තාය.

'මං මගේ අයියට මුළු හිතින්ම සුබ පතනවා...'

නංගී දෙපතුල් වලින් ඉස්සී මගේ දෙකම්මුල් සිපගත්තාය. ඒ මගේ ආදරයට ලැබුණු ප්‍රථම සුබ පැතුමය. ඒ පැතුම මට ලැබුනේ මගේ පපුවේ එක පැත්තක් වන මගේම සොයුරියගෙනි.

'ඔයාට කවදාවත් වරදින්නේ නෑ අයියේ... දෙවියෝ ඔයා ගැන බලාගන්නවා...'

'මට තාමත් හිතාගන්න බෑ නංගී...'

'බලාපොරොත්තු වෙච්ච දේවල් ලැබුණට පස්සේ ඒ ගැන තිබ්බ අගය අඩු වෙනවලු... අයියා කවදාවත් මේ දුප්පත් කෙල්ලට එහෙම කරන්නෙපා... ඒකිව මලක් වගේ බලාගන්න... අයියව දෙවි කෙනෙකුට වගේ සළකගෙන ඒකි ඔයා ළඟම වැටිලා ඉදී... බයවෙන්නෙපා අනික් ගෑනු වගේ නෙමේ අයියගේ පොටෝ එකකට මේ කෙල්ල උදේ හවා ඕනනම් මල් පහනුත් තියයි...'

නංගී කීවේ දෑස් වල තෙතමනයක්ද සහිතවය.

'මං දන්නවා නංගී... ඔයාට අම්මට තාත්තට පොඩි මාමට මගේ අතින් වරදක් වෙනවද...'

'කවදාවත් නෑ...'

'ඒ වගේම තමා මේ කෙල්ලටත්... එයා මගේ ලේ වලට ඇවිල්ලා ඉවරයි...'

මම හැඟීම්බරව කීවෙමි.

'යන්න... අන්න කෙල්ල කුස්සියේ උයනවා... ගිහින් මෙහෙම බෙල්ල බදාගෙන කිස් එකක් දීලා කියන්න සදහටම ඔබ මගේ චන්දනා කියලා... කියන්න...'

නංගී මගේ බෙල්ල බදාගෙන කීවාය.

'අ..ද බෑ නංගී... ඒක කිව්වොත් මේ දැන් ඉඳලා හරියටම හෙට උදේ වෙනකල් කෙල්ල අඬනවා...'

'ඒක නෙමේ කියන්නැත්තේ...'

'එහෙනම්...'

'මං දන්නවනේ ඔයා ගැන... කෙල්ලව ළඟට කරගෙන





මෙහෙම අත ගගා... ඉඹ ඉඹ ඔයාට ඒක කියන්න ඕන... නේද...'

මම සිනාසී බිම බලාගත්තෙමි.

'නොකිව්වත් කමක් නෑ... ගිහින් ටිකක් බලන්න... දැන් ඔය ඉන්නේ ඉස්සර හිටපු චන්දනා නෙමේ... ඔයාට ලැබිච්ච චන්දනා... දැන් බලනකොට වෙනස් වෙලා පේන්නේ...'

නංගී කියන කතාව ඇත්තය. මා තව ටිකකින් දකින්නේ මෙතුවක් දවසක් මා දුටු චන්දනාව නොවේ. දැන් මා දකින්නේ ඒ අසරණ දුප්පත් කෙල්ලව නොවේ. සදහටම මගේ වන්නට යන මගේ අනාගත බිරිඳවය.

එදාට වඩා අද මට ඇයව කොතරම් ලස්සනට පෙනේවිද... මම නොදනිමි.

චන්දනා උන්නේ තුවිල්ස් පෙම්පරාදු කරමිනි. මා දුටුවනම ඇය ගැස්සී බැලුවාය. එහෙමම අපි බලාගෙනම උන්නෙමු. හරියටම ඇය තේරුම් ගන්නවා නම් මගේ දෑස්වල සියල්ල ලියවී තිබුණි.

'මට උඹව ලැබුණ කෙල්ලේ... මටම ලැබුණා...' දුවගෙන ගොස් ඇයව බදාගෙන ඔසවාගෙන එසේ කෑ ගසන්නට මට සිතුණි. එහෙත් මම දිගටම ඇය දෙස බලාගෙනම උන්නෙමි. කෙල්ල උන්නේ පුදුමයෙනි.

මගේ දෑස් තිබුණේ තෙත්වීය.

'සං..දේ..ශ්... අ..යි..යේ...'

ඇය උගුරෙන් මෙන් මට කතා කළාය.

'ඈ... ඈ..යි... ඈ..ඩු..වේ...'

ඇය ඇඬුවේ හඬන්නට මෙනි. මට ඒ මොහොතේ ඇඬුණේ ඇයව ලැබුණ සතුටට යැයි කිව්වොත් පමණ වීට ඇය

නොපිළිගන්නට පුළුවන.

'ඇ..යි සංදේශ් අ..යි..යේ අ..යි..ය..ට කරදරයක්ද...'

කෙල්ල ඉන්නේ ඒ තරම් බියකිනි.

'නෑ... මුකුත් නෑ...'

'ඇ..යි මේ...'

අනේ ඇයට මේ සියල්ල කියන්නට හැකිනම්... ඇයට කියනා තුරු මේ පපුව තවත් දවස් දෙකක් මේ දුක දරාගත යුතුය.

'අ..යියේ...'

මම ඇයව නොත් පුරාම දක ගත්තෙමි. කිසිම ප්‍රශ්නයක් නැත. මට ලැබුනේ සඳක් වැනි කෙල්ලෙකි. මලක් වැනි කෙල්ලෙකි.

'කරදරයක් නෑ... බයවෙන්නෙපා...'

මම යුවතියගේ හිස අතගා කීවෙමි.

'ඇත්තටම කරදරයක් නෑ නේද අයියේ...'

'නෑ.. දරුවෝ නෑ...'

'මං හරි බයේ උන්නේ... මං හිතුවේ සංදේශ් අයියලගේ අම්මයි තාත්තයි මොකක් හරි ප්‍රශ්නයකට අයියට බණිනවා කියලා...'

'මං..ට නෑ... මොනවද හදන්නේ...'

'ඔක්කොම හදලා ඉවරයි... නූඩ්ල්ස් ටික තෙම්පරාදු කරලා මාළු ටික බදින්න විතරයි තියෙන්නේ...'

'හෙට අපි කට්ටියම නුවර යනවා... මාලිගාවට... ඔයත් එන්න ඕන...'





'මං ඉ..න්..න..ම්...'

'නෑ... ඔයා එන්නම ඕන...'

'ඇ..යි ඒ...'

මම කිසිවක් නොකීවෙමි. අම්මා නංගීත් සමඟ කුස්සියට ආවාය. ඇය ආ හැටියට බලා උන්නේ ඇගේ ලේලිය දෙසය. අම්මාගේ කටින් තුමක් හෝ පිටවෙතැයි මට බිය සිතුණි.

'අනේ රත්තරන් ඔයා උයනවා ඉවරයක් නැනේ...'

'නෑ අම්මේ ඉවරයි... උණුවෙන් කන්නෙපායැ...'

අම්මා අතේ තබාගෙන උන් කුඩා පෙට්ටියක් විවර කළාය.

'මං ඔයාට පොඩි තෑග්ගක් ගෙනාවා... ඒක දෙන්නත් අමතක උනා දුවේ...'

මට පුදුම සිතුණි. අම්මාත් තාත්තාත් කොළඹ සිට එන්නට ඇත්තේ සියල්ල තීරණය කරගෙනය. ඇය මේ තෑගි ගනිද්දී ඇගේ පුංචි ලේලියව මතකයේ තබා ගන්නට ඇත.

'අ..නේ අ..ම්..මේ... මේ මො..න..ව..ද...'

'සංදේශ් අයියටයි දුවටයි අපි තෑගි ගත්තා... ඒ ගමන් ඔයාවත් මතක් වෙලා ගත්තා... කෝ එන්න මං බඳින්න...'

අම්මා ඇයට රැගෙන විත් තිබුණේ සිහින් රන් මාලයකි. චන්දනා දෑස් වල කඳුළු පුරවාගෙන බලා සිටිද්දී අම්මා එය ඇගේ කරේ බැන්දය.

'අම්මට පින්... මං..ට මගේ අම්මවත් මෙහෙම මාලයක් බැඳලා නැහැ අම්..මේ...'

චන්දනා පහත් වී අම්මාට වැන්දාය. ඇය එහෙමම චන්දනාව තුරුළට ගත්තාය. නංගීත් මමත් මුහුණට මුහුණ

බලා ගත්තෙමු.

'හරි දුවේ... දත් අඩන්නෙපා...'

අම්මා චන්දනාගේ හිස අතගා කුස්සියෙන් ගියාය. හීන් රත් වෙන් පට ඇගේ පාළු කරට ලස්සනය.

# 39

මැද කඳුකරයේ උස්ව පරණගම අහසට ලස්සනට සඳ පැයුවේ අද යැයි මට සිතුණි. ඒ තරමම ලස්සනට බණ්ඩාරවෙල අහස පුරා සඳ අපූරුවට පායා තිබුණි.

අහස යුවතියක් මල්වර වූ දිනයක ඇගේ මුහුණ මෙන් නිර්මලව නිකැළැල්ව තිබුණි. ඉඳහිට කුඩා වළාකුලක් රස්තියාදුවේ යන්නට මෙන් ඒ මේ අත ගියේය. කඳු හිස් මත වූ මීදුම් කුට්ටි මතට අපරිමාණ සඳ රැස් දහරා වැටී තවතිසාවක් මා වටා මැවී ඇතැයි මට සිතුණි.

ලස්සන මේ කඳුකර පරිසරයද... මේ සඳ දිය වැගිරෙන අහසද... නොවේනම් මගේ හදවතද කියා මට තිනව්වක් නැත.

කාලාන්තරයකට පසු... කෙනෙකු බොහෝ දුක් විඳි පසු... එක් ලස්සන දවසක් උදවේ යැයි රවින්ද්‍රනාත් තාගෝර් තුමාගේ කවියක තිබුණි. ඒ දවස දෙවියන්ගේ දවස යැයි එතුමා ගීතාංජලී නම් පොතේ ලස්සන කවියකින් ලියා ඇත. ඒ රාත්‍රියේදී ඔබට කරන්නට ඇත්තේ දෑස් පියාගෙන බලා සිටීම පමණකැයි එතුමා ලියා ඇත.

ජීවිතයේ බොහෝ දවස් ගෙවී ගිය පසු උදවන ඒ අපූරු දේවමය දවස අද යැයි මට සිතෙයි. මගේ ජීවිතයේ සුන්දරතම... අපූරුතම දවස අද යැයි මට දැනෙයි.

හදවතට මහා සැනසීමක් නොවේනම් නිදහස් බවක් දැනෙයි. ආදරය මහා බරකැයි කව්දෝ කියා ඇත. එහෙත් ලොව ඇති ඉතා සැහැල්ලුම දේ ආදරය යැයි මට සිතෙයි. මේ රාත්‍රියේ අර ඈත පෙනෙන මීදුම් වළාකුළු අතර ඇවිදයන්නාක් මඳු මෘදු නිදහස්



www.sinhalaelibrar

මන්මත් බවක් මගේ ලයට දනෙයි.

ඒ සුන්දර චමත්කාර ජනක නිදහස් බව මට දුන්නාට මගේ ආදරණීය දෙමව්පියන්ට මම තවත් වතාවක් පින් දුන්නෙමි. මා වැනි අහිංසක දරුවෙකුගේ කඳුළු වලට ඔවුන් මේ තරම් කරුණාවන්ත ලෙස සළකාවි යැයි මම ඇත්තටම නොසිතුවෙමි.

අද හවස අම්මාත් තාත්තාත් නංගීත් යළි කොළඹ බලා යද්දී ස්ටේෂමේදී මම ඔවුන්ගේ දෙපා නමද්දී මට ඇඬුණි. අම්මා මාව වැළඳගත්තාය. මට හෝ ගා ඇඬුණි. එහෙම අඬන්නේ ඇයිදැයි අම්මාවත් තාත්තාවත් නංගීවත් ඇසුවේ නැත.

මම... මගේ පුංචි පවුල... මගේ ආදරණීය දෙමව්පියන්... මගේ සදරණීය සොයුරිය... මගේ අනාගත බිරිඳ... පොඩි මාමා... මතු යම් දිනයක අප අතරට එන පුංචි අමුත්තන් ඒ සියල්ල වෙනුවෙන් මම හඬන්නෙමි.

කෙනෙකු පරිණත වූවා යැයි කියන්නේ තමා වෙනුවෙන් හැඬීම නවත්වා අනෙකා වෙනුවෙන් තමා ආදරය කරන ආදරණීයයන් වෙනුවෙන් හඬන්නට ගත් පසුය.

තවමත් විසි එක්වෙනි උපන් දිනයවත් සමරා නැති මම ජීවිතය නම් වූ මේ මහා මහමෙර එක ඇඟිල්ලකින් මගේ පපුව මත තබා ගත්තෙමි.

ජීවිතයේ බර මට බරක් නොවේ...

සඳ පින්න වැටි තරමට සීතලද වැටිය. සීතල වැටියෙන්ම දනෙන්නේ රාත්‍රිය කියා නොබලා මා නෑව නිසාය. ජීවිතයේ පවිත්‍රම රාත්‍රිය දෙරකඩ ඉන්නා මට නොනා සිටින්නට නොහැකි විය.

ඒ මගේ හැටිය. චතුර මිනිසුන්ගේ ආත්මයට මොනවාදෝ කරයි...

පැයක් පමණ මම මද රස්නය තිබූ උණු දියෙන් නෑවෙමි. කොපමණ උණු දියෙන් නෑවද එළියට ආ විගස සීතල පපුවටම දනෙන්නට ගනී.

මා නාගෙන තුවාය පිටින් එද්දීම චන්දනා මට කිරි කෝපි එකක් හදාගෙන කාමරයට ආවාය. අපේ ඇස් එකට මුණගැසුණි. තවමත් මා ඇයට කිසිවක් කියා නැත.

එහෙත් කෙල්ල ඉන්නේ විශාල දෙයක් ඇස්වල තබාගෙනය. යමක් කියන්නට යන පරක්කුව පමණය. ඇය අඬන්නට ගනියි.

'අ..නේ ඇ..යි දෙයියනේ නෑවේ...'





මම සිනාසුනෙමි. මෙතෙකම මේ සීතල දැසින්ම ඇගේ උණුසුම් එක වැළඳගෙන සියල්ල කෑ ගසා ඇයට කිව හැක.

එහෙත් ආදරය ඊටත් වඩා නිස්කලංකයේ විඳගන්නට මම ආශා කළෙමි. මට ඇය හිමි වී අවසානය. මතු මතු ආත්ම භව දහසකට මට ඇයව හිමි වී අවසානය.

ආත්මයේ පාද පරිචාරිකාව හමු වූ පසු ජීවිතයේ තවත් සොයන්නට දෙයක් නැතැයි මට සිතෙයි.

'මට නාන්න හිතුණා..'

'අසනීප වෙනවනේ දෙයියනේ... ඔය ඔළුව හොඳට පිහදාගන්න.. ඉන්න අනිත් දවසෙ අම්මා ආවම මං කියනවා රෑට නානවා කියලා...'

මම යුවතියගේ දෑස් දෙසම බලාගෙන ඇය අසලටම ආවෙමි. යුවතියගේ හිස් දෙකොල් යටට ගියේය.

'මිනිහෙක් ලැබුණොම හැමදාම ඒ මිනිහගේ වැරදි පොඩි කාලේ වගේ අම්මට කිය කිය ඉන්නෑ... ගෑනි දනගන්න ඕන මිනිහව හදගන්න...'

මට එසේ කියවුණ. චන්දනා දෑස් ලොකු කරගෙන මා දෙසම බලා උන්නාය.

'මං.. මා..ට ඒ..හෙ..ම කෙ..නෙ..ක් ලැ..බෙන්..නැ..නේ සං..දේ..ශ් අ..යි..යේ... ලැබෙනවනම් මං දන්නවා හදගන්න...'

යුවතියගේ දෑස් දෙපිටින් මදටිය ඇට තරම් කඳුළු කැට දෙකක් පැන්නේය. මම සීතල අතින් ඒ මුහුණ පිසදැම්මෙමි. දැන් මම බයක් සැකක් නොමැතිව ඇයව අල්ලමි. ආත්මියවත් ශාරීරිකවත් ඇය දැන් මගේය. මගේමය.

'ඔයාට ලැබෙයි... ගහලද හදගන්නේ...'

මම ළංවී ඇසුවෙමි. ඇය කඳුළු අතරින් සිනාසුනාය.

'මං ගහන්නෑ... බණින්නෙත් නෑ... මං.. මං.. ආ..ද..රෙ..න් හදගන්නවා...'

'මාත් ආස එහෙම මාව ආදරෙන් හදගන්න ගෑණියෙක්ට...'

ඇගේ නළලත මැදින් වූ කොණ්ඩයේ මටා බෙදුම් රේඛාව

දෙස බලමින් මම ඇසුවෙමි.

'මං එහෙනම් බඩුවක් කියන්නද...'

'හා...'

මගේ පපුව පිපිරෙන්නට තරම් විය.

'අයියව හදාගන්න ගහන්න ඕනෙත් නෑ... බණින්න ඕනෙත් නෑ...'

'ඈ..යි...'

'අයියා දිහා බලලා ගෑණියෙක් හැදෙනවා මිසක්... ගෑණියෙක්ව ඇවිත් හදන්න දෙයක් අයියගේ ජීවිතේ නෑ...'

මගේ දිවග විසළිණි.

'කොහොමද එහෙම කියන්නේ...'

'මං... මං... දන්න නිසා කියන්නේ...'

සත්‍ය එය නම් මා ගැන දන්නා හොඳම යුවතිය ඇය බව මම යළිත් වරක් තීරණය කළෙමි.

මම සඳ රැසින් ප්‍රභාමත් වූ මිදුලට බැස්සෙමි. එන්නට ප්‍රථම මම චන්ද්‍රනාව සෙව්වෙමි. ඇය රෑට රොටී හදන්නට පිටි අනා තබා මස් කරියක්ද හදා ඇඟ සෝදාගන්නට නාන කාමරයට ගොස් උන්නාය.

පොඩි මාමා ඔහුගේ මිතුරෙකු සමඟ ගියේය. රෑට කෑම කන්නට එපා යැයි ඔහු කීවේය.

'ලො..කු පු..තේ...'

යන්නට ප්‍රථම ඔහු මගේ උරමඩලට අතක් තැබුවේය. මගේ දෑසට කඳුළු පිරුණි.

'පො..ඩි මා..මේ...'

'උඹට දන් සතුටුයි නේද කොල්ලෝ...'

'සතුට එළියට දාගන්න බැරුව පොඩි මාමේ ඉන්නේ... ඇඬෙයි කියලා බයයි...'

ඔහු දයාවෙන් මගේ හිස අතගෑවේය.

'උඹට වරදින්නෑ පුතේ... හරි විදිහට යමක් කරනකොට හරියනවා... උඹ හදක් ඉල්លුවනේ... මං උඹට හඳ අරන් දුන්නා....'

'ඒක හඳක් නෙමේ පොඩි මාමේ... පසළොස්වක හඳක්...'





ඔහු කිසිවක් නොකියා මදෙස බලා උන්නේය.

'කියන්න පොඩි මාමේ...'

'උඹ ආදරේ කරනවා දක්කහම මටත් හිතෙනවා ගෑණියෙක්ව ආයෙමත් ආදරේ කරන්න තිබ්බනම් කියලා...'

'පොඩි මාමා වයසට ගිහින් නෑ...'

ඔහු සිනාසුනා පමණි.

'මං යන්නම් පුතේ...'

'පොඩි මා..මේ...'

යන්නට ප්‍රථම මම ඔහුව දෑතින්ම අල්ලා ගත්තෙමි. ඉන් පසුද ඔහුට දණ ඔබා වැන්දෙමි.

'වැඩිය බොන්නෙපා පොඩි මාමේ...'

ඔහු මගේ හිස අතගා වාහනයට නැග්ගේ හිස වනමිනි.

දැන් රාත්‍රී අටට පමණ වන්නට ඇත. බද්ලු කෝච්චියේ එළිය පෙට්ටි ටික කඳු මැදින් ගියේ මේ දැන්ය.

අවට තිබුනේ සඳ එළිය පමණකි. මම සරමක් ට් ෂර්ට් එකක් පමණක් ඇඳ උන්නෙමි. ස්වීටරය ගෙනෙන්නට ඇතුළට යන්නට සිතුණද මට මිදුල දමා යන්නට බැරි ගතියක් දැනුණි.

මොහොතකින් මං බලාපොරොත්තුවෙන් උන් රුව දොරකඩින් මතුවිය. ලා රෝස පැහැයට හුරු රෑ ඇඳුම උඩින් ස්වීටරය දමා උන් චන්ද්‍රනා මිදුලට ආවේ මගේ ස්වීටරයද අතින් රැගෙනමය.

මගේ දුක... මගේ වේදනාව... මගේ හැඟීම් මටත් කලින් දැනෙන ගෑහැණියක් මට ලැබීම ගැන මම දෙවියන්ට ස්තූති කළෙමි. මම සඳ පිනි පොද වැටුණු උයන මැද තණ බිස්සේ හිටගෙන මා දෙසට එන මගේ ආදරණීය පාද පරිචාරිකාව දෙස බලා උන්නෙමි.

කිසිදු ඇඳයක් නැත. මට ලැබුනේ පසළොස්වක සඳකි. ඇය දෙසින් දෑස් ගන්නට බැරුව මම ඇය දෙසම බලා උන්නෙමි. සිදුවීමයකට මෙන් ඇයද ආවේ මගේ නෙත් මත දෙනෙත් තබාගෙනමය.

'සීතලයිනේ... ආ.. ඈ..දගන්..න...'

ළඟටම ආ පසු ඇය මා අතට ප්විටරය දුන්නාය. නැත. දන් සීතල නැත. උතුරු අර්ධගෝලයේ සීතල හිම කන්දක තනිවුවද දන් මට සීතලක් නැත.

ප්‍රේමයෙන් මගේ ආත්මයම උණුසුම් වී හමාරය. මම ආදරය කර ඇත්තෙමි. එහි දුකද විඳ ඇත්තෙමි. එහෙත් ප්‍රේමය මේ තරමටම ගණසම් යැයි මම නොදන උන්නෙමි. මෙපමණටම උණුසුම් යැයි මම නොදන උන්නෙමි.

'ඇ..යි සං..දේ..ශ් අ..යි..යේ...'

යුවතිය උගුරෙන් මෙන් ඇසුවාය. වන්නුණු විලවුන් නොර වූ ඇගේ මුහුණ නිර්මලය. නිකැළැල්ය. පිරිසිදුය. මට ඇත්තේ ආදරයෙන් දෙවා තොලා ගන්නට පමණි.

'අද මොනවා වෙලාද මන්ද...'

තමාටම මෙන් ඇය කියාගත්තාය.

'අද නෙමේ චන්දනා... බණ්ඩාරවෙලට ආපු දවසේ ඉඳලා මොනවද උනා... මත් හිටියේ මේ මොනවද වෙන්නේ කියලා තේරුම් ගන්න බැරුව... ළඟදී තමයි මොනාද උනේ කියලා මට තේරුම් ගියේ...'

එලෙස මට කියවිණ. ඇගේ කුඩා දෙනෙත් ලොකු වී ඇත. අප තවමත් හිටගෙනය.

වෙනද ගිරවියක මෙන් කියවූ යුවතිය අද නිහඬය. සැබෑය. හදවත දෙඩමින් වෙද්දී මුව නිසල වෙයි.

'අර... අද ලස්සනට හඳ පායලා... බලන්න කඳු උඩ තියෙන මීදුම් උඩට වැටිලා තියෙන ලස්සන...'

මම ඇයට පෑවී සඳ පෙන්වූයෙමි. එහෙත් මම සඳ දෙස නොබලා ඇය දෙස බලා උන්නෙමි.





'හ..රි ල..ස්..ස..න..යි...'

ඇය මිමිණුවාය.

'වෙනද නැති ලස්සනක් පේන්නැද්ද... කවදවත් මෙතනදී දක්කේ නැති ලස්සනක්...'

යුවතිය දෑස් මා වෙතට හැරෙව්වාය. තරමක නොසන්සුන්තාවයක් එහි විය.

'පේ..නා..වා.. ඇ..යි ඊ...'

මමද නොදනිමි. මම විනාඩි පහකට පමණ පසු චන්දනාගේ දෙඋරහිස් අල්ලා ඇයව මා පැත්තට හරවා ගත්තෙමි. ඒ දෑස... ඒ මුහුණ... ඒ දෙතොල සියල්ල මා වෙනුවෙන්ම මවා ඇති බවක් මට දනුණි.

'සං..දේ..ශ් අ..යි..යේ...'

තිව් සැනසී ගිය හඬකින් යුවතිය කතා කළාය.

'ම..ට ක..තා..ව..ක් කි..ය..න්..න ති..යෙ..නා..වා...'

ඒ ටික කියද්දී මගේ කටහඬ බිඳී ගියාක් සේ විය. ආදරයේ ප්‍රථම මාත්‍රාවේදී සියල්ලෝම ආධුනිකයන්ය.

'මං... මං... අ..හ..ගෙ..න ඉ..න්..නා..ම්...'

යුවතියගේ දෑස් තෙත් විය... ඒ ඇයිදැයි මම නොඇසුවෙමි. අප දෙදෙනාම පැමිණ සිටියේ දෛවයේ තීරණාත්මක මංසලකටය. මේ රාත්‍රිය... මේ සඳ එළිය... මේ මීදුම් සියල්ලම අපේ දෛවයේ සාක්ෂිකරුවෝය...

'මෙ..තැ..න බැ..හැ... ඔයාට සීතලයි...'

'ම..ට සීතල නැ..හැ...'

'ඇ..යි...'

'දැ..න්..නෑ...'

මම චන්ද්‍රානාගේ කුඩා ඇඟිලි අඩු වලට මගේ දකුණත යැව්වෙමි. ඒවා පැටලෙන්නට බලා උන්නාක් මෙන් තද විය. අප අත්වැල් බැඳගෙනම නිවසට ඇතුල් උනෙමු.

සැන්දෑවේ චන්ද්‍රනා දල්වූ හඳුන්කූරු වල සුවඳින් මුළු නිවසම පිරී තිබුණි. ඉන් ආවේ පමන් මල් සුවඳකි.

මගේ කාමරයේ වූ ලා කහ පැහැගත් ආලෝකය ඇගේ මුහුණට මැවී තිබුණි. මම ඇගේ දෙඋරහිස මත දෑතම තැබුවෙමි.

'එ..ක දැ..වස..ක්...'

'ම්...'

'කිව්වා නේද කතාවක්..'

'ම්...'

'මොකක්ද...'

'මං හොඳාක් ඒවා කියලා තියෙනවා...'

'හොඳ මහත්තයෙක් ලැබුණොත්.. මොනවා කරනවා කියලද කිව්වේ... ආ...'

'මේ..ම අත්දෙක එකතු කරලා... උ..ඬ් හා..වා වැ..දැ..ලා මේ ඇ..ස් දෙ..ක වා..ගේ බලාගෙන්..නවා.. කියලා...'

යුවතියගේ දෑසින් වැහි වතුර මෙන් කඳුළු ගලාගෙන ගියේය.

'තව දවසක්...'

'කි..ය..න්..න...'

ඇය උන්නේ පිච්චෙමිනි.

'මං පහනක් දුන්න නේද කියන්න කියලා...'

'ඔ..ව්...'





'හිතේ තියෙන කෙනාත්ව ඉල්ලන්න කියලා...'

'ඔ.. ඔ..ව්...'

'කාවද ඉ..ල්..ලු..වේ...'

ඇය ඉකි ගසා හඬන්නට විය.

'කිය..න්..න.. කව්රු ලැබුණොත්ද මෙම අත දෙක එකතු කරලා වැඳලා බලාගන්..නේ...'

ඇගේ දෙකොලන් නිකටත් දිව්ව සෙලවෙමින් ඉකි හඬ පිටව ආවේය.

'අ..නේ දෙ..යි..ය..නේ ම..ම.. කො..හො..ම..ද කි..ය..න්..නේ...'

'මේ බලපන් කෙල්ලේ මගේ ඇස් දෙක.. දි..හා...'

ඇය මදෙස බැලුවාය. ඇයට දකින්නට ලැබෙන්නේ දෑස තොගවේ. කඳුලින් වැසී ගිය වීදුරු බෝල දෙකකි.

'අ..නේ ඇ..යි මේ...'

'මේ...'

මටද කියන්නට ගිය දේ කියවෙන්නේ නැත. මාවද වෙව්ලන්නට විය.

'කි..ය..න්..න ර..ත්..තා..රා..න් අ..යි..යේ...'

'මේ.. ක..දු..ළු උඹට විශ්වාසද...'

ඇය අත තබා ගත්තේ මගේ පපුවටය.

'ම.. ම..ගේ පණටත් ව..ඩා...'

'මේ කඳුළු වල අත තියලා කියපන් එද ඉල්ලුවේ කාවද කියලා...'

මම ඇගේ දෑතම මගේ කඳුලින් වැසී ගිය කම්මුල් මතට ගෙන ආවෙමි.



www.sinhalaelibrary.com

‘අ..නේ මං.. කො..හො..ම..ද දෙ..යි..ය..නේ කි..ය..න්..නේ...’

ඇය ඇඬුවාය. මගේ මුහුණ මත තිබූ යුවතියගේ දෑත් වෙව්ලමින් තිබුණි.

‘උඹ කියන්නෑ... එහෙනම් මං කියන්නද...’

චන්දනා හිස වැනුවාය.

‘මෙහෙම වාඩිවෙන්න...’

මම චන්දනාව ඇඳමත වාඩි කළෙමි. ඉන් පසු මමද ඒ අසළින් වාඩි උනෙමි.

‘මේ බලන්න...’

ඇය මුහුණ හැරෙව්වාය. මම යුවතියගේ කුඩා උකුල් තලාව දෙස බලා උන්නෙමි. ජීවිතයම සතපා ගන්නට මට මේ උකුල් තලාව හොඳටම ඇතිය.

‘මා..ව...’

‘ම්...’

‘මුළු ජීවිතේ පුරාම...’

‘කි..ය..න්..න..කෝ...’

‘මෙහෙම මේ උකුලේ නිදි කරවගන්නවද...’

ඇයටවත් සිතාගන්නට බැරි මොහොතක මම එහෙමම ඇගේ උකුලට මගේ හිස තැබුවෙමි. චන්දනා ගල් ගැසී ගියාය. මම අම්මා කෙනෙකුගේ උකුල බදාගන්නාක් මෙන් බැසිබරව ඇගේ සිනිඳු මෘදු උණුසුම් උකුල් තලාව බදාගත්තෙමි...

ගැහැණියකගේ නිර්මල ආත්මීය සුවඳ...

‘කෙ..ල්..ලේ...’

‘මො..න..ව..ත් කි..ය..න්..නෙ..පා ම..ගේ දෙ..යි..යෝ.. මො..න..ව..ත්



කි..ය..න්..නෙ..පා...’

කෑ ගසා හඬමින් ඒ වචන ටික කියූ චන්දනා මගේ මුහුණ දැඩිව වැළඳගෙන සිය කුරුල් දරුවාව ඉඹින අම්මා කෙනෙකු මෙන් අසිහියෙන් සිපගත්තාය.

‘කි..ය..න්..න මැ..නි..ක.. ම..ට ආ..ද..රේ..ද...’

ඇගේ මුහුණ මාගේ මුහුණ මත තිබියදීම මම ඇසුවෙමි.

‘මේ කෙල්ල.. ම..ගේ ර..ත්..ත..ර..න් වූ..ටි ම..හ..ත්..ත..යට කොච්චර ආ..දරේද කි..යලා ඔයා දන්නවා දෙ..යියෝ...’

හඬමින්ම චන්දනා කීවාය.

‘අ..නේ ම.. ම..ට ලැ..බු..නා..නේ...’

මගේ අම්මාට පසු මා දුටු හැකිම්බරම ගැහැණියගේ කඳුලින් දෙන වෙමින් මම දෑස් පියාගත්තෙමි. ප්‍රේමය කුංකුම කල්පයක් වී නම් මගේ නෙතට අංජනයක් වූයේ මේ ආදරයයි...

## නිමි.

ප්‍රේමය යනු තමා වෙනුවෙන් වින්දිත් කිරීම නොව
අනෙකා වෙනුවෙන් පරිත්‍යාග කිරීමය...
ජීවිතය යනු පූර්වාත්මයේ එකට උන් ආත්මයන්
සොයා යන ගමනය... පතාගෙන ආ අය ලැබුණ කල
ජීවිතය තව්තිසාවකි... පතාගෙන ආ අය හමු නොවූ කල
ජීවිතය අපායකි... මේ සංසාරය පුරා අප සරන්නේ
අපට වඩාත්ම ආදරය කරන අය සොයමින් වින්දනා කිරීමය...
සංදේශ් නම් වූ අහිංසක තරුණයාත් ශශිනා නම් වූ යුවතියත්
චන්දනා නම් වූ ගැහැණු දරුවාත් අතර ගලා ගිය
ඒ සංසාරික චන්දනාගේ කඳුලින් සුනුම්ස් ගා



www.sinhalaelibrary.com